**2026 අගෝස්තු මස 04 වන දින පෙරවරු 9.30 ට**
**මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**
**මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව**

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. රංජලා එස්.ජයතුංග මහත්මිය |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 51. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.08.04 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2026.07.07 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.07.07 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව පිළිගත යුතුයැයි යෝජනා කර සිටිමි.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.07.07 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-</u>

**02(1)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 178 වන වීරපුරන්අප්පු සැමරුම් උත්සවය 2026/08/07 දින පෙ.ව.9.30ට මොරටුව මහා නගර සභාවේදී පැවැත්වෙන බැවින් ඒ සඳහා සහභාගි වන මෙන් කාරුණිකව ආරාධනා කර සිටිනවා.

**02(2)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 2026.08.07 දින වීර පුරන්අප්පු ගුණානුස්මරණ වැඩසටහන පැවැත්වීමට නියමිත බැවින් 2026.08.07 දින පෙ.ව.10.30 පැවැත්වීමට නියමිතව තිබූ ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව එදින ප.ව.1.00 ට පැවැත්වීමට කටයුතු යොදා ඇති බව ගරු සභාවට දන්වා සිටිනවා.

**02(3)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/07/10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි වූ බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එච්.කේ.ෂර්මන් පිලීසියන් ප්‍රනාන්දු මහතා 2026/07/22 දිනැති ලිපිය මගින්

දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(4)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/07/13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට හා 2026/07/14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස ගරු නියෝජ්‍ය නගරාධිපති ඩබ්.පී.ප්‍රභාෂනී වික්‍රමසිංහ මහත්මිය 2026/07/13 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(5)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/07/14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී එස්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා 2026/07/14 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(6)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 2026/07/15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී යූ.අනුරසිරි ජයලාල් ස සිල්වා මහතා 2026/07/14 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(7)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/07/16 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී සිත්ති මසීනා බක්කර් මහත්මිය 2026/07/16 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

**02(8)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වයක් හේතුවෙන් 2026/07/15 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි විය නොහැකි වූ බැවින් නිවාඩු ලබා දෙන ලෙස මහා නගර සභා මන්ත්‍රී ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා 2026/08/03 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බැවින් 2014/11/20 දිනැති අංක 1889/32 දරණ ගැසට් පත්‍රයේ මහා නගර සභාවල

සභිකයින් සඳහා දීමනා ගෙවීමට අදාල නියෝග මාලාවේ අංක 03 යටතේ එදින කමිටු රැස්වීමට සහභාගි නොවීම සම්බන්ධව සභාවේ අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කරනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ලුනාව කලපුව මංතීරුව වගේම වීරපුරන්අප්පු රථගාල ඉහළ මාලයේ තිබෙන ළමා උද්‍යානය ඒ වගේම කටුබැද්ද ඇවිදින මංතීරුව යන මේ ස්ථාන 3ම විශේෂයෙන්ම විවිධ පුද්ගලයන් පැමිණෙන ස්ථාන ඒ සිරි නරඹන්න, ඒ වගේම ශාරීරික ව්‍යායාම සිදුකරන්න. නමුත් මෑතක සිට ඉතාම අශෝභන ලෙස හැසිරෙන කාණ්ඩායම් කිහිපයක් මේ ස්ථාන 3ම සිටිනවා. මම හිතන්නේ මේක නතර වෙලා තිබිලා දැන් නැවත සිදුවෙනවා. මොකද මේ ස්ථානයේ අපි ඇවිදින්න ගියාම අපිට තේරෙනවා ඒ ස්ථානයට සුදුසු නොවන විදිහට තමයි ඒ පිරිස් හැසිරෙන්නේ. ආරක්ෂක නිලධාරින්ගෙන් ඒ පිළිබඳව විමසුවම ඔවුන් ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් කියන්නේ නැහැ. යම් කිසි සම්බන්ධතාවයකින් කතා කරලා මේක නතර කරලා තිබුනේ. දැන් නැවත මෙය සිදුවෙන බව අපිට දැනගන්න ලැබුනා. විශේෂයෙන්ම ලුනාව ඇවිදින මංතීරුවේ සහ වීරපුරන් අප්පු රථගාල ඉහල මාලයේ තිබෙන ළමා උද්‍යානයේ. තරුණ ජෝඩු, පාසල් යන ළමුන් තමයි මේ තැන් වල මේ විදිහට හැසිරෙන්නේ ඒ නිසා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(2)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද ඇවිදින මංතීරුවේ එන්ට්‍රන්ස් දෙකක් තියෙනවා. අපිට උවමනා කරන ස්ථාන වල අපි භාණ්ඩ ගබඩා කරලා තියෙනවා. ඒ ස්ථාන වලට ඉන්නේ සේවකයින් දෙදෙනයි. ඒ ස්ථානයේ එක සේවකයෙක් හිටියොත්, එක පැත්තකට එක සේවකයෙක් අවොත් අනිත් පැත්තට සේවකයෙක් නැහැ. අඩුම ගානේ සේවකයින් 3ක් වත් ඒ ස්ථානයට යොදවන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(3)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, රාවතාවත්ත පොදු සුසාන භූමිය ඇතුළු මොරටුව මහා නගර සභාවට අයත් සුසාන භූමි වල මිනි වළවල් කැපීම සඳහා සිටින අපේ සේවකයින් සේවක මහතුන් කිහිපදෙනෙක් විශ්‍රාම ගිහින් තිබෙනවා. තව සේවක මහතුන් කිහිපදෙනයි සිටින්නේ ලබන අවුරුද්ද වන විට තවත් සේවකයන් දෙදෙනෙක් විශ්‍රාම යනවා. අපි මැන් පවර් සේවකයන් ඒ ස්ථානවලට යොමු කරත් ඒ අය ඒ කාර්යය නිසියාකාරව ඉටු කරන්නේ නැහැ විශේෂයෙන්ම පසුගිය සතියේදී දරුවෙක් කෝච්චියකට යටවෙලා මුළු සිද්ධිය ඔබතුමා දන්නවා ඒ සඳහා ඔබතුමා මැදිහත් වෙලා මිනිවල කපන්න ලොකු උත්සාහයක් දැරුවා ඒ අවස්ථාවේදී මැන් පවර් සේවකයන් දෙදෙනෙක් ආවත් ඔවුන් ඒ වැඩේ කරන්නේ නැතුව එක මගහැරලා ගියා ඒ ස්ථානයේ ඔවුන්ට ඒක කරන්න බැහැ කියලා අපි මේ සම්බන්ධයෙන් සොයා බැලුවාම ඔවුන් කියන්නේ අඩුම තරමේ ආදේශක පත්වීමක් හෝ තිබෙන කිහිපදෙනෙක් යොදවලා මේ වැඩේ කරන්න කියලා. මොකද ආදේශක පත්වීමක් තියෙනවා නම් ඔවුන්ගේ පැමිණීම අනිවාර්යය වෙනවා මොකද ඔවුන් දන්නවා ඔවුන්ගේ පැමිණීමෙන් ඔවුන්ට ස්ථිර පත්වීමක් ලබාගන්න පුළුවන් කියලා මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා

**03(4)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ප්‍රදේශයේ තිබෙන පොදු පහසුකම්වලින් එකක් තමයි ප්‍රවාහන පහසුකම මේ ප්‍රවාහන පහසුකම විශේෂයෙන්ම සතියේ දිනවල හොඳින් තිබුණත් ඉරිදා සහ විශේෂයෙන්ම පෝය දිනයේදී මුළු මොරටුවේම ප්‍රවාහන පහසුකම් ඉතා මන්දගාමී තත්ත්වයක පවතින බව තමයි පෙනෙන්නේ ඉදිබැද්ද ප්‍රදේශය ගත්තොත් උදේ වරුවට බස් රථ දෙකක් තිබුනොත් හවස් වරුවට එකම එක බස් රථයක්වත් නැහැ බොහොම අහම්බයකින් තමයි බස් රථයක් තියෙන්නේ මේ තත්ත්වය තමයි මුළු මොරටුවේම තියෙන්නේ මේ සම්බන්ධයෙන් මුළු මහත් මොරටුවේ ජනතාවම කනස්සල්ලට පත්වෙලා සිටිනවා අපි පෙර කාලවල දැක්කා පහුගිය රජයන් ක්‍රියාත්මක කළ බහුවිධ සංවර්ධන මධ්‍යස්ථාන පොදුවේ හදාගෙන මුළු මොරටුවෙන් ලංකාව පුරාම බස් රථ හදාගෙන ව්‍යාපෘතියක් කරන්නට යනවා ඊට පෙර ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කියලා ඉල්ලා සිටිනවා ප්‍රවාහන ඇමතිතුමා සමග සාකච්ඡා කරලා මොරටුවේ ජනතාවට තිබෙන මේ පොදු ප්‍රවාහන පහසුකම විශේෂයෙන්ම පෞද්ගලික බස් රථ එන්නේ නෑ මොකද ඔවුන් දන්නවා හවස් වරුවට ඉරිදා දිනයේදී සහ පොහොය දිනයේදී ලොකු පිරිසක් එන්නේ නැති නිසා ඔවුන්ට ආදායමක් නැහැ නමුත් ළඟම බස් රථ සේවාව අපිට ලබා ගන්නට පුළුවන් එම නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(5)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දන්නවා හිටපු සහ වත්මන් මන්ත්‍රීවරු කිහිප දෙනෙකු අධිභාරය සඳහා කැඳවල තිබෙනවා නියෝග වගයක් අපිට ඒ අධිභාර කමිටුවෙන් ඔබතුමා ඇතුළුව අපි මන්ත්‍රීවරුන්ට ලියුමක් යවලා තිබෙනවා අපි ළඟ තිබෙන තොරතුරු ලබාදෙන්නට කියලා. අවස්ථා කිහිපයකදීම අපි නිලධාරීන් සමග සාකච්ඡා කරා දැන් මේ කමිටුව සූදානම් වෙලා තියෙනවා අපෙන් ඒ සඳහා අපි ළඟ තිබෙන ලිපි ලේඛන උන්ට ලබා දෙන්න කියලා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා විශේෂයෙන්ම මේ සතිය අඟහරුවාදාත් ඊළඟ අඟහරුවාදා සවස් භාගය වෙද්දිවත් මේ පිළිබඳව අපිව දැනුවත් කරලා මොකද සවස තුනෙන් පසුව ගත්තොත් හොඳයි අපේ නීතිඥ මහත්වරුන් කිහිපදෙනෙක් මේ අධිභාරයට යොමු වෙලා තිබෙන නිසා මන්ත්‍රීවරු හැටියට හිටපු අය, ඒ නිසා ඔවුනුත් ඉල්ලීමක් කරා සවස් භාගයේදී මේ නිලධාරීන්ව අපට සම්බන්ධ කරවලා විශේෂයෙන්ම මේ ලිපි ටික යවලා, මේ අධිභාරයට ලක්වෙච්ච මන්ත්‍රීවරුන්ට ඒ සඳහා නිර්දේශ දීපු නිලධාරීන් නිදහස් වෙලා තිබෙනවා. මම ළඟ තිබෙනවා එම ලිපි ලේඛන ඉදිරිපත් කරන්න. හිටපු ආණ්ඩුකාරතුමා අපිට එම ඉන්ධන දීමනාව ලබා ගන්න සුදුසුයි කියලා එවපු ලියුම එතකොට එම නියෝගය පරිදි තමයි මෙම දීමනාව අපි ලබා ගත්තේ ඉතින් අනිත් පැත්තෙන් පෞද්ගලිකව මට එවලා තියෙනවා ලිපියක් ඔබතුමා දන්නවා ඔබතුමා මන්ත්‍රීවරයෙක් හැටියට මෙම මුදල ගෙව්වා. තවත් මන්ත්‍රීවරු ගෙවපු අය ඉන්නවා. විශේෂයෙන්ම මොරිස් විජේරත්න මැතිතුමා පළාත් සභා මන්ත්‍රීවරයෙක් ලෙස ඉන්න කාලේ එතුමාගේ මුදල් කපලා මෙහෙට එවලා තියෙනවා. ඒ වගේම අපේ හිටපු නියෝජ්‍ය නගරාධිපති ධම්මික චන්ද්‍රනාත් මන්ත්‍රීතුමා විශ්‍රාම යද්දි ඒ මුදල එකෙන් කැපුවා. දැන් මට ලිපියක් ලැබිලා තියෙනවා මම මේ මුදල ගෙවලා ඉවරයි කියලා හිටපු නාගරික කොමසාරිස්තුමිය එස්.කේ. ජයසුන්දර මහත්මිය මට ස්තුති කරලා ලිපියක් එවලා තියෙනවා. ඉතින් මේක උභතෝටික ප්‍රශ්නයක් මේ ප්‍රශ්නය නිරාකරණය කරගන්නට ඔබතුමා ඒ කමිටුවත් එක්ක ලබන අඟහරුවාදා වෙද්දි අපිව මුණගස්වලා, කොමසාරිස්තුමියත් ඒ අදාල නිලධාරීනුත් සම්බන්ධ කරලා. ඒ කමිටුවත් සමඟ අපිට සාකච්ඡාවක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අද රස්නේ දවසක් නොවුනත් මේ දවස් වල හරි රස්නෙයි. ඒ නිසා වතුර බෝතලයක් තිබුනනම් හොඳයි වතුර වීදුරුවක් තියනවට වඩා. එකට අපහසුතාවයක් තියෙනවනම් අපේ වැටුපෙන් හරි කමක් නැහැ කපාගෙන වතුර බෝතලයක් අපිට ලබා දෙන්න කියලා ඉල්ලනවා.

03(6) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ සභාව පසුගිය කාල සීමාව පුරාම පවත්වාගෙන යාමේදී සැහීමකට පත්වෙන්නට පුළුවන් සභාවක් ලෙස නෙමෙයි අපි දැක්කේ. මේ සභාවට අපි සහභාගී වෙන්නේ ඉතිහාසයේ කවදාවත් මන්ත්‍රීවරු 52ක් හිටියේ නැහැ. ප්‍රථම වතාවට 52ක් මන්ත්‍රීවරු නියෝජනය කරන සභාවක් දැන් තියෙන්නේ. හැබැයි මේ කලින් සභා වල මේ කරුනු, කාරණා වලට රාත්‍රිය වෙනකන් මේ සභාව ඇදගෙන ගියා. අපි මාසයකට එක දවසයි සභාව නියෝජනය කරන්නේ ජනතාව වෙනුවෙන්, අපි මේ සභාව තුළ තමයි හැම අදහසක්ම ඉදිරිපත් කරන්නට ඕන විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු ඉතාමත්ම වැදගත් කලෝචිත මහජනතාවගේ අදහස් මේ සභාව තුළ දන්වා සිටිනවා. ආණ්ඩු පක්ෂයේ අය ඒ අවස්ථාව නොගත්තත් ඔවුනුත් මේ අවස්ථාව ලබා ගත යුතුයි හැමදාම මේ විදිහට කතා නොකර ඉන්නේ නැතුව. ඉතින් මම කියන්නේ මේ සභාවේ අපි නියමිත වේලාවක් අනුව කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා. විශේෂයෙන්ම පහුගිය සභාවෙදී අපි දැක්කා ගණකාධිකාරිතුමියගේ ස්ථාන මාරුවීම සමඟ උත්සවයක් ලැස්ති කරලා තිබුනා. එවා කරන්න ඕන ඒ සම්බන්ධයෙන් අපේ කිසිම තර්කයක් නැහැ. නමුත් සභාව තියෙන දිනයේ පැවැත්වීම තමයි අපේ කණගාටුව තිබෙන්නේ. මේ සභාව පවත්වන දවස සභාව වෙනුවෙන් සම්පූර්ණයෙන්ම වෙන්කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම සභාව පටන්ගත්ත වෙලාවේ ඉඳලා එක, දෙක, තුන, හතර වෙනකන් සමහරක් නිලධාරින් මන්ත්‍රීවරුන් වෙන වෙන ලෙඩ තියෙන අය මෙතන ඉන්නවා. වෙලාවට කන්න ඕන අය මෙතන ඉන්නවා. හැබැයි සමහරක් වෙලාවට නිරහාරවම ඔවුන් මෙතන ඉන්නවා 4 විතර වෙනකන්. ඒ නිසා මේ සභාව පටන් ගැන්මේ ඉඳලා අපි ඉල්ලීමක් කරනවා 1.00ට නවත්තලා පැය භාගයක් දිවා ආහාරය ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. ඊට පස්සේ සභාව හවස් වෙනකන් පවත්වාගනෙ යනවනම් වෙන මුකුත් ඔනේ නැහැ තේ එකක් ලබා දීමට කටයුතු කරන්න තේ නැතත් මේ දවස අපිට වෙන්කර දෙන්න මේ සභාව දිගටම කරගෙන යන්න. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව පසුගිය සභා රැස්වීම රාත්‍රී 10 වෙනකන් පවත්වලා තියෙනවා. අපි නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා නිලධාරින්ටත් අතිකාල දීලා නිලධාරින්ටත් එක දවසක් ඒ වෙනුවෙන් කැපවෙන්න කියලා. මේ සභාව හැමදාම එහෙම වෙන එකක් නැහැ අවුරුද්දකට එකක් හෝ දෙකක් හරි මේ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(7) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද ප්‍රජාශාලාවේ මේ වන විට ප්‍රශ්නයක් පැනනැගිලා තියෙනවා. එය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය යටතට ගිහිල්ලා තියෙනවා කියලා ආරංචියක් තියෙනවා. එක ඇත්තක්ද.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එහෙම දෙයක් වෙලා නැහැ. එක බොරුවක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, හේතුව මීට අවුරුදු 40කට ඉස්සරත් අපි ඔතන තමයි සෙල්ලම් කරේ. මේක නගර සභාවට අයිති භූමියක්. එක අපි සතුව තියෙන්නට ඕන. ජනතාවට මට මේ ගැන කියන්න පුළුවන්.

**03(8)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මැක්සි මන්ත්‍රීතුමා සඳහන් කරා දරුවෙකු කොච්චියට පැනලා මිය යාම සම්බන්ධ සිද්ධියක්. මේක මේ සභාවට අපි නියෝජනය කරන කොට්ඨාශයක දරුවෙක් මෙහෙම වෙලා තියෙනවා කියන්නේ එය ඉතා කණගාටුදායක තත්ත්වයක්. අපිට ආරංචි වුනා ඔබතුමා මැදිහත් වෙලා ඒ මරණ කටයුතු සිදුකරා කියලා. මේ තත්ත්වය ඉදිරියේදී තවත් වැඩි වෙන්න පුළුවන්. ඒ නිසා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අද ඉන්නවා විවිධ නිලධාරීන්, තමුන් නියෝජනය කරන කොට්ඨාශය තුළ හැඳින ගැනීමක් තියෙන්නට ඕන මේ පුද්ගලයින් කවුද කියන එක. ඒ දරුවන් පිළිබඳ හැඳින ගැනීමක් තිබෙන්නට ඕන. අදාල කාර්යාල වලට වෙලා වඩිවෙලා ඉන්න එක නෙමෙයි මේ අයගේ වගකීම වෙන්න ඕන. ග්‍රාමසේවක මේ සම්බන්ධව දැනගෙන ඉන්න ඕන. අද තරුණ නිලධාරින් පිරිසක් පත්කරලා ඒ අය පොතේ හැටියට තමයි අද රාජකාරී වල නියැලෙන්නේ. ඒ නිසා මෙවැනි තත්ත්වයන් ඇති නොවෙන්න. සංවර්ධන කමිටුව තමුන්නාන්සේලා නියෝජනය කරනවා. මේ සංවර්ධන කමිටුවට මේ අදහස ගෙනිහිල්ලා මේ වගේ තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවෙන්න ක්‍රමවත් වැඩපිළිවෙලක් යොදන්න කියන ඒ ඉල්ලිම කරනවා.

**03(9)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම දැක්කා ඔබතුමා අපෙන් ඉල්ලීමක් කරනවා අයවැය යෝජනා ලබා දෙන්න කියලා. මම අහන්න කැමති මොකටද කියලා අපි ඔබතුමන්ලාට අයවැය යෝජනා ලබා දෙන්නේ කියලා. පහුගිය කාලයේ අපි සංවර්ධන යෝජනා ලබා දුන්නා නමුත් එක යෝජනාවක්වත් ක්‍රියාත්මක කරන්න අපිට මුදල් වෙන් කිරීමක් කරලා දුන්නේ නැහැ. ඒ නිසා මම හිතනවා අපි විපක්ෂ මන්ත්‍රී කණ්ඩායම එක අපිට අවංකවම ලබා දෙනවා කියලා විතරක් කියනවනම් අපිට යෝජනා ලබා දෙන්න පුළුවන්. එහෙම නැතුව මම හිතන්නේ නැහැ විපක්ෂයේ අපේ කණ්ඩායම අපෙන් ඉල්ලන යෝජනා වලට ප්‍රතිචාරයක් දක්වන්න ඕන කියන හැඟිමක් අපිට නැහැ. ඒ වගේම සඳහන් කරන්න ඕන මාධ්‍යජාල ක්‍රියාකාරිකයෙකු හැටියට ජගත් පනාගොඩ මහතා මොරටුවේ දීර්ඝකාලයක් මාධ්‍යවේදීයෙකු විදිහට පුරෝගාමියා නමින් වෙබ් සයිට් එකක් පවත්වාගනෙ යනවා. ඒකෙදි ඔහු මොරටුවේ තියෙන ප්‍රශ්න පිළිබඳව කතා කරලා ජනතාවගේ ඇස් අරින පුද්ගලයෙක් එම නිසා එතුමාට මේ සභාව නියෝජනය කරන්න සභාවේ තියෙන දේවල් ස්වාධීනව වාර්තාකරණය කරන්න එතුමා අවස්ථාවක් ඉල්ලලා තියෙනවා මම හිතන්නේ ඔබතුමාගෙනුත් ඒ අවස්ථාව ඉල්ලුවා ඔබතුමා එතුමට දන්වලා තියෙනවා මේ සභාවට දන්වලා ඒ අවස්ථාව ලබා දෙනවා කියලා මම ඉල්ලීමක් කරනවා තමුන්නාන්සේගෙන් මේ සභාවට ඒ සම්බන්ධයෙන් දාන්න අපි අනුමැතිය ලබාදෙන්නම් ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(10)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කමිටු සම්බන්ධයෙන් කතා කළ යුතුයි. තමුන්නාන්සේ පහුගිය දවස්වල කමිටු නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට දීමනා ලබාදීම සම්බන්ධව මම එකඟ වෙනවා හැබැයි ඒක නීතිය නෙමෙයි නගරාධිපතිතුමා දෙහිවල ගල්කිස්සේ මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ මම

එහෙයින් අපේ මන්ත්‍රීතුමෙක් ගෙන් අහල බැලුවහම එයා ඒක කමිටුවකටවත් යන්නේ නැහැ නමුත් දීමනාව ලබා ගන්නවා කොළඹත් එහෙමයි. මන් අහලා බැලුවා එහෙනුත් මේක ආණ්ඩුකාරවරයා දුන්නා කියල එහෙනම් පොදුවේ හැම කෙනාටම බලපාන්න ඕනේ අපේ මන්ත්‍රීවරියක්ට පහුගිය මාසේ ඒ දීමනාව ලැබුණේ නැහැ කියලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඒ සඳහා ඉල්ලා සිටිනවා. හැබැයි මම පැහැදිලි කරන්න ඕනේ මේකෙන් මන්ත්‍රීවරුන්ට කමිටු මගහරින්න බැහැ මන්ත්‍රීවරු අනිවාර්යෙන්ම කමිටු නියෝජනය කරන්න ඕනේ. නමුත් මේක නීතිය නෙමෙයි කියලා අවධාරණය කරනවා.

**03(11)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, ඉතාම සංවේදී ජනක පුවතක් මට දැනුම් දෙන්නට තිබෙනවා. අපේ මැන් පවර් සේවක මහතෙක් වන ඩබ්.පී. සමන්ත යන අය අපි කවුරුත් දන්න රංජිත් රියදුරු මහතාගේ සහ සඳුන් රියදුරු මහතාගේ බාල සහෝදරයා ඊයේ දිනයේදී අභාවප්‍රාප්ත වෙනවා. එතුමා අපේ පාක් එක උඩ වාඩිවෙලා ඉන්න වෙලාවක වැටිලා තියෙනවා නින්ද ගිහිල්ලා. ඊට පසුව රෝහල් ගතකරලා තිබෙනවා. පසුව කොළඹ ජාතික රෝහල වෙත මාරු කර යවලා තියෙනවා. දින 3ක් පමණ කාලයක් දැඩිසත්කාර එකකයේ ප්‍රතිකාර ලබමින් හිටියා. ඉතින් අපිත් සමඟ මාස කිහිපයක් මැන්පවර් සේවකයෙක් ලෙස රාජකාරි සිදුකරා. එතුමා තරුණ දරුවෙක් තවම විවහා වෙලත් නැහැ ඉතින් අපේ සභාවේ ශෝකය මේ වෙලාවේ පළ කර යුතුයි එතුමාගේ වියෝව වෙනුවෙන්. ඔබතුමාගේ ඇතුළු සමස්ත සභාවේම ශෝකය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

**03(12)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, වසර ගණනාවක් මේ සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට නැවත යම් කාල සීමාවක් නිහඬව ඉඳලා ගිය මාසේ 7 වන දින නැවත මේ සභාවට පය තිබ්බා. නමුත් මට කණගාටුයි පෞද්ගලිකව මම ගැනම කතා කරන්න වෙච්ච එක ගැන. මම පොඩ්ඩක් අහන්න කැමති මගේ ස්ථානය මෙතනද කියන එක දැන් මාසයක් ගත වුණා. තවම මට හැගෙන්නේ මගේ ස්ථානය හරියට ස්ථාන ගත කරලා නැහැ කියලා. මම හිතනවා මෙය හැකි ඉක්මනින් නිවැරදි කරයි කියලා.

**03(13)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, මා මේ සභාවට පත්වෙලා එන්න මාස 3කට පෙර ඔබතුමාට දෙවන පටුමග, කඩලාන, එම්.ජේ.සී. ප්‍රනාන්දු මාවතේ ලිපියක් යොමු කරලා තියෙනවා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අත්සන් කරලා කාණුවක් සම්බන්ධව මේ ගඟට වතුර බසින කාණුවට වතුර එන්නේ සර්වෝදය පැත්තේ ඉඳගෙන මම හිතන්නේ මම මේ සභාව නියෝජනය කරන කාලයේ පවුල් තුන්හාරසීයක් විතර අත්සන් කරලා මට ලිපියක් ගෙනල්ලා දුන්නා. එතකොට එකේ ප්‍රතිඵලයක් වශයෙන් එවකට මීටත් පෙර වසර ගණනාවකට විසඳ ගන්න බැරි ප්‍රශ්නයක් එවක තිබුණ වාතාවරණය අනුව ආපු තර්ජන ගර්ජන පසෙකලා මේ ප්‍රශ්නය මම විසදුවා නමුත් අද කියන්න කැමති ඒ ප්‍රශ්නය ඉස්මතු වෙලා තියෙන නිසා තමයි දැනට මාස කිහිපයකට පෙර ඔබතුමාට මේ ලිපිය ගෙනත් දීලා තියෙන්නේ ඒ ලිපියේ කොපියක් මට දුන්නා අද ඒ අය. ඒ වැඩේ වුනේ නැහැ කියලා. මේ ගඟට වතුර බසින ස්ථානය සුද්ධ පවිත්‍ර කරන්නත්, ඊට පස්සේ අපේ ග්‍රවුන්ඩ් එක තියෙනවා එක හැදුවට පස්සේ තවම එකේ පස් ටිකවත් අපි අරන් දාලා නැහැ. මොකද එකේ ප්‍රමිතිය බලන්න ඕන නිසා තමයි මමත් ඒ කාලේ මේක වැඩිය සුද්ධ කරේ නැත්තේ. නමුත් 2008 ඉඳන් මම විශ්වාස කරනවා තවම ඒ ප්‍රශ්නයට කිසිම පිළියමක් කිසිම කෙනෙකුගෙන් ලැබුනේ නැහැ කියන එක. ඉතින් එක නිසා මම කියනවා මේ ප්‍රශ්නය කල්

දාන්න එපා. මොකද ඉදිබැද්ද, විල්ලෝරාවත්ත ඔය අවට ප්‍රදේශ වල ළමයි පාසල් යන්න එන්නෙත් මේ ඩික්සන් ජේ. පීරිස් ක්‍රිඩාංගනය ඉස්සරහ තියෙන පාරෙන් එතකොට එතන වතුර තියෙන තැනක්. ඉතින් මේවා සුද්ධ පවිත්‍ර කිරීම් හරියට කරනවනම් ඒ වතුර බැස්ම නිසි ආකාරව කෙරෙනවා. ඉතින් එක නිසා මම හිතනවා ඔබතුමාලාගේ පාලන කාලයේ ඉන්න අනවශ්‍ය පුද්ගලයෝ දේවල් කිවුවත් එවා ගණන් නොගෙන අත්‍යාවශය කාරණය මොකද්ද කියලා බලලා කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**03(14)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ සේවකයින් පිළිබඳ මම මේ සභාවේ කවදාවත් කතා කරලා නැහැ තීන්දු ක්‍රියාමාර්ග ගන්නවා මිසක්. නමුත් අංක 1508 දරණ අනුර ශාන්ත මහත්මයා සංචිතයේ රියදුරෙක් එතුමා වසර 7කට වැඩි කාලයක් මෙහි සේවය කරලා තියෙනවා. දැන් කොහොම හරි එතුමාගේ සේවය නවත්තලා තියෙනවා. මම දන්නේ නැහැ මෙය දේශපාලන හේතුවක්ද මොකද්ද කියන එක මම අනුර මහත්මයා ගැන සෑහෙන්න කාලයක සිට දන්න කෙනෙක්, එතුමා බොහෝම නිහතමානී පුද්ගලයෙක්, එතුමා එතුමාගේ කාර්යභාර්ය අවංකව ඉටු කරන පුද්ගලයෙක් කියලත් මම දන්නවා. එම නිසා මේ සම්බන්ධව හොයලා බලලා ඒ රියදුරු මහත්මයාට යම්කිසි සහනයක් සලසා දෙයි කියලා මම විශ්වාස කරනවා.

**03(15)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අද දින පත්තර වල ඔබතුමාලාගේ රජයෙන් දාලා තියෙනවා වැව් අමුණු ගණනාවක් පිළිසකර කරන්න යෝජනා කරලා තියෙනවා කියලා. ඒ එක්කම මගේ ප්‍රදේශයෙත් තියෙනවා කාන්තා සංවිධානයක් සමුපාකාර කාන්තා සංවිධානය කියලා. එකේ මම හිතන්නේ අත්සන් 100කට වැඩි ගණනක් අත්සන් කරලා තියෙනවා අපේ ප්‍රදේශයේ තියෙනවා හොඳ ගඟක් ඒ ගඟ ඇත්තම කියනවනම් මේ වන විට විනාශ වෙලා තියෙන්නේ. මේක පවිත්‍ර කරොත් විශාල ලෙස ප්‍රයෝජනයට ගන්න පුළුවන් අනිත් එක යම් යම් නියඟ කාලයක් එන්නත් පුළුවන් එතකොට මිනිසස්සු විශාල ලෙස අපහසුතාවයට පත්වෙනවා. මම හිතන්නේ මේක කාලෝචිත ප්‍රශ්නයක් මේක ඔබතුමන්ලාගේ රජයට යෝජනා කරලා, මේ සඳහා අවශ්‍ය කටයුතු සකසා දෙන්න කියන ඉල්ලීම සිදුකරනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, සභාවෙන් ඉල්ලා සිටින්නේ විපක්ෂ නායකතුමාගේ පැත්තෙන් මතු කලා සම්පූර්ණ කාලය ඊ 10ය වුනත් කමක් නැහැ සභාව පවත්වාගෙන යන්න කියන එක. මම එකඟයි එකට. හැබැයි අපි පෙත්සම් පැමිණිලි අයිතමය හැම විටම අතුරු ව්‍යවස්ථානුකූලව පැහැදිලි කරන්නේ සංක්ෂිප්ත වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න. ඉතින් ඒ අවස්ථාව හැමෝටම තියෙනවා. එම නිසා මම නැවත නැවත ඉල්ලීම කරන්නේ අපි අපේ ප්‍රශ්නය සංක්ෂිප්තව අරගෙන ඒ ටික ඉදිරිපත් කරමු.

**03(16)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ සුදේශ් මන්ත්‍රීතුමා කිවුවා අපේ සේවක මහත්මයෙක්ගේ අභාවය පිළිබඳ ඇත්තටම ඒ සිද්ධිය වෙච්ච තැන අපේ ගිලන්රථය තියෙනවා. අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ එක හදලා නැහැ. එක හදලා තිබුණනම් 1990ට කතා කරලා එක එනකන් බලන් ඉන්න ඕන නැහැ. සමහරක විට අපේ ගිලන්රථය තිබුණානම් අපිට ඒ සේවක මහතාව ගොඩගන්න පුළුවන් වෙන්න තිබුණා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා මේ ගිලන්රථය සකසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මෙතුමා කියන කාරණාවේ පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕන. ඒ සේවකයා වැටිච්ච එක සම්බන්දයෙන් කිසි කෙනෙක් දන්නේ නැහැ. එ සේවක මහත්මයා වැටුනට පස්සේ එයාට ඒ වෙලාවේ අමාරුවක් දැනිලා නැහැ, එයාගේ අයියා තමයි ඇවිල්ලා එයාගේ බයික් එකේ නැගලා තමයි එයා යන්නේ. ඇන්බියුලන්ස් ප්‍රශ්නයක් ඒ වෙලාවේ තිබුනේ නැහැ. ගියාට පස්සේ රෑ තමයි මෙයාට අමාරු වෙලා තියෙන්නේ, මෙයා රෝහලට නොගිහින් ගෙදර තමයි ගිහින් තියෙන්නේ එතන ප්‍රශ්නයකුත් තියෙනවා. මේක සභාවේ ප්‍රශ්නයක් නෙමෙයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මගේ දැනුවත් වීමේ හැටියට මම කියන්නේ මේ ඇන්බියුලන්ස් එක කැඩිලා අවුරුද්දක් විතර වෙනවා මේක හදලා තියෙන එක හොඳයි කියලා මම කියන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ. ඞී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, එක හදලා තියෙන්නේ.

**03(17)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, පසුගිය දින මොරටුවේ විශාල පෙරහැරක් තිබුණා, එකට ඔබතුමත් සම්බන්ධ වුනා මම ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා එකේ ඇති වුණ ගැටළුව සම්බන්ධව මැදිහත් වෙලා කටයුත කරලා එකට යම් සහනයක් ලබා දෙන්නත් කටයුතු කිරීම සම්බන්ධව. විශාල මුදලක් වැය කරලා මේ පෙරහැර ලස්සනට කරනවා. ශ්‍රීනාත් දන්දෙණිය කියන දේව ගැතිවරයා තමයි මේ පෙරහැර කරන්නේ. මේකේ ස්පිකර් දාලා තිබුණා ඒ පෙරහැර යන මාර්ගයේ. අපි දකිනවා වෙනත් අවස්ථාවන් වලදී මේවා විසන්ධි කරන්නේ නැහැ. එතනටම ඇවිල්ලා ඒ එස් පී මහත්මයා එක විසන්ධි කරලා තිබුණා. ඒ එස් පී මහත්මයා යම් යම් තැන් වලදී නීතිය නවලා කරනවා කියලා මට කියන්න පුළුවන්, එතුමා ඒක අපිට විතරක් එහෙම කරන එක අසාධාරණයි. එම නිසා අපගේ විවේඡනය අපි ඉදිරිපත් කරනවා ඒ එස් පී මහත්මයා සම්බන්ධයෙන්.

**03(18)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ප්‍රියනාත් මන්ත්‍රීතුමාගේ පත්වීම අපිට වටිනවා ගොඩක් මමත් හිතනවා එතුමාගේ අසුන ඔතනට වඩා වෙනස් වෙන්න ඕන කියන එක. එම නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. එතුමා වැඩි කලක් සභාව නියෝජනය කරා ඔහු සමහර අවස්ථාවන් වල ඛණ්ඩ වුන අවස්ථාවන් තියෙනවා. සමහර අයට පස්සේ හරි තැනක් තියෙනවනම් ඔහුව එතනින් තියන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඞී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනී, මෙතුමා මන් දන්න බොහෝම සමීප මන්ත්‍රීවරයෙක් එක පිළිගන්නවා. අදාළ නීතිය ඇතුලේ අඛණ්ඩතාවය බිඳ වැටීම කියන ප්‍රශ්නය තියෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු අත්සන් කරලා ස්ථානයක් නම් කරලා දෙන්න මම ඒ ස්ථානයට එකඟයි.

**03(19)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, මොරටුව මහා නගර සභාවේ සම්ප්‍රදායක් තියෙනවා ආසන පැනවීම සම්බන්ධයෙන්, මම උදාහරණයක් කියන්නම් සුරේෂ් මන්ත්‍රීතුමා අපිට ඉස්සර තමයි මේ සභාවට ආවේ. ඔබතුමාලා සමකාලීනයෝනේ, එතකොට අපිට මතකයි අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නකොට සුරේෂ් මන්ත්‍රීතුමා පත්වුනාම ඒ අඛණ්ඩතාවය තියෙන මන්ත්‍රීවරුන්ට පස්සේ වාඩිවුනේ සුරේෂ්

මන්ත්‍රීතුමා ඒ කියන්නේ හැමදාම වුනේ එහෙමයි. බණ්ඩව සභාවේ ඉන්න කට්ටියට පස්සේ ඒ ජොෂ්යත්වය තියෙන මන්ත්‍රීවරයා වාඩි වෙන්නේ. පොඩි ගැටළුවක් තියෙනවා අවුරුද්දකට පස්සේ ආපු එක. ඒක නිසා අපිට ලේකම් අංශයට දෝෂාරෝපණය කරන්න බැහැ මේ ආසන පැනවීම සම්බන්ධව මොකද අවුරුද්දකට පස්සේනේ ඉන්නේ. ප්‍රියනාත් මන්ත්‍රීතුමත් උභතෝටික ප්‍රශ්නයක් පැන නඟිනවා. එ නිසා අපි විපක්ෂයක් හැටියට ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපේ ඒ අඛණ්ඩතාවය තියෙන මන්ත්‍රීවරුන්ට පස්සේ ඒ ජොෂ්ය මන්ත්‍රීතුමාගේ ආසනය පනවන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, තාරක මහත්මයා දන්නවා එතුමා ලේකම් වෙලා ඉන්න කාලයේ නිමල් යසසිරි මන්ත්‍රීතුමාගේ හදිසි පත්වීමක් ආවා එදා කොහොම හරි ශීට් එක ලැයිස්ති කරලා නැහැ නගරාධිපතිතුමත් එ දවස්වල පොඩ්ඩක් මන්දගාමීව හිටියේ. පස්සේ මම තාරක මහත්මයාට ඇවිල්ලා කතා කරලා මම ක්ෂණිකව ඒ සුදුසු තැන එතුමා හරහා ලැයිස්ති කරලා දුන්නා. මේකට විපක්ෂයෙන් ලියුම් අවශ්‍ය නැහැ. මේ ගැන හොයලා බලලා කටයුතු කිරීමේ අයිතිය ඔබතුමාට තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාගේ අයිතිය තව කාටවත් දෙන්න එපා, ඔබතුමාගේ අයිතිය ඔබතුමා අරගන්න සභාවේ ගෞරවය අරක්ෂා කරන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එක තමයි සභාවේ සම්ප්‍රදායන් තියෙනවා ඒ වගේම නීතිමය තත්ත්වයන් තියෙනවා ඔය දෙකම පිළිපැදගෙන ආරක්ෂා කරගෙන යන්න ඕනනේ. නීතිමය පැත්ත අපිට අභිබවා යන්න බැහැ හැබැයි අපිට පුළුවන් එකඟතාවයන් හදා ගන්න සම්ප්‍රදාය තුල ඒ නිසා තමයි මට කිසි බාධාවන් නැහැ අවශය විදිහට ඔබ නම් කරලා ඉල්ලීමක් ඉදිරිපත් කරාම එකට අවස්ථාව තියෙනවා. එක මේ මහා ලොකු ප්‍රශ්නයක් නෙමෙයි. ප්‍රියනාත් මන්ත්‍රීතුමා දීර්ඝකාලයක් මේ සභාව නියෝජනය කරා කියන්න අපි හැමෝම දන්නවා. අපිට ස්ථාන පිළිබඳ ගැටළුවක් නැහැ. අර නීතිමය පැත්තේ තියෙන බාධාව නිසා එකඟතාවයකින් යමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපි දැන් විපක්ෂය හැටියට පොදුවේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරානේ එතකොට නැවත ඉල්ලීමක් දෙන්න අවශ්‍ය නැහැනේ මොකද අපි සභාවෙනේ මේ ඉල්ලීම කරන්නේ. ඒ නිසා ඊලඟ දවසේ එක සිදුකරලා දෙන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න තවත් විපක්ෂ මන්ත්‍රීවරයෙක්වමනේ පිටිපස්සට දාන්න වෙන්නේ, එතකොට මම කියන්නේ ඔබ මෙන්න මේ එකඟතාවය හරහා කිවුවනම් මේ ස්ථානයට දාන්න කියලා මම හිතනවා එක තමයි හොඳම දේ කියලා. නැත්නම් ඒ දාපු මන්ත්‍රීවරයා අයේ ප්‍රශ්නයක් හදනවා.

03(20) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම මේ සම්බන්ධයෙන් අපේ ලේකම්වරයා සමග කතා කළා එතකොට එතුමා අපිට මේකේ නීතිමය තත්ත්වය සම්බන්ධයෙන් පෙන්නලා දුන්නා මහ නගර සභා ආඥා පනතේ මන්ත්‍රී සභිකයෙක් පත්වෙලා ඇවිල්ලා බණ්ඩ වුනාට පස්සේ එතුමා ඉන්න ඕනේ ඒ ස්ථානයේ කියලා අපිට පෙන්වලා දුන්නා. එම නිසා ඒ සම්බන්ධයෙන් අපේ තර්කයක් නැහැ නමුත් පෙර අවුරුදුවල ඒ තත්ත්වය වෙනස් වෙලා තිබුණා නිමල් යසසිරීමන්ත්‍රීතුමා සුරේෂ්

ඉන්දික මන්ත්‍රීතුමා වගේ කට්ටිය මේ ස්ථානය තැබුවා. නීතිමය ප්‍රශ්නයක් ඇති මේ සම්බන්ධයෙන් ඒ සම්බන්ධයෙනුත් හොයලා බලන්න කියලා කියන්න කැමතියි.

03(21) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාවනා හා පෙත්සම් පැමිණිලි යටතේ මම පසුගිය දිනක මතු කරා ලුනාව කලපුවේ ලයිට් පතුවෙන්නෙ නැහැ කියලා. ඒක තාම එහෙමමයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ ලයිට් එක දැන් පත්තුවෙනවා. ඒවා හදල තියෙන්නේ

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම ඊයේ රාත්‍රියේත් ලුනාව කලපුවට ගියා ඒ ලයිට් වැඩ කරේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, විපක්ෂය හැටියට පොදු එකගතාවයක් ප්‍රකාශ කරන්නම් ශිරෝමී මන්ත්‍රීතුමියට එහා පැත්තේ වඳුන් මන්ත්‍රීතුමා ඉන්න ශීට් එක ප්‍රියනාත් මන්ත්‍රීතුමාට ලබා දුන්නනම් හරි කියලා අපි හිතනවා.

03(22) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, එම මාතෘ සායනයේ දොරවල් ඔක්කොම කැඩිලා දොරවල් උස්සලා තියලා තමයි ඒක වහල යන්නේ. නගර සභාවේ වඩුකාර්මිකයෙක් ඉන්නවා ඉතින් ඔහුව යොදවල මේක කරගන්න ඕනේ ගැබිණි මව්වරු ඇවිල්ලා ඒ කැඩිච්ච දොරවල් උස්සලා තියලා තමයි යන්නේ ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(23) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම පසුගිය සභාවේදීත් කතාකරා ප්ලෑනින් සෙක්ෂන් ඒක සම්බන්ධව. සැලසුම් කමිටුව ඉතාමත්ම මන්දගාමී තත්ත්වයක තමයි පවතින්නේ මේ වැඩ කටයුතු ක්‍රියාත්මක වෙන්න ඉතාම මන්දගාමීව. ප්ලෑන් එකක් බාර දුන්නහම සතියක්, එකහමාරක් යනවා එස් ඩබ්ලිව් ගාවට ඒ ෆයිල් එක යන්න. ඊට පස්සේ එස් ඩබ්ලිව්ගෙන් රිපොට් එක ඇවිල්ලා ඒක කමිටුවට යන්න තවත් සතිය එකහමාරක් විතර යනවා. එතැනට තව කාට හරි දාලා හරි කමක් නෑ එතන ඉක්මනින් වැඩ කටයුතු කරන්න අවස්ථාව සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(24) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තමයි අපි ගිය සභාවේදීත් කතා කරපු අර ගොනුව සම්බන්ධව, එම ගොනුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දීපු ලිපිය ගෙනැල්ලා අපි බාර දුන්නා ගිය සතියේ සඳුදා නමුත් මේ පහුගිය බ්‍රහස්පතින්දා තිබුණු කමිටුවටවත් ඒක ඇවිල්ලා තිබුණෙ නැහැ. මෙච්චර කතා කරලත් ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් ක්‍රියාත්මක වෙලා තිබුණෙ නෑ. ඒ හින්දා මේ ගැන සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

03(25) <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ මහ නගර සභාව නියෝජනය කරනවා දැනට හාර්ඩ් බෝල් ටීම් එකක් තියෙනවා. ඔවුන් අති දක්ෂ ලෙස ක්‍රීඩා කරනවා අපේ සුසන්ත මන්ත්‍රීතුමත් ඔවුන්ට සහයෝගය දක්වනවා දැනට සෙල්ලම් කරපු මැච් තුනම දිනලා තියෙනවා. මම ඒ සෙල්ලම් කරන තැනට ගියා ඒ ක්‍රීඩකයන්ට

කන්න කෑම එකක්වත් තිබුණේ නැහැ. අඩුම තරමේ ග්ලූකෝස් පැකට් එකක්වත්, වතුර බෝතලයක්වත් නැහැ ඒ නිසා ඔවුන් සඳහා අවශ්‍ය දේවල් සපයා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඔවුන් අපෙන් කලින් කරන ඉල්ලීම අනුව අපි ඔවුන්ට ඒ මුදල ලබා දෙනවා. අම්පයාස්ලට සහ ආහාර පානවලට.

**03(26)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පහුගිය තිස් වෙනිදා තිබුණා ශ්‍රී ලංකා පාස්ට් ෆේලේයර්ස්ලා ඇවිල්ලා නළු නිළියො ඇවිල්ලා ලොකු තරගයක් තිබුණා ද සොයිසා ක්‍රීඩාංගනයේ, ගොඩාක් ලොකු වියදමක් දරලා තිබුණා. නමුත් ප්‍රචාරණ කටයුතු හරියාකාරව සිදුවෙලා නැහැ මම ඒ උපසභාපතිතුමියගෙන් ඇහුවහම එතුමිය කිව්වේ මේක මොරටුවට ගෙනාවේ ගොඩක් සෙනග පිරෙයි කියලා හිතලා කියලා. නමුත් සිය දෙනෙක්වත් හිටියේ නැහැ. මොකද ප්‍රචාරණ කටයුතු සිදුවෙලාම නැති නිසා මේ කටයුතු හරියට නිසියාකාරව බලලා කරානම් පෝස්ටර් ටිකක් ගැහුවනම් කොච්චර හොඳ දෙයක් කරන්න තිබුණද ඒ නිසා මේ වගේ කටයුතු වලදී ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරලා සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(27)** <u>**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විල්ලෝරාවත්ත දැයට පිපෙන මල් පෙර පාසලේ දෙමාපියන් සහ ගුරුවරුන් එකතුවෙලා ලිපියක් බාර දීලා තිබුණා. දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පෙර පාසල වෙනත් ආරක්ෂිත ස්ථානයකට රැගෙන යාම සම්බන්ධව අවුරුදු ගානක් තිස්සෙම මේ පෙර පාසල තිබුණේ දරුවන්ට ආරක්ෂිත ස්ථානයක නෙමෙයි. එම නිසා දරුවන්ට සුදුසු ස්ථානයකට මෙම පෙරපාසල සකස් කර දීම සම්බන්ධව දෙමාපියන් සහ ගුරුවරුන්ගේ ස්තූතිය පුදකර සිටිනවා. ඉතින් මේ සම්බන්ධව මහන්සි වුණ ඔබතුමාටත් මෙම යෝජනාව සභා සම්මත කළ ජීවන්ත මන්ත්‍රීතුමාටත් මේ සඳහා කැපවුණු අප නිලධාරී මණ්ඩලයටත් දෙමාපියන් වෙනුවෙන් ස්තූතිය පුදකර සිටිනවා. මේ දරුවන්ව ඌරෝ, බල්ලො ගාල් කරන තැනකට ගාල් කරලා තිබුනේ හිතක් පපුවක් නැති පාලකයෝ ටිකක් ඉතින් ඒ නිසා මේ දරුවන් වෙනුවෙන් ආරක්ෂිත ස්ථානයක් ලබාදීම සම්බන්ධයෙන් ඔබ සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා.

**03(28)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාවනා හා පෙත්සම් යටතේ බොහොම කෙටියෙන් ඉල්ලීමක් කියනවා ඉදිරිපත් කරන්න. නැගෙනහිර මොරටුමුල්ල අංක 89/7 ඒ මාර්ගයේ පදිංචිකරුවන් අට දෙනෙක් විතර අත්සන් කරලා ලිපියක් භාර දීලා තිබෙනවා. කුඩා වැස්සකට පවා මේ මාර්ගය යටවෙලා පාසල් යන දරුවන්ට පාසලට යන්නවත් බැරි තත්වයකට පත්වෙනවා කියලා දීලා තියෙනවා මේ මාර්ගය සංවර්ධනය කරපු මාර්ගයක් මේ සංවර්ධනය කිරීමේදී මාර්ගය මැද කොටස බොහොම බෑවුම් ස්ථානයක් බවට පත්වෙලා තියෙනවා. ඒ නිසා වෙන්න ඇති මම හිතන්නේ මේ කොන්ක්‍රීට් කරපු මාර්ගය මැද කොටසේ වතුර පිරෙනවා පොඩි වැස්සකටත් ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(29)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ආයාවන හා පෙත්සන් යටතේ ඔබතුමාට ගමේ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරනවා. හැබැයි අපට මෙන්න මේ වගේ ලිපියක් එවලා තියෙනවා අපි ඉදිරිපත් කරලා තියෙන පැමිණිලි පිළිබඳව ඔබතුමා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා වෙත මෙය යොමු කරා 2026/07/07 වෙන දින පැවති මාසික සභා රැස්වීමේදී න්‍යාය පත්‍රය සඳහා අයිතම අංක තුන යටතේ

සභාව අමතා එවන ආයාවන හා පෙත්සම් පැමිණිලි සංදේශ සභාව හමුවේ තැබීම මැයින් ඉදිරිපත් කර ඇති ලිපි වලට මුල් පිටපත ඔබ වෙත ඉදිරිපත් කරනවා කියලා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා වෙත. ඔබතුමා මේකේ සඳහන් කරලා තියෙනවා මේවට ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව මේවා ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා දැනුවත් කරන්න කියලා. හැබැයි ඒ දැනුවත් කිරීම මෙච්චරයි, දැනුවත් කිරීම තමයි මම මෙන්න මේ පාර සම්බන්ධව කතා කරා කියලා දාලා තියෙනවා හැබැයි මේ සම්බන්ධයෙන් ගත්තු ක්‍රියාමාර්ගයක් නැහැ නැවත පෙරළා මට එවලා තියෙනවා. ඔබ සභාවට ඉදිරිපත් කළා කියලා ඒ ටිකම මට එවලා තියෙනවා. ගිය සභාවේ අපි ඉදිරිපත් කරා මේ වෙනකොට සභාවේ මාසයක් වෙනවා හැබැයි මේවා වලට ගත්තු ක්‍රියාමාර්ගයක් නැහැ මම ඉන්න පාර සේවා පටුමග පවුල් තිස්පහක් විතරක්සන් කරලා ලියුමක් දුන්නා මේක සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා නමුත් මේ වෙනකන් ඒ සඳහා පිළිතුරක් නැහැ. හැබැයි නැවත ඒ අය තවත් ලිපියක් අරන් ආවා ඔබතුමාට අත්සන් කරලා දෙන්න කියලා. මම පසුව ඔවුන්ට මේ සභාවේ කතා කරපු වාර්තාවේ පිටපතකුත් ලබා දුන්නා. මේ සභාව දැන් අපේ නෙමේ ඔබතුමාලගේ අපිට පුළුවන් මේවා ඔබතුමාලට ඉදිරිපත් කරන්න විතරයි. ඔබතුමාලා අපිට කානු කණ්ඩායමක් හරි දුන්නොත් විතරයි අපිට මේවා සුද්ද පවිත්‍ර කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි ඔබතුමාගේ පාලනය තුළින් අපිට ඒවා ලැබෙන්නේ නැහැ, ලැබෙන්නෙ නැතිවුනාම අපිට කරන්න පුළුවන් එකම දේ තමයි මේ සභාවට මේ ලිපි ඉදිරිපත් කරන එක. අදත් ලිපි කිහිපයක්ම තියෙනවා නමුත් මම ඒවා ඉදිරිපත් කරන්න යන්නෙ නෑ මොකද කිසිම තේරුමක් නෑ. මොකද ඉදිරිපත් කරපු ලිපියටවත් පිළිතුරක් ලැබෙන්නෙ නැතුව මේකේ දිගින් දිගට අපි ඉදිරිපත් කරා කියලා මම හිතන්නෙ නෑ මේකේ සාධාරණයක් වෙයි කියලා. ඒ නිසා අපි ලිපියක් ඉදිරිපත් කළහම තමුන්නාන්සේලාගේ බලය තියෙන්නේ මේක අපි හරහා කරන්න ඕනේ නැහැ මේ ලිපිය අපි බාරදුන්නහම තමුන්නාන්සේලාගේ නියෝජිතයා හරහා හරි කමක් නැහැ මේ කාණු ටික සුද්ද පවිත්‍ර කරන්න. අපිට ඕනේ වැඩේ කරන්න විතරයි. කවුරු කියලා හරි කමක් නෑ වැඩේ වෙනවනම් අපි මේ සභාවට ඉදිරිපත් කරන ලිපි ලේඛන අඩුවෙනවා. එම නිසා මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම හැම වෙලාවෙම කියනවා මේ කැළි කසළ ගෙනියන එක සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. මේ කුණු ගෙනියන්නේ සති තුනකට සැරයක් තමයි සති තුනකට සැරයක් ඇවිල්ලා මේ ඉඳුල් කුණු ගෙනියන්න ප්‍රමාණවත් නැහැ. ඉඳුල් බකට් එක වත්තේ තියාගන්න බෑ පණුවෝ වහලා ගඳ ගහනවා මේ මිනිස්සුන්ට තියෙන්නෙ පොඩි ඉඩම් කොටස්. මේවා වල මේ මිනිස්සු බකට් දෙක තුනක් තියාගෙන ඉන්නකොට හරිම අපහසුතාවයකට පත්වෙනවා. අපි ඉද්දි සතියට දවස් දෙකක් යැව්වා. අඩුම තරමේ සතියට එක දවසක්වත් මේ කුණු ටික ගෙනියන්න යවන්න අපි දන්නවා මේකෙ ප්‍රශ්න තියෙනවා මේවා කළමනාකරණය කරගන්න ඕනේ. නමුත් සතියට එක දවසක් හරි යවලා මේකට අපිට විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, වීදි ලාම්පු මේ වෙනකොට සභාව තුළ ඉවර වෙලා තිබෙනවා. පැමිණිලි දෙක තුනක් දාලා තියෙනවා. මේ වෙනකොට මොරටුව බල ප්‍රදේශයේ දිනකට මරණ දහයක් පහළොවක් සිද්ධ වෙනවා හැබැයි මේ වෙනකොට සභාව තුළ තිබෙන්නේ පැෂර් ලයිට් 6 ක් හතක් වගේ තමයි අනිත් ඒවා ඔක්කොම අක්‍රිය වෙලා තියෙනවා. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරලා ලයිට් කිහිපයක් ගේන්න. නැත්නම් අපි මෙතනට දැනුම් දීම කරහම ලයිට්

නැති නිසා මේවා කරන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මේ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා අපිට ඇහුම්කන් දෙනවා කියන එක හරි ඇහුම්කන් දුන්නට මේවා කරන්න බඩු තියෙන්න එපැයි ලයිට් නැතුව අපි ඔබතුමාට කිව්වයි කියලා කරන්න පුළුවන් දෙයක් නැහැනේ. ඒ නිසා මේ සඳහා මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා කියන්න කැමතියි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මතු කරන සමහර කාරණා වල පොඩි ගැටළු තියනවා. ඔබතුමාට මරණ ගෙදරකට ලයිට් එකක් ගහගන්න හම්බවුනේ නැද්ද, දැනුම් දීපු හැම මළ ගෙදරකටම ලයිට් ගහලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනී, දැනුම් දුන්නාම වැඩේ කරනවා. මම කියන්නේ ලයිට් නැතුව මේ වැඩේ කරන්න බැහැ කියන එක. මේ වෙලාවෙ සභාව ඇතුළෙ තියෙන්නෙත් පැෂර් ලයිට් 6 ක් නැත්නම් 7 යි. විදුලි අධිකාරිතුමාගෙන් අහන්න මේක බොරුද කියලා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, මේ සඳහා පිළිතුරු ලබාදීමට විදුලි අධිකාරිතුමාට අවස්ථාව ලබා දෙනවා.

<u>විදුලි අධිකාරී - කේ.පී.ඩී.එන්. දුල්සිරි කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනී, දැනට ෆැෂර් ලයිට් අටක් වගේ පමණ තියෙන්නේ.පිච්චිලා තියෙනවා සැහෙන්න ප්‍රමාණයක්, දැනුම් දුන්නොත් මළගෙයක් ගැන අපි පැෂර් ලයිට් ගහනවා. නමුත් තියෙන ලයිට් ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනී, මම පෙරේදත් කතා කරා එතකොට කියනවා පැෂ් ලයිට් තියෙන්නේ හයයි හතයි මේ වෙනකොට ඒ ඔක්කොම ටික ගහලා තියෙන්නේ ඒ නිසා මළගෙවල් දෙකකට පැෂර් ලයිට් ගහන්න වුනේ නැහැ. එක්කෝ මෙයාලා අපිට බොරු කරනවා එක්කෝ නැත්නම් ඔබතුමාට බොරු කරනවා. ඒ නිසා මේවා නිවැරදි කරගෙන අපි යමු.

03(32) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ මා වෙත ලැබී තිබෙනවා පැමිණිල්ලක් විශේෂයෙන්ම මේ පැමිණිල්ල මම ඉදිරිපත් කරා 05 මාසයේ 07 වෙනදා මෙ නැවතත් මට අද දිනයේ ලැබිලා තියෙනවා. ඉදිරිපත් කරන්න මොරටුමුල්ල පෙදෙස පස්වන පටුමගේ ලක්ෂ්මන් ප්‍රනාන්දු මහතා විසින් නිවස ඉදිරිපිට කාණු පද්ධතිය පුළුල් කර පිළිසකර කර දෙන්න කියලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. නමුත් මේක විශාල කාණු පද්ධතියක් නෙමෙයි. මම හිතන්නේ මේ කාණු පද්ධතිය අඩි 5ක් 6ක් වගේ ප්‍රමාණයක් තමයි තියෙන්නේ. මේක නවීකරණය කරාට පස්සේ එතන අදාළ ස්ථානයේ ජනතාවට මම හිතන්නේ සමාන්‍ය පොඩි වැස්සකට පවා නිවෙස් ඇතුළට වතුර දාන තත්ත්වයකට පත්වෙලා තියෙනවා. මේක ප්‍රතිසංස්කරණයෙන් පස්සේ සිදුවෙච්ච දෙයක් ඉතින් එතුමා පුනපුනා කියනවා මෙය ඉටු කරලා දෙන්න කියලා. මොකද මේක ලොකු පිරිවැයක් යන දෙයක් නෙමෙයි. මේ සඳහා ඔබතුමාගේ විශේෂ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(33) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනී, ජොෂ්ඨ පුරවැසියන්ගේ සංගමයේ සභාපතිතුමා මට කතා කරලා විශේෂ ස්තුතියක් කරා. මම මේ සභාවට දෙවරක් තුන්වරක් ඉදිරිපත් කළා ජොෂ්ඨ පුරවැසියන්ට අදාළ ස්ථානයක් ලබා දෙන්න කියලා ඔවුන්ගේ කර්තව්‍යන් ඉටු කරගන්න කියලා. නැවතත් මම ඔබතුමාට මොරටුමුල්ල දේවස්ථානයේදී නැවත මතක් කළා ඔබතුමා ඉන් පසුව එතුමා එකක් ගිහිල්ලා ඒ අදාල කාර්යය පසු විපරමක් කරලා තියෙනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා මට කිවුවා යනකොට කියන්නම් කියලා නමුත් මට දැනුවත් කිරීමක් කරේ නැහැ. මේක හැප්පි හැප්පි කරපු දෙයක් මට දෙපාරක්ම ලිපි ආවා නගර සභාවෙන් මේක කරන්නේ නැහැ කියලා. මම නොමැති වුනත් සතුටුයි එවැනි කාර්යක් කිරීම ගැන. මොකද ජොෂ්ඨ පුරවැසියන් අහක දාලා ඔබට ඉදිරි ගමනක් නැහැ. ඔබතුමා මේ යොජනාව සම්බන්ධයෙන් අවදානය යොමු කිරීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. එතුමත් සතුටු වුනා එතුමා මට ස්තුති කරා. මොරටුව මහා නගර සභාවේ අපි වැඩිහිටියන් දෙස බලන ප්‍රමාණය මදී මොකද වෙන සභාවල් වල වැඩිහිටියන්ට මීට වඩා අවදානය දෙනවා. ඒ ස්ථානය ලබා දෙන්න කියලා නැවත ඉල්ලීම කරනවා.

**03(34) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාවන හා පෙත්සම් පැමිණිලි යටතේ විශේෂ ස්තුතියක් පුද කරන්න ඕන. දීර්ඝකාලයක් කොරළවැල්ල මෝසස් පටුමගේ ජනතාව වැසි ජලයෙන් මහත් පීඩාවට පත්වෙලා ඉන්න මොහොතක විශාල මුදලක් වෙන් කරලා ඒ මාර්ගය කාපට් කිරීම සම්බන්ධව. දැන් එම මාර්ගයේ වැඩකටයුතු ආරම්භ කරලා තියෙනවා. මීට පෙර අපිට කරගන්න තිබුන කාර්යයක් තමයි පවතින යුදමය තත්ත්වය හේතුවෙන් බඩු වල මිල ගණන් වැඩි වීම නිසා එක කරන්න ප්‍රමාද වුනා. නමුත් මේ මොහොත වෙනකොට ඒ කර්තව්‍යය ආරම්භ කරලා අද දින වෙනකොට මෙය අවසන් කරනවා. මේ සඳහා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**03(35) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, කොරළවැල්ල සුසාන භූමිය පිටුපස ප්‍රදේශවාසීන් මහත් පීඩාවට පත්වෙලා හිටියා කාලයක් වැසි ජලය බස්සවා ගන්න නොහැකිව. ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවදානය යොමු කරලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දුන්නා. ඔවුන්ගේ ස්තුතිය ඔබතුමා හට පුද කරනවා.

**03(36) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, කොරළවැල්ල සුසාන භූමිය මාවත එම් පී පෙරේරා මාවත කාපට් කිරීම සම්බන්ධව, අගමැතිතුමියගේ ප්‍රතිපාදන වලින් මිලියන 6කට වඩා වැඩි මුදලක් යොමු කරලා හෙට හෝ අනිද්දා දිනයේ කාපට් කිරීම සිදු වෙනවා. ඒ සම්බන්ධවත් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**03(37) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, ආයාවන හා පෙත්සම් පැමිණිලි යටතේ කරුණක් ඉදිරිපත් කරන්න තිබෙනවා. අපේ ජාතික වීරයෙක් වීරපුරන් අප්පු ශ්‍රීමතානන්, එතුමා වෙනුවෙන් මොරටුවේ මහා නගර සභාව විදිහට ඒ වගේම වෙනත් අවශේෂ ජනතාව විදිහට එතුමාව සැමරුමකට ලක් කරනවා. වීරපුරන් අප්පු විරුවා වෙනුවෙන් ස්මාරක කිහිපයක් මේ මොරටුව තුළ නිර්මාණය කරලා තියෙනවා. එක ප්‍රධාන ස්මාරකයක් තියෙනවා අපේ නගර සභාව ඉදිරිපිට තවත් ස්මාරක කිහිපයක් තියෙනවා. එකේ තවත් එක ප්‍රධාන ස්මාරකයක් තියෙනවා ලුනාව කලපුව

ක්‍රීඩාංගනයේ. එම ප්‍රතිමාවේ දැන් සැලකිය යුතු කාලයක් තිස්සේ පුරන් අප්පු දරන් සිටින කඩුව ගලවන් ගිහින් තියෙනවා. මට මේ ශිෂ්ඨ සම්පන්න සභාවේ එක කියන්න විදිහක් නැහැ තව තව හානි සිදු කරලා තියෙනවා. මම මේ කාටවත් දොස් කියනවා නෙමෙයි අපි සභාවක් විදිහට ලැජ්ජ වෙන්න ඕන. මොරටුව පුතෙක් 1848 හිරු නොබසින අධිරාජ්‍ය කියපු බ්‍රිතාන්‍යාට එරෙහිව එවැනි දෙවන නිදහස් අරගලය කරලා අවසාන රජු විදිහට එතුමා අභිශේක ලබපු මේ මොරටුවට, මුළු රටට විතරක් නෙමෙයි මුළු ලෝකයටම මේ රටේ වීරයන්ගේ වීරත්වය විදහා පාපු මිනිහෙක්. ඒ මනුස්සයාගේ ප්‍රතිමාවේ කඩුව මොකෙක් හරි අවලමෙක් ගලවන් ගිහින් තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ එළඹෙන 8 වෙනිදා එතුමාගේ 178 වන සමරුව, එතුමාව 1848 අගෝස්තු 8 වනදා තමයි සුද්දා බෝගම්බරදී එල්ලලා මැරුවේ. මම ඔබතුමාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා මේ කාරනාව සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දීලා පුළුවන් කමක් තියෙනවනම් 8 වෙනිදාට පෙර මේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්න පුළුවන්නම් මම විශ්වාස කරනවා අපි 8 වෙනිදාට මේ විරුවා සමරන්නේ අපේ යුතුකම ඉටු කරලා කියලා.

**03(38)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, මේ කරුණ මැක්සි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරා, ආයාවන හා පෙත්සම් පැමිණිලි යටතේ එකම කරුණ දෙපාරක් ඉදිරිපත් කරන්න බැහැ කියලා මම දන්නවා. නමුත් මේ කරුන එක පැත්තකින් මට බලපාන නිසා මම මේ කාරණාව ඉදිරිපත් කරනවා. දැන් ඉන්න සහ හිටපු මන්ත්‍රීවරු කිහිප දෙනෙකුටම අධිභාරයක් ඇවිල්ලා තියෙනවා මුද්දර දීමනාව සහ ඉන්ධන දීමනාව ලබා ගැනීම සම්බන්ධයෙන්. ඒ අධිභාරය සම්බන්ධයෙන් ගැටළුවක් නැහැ අපිට සාකච්ඡාව ලබා දෙන්න අපි ඒ කාරණාව කරනවා. මෙතන විශේෂ තත්ත්වය තමයි මේ මුදල් ලබා ගන්නකොට, ඒ අමතර දීමනා ලබා ගන්නකොට මමත් ඔබතුමාත් අපි දෙදෙනාම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු හැටියට තමයි මේ සභාව නියෝජනය කරේ. එදා මම පක්ෂයෙන් විමසලා තමයි ඒ පක්ෂයේ උපදෙස් මත තමයි ඒ මුදල අරගෙන අපි දන්නවා ජනතා විමුක්ති පෙරමුනේ ක්‍රමයක් තියෙනවා ඒ දීමනා ඔක්කොම පක්ෂයට පරිත්‍යාග කරනවා. ඒ අනුව අපි ඒ මුදල් පක්ෂයට පරිත්‍යාග කලේ. මමත් ඔබතුමාවත් එක රුපියලක්වත් පෞද්ගලික පරිහරණයට අරගෙන නැහැ. දැන් ඔබතුමාගේ දීමනාව මම විශ්වාස කරනවා මේ වෙනකොටත් ඔය ක්‍රියාවලියම සිදුවෙනවා කියලා. දැන් ඔබතුමා ඔබතුමාගේ දීමනාව පක්ෂයේ උපදෙස් මත කපා හැරලා අර ඇරියස් එක ගෙවා නිම කරා කියලා ඔබතුමා කියනවා. නමුත් මට එක කරන්න හැකියාව ලැබුනේ නැහැ. එතකොට දැන් ප්‍රශ්නය තියෙන්නේ මම ඉල්ලීමක් කරනවා විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්තුමාගෙන් මොකද මම ඒ රුපියලක්වත් පුද්ගලිකව වියදම් කරලා නැහැ. එම නිසා ඒ යම්කිසි සාධාරණයක් කරනවනම් මා සම්බන්ධයෙනුත් සානුකම්පිතව සලකා බලන්න කියලා මම පක්ෂ ප්‍රධාන ලේකම්තුමාගෙන් මේ අවස්ථාව ඉල්ලීමක් කරන්න අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම මැක්සි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ අපිට මේ කාරනා සම්බන්ධව කතා කරොත් අපි කවුරුත් මේක බලෙන් ගත්තේ නැහැ. අපි සියළු දෙනාම යම්කිසි ක්‍රමවේදයක් අනුව තමයි මේ මුදල් ලබා ගත්තේ ඒ සාකච්ඡාව මේ කමිටුවත් එක්ක ලබා දීලා ඉදිරියේදී අනෙකුත් ඉහළ නිළධාරින් සහ මැති ඇමතිවරුත් සමඟ සාකච්ඡා කරලා යම් සහනයකට යන්න අපි උත්සහයක් ගමු ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(39)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාවන හා පෙත්සම් පැමිණිලි යටතේ වාචික කරුණක් ඉදිරිපත් කරන්න තියෙනවා. මළපහ අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතිය යනවා කල්දෙමුල්ලේ සහ මොරටුවේ කොට්ඨාශ කිහිපයක. දැන් එම ව්‍යාපෘතිය තුළින් මේ කල්දේමුල්ල කොට්ඨාශ වල වීදී කිහිපයක් මේ වෙනකොට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනගමන් තියෙන්නේ. එවා වලින් දාන පස් සියල්ල කාණු වලට ඇවිල්ලා වසර කිහිපයක් තිස්සේ ඉඳන් මේ ව්‍යාපෘතියෙන් එක පිරිසිදු කරන්නෙත්

නැහැ. ගිය සතියේ ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකතුමා ව්‍යාපෘති කළමනාකාරතුමා එක්ක සාකච්ඡාවක් තිබුණා මමත් එකට සහභාගී වුනා අපේ නාගරික ඉංජිනියර්තුමත් හිටියා. දැන් තියෙන්නේ වැසි කාලගුණික තත්ත්වයක් අද වෙනකොට මධ්‍යම පළාතේ විශාල වැසි තත්ත්වයක් තියෙනවා. ඉතින් මේක බස්නාහිරට බලපානකොට මේක අපිටත් බලපානවා. මා ඉල්ලා සිටිනවා මේ ව්‍යාපෘතියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා ඉතා ඉක්මනින් කල්දෙමුල්ල කොට්ඨාශයේ මේ කාණු ටික ඉතා ඉක්මනින් ඒ ආයතනයට කියලා පිරිසිදු කරලා දෙන්න කියලා.

**03(40)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ගිය සතියේ දහම් මාවතේ අළුයම 03.50 ට පමණ වහනයකින් ඇවිල්ලා කැළි කසළ බෑග් වගයක් හිස් ඉඩමකට දලා ගිහින් තියෙනවා. මම ඒ නිවාස කිහිපයකින් තොරතුරු ගත්තා සීසීටීවී කැමරා වලින් එකේ ඩිමෝ බට්ටා වහනයක් තියෙනවා නමුත් වැස්සක් තියෙන නිසා මේ වාහනයේ අංකය සොයා ගන්න බැරි වුනා. මහජන සෞඛ්‍ය පරික්ෂකතුමත් ඇවිත් බලලා තිබුනා. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(41)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද ප්‍රදේශයේ නිවාස ව්‍යාපෘතියක් යනවා බැටරි වත්ත මේ ව්‍යාපෘතියේ ඉන්නවා අපේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකතුමා ඉන්නවා ජනක මහත්මයා. අද උදේ මට කතා කරලා කිවුවා ඒ දන්දෙණිය වත්තේ නිවාස කිහිපයක් ඉරි ගිහිල්ලා කියලා. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(42)** <u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පාරවල් කැඩිලා දැන් අවුරුද්දක් පමණ වෙනවා නගර සභා සීමාව තුළ තියෙන අපේ පාරවල්, දැන් මේ කෝලාස් වල ප්‍රශ්නයක් තියෙනවා. ඒක පැහැදිලිව අපි දන්නවා දැන් මේ ඉංජිනේරුතුමත් කිවුවා ගිය සතියෙත් ගෙනාවා කෝලාස් කිහිපයක් ඒකේ ප්‍රමිතිය අඩුයි කියලා නැවත ගෙන්නුවා කියලා. නමුත් ඒක මිනිස්සුන්ට කිවුවම ඔවුන් අපිට කියන්නේ වරිපනම් බදු ගෙවනවා කියලා. දැන් ඇත්තටම අපි ගමේ මන්ත්‍රීවරයා විදිහට සමාජයේ ඉන්න නිසා අපිටත් මේක බලපානවා. ඉතින් කල්දෙමුල්ල විතරක් නෙමෙයි මොරටුව නගර සභා සිමාව තුළ ඇතිවෙලා තියෙනවා. ඉතා ඉක්මනින් මේ කෝලාස් ටික ගෙනල්ලා ඒ පාරවල් ටික පිලිසකර කර දෙන්න කියන එක තමයි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ.

**03(43)** <u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචන හා පෙත්සම් පැමිණිලි යටතේ කරුණක් ඉදිරිපත් කරන්න කැමති, 2025 ජුලි 24 වනදා යෝජනා අංක 10 යටතේ මම යෝජනාවක් ඉදිරිපත් කරනවා, එගොඩඋයන දකුණ කොට්ඨාශයේ ලාල් පීරිස් පාරේ මා විසින් සංවර්ධනය කරපු පාරක්. 75% නිමකරා තව 25% ඉතුරු වෙලා තිබුනා ඒ කොටස සහ තව කාණු පද්ධතියේ කොටස සංවර්ධනය කරලා දෙන්න කියන ඉල්ලීම කරා, 2025 ජුලි තමයි මේ ඉල්ලීම කරන්නේ. එකේ නිර්දේශය තමයි උක්ත කරුණ සලකා බැලූ කමිටුව මෙම ව්‍යාපෘතිය නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ඉටු කළ යුතු කර්මාන්ත පිළිබඳ ලේඛනයට ඇතුළත් කර ඉදිරි කටයුතු කිරීමට නිර්දේශ කරනවා. අද වෙනතුරු මම දකින්නේ නැහැ එහෙම එකක් වෙනවද කියලා. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(44)** <u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, 2025 අගෝස්තු මාසයේ මම තවත් යෝජනාවක් ඉදිරිපත් කරා සොයිසාපුර නිවාස සංකීර්ණයේ භෞතික ගැටළු සම්බන්ධව අවදානය යොමු කරන්න කියලා.

යෝජනා අංක 9 යටතේ, ඒකේ නිර්දේශය තමයි උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නිර්දේශ කරන ලදී. ඒ නිර්දේශය තවම ක්‍රියාත්මක වුනේ නැහැ. ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

03(45) <u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, එගොඩඋයන දකුණ ප්‍රජාශාලාව සංවර්ධනය කරනවා, කරලා පාරමී පෙර පාසලේ මේ ප්‍රජාශාලාවට අනුයුක්ත කරනවා. ඒ නිසා ඒ සම්බන්ධව මම කියනවා නැවත ප්‍රජාශාලාවක් හැටියට හෝ පෙර පාසලක් හැටියට හෝ සංවර්ධනය කරලා නැවත ජනතාවට ලබා දෙන්න කියලා. එකේ නිර්දේශය තමයි තාක්ෂණ නිලධාරි නිර්දේශය අනුව ඇස්තමේන්තු සකස් කිරීමට නිර්දේශ කරනවා. මේක කරන්නේ 2025 දෙසැම්බර් මාසයේ ඒ නිර්දේශය අනුව 2026 මාර්තු මාසයේ කමිටුවේදී එම යෝජනාවටම නිර්දේශය ලැබෙනවා මේ කමිටුවට ඇස්තමේන්තු ඉදිරිපත් නොවූ බැවින් මීලඟ කමිටුවට ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට නිර්දේශ විය කියලා. දෙසැම්බර් ඉඳලා ඇස්තමේන්තු ඉදිරිපත් කරන්න කියනවා නමුත් මාස 3කට පස්සෙත් ඇස්තමේන්තු ඉදිරිපත් වෙන්නේ නැහැ. ඊට පස්සේ ඉලඟ කමිටුවට ඉදිරිපත් කරන්න කියනවා. ඊට පස්සේ 2026 අප්‍රේල් මාසයේදී එම යෝජනාවෙම නිර්දේශයේ තියෙන්නේ මිලියන 7ක් ඇස්තමේන්තු වෙනවා නිර්දේශය කිරීමට ඉංජිනේරු දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන ඉටු කළ යුතු කර්මාන්ත ලේඛනයට ඇතුළත් කිරීමට නිර්දේශ වෙනවා. මේ සම්බන්ධව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා මම දන්නේ නැහැ එගොඩඋයන දකුණ මම නියෝජනය කරන නිසා කියලා, ඔබතුමාගේ කොට්ඨාශය ඒ නිසා ටිකක් දැඩි අවධානයක් යොමු කරන්න මේ ජනතාවගේ අයිතියක්. මේවා ලේඛන ගත වෙනවා ඊට පස්සේ කිසි දෙයක් වෙන්නේ නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඒ වතුර රැදෙමින් තිබුණ අවශ්‍ය කොටස සකසලා තියෙනවා දැන් වතුර බහිනවා. පාරේ දැන් වතුර රැදෙන්නේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, ඉතුරු කොටස හදලා නැහැ ඒ පාරේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, මම පොඩි පැහැදිලි කිරීමක් කරේ. කළ හැකි කොටස කළ හැකියි. ප්‍රජාශාලාව පිළිබඳව ඔබතුමිය කියන එක හරි ඉතා ඉක්මනින් ඒක කරන්න ඕන. අවශ්‍යතාවයක් ඒ ප්‍රදේශයේ ජනතාවගේ. මාතෘ සායනට අදාල ඔබතුමාටගේ යෝජනාවත් ඉදිරියේදී සිදු වෙනවා.

03(45) <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මා හට ලැබුණ පෙත්සමක් මම සභාවට ඉදිරිපත් කරනවා. විජිත මාවත ප්‍රිමික්ස් දමා අළුත්වැඩියා කර පිළිසකර කර දෙන්න කියලා. මම එම ලිපිය සභාගත කරනවා.

03(46) <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, එගොඩඋයන කටුකුරුන්ද මාතෘ සායනය සම්බන්ධව දැන් ඒ සායනය මෝදරට අරගෙන ගිහින් තියෙනවා. එම නිසා ඒ ගැබිනි මව් වරුන් ත්‍රිවිල් රථ සඳහා රුපියල්

250ක් වගේ මුදලක් වැය කරලා තමයි සායන වලට සහාභාගි වෙන්නේ. අපේ පුස්තකාලයේ කොටසක් ඔවුන් දෙන්නම් කියනවා ඒ සායනය පවත්වන්න. ඒ සම්බන්ධවත් සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(47)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ගලි රථ බවුසර් සම්බන්ධයෙන් ගැටළුවක් තිබෙනවා. ගලි රථ සේවාව ලබා ගන්න ජනතාව පැමිණියාම ඔවුන් කියනවා ගලි රථ සේවාව ලබා ගැනීම ඉතා අපහසුයි කියලා. සමහර අවස්ථාවන් වලට ඒ තිබෙන බටය දිග මදී, මීටර් 60ක් වගේ තමයි තියෙන්නේ මේ මොරටුවේ අඩි 03,04, පාරවල් තියෙනවා. ඉතින් වහන ගන්න බැහැ. එම නිසා මේ බටයේ දිග මීටර් 300ක් 250ක් වගේ කරගන්න පුළුවන්නම් හොඳයි කියලා හිතනවා. ඒ ගැන අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(48)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ ලඟදී පොඩි සිදුවීමක් වුනා නිවෙස් වලට කුණු ගෙනියන්න එන්නේ සිකුරාදා දිනයට නිසා ඒ වැඩට යන මිනිස්සු පාරට කුණු ගෙනත් තියෙනවා. තිබ්බට පස්සේ වෙනත් එය ඒ සිද්දිය ෆොටෝ ගහලා දානවා. ඊට පසුව පොලීසියෙන් ඇවිත් ඒ මිනිස්සුන්ට පොලීසියට එන්න කියලා උසාවි දානවා. අපිට බදු ගෙවන ජනතාව ඒ. ඒ මිනිස්සු වැඩට යන්න කලින් තමයි ඇවිල්ලා කුණු බාල්දි දෙක පාරෙන් තියලා යන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(49)** <u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, නගර සභාවෙන් ලිපියක් ලැබිලා තියෙනවා 27 වනදා එන්න කියලා ඒ වුනාට ලිපිය ලැබෙන්නේ 28 වනදා මොරටුවේ ඉඳලා ලිවුමක් එගොඩඋයනට යවා ගන්න බැහැ දවස් ගාණක් ප්‍රමාද වෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(50)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පසුගිය දා අපි දැක්කා කොට්ඨාශ කිහිපයකම ඩෙංගු මර්දන කටයුතු සිදුකරනු ලැබුවා. කටුබැද්ද දකුණ කොට්ඨාශයේ මේ ඩෙංගු මර්දන වැඩසටහනේදී අපිට උපදෙස් ලබා දී තිබුනේ පක්ෂ විපක්ෂ සියළුදෙනාවම එකතු කරගෙන මේ වැඩේ කරන්න කියලා. විශේෂයෙන්ම ස්තුතියක් කරන්න ඕන ඒ ක්‍රියාවලියේදී කටුබැද්ද දකුණ කොට්ඨාශයේ අපි සම්බන්ධ කරගත්තා අපිට අපේ විපක්ෂ මන්ත්‍රීවරු සේනක මන්ත්‍රීතුමා ඒ වගේම සුදත් ක්‍රිශාන්ත මන්ත්‍රීතුමා. ඒ සම්බන්ධයෙන් මට තියෙනවා විපක්ෂයේ වුනත් ඒ මන්ත්‍රීවරුන්ට ස්තුති කරන්න. ඒ වගේම එම වැඩසටහන ඉතාම සාර්ථක අන්දමින් සිදුකරන්න ලැබුනේ රාජ්‍ය ආයතන වල සහයෝගයත් සමඟ. විශේෂයෙන් මම මේ මන්ත්‍රීවරුන්ටත් මේ සභාවේ ස්තුතිය පුද කර සිටිනවා. ඒ වගේම මේ කටයුත්තට සහභාගි වුනා එක්සත් ජාතික පක්ෂයේ ඡන්දය ඉල්ලපු ජනක මහත්මයා. එතුමාටත් ස්තුතිය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

**03(51)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම කියන්න කැමති කටුබැද්දේ පොදු ළිඳක් තිබුණා. මම මීට කලින් මේ ගැන කතා කරා හැබැයි මේ ළිඳ නගර සභාවට අයිති ළිඳක් නෙමෙයි. ඉඩම් නිලධාරියා සමඟ සාකච්ඡා කරලා බැලුවම එක අපිට අයිති නැහැ එක අයිති රජයට. ඒ නිසා මේක කුණු වලින් වැහිලා තිබුනේ. අපිට මුකුත් කර ගන්න විදිහක් තිබුනේ නැහැ. ඒ අවස්ථාවේදී ඔය ජනක කියන පුද්ගලයා ඇවිත් මගෙන් ඇහුවා මේ ළිඳ අපි අඳිමුද කියලා. මමත් ඒ වෙලාවේ එකට කැමති වුණා.

කියන්න සතුටුයි විපක්ෂයේ උනත් හොඳ වැඩක් කරනවනම් අපිත් එකතු වෙලා එක කරනවා. ගමේ සංවර්ධනය ගැන වෙනම ඇහැකින් බලන පුද්ගලයින්ට මේවා රුස්සන්නේ නැහැ. මේක අවුරුදු 80ක් පැරණි ලිඳක්. මම ඒ සම්බන්ධයෙනුත් ඒ මහත්මයාට ස්තුතිය පුදකර සිටිනවා.

**03(52)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ වෙනකොට ලුනාව කලපුව මිනිස් ජීවිත, සත්ත්ව ජීවිත වලට හානි කරන ප්‍රධාන රකුසෙක් බවට පත්වෙමින් ඉන්නවා. එම නිසා ඔබතුමාගේ අවදානය යොමු කරන්න මම විශේෂයෙන් අවදානය යොමු කරනවා. ලුනාව කලපුව මේ වෙන විට පසුගිය කාලයේදී බේර වැවේ තිබුණ ගඳ සහ අපවිත්‍රභාවය මොරටුවේ ලුනාව කලපුවට ආදේශ වෙලා තියෙනවා. අනිත් පැත්තෙන් ගත්තට පස්සේ විශේෂයෙන් මේ ඇල්ගී හා මේ රාසායන ද්‍රව්‍ය මේකට එකතු වෙනවා කියන විශ්වාසය අපිට තියෙනවා. පහුගිය දවස් වල ඔබතුමත් මමත් අපි හැමදෙනාම අගලකඩ ස්වාමීන් වහන්සේගේ විහරස්ථානයේ තිබ්ච්ච පිංකමට සහභාගි වුනා. ඒ වේලාවේ ඒ ඉහළ මාලයේ ඉඳලා බලනකොටත් මේ ගඟ කොළ පාටකට පත්වෙලා තිබුණා. ඒ නිසා ඉතා ඉක්මනින් මේක සකස් කරේ නැති වුනොත් නළපාන ජාතකයේ එන රකුසෙක් ඉන්නවා වගේ වෙයි. බොධි සත්ව වඳුරා මේකට විසඳුම් සෙව්වා වගේ ඔබතුමාටත් මේකට උත්තර සොයන්න වෙලා තියෙනවා. මම අවදානය යොමු කරනවා කැස්බෑව ප්‍රදේශයේ මේ ආසන්නම සිද්ධියට සමාන සිද්ධියක් වුනා මේ ලඟදී මම කේඩීයු රෝහලට ගිය වෙලාවේ රෝහලේ 3 වන වාට්ටුවේ එකම පවුලේ එක දරුවෙක් උඩ තට්ටුවේ හිටියා තව දරුවෝ දෙන්නෙක් හිටියා අවුරුදු 19යක ඔවුන්ගේ අයියා මිය ගිහින් තිබුනා. හේතුව තමයි ඒ ආසන්නයේ තිබුණ මේවගේ වැවකට බැස්සා ලෙඩ උනාම හිතුවේ මී උණ කියලා. හැබැයි ආසන්න සිද්ධිය වෙනස් වෙමින් පවතිනවා. ඒ ආසාන්නයේ තිබෙන කාර්මාන්තශාලා වලින් පිට වෙන රාසායන ද්‍රව්‍ය නිසා මේක සිද්ධ වෙනවා කියලා දැන් විමර්ෂනය වෙනවා. ඒ නිසා මේ ගැන සලකා බලා ලුනාව කලපුව මේ රකුසගෙන් බේර ගන්න. අපිට සම්පතක් තියෙනවා ඒ තමයි මේ ආසන්නයේ තියෙන ජල සම්පාදන මණ්ඩලයේ තියෙන රාසායන පරීක්ෂණ ආයතනය. මේකට අපේ ජල සම්පල යවලා ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්. මේවට මුදල් ගෙවීමේ ප්‍රොසීඩ් එකේ ප්‍රශ්නයක් තියෙනවනම් මගේ මන්ත්‍රී වැටුපෙන් කපාගෙන මේ පරීක්ෂණ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(53)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ වසරේ තව දින කිහිපයකින් එන්වීකිව් මිලියනය සම්පුර්ණ වෙච්ච උත්සවය තියෙනවා බිඑම්අයි සීඑච් එකේ. එහි ගෞරවය සම්පූර්ණයෙන්ම ලැබෙන්න ඕන මොරටුවේ ඉන්න එන්වීකිව් අධ්‍යක්ෂකවරයා වෙච්ච වජිර පෙරේරා මැතිතුමාට. එතුමා මූලික වෙලා තමයි 2005 වසරේදී එන්වීකිව් හැදුවේ. එයින් යම් ප්‍රතිලාභ කොටසක් නගර සභාවටත් ලැබුණා. ඒ වගේම ලංකාවේ ඉන්න සමස්ථ ජනතාවගේ ප්‍රගමනයට මේ එන්වීකිව් හේතු වුණා. ඒ නිසා ඒ හදවත් වලට ඒ ප්‍රතිලාභය ලැබෙන අවස්ථාව වන විට මම ආයාචනයක් කරන්න කැමති මේ එන්වීකිව් අධ්‍යක්ෂකවරයා වෙච්ච වජිර පෙරේරා මැතිතුමාට මීට මාස එකහාමාරකට ඉස්සෙල්ලා එතුමාගේ සීඕසී එක ලබා ගන්න නගර සභාවට පැමිණි අවස්ථාවේ ඇප්ලිකේෂන් එකක් යොමු කරනවා අද වෙනකන් යම් ප්‍රමාදයක් නිසා එක සිදුවෙලා නැහැ. ඒ නිසා අද කමිටුවේදීවත් එන්වීකිව් මිලියනයේ හදවත් සම්පුර්ණ කරන වෙලාවේ ඒ අධ්‍යක්ෂකවරයාගේ හදවත සතුටු කරන්න මේ සීඕසී එක පාස් කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(54)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, අපි විවේචන වගේම අපේ තිබෙන මනුස්සකම් අගය කරන්න ඕන. එම නිසා මම මෙය අවස්ථාවක් බවට පත්කර ගන්නවා අපේ සුජිත් ඩිල්රෝයි මන්ත්‍රීතුමාට ස්තුතියක් පුදකරන්න. සති දෙකකට කලින් චින්තක දේශප්‍රිය කියන යොවුන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු ඇමතිවරයා මේ ප්‍රදේශයට ආවා බොරුපන සුද්ධ පවිත්‍ර කර ගන්න ඔබතුමන්ලත් උදව් කරලා තිබුනා. ඒ වගේම ආර්ඩී එකේ අපේ මයුරි මිස් ඇතුළු පිරිස මේකට උදව් කරාම ඔවුන්ට පස් දාගන්න තැනක් තිබුනේ නැහැ. මම ඕක අහගෙන ඉඳලා කිවුවම මට පස්සේ මම සුජිත් ඩිල්රෝයි මන්ත්‍රීතුමාට කිවුවා. එතුමා ඔහුගේ වැඩ රාජකාරී දාලා ඇවිල්ලා එකට උත්තරයක් සපයන්න උදව් කරා. එම නිසා එතුමාට මගේ ස්තුතිය පුදකරනවා.

**03(55)** <u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, එල්නීනෝ ලානීනා තත්ත්වය එක්ක මේ දේශගුණික විපර්යාසයන් බලපාලා තියෙනවා. ඒ නිසා මේකට කඩිනමින් කමිටුවක් පත්කරලා දැන් එන වැසි තත්ත්වයක් අනාගතයේදී එන්න තියෙන නියන් තත්ත්වයටත් මොරටුව විදිහට සහ සමස්ථ රට විදිහට අපි අපදා කළමණාකරන කමිටුවක් පිහිටවලා එකට ක්‍රියාමාර්ග ගතයුතුයි. එහෙම නැත්නම් මේක ආවාට පස්සේ වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා මේකට වහා වහා සූදානම් විය යුතුයි. එහෙම නැති වුනොත් අපිට කම්පා වෙන්න වෙන තැන් වැඩි වෙනවා. ඒ නිසා එ සඳහා අවශය කටයුතු සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, විශේෂයෙන්ම කියන්න ඕන මම දැක්කා ඉන්ටර්විව් එකකදි ඔබතුමා කියලා තියෙනවා මේ මාතෘකාව යටතේ කවුරුහරි මන්ත්‍රීවරයෙක් දිගින් දිගටම කරදර කරනවා කියලා. එකේ නම පැවසුවනම් තමයි හොඳ මොකද මේ මාතෘකාව තමයි මම අඩුවෙන්ම කතා කරන මාතෘකාව.

**03(56)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාගේ අවදානය යොමු කරනවා අද වෙනකොට මේ සේවකයෙ මුහුණ දීලා තියෙන ප්‍රශ්නයක් වෙනුවෙන්, විශේෂයෙන් අපේ කම්කරු සේවකයින් උදේ ඉඳන් හවස් වෙනකන් මහන්සි වෙලා ආවට පස්සේ තමන් පැය 12ක් රාජකාරී කරලා ඉලඟ පැය 12 ට සූදානම් වෙන්න ඇඟ පොඩ්ඩක් තෙමා ගන්න, හෝද ගන්න ස්ථානයක් නැහැ. මේ නගර සභාවේ ඉස්සරහින් අවාම බෝහොම ගාම්භිර පෙනුමක් තියෙනවා මේ බිල්ඩින් ටික දැක්කම. හැබැයි පිටිපස්සට ගිහිල්ලා බලනකොට ඉතාමත්ම අසෝබන තත්ත්වයක් තියෙන්නේ. පිටින් මනුස්සයෙක්, සේවාදායකයෙක් ආවොත් ඒ මනුස්සයට හදිස්සියට බඩේ අමාරුවක් හැදුනොත් යන්න වැසිකිලියක් නැහැ. අපි මේක අපේ පාලන සමයේදී පවා දිගින් දිගට කතා කළා මට මතකයි අපි කමිටු වලට දාලා ක්‍රියාත්මක කරන්න කිවුවා හැබැයි ක්‍රියාත්මක වුනේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවදානය යොමු කරනවා මේ සේවකයින්ට සහ ඒ ඉන්න පාර්ශවයන්ට පිරිසිදු වෙන්න පිරිසිදු ස්ථානයක් හදලා දෙන්න කියලා. මහා ලොකු වියදමක් යන්නේ නැහැ මේකට. වැසිකිලි පද්ධතියක් හදන්න එන පාරිභෝගිකයින්ට යන්න කාන්තා සහ පිරිමි වැසිකිලි දෙකක් හදන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**03(57)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මන්ත්‍රීවරු පිරිසක් ඉරිදා දවසේ අපේ කණ්ඩායම් රැස්වීම තියලා අපි බලාගෙන ඉන්නකොට කළුවරේ විශාල ප්‍රමානයක් මෙතනින් යනවා. කාන්තාවොත් යනවා පිරිමිත් යනවා. අපි බැලුවා මොකද කියලා පස්සේ සිකියුරිටි එකෙන් ඇහුවා මොකද කියලා මේ අය ඇතුලට යන්නේ කියලා. එතකොට තමයි අපි දන්නේ ඇඟිලි සලකුණු යන්ත්‍රයක් කොහේ හරි අස්සක තියෙනවලු රෑ 7ට,8ට,9ට, 10ට, 11ටත් එනවලු 12ටත් එනවලු මේ ඇඟිල්ල තියන්න. ඒ නිසා පළවෙනිම දේ කරන්න ඕන ඒ අස්සේ ඇඟිලි සලකුනු යන්ත්‍රයක් තිබ්බා කියලා මෙලෝ වැඩක් නැහැ මොකද ඕන කෙනෙකුට එක ඩැමේජ් කරන්න පුළුවන්. ලොකු අනාරක්ෂිත බවක් තියෙනවා. ඒ නිසා ගෙනල්ලා මේ පේන තැනකින් සවි කරන්න කියන ඉල්ලීම කරනවා. දන්නවනේ මෙතන කොමසාරිස් කාර්යාලය ලඟ තිබිලත් ගොඩක් වෙලාවට එක්කේ ඇණයකින් ඇනගෙන යනවා නැත්නම් එක්කේ මොකක් හරි කරලා විනාශ කරනවා. කිහිපයක්ම වුනා එහෙම. මේවා පොදු දේපල ඒ නිසා එක ගලවලා මේ පේන තැනකින් නැතිනම් සිකියුරිටි එක ගාවින් තියන්න කියන ඉල්ලීම කරනවා. ඒත් එක්කම මේකේ ක්‍රමවේදයක් නැහැ මේ ඇඟිලි සලකුනු තියන්න හවස්වරුවේ නිලදාරින් කවුරුත් නැහැ, දේශපාලන්ඥයෝ නැහැ කවුරුත් ඔවුන් ඇවිල්ලා තමන්ට රිසි සේ ඇඟිල්ල තියලා යනවා. අපි දන්නේ නැහැ ඕටිද මොනවද කියලා අපිට අවබෝධයක් නැහැ. අපි ජීවිතයට දැකලා නැති මිනිස්සුත් ඇවිල්ලා ඇඟිල්ල තියලා යනවා අපිව අඳුරන්නෙත් නැහැ ඔවුන්. අනිත් එක මේක සභාවට තර්ජනයක් ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා සිකියුරිටි එකේ හරි වෙලාවක් දාලා ඒ වේලාවෙන් පස්සේ ඇතුළුට එන කට්ටියට පොතක් දාන්න ඇතුල් වීමයි පිට වීමයි ලකුණු කරන්න. එතකොට සිකියුරිටි එකෙන් දන්නවා ආවේ කවුද කියලා හදිස්සි අපරාදයක් වුනොත් එතකොට අල්ල ගන්න පුළුවන්. ඒ නිසා කරුණා කරලා මේ සඳහා අවදානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

**03(58)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, 2025.08.12 වනදා මම යෝජනා කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරා. එකක් තමයි අඟුලාන ආදාහනාගාරය සම්බන්ධව එකට ඔබතුමාලා ලක්ෂ 15 වෙන් කරලා එහි ප්‍රතිසංස්කරණ කටයුතු කරා. මුදලක් ඉතුරුත් වුනා. දැන් ඒ ආදාහනාගාරය පාවිච්චි කරන්න විදිහක් නැහැ ඒ ආදාහනාගාරයේ තිබුණ බ්ලෝවර් එක අරන් ගිහින් කොරළවැල්ලේ ආදාහනාගාරයට සවි කරලා තව සල්ලි තියෙනවනම් මේ ආදාහනාගාරය හදන්න නැත්නම් මේකේ තේරුමක් නැහැ. අඟුලාන පොදු සුසාන භූමිය වෙනයි ආදාහනාගාරය වෙනයි එක තියෙන්නේ දෙපැත්තක. මම පොදු සුසාන භූමිය ගැනත් මම යෝජනාවක් ඉදිරිපත් කරා නැවත අරගෙන කමිටුවට දාලා දැන් තමයි වැඩ පටන් ගත්තේ. ඒ වගේම ඔය ආදාහනාගාරය සම්බන්ධව මම යෝජනාව ඉදිරිපත් කරලා වසරක් වෙනවා ඊට පස්සේ ආදාහනාගාරය තියෙන්නේ 4යි. අනිත් තුනේම ඔබතුමන්ලා වැඩ කරගෙන යනවා. අඟුලාන පොදු සුසාන භූමියේ ආදාහනාගාරයේ පිලිවෙලකට වැඩක් කරලා දෙන්නේ නැහැ. ඒ දුප්පත් ජනතාවක් ඉන්නේ අඟුලාන, ලක්ෂපතිය, කල්දෙමුල්ල, උයන ප්‍රදේශ වල ජනතාව මෙතනට එන්නේ. ඔවුන්ගේ අවසන් කටයුතු හරියාකාරව කර ගන්න ඒන නිසා මේක කරලා දෙන්න කියන්නේ. මම මැරුනම මගේ මිනිය වළලන්නේ අඟුලාන පොදු සුසාන භූමියේ නෙමෙයි අපිට පවුල් වලක් තියෙනවා රාවතාවත්ත පොදු සුසාන භූමියේ. මම මේ යෝජනාව ඉදිරිපත් කරේ ප්‍රදේශවාසී ජනතාවට සේවයක් ඉටු කරලා දෙන්න. මේ යෝජනාව මම ගෙනාපු නිසාද කොහොද මේ ගැන කිසිම තැකීමක් කරන්නේ නැහැ. කොරළවැල්ල සුසාන භූමිය හදනවා වගේ මේකත් හදගන්න මම මේ යෝජනාව කරේ

එකේ ලස්සනට මල් ඉන්දනවා. අඟුලාන සුසාන භූමියේ වල් පැලයක් ගලවන්න එක සේවකයෙක් නැහැ. ඒ නිසා මේ සඳහා අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(59)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම මීට වසරකට කලින් ඔබතුමාට ඉදිරිපත් කරා රේල් පාර යටින් හියුම් පයිප්ප දැමීම සම්බන්ධයෙන්, අපේ කොමසාරිස්තුමිය මේ ගැන සැලකිලිමත් වෙලා මාස 10කට පස්සේ තමයි සීජීආර් එකට ලියුමක් දාන්නේ. ඉතින් මෙහෙම කල් දාලා වැඩ කරනවට වඩා ඉක්මනින් මේ වැඩකටයුතු කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(60)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, කලපුවේ ඉවුර ගස් වැටෙන නිසා ගොඩ කරන්න කියලා ඉල්ලීමක් කරා, එකට බාච් එක ගිහිල්ලා දාලා තිබුණා. නමුත් එක එතනම තියෙනවා වැඩේනම් කෙරෙන්නේ නැහැ ඒ සම්බන්ධවත් සොයා ලබා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(61)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම තවත් යෝජනාවක් ඉදිරිපත් කරා සේවකයින්ගේ වැසිකිළි ප්‍රශ්නය සම්බන්දයෙන්, මම නැති අවස්ථාවක එය කමිටුවෙනුත් ඉවත් කරලා තිබුනා. ඔබතුමත් එදා කිවුවා මෙය කරන්න ඕන වැඩක් කියලා. මේ යෝජනාව ඉදිරිපත් කරා විතරයි. දැන් එක කමිටුවෙත් නැහැ. එම නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඔබතුමාගෙන් ඉතා කරුණිකව ඉල්ලා සිටිනවා අපි ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ බොහෝම කෙටියෙන්, ඉතින් අපිට ඒ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. ගිය සභා වාරයේදීත් මට කතා කිරීමට නොහැකි වුනා. ඒ නිසා අවස්ථාව සෑම මන්ත්‍රීවරයෙකුටම ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(62)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, වාචික ඉල්ලීමක් ඉදිරිපත් කරන්න තියෙනවා. කපිල සුදීප්, අංක 260 පොදු ජය මාවත වරිපනම් අංකය 31 ඒ කාණු සුද්ධ පවිත්‍ර කර දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. අපි ලක්ෂ ගණනාවක් වියදම් කරලා හදපු අඟුලානේ කාණුවක් සම්පූර්ණයෙන්ම පස් වලින් යට වෙලා තියෙනවා. මේ හරියටම අගුලාන පොදු ජය විද්‍යාලය පිටුපස කොටස. ඒම නිසා ඉතාම ගෞරවයෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ පස් ටික ඉවත් කරලා මේ කාණුව පාදලා දීලා වතුර රැදෙන එක නතර කරලා දෙන්න කියලා.

**03(63)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අජිත් තිලකවංශ මහත්මා වාචිකව ඉල්ලීමක් කරා අංක 89, රිවර් සයිඩ් ගාර්ඩන්, අඟුලාන. මේ වත්තේ අංක 89,92,93,94 කියන මේ නිවාස වල කුණු රැගෙන යාම මඟහැරෙනවා කියලා. මම හිතන්නේ පාරවල් දෙකක් අතර මේ වත්ත තියෙන්නේ. එම නිසා වෙන්න ඇති මේ වත්තේ තියෙන කසළ ගෙන යැම මඟහැරෙනවා. ඒ නිසා අපි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාටත්, ඒ වගේම සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමාගෙනුත් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් සොයා බලන්න කියලා.

**03(64)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම තවත් ඉල්ලීමක් තියෙනවා. රම්‍යනදී මාවතේ ඔබතුමාලා මේ මෑතකදී හදපු පාරට ගහක් බරවෙලා තියෙනවා. එම නිසා වාහන ගමනාගමනයට පොඩි අපහසුතාවයක් තියෙනවා. ඒ ගැන සොයා බලලා ඒ ගස ඉවත් කරලා දෙන්න කියලා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

**03(65)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මම ගිය සභා වාරයේදීත් මේ ගැන කතා කරන්න සූදානමින් සිටියා. නගර සභාවට පමණක් මේ ඩෙංගු උවදුර පාලනය කළ නොහැකියි. ඒ නිසාම මම තීරණය කළා අඟුලානේ සෑම නිවසකටම ගිහිල්ලා ටෙන් මිනිට්ස් චැලේන්ජ් කියලා වැඩසටහනක් කරන්න කියලා. දිනකට ගෙවල් 4කට 5කට ගිහිල්ලා අපි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යනවා. ඉතින් ඒ යන අතරේදී මේ දැන්වීම සහාගත කරනවා දැක බලා ගන්න. අපි ගෙවල් වලට ගිහිල්ලා ඒ ජනතාව දැනුවත් කරාම ඒ තියෙන කුණු කසල ඉවත් කරගන්නේ කොහොමද, වතුර රැදෙන ස්ථාන ඉවත් කරගන්නේ කොහොමද කියලා අපි අහනකොට ඒ මිනිස්සු අපෙන් අහනවා නාගරික මන්ත්‍රීතුමනී මේ කාණුවේ රැදෙන වතුර වලට මදුරුවෝ බෝ වෙනවා එවට අපි මොනවද කරන්නේ කියලා අහනවා. ඒ නිසා කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේවා බලලා කරන්න කියලා. මෙතුමා වැඩ කරනවා අපි නැහැ කියන්නේ නැහැ. හැම බදාදාම බැලුවොත් කොහෝ හෝ කාණුවක් සුද්ධ කරනවා. හැබැයි පිළිවෙලකට වැඩක් වෙන්නේ නැහැ කියන එක කියන්න ඕන. මම මේ කාටවත් චෝදනා කරනවා නෙමෙයි. තිලකසිරි මන්ත්‍රීතුමා කිවුවා වගේම එතුමා ආසනය දිනපු මන්ත්‍රීවරයා වෙලත් එතුමාටවත් හම්බවෙන්නේ නැහැ කාණු කණ්ඩායමක් ඒ නිසා අපි ගැන මොන කතාද, එම නිසා මේ නගර සභාවේ සේවකයෝ යොදවලා මුදල් නාස්ති නොකර මේ වැඩේ හරියට කරන්න. සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමා ඔබතුමාට මම ආරාධනා කරනවා එන්න අඟුලානට තණකොළ කපන හැටි මම පෙන්වන්නම්. කාණු සුද්ධ කරන්නේ කොහොමද කියලා මම පෙන්වන්නම් ඇවිල්ලා බලන්න. අපි එකාබද්ධ විපක්ෂය හැටියට මේ ඩෙංගු උවදුරට මුහුණ දෙනහැටි ගැන ඉදිරිපත් කරා ජේවීපී අයට විතරක් නෙමෙයි යූඑන්පී අපිටත් මේ මදුරුවා විදිනවා. අඟුලානේ ඩෙංගු මර්දන වැඩසටහන ගැන කණගාටුයි. මේ පිළිබඳ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(66)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ආයාචනා හා පෙත්සම් යටතේ ඉදිබැද්ද සුදර්මාරත්න මාවතේ කෙළවරේ තේක්ක වත්ත ප්‍රදේශයේ ප්‍රදේශවාසීන් ඉදිරිපත් කරලා තියෙනවා මේ ප්‍රදේශය වැස්සට යට වෙනවා. එම නිසා ඒ ප්‍රදේශයේ ජනතාව විසින් ලිපියක් මා වෙත ඉදිරිපත් කරලා තියෙනවා. කාණුවක් දාලා දෙන්න කියලා මේ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරනවා.

**03(67)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, සේවක මහත්මයෙකුගේ අපදා ණය සම්බන්ධයෙන් මතක් කිරීමක් සිදු කරනවා. අපි සේවකයින්ට මේ අපදා ණය ගෙවන්න ඕන ඉතින් ඒ සඳහා ඔබතුමාගේ අවදානය යොමු කරනවා.

**03(68)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුවැල්ල දකුණ කොට්ඨාශයේ ක්‍රිශාන්ත ද මෙල් මාවතේ ජනතාව විසින් මා හට ලිපියක් භාර දීලා තියෙනවා. ඔවුන්ගේ පාර සංවර්ධනය කර දෙන්න කියලා මම එම ලිපිය සභාගත කරනවා.

**03(69) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශණ කුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ ඉදිබැද්ද ඩග්ලස් ක්‍රීඩාංගණයේ අත්පන්දු ක්‍රීඩා කරන වොලිබෝල් කණු දෙක ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. අත්සන් ලේඛනයේ අත්සන් සියයක් විතර තියනවා. ක්‍රීඩා කරන ක්‍රිඩකයන්ට එම කණු දෙක අනතුරුදායකයි. ඒක වෙන ස්ථානයක ස්ථාපිත කරලා දෙන්න කියලා තමයි ක්‍රීඩකයො ඉල්ලා සිටින්නේ.මේ පෙත්සම මම සභාගත කරනවා.

**03(70) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශණ කුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,කඩලාන ක්ලිනික් එක පිටපුස තිබෙන නගර සභාවට අයත් ඉඩම ප්‍රයෝජනයක් ගන්න පුලුවන් ඉඩමක්. ඒක සොයිසා පාරට කිට්ටුව තිබෙන්නේ. එම ඉඩම රෙන්ට් කරලා නගර සභාවට ආදායමක් ගන්න පුලුවන්. අපේ සභාවේ නීතීඥතුමිය හා නීතීඥ මහතුන් ඒ ගැන හොයලා බලලා තීරණයක් ගන්න.අපිට රුපියල් තිස්හතලිස් දහසකට රෙන්ට් කරන්න පුලුවන් ෆර්නිචර්ස් ෂොප් වලට. ඒ අවට තියෙන්නේ ඔක්කොම ෆර්නිෂර් ෂොප්.ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒ වැඩේට පියවර ගත්තානම් නගර සභාවට ආදායමක් හොයන්න පුලුවන්.

**03(71) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා</u>**

ගරු නගරාධිපතිතුමනී, අස්වැසුම දීමනාව ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කපා හැරලා තියනවා. එක්දහස්නමසිය 89 ජනසවිය නමින් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ආරම්භ කරා. ඉන්පසු සමෘද්ධිය නමිනුත් වර්තමානයේ අස්වැසුම නමිනුත් මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.මේ වැඩසටහනේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය සහිත පවුල් අඩුකිරීමත්, පවුල් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරිමත් කියන්න කණගාටුයි. අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ඒ වගේම පිළිකා රෝගීන්ගේ ආබාධිතයන්ගේ හා ජේෂ්ඨ පුරවැසියන්ගේ දෙදහස් පන්සිය, පන්දාහ දීමනාව අද ඔබතුමන්ලා නැති කරලා තියනවා. ඉල්ලීමක් කරනවා පිළිකා රෝගීන්ට ජේෂ්ඨ පුරවැසින්ට නැවත අස්වැසුම ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

## 04. <u>ප්‍රශ්න</u>

**04 (01) <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි අංක 04 (01) යටතේ මහා නගර සභා මන්ත්‍රී ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු ලබාදීමට මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**04(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති ප්‍රශ්න,**

01. මොරටුව මහා නගර සභාව සතුව නිල නිවාස කීයක් තිබේද?
    - I. ඉහත නිල නිවාස ප්‍රමාණය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ පවතීද?
    - II. එසේ ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ නොපවතින නිල නිවාස ඇත්නම් ඒ කොපමණද?
    - III. ඉහත II හි සඳහන් නිල නිවාස මොනවද? පදංචිවීමට නුසුදුසුවීමට හේතු මොනවද?

02. මොරටුව මහා නගර සභාවේ නිල නිවාස ඉල්ලුම් කල හැකි නිර්ණායතයන් මොනවද?
    I. මොරටුව මහා නගර සභාවේ දැනට ලබාදී ඇති සියලුම නිල නිවාස ලබාදී ඇත්තේ ඉහත නිර්ණායකයන්ට අනුකූලවද?
    II. ඉහත නිර්ණායකයන්ට අනුකූල නොවන පරිදි නිල නිවාස ලබාදී තිබේද? එසේ ලබාදී ඇත්නම් කුමන සුවිශේෂී හේතුවක් මතද? ඒ කුමන අය සඳහාද? ඔවුන්ගේ නම් සහ තනතුරු මොනවද?

03. මොරටුව මහා නගර සභාව මඟින් 2026/07/01 වන දින වන විට නිල නිවාස ලබාදී ඇති දැනට පදිංචි වී සිටින අයවල්න්ගේ නම් සහ තනතුරු සහ ඔවුන් දැනට සේවය කරනු ලබන දෙපාර්තමේන්තු මොනවද?

04. මොරටුව මහා නගර සභාව සතුව ඇති වෙනත් කාර්යයන් සඳහා යොදාගනු ලැබූ ස්ථාන වර්ථමානයේ නිල නිවාස බවට පත්කර තිබේද?
    I. ඉහත අංක 04 හි සඳහන් පරිදි එසේ නිල නිවාස බවට පත්කර ඇති ස්ථාන මොනවද?
    II. එම ස්ථාන මේ වන විට නිල නිවාස ලෙස භාවිතය සඳහා ලබාදී තිබේද?
    III. එසේ ලබාදී ඇත්නම් එම ලබාදී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන දෙපාර්තමේන්තු මොනවද?

05. මොරටුව මහා නගර සභාවේ තනි පුද්ගලයන් සඳහා භාවිතා කරනු ලබන නිල නිවාස තිබේද?
    I. ඉහත පරිදි තනි පුද්ගල නිල නිවාස තිබේනම් ඒවා ලබා දී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවද?
    II. එම තනි පුද්ගල නිවාස ලබා දී ඇත්නම් එසේ ලබා දී ඇති අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවද?

06. මොරටුව මහා නගර සභාව මඟින් ලබා දී ඇති නිල නිවාස සඳහා මාසික ගාස්තුවක් අයකරනු ලබන්නේද?
    I. එසේ ගාස්තුවක් අයකරනු ලබන්නේ නම් එම ගාස්තු තීරණය කරනු ලබන්නේ කෙසේද?
    II. ලබාදී ඇති සියලුම නිල නිවාස සඳහා මේ වනවිට මාසිකව අයකරනු ලබන ගාස්තුව පදිංචිකරුවන් විසින් ගෙවනු ලබන්නේද?
    III. මොරටුව මහා නගර සභාවේ කුමන හෝ ස්ථානයක් නිල නිවාසයක් ලෙස භාවිතා කරමින් මාසිකව සභාව වෙත ගෙවිය යුතු ගාස්තුව නොගෙවන අය සිටීද? එසේ නොගෙවීමට හේතු මොනවද? එසේ නොගෙවන්නේනම් එම අයගේ නම්, තනතුරු සහ සේවය කරනු ලබන ස්ථාන මොනවාද?

07. මොරටුව මහා නගර සභාව මඟින් ලබාදී ඇති නිල නිවාසයක තනියම වාසය කරන බව සභාව දැනුවත් කර තිබියදී එම නිල නිවාසය වෙත වෙනත් අය අවේලාවේ ගෙන්වා ගැනීඹට සභාවෙන් අවසර තිබේද?

08. මොරටුව මහා නගර සභාව මඟින් ලබාදී ඇති නිල නිවාස සඳහා ගමන් කිරීමට සභාවේ වාහන සංචිතයේ වාහන භාවිතා කිරීමට හැකියාවක් පවතීද?
    I. එසේ හැකියාවක් පවතීනම් ඒ කුමන තනතුරු දරණ අයවලුන්ටද?

II. නිල නිවාස සඳහා යැමට දැනට වාහන භාවිතා කරනු ලබන අයවලුන් මොරටුව මහා නගර සභාවේ සිටීද? එසේ නම් එම අයගේ නම්, තනතුරු සහ සේවා ස්ථාන මොනවාද?

## 05. <u>යෝජනා :-</u>

**05(01) මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මොරටුව මහා නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ කටුබැද්ද කලාපයේ සේවකයන්ගේ පැමිණීම සහ පිටවීම සලකනු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කලද මොරටුව මහා නගර සභාව මඟින් පාලනය වන සෞඛ්‍ය කලාප වලසේවක පැමිණීම සහ පිටවීම සටහන් කිරීමේදී සියළුදෙනාම නොවුනත් සමහර ප්‍රධාන පරිපාලකවරුන් සහ සෞඛ්‍ය කම්කරු තනතුරේ සිටියදී විවිධ හේතුන් මත වැඩබලන පරිපාලක තනතුරු ලබාගත් සමහර පුද්ගලයින් විසින් වංචා සහ අක්‍රමිකතා කරන බවට සාක්ෂි සහිතව දිගින් දිගටම පැමිණිලි ලැබෙන බැවින් සහ මේ පිළිබඳව අභ්‍යන්තර විගණන අංශයට පැමිණිලි කලද ඔවුන් විසින් ලබාදෙනු ලබන නිර්දේශයන් ඉදිරි කටයුතු සඳහා නාගරික කොමසාරිස්වරියට භාර දුන්නද නාගරික කොමසාරිස්වරිය ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා උදාහරණ වශයෙන් කොරළවැල්ල කලාපයේ ප්‍රධාන පරිපාලක වංචා සහගත ලෙස සේවකයන්ගේ පැමිණීමේ ලේඛණය වෙනස් කර ටිපෙක්ස් කිරීම වාර්ථාව කොමසාරිස්වරියට යොමුකලද එයට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන හමස්පෙට්ටියේ දමා ඇත. මේ හේතුව නිසා දූෂණ හා වංචා රාශියක් සිදුවන බැවින් කඩිනමින් තවමත් ඇඟිලි සලකුණු යන්ත්‍ර සවි නොකරන ලද සෞඛ්‍ය කලාප කාර්යාල සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකල යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව මම ඇත්තටම ඉදිරිපත් කළේ සමස්ථ සේවක ප්‍රජාවම මූලික කරගෙන තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙන්නේ. ඔබතුමන්ලා බලයට එනකොට පැහැදිලිව කිවුවා පොරොන්දු දුන්නා මේ අක්‍රමිකතා නැති කරනවා කියලා. හැබැයි මේ මොරටුව මහා නගර සභා ප්‍රධාන කාර්යාලයේ ඉන්න හැම සේවකයෙක්ම පැමිණීම සහ පිටවීම තමන්ගේ ඇඟිලි සළකුණ භාවිතා කරලා සටහන් කරනවා. හැබැයි අපේ නගර සභාවේ, දැන් උදාහරණයක් ප්‍රජාශාලා වල භාරකරුවන්, අපි කියමුකෝ කටුබැද්ද ප්‍රජාශාලාව මුරකරු පවා නගර සභාවට ඇවිල්ලා ඇඟිලි සලකුණ තියලා තමන්ගේ පැමිණීම සටහන් කරලා තමයි අදාළ තැනට වාර්තා කරන්නේ. ඒ ඉදිබැද්ද වුණත් එහෙමයි. කොරළවැල්ලේ එගොඩඋයන වුණත් එහෙමයි. හැබැයි මේ සමහර සෞඛ්‍ය කලාප වල සේවකයෝ ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරන්නේ නැහැ. මොකද හේතුව අපි කොච්චර කිවුවත් ඒ කලාප වලට ඇඟිලි සලකුණු යන්ත්‍රය සවි කරලා නැති නිසා විශාල අක්‍රමිකතාවයන් රාශියක් මේ වෙනකොට සිද්ද වෙනවා. අපි දන්නවා පහුගිය කාල සීමාව තුළ සමහර පරිපාලකවරුන් සේවකයන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කරලා එහෙම නැත්නම් අපි ව්‍යවහාරයේ භාවිතා වන ආම් නේවි භාවිතා කරලා මාසේ අන්තිමට ඔවුන්ගෙන් විශාල මුදලක් කප්පම් වශයෙන් ගන්න පරිපාලකවරුන් සැදී පැහැදි හිටියා. පහුගිය කාලෙත්

හිටියා. හැබැයි පහුගිය කාලේ හිටිය කට්ටිය සමහර පරිපාලකවරු තමවමත් තමන්ගේ ඒ ක්‍රියා කලාපය ඒ ආකාරයෙන්ම කරගෙන යනවා. එක කලාපයක විතරක් නෙවෙයි. මේ සමස්ථ කලාපයන්ගේ සමහර පරිපාලකවරු සමහර වෙලාවට සේවකයා එන්න ඕනේ උදේ 7න් ඉස්සරවෙලා. සේවකයා එන්නේ 8නුත් පස්සේ. ඇවිල්ලා අත්සන් කරන්නේ 6.30 සමහර වෙලාවට පරිපාලකවරයා එන්න ඕන උදේ 7න් ඉස්සරවෙලා. හැබැයි පරිපාලකවරයා එන්නෙත් 8නුත් පස්සේ ඇවිල්ලා අත්සන් කරන්නේ 6.30, 6.00 නතිනම් 7න් ඉස්සෙල්ලා වෙලාවක. සමහර වෙලාවට පරිපාලකවරු තමයි සේවකයින්ගේ පිටවීම අත්සන් කරන්නේ. කවදාවත් උදේ අත්සන් කරන සේවකයා සමහර සේවකයෝ හවස ඇවිල්ලා පොත අත්සන් කරන්නේ නැහැ. පරිපාලකවරයා තමයි ඒ අත්සන ගහන්නේ. එක්කෝ පරිපාලකවරයා අත්සන ගහනවා නැතිනම් පහුවදා උදේට තමයි පහුවදා උදේ පැමිණීම සහ පෙර දවසේ පිටවීම කියන දෙකම අත්සන් කරන්නේ පහුවදා උදේට. ඒ වගේ විශාල අක්‍රමිකතා රාශියක් අද වෙනකොට මේ කලාප ඇතුලේ සිද්ධ වෙනවා. ඒ නිසා විශාල අසාධාරණයක් මේ නගර සභා පරිශ්‍රයේ 8 පහුවුණොත් එහෙම සේවකයෙක් පැමිණෙන්න තමන්ගේ වෙලාව පහුවෙලා විනාඩි 3ක් 4ක් ගියොත් එක්කෝ ශෝර්ට් ලීව් එකක් එක්කෝ වරුවක්, එක්කෝ දවසම කපනවා. එහෙම තත්ත්වයක් එකම නගර සභාව තුළ එක පාර්ශවයකට එහෙම තත්ත්වයකුයි තව පාර්ශවයකට අත්සන් කරන්නේ නැති වුණත් සමහරු දවස් තුන හතර වැඩට එන්නේ නැහැ හැබැයි පරිපාලකවරයා චෙක් රෝලත් මාර්ක් කරනවා අත්සනත් ගහනවා කිසිම ප්‍රශ්ණයක් නැහැ. මාසේ අන්තිමට ඒ තමන්ට අවශ්‍ය සන්තෝෂම තමන්ට ලැබෙනවා සේවකයින්ගෙන්. ඒවගේ අසාධාරණකම් රාශියක් සිද්ධ වෙනවා මේ කලාප වල ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරන්නේ නැති නිසා ඒවා සම්බන්ධයෙන් සාක්ෂි පිටින් ඔප්පු කරත් ඔඩිට් එක, ඔඩිට් එකේ වාර්තා මොනද කියලවත් මොනාද වෙන්නේ කියලවත් අපි දන්නේ නැහැ. ඔඩිට් එකෙන් අපි ඇහුවාම ඔඩිට් එකෙන් කියනවා කොමසාරිස්තුමියට වාර්තාව දැම්මා කියනවා. හැබැයි මේ දක්වා ඒ ඉදිරිපත් කරපු එක පැමිණිල්ලකටවත් කොමසාරිස්තුමියගේ එහා පැත්තට ඒ කියන්නේ එතුමිය මොන ප්‍රතිචාර දැක්වුවාද කියලවත් අපි දැනුවත් වෙන්නේ නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේ ඇඟිලි සලකුණු යන්ත්‍රයකට මහ ලොකු ගාණක් යන්නේ නැහැ. ඒ නිසා මේ හැම සේවකයාටම එක හා සමානතාවය තියෙන්න ඕන. ඒ නිසා කරුණාකරලා අපි කියන්නේ මේ කලාප වලටත් හැම කලාපෙකටම ඇඟිලි සලකුණු දානකොට ඒ කලාපය අවට අපේ සේවකයෝ පුස්තකාල වල ඉන්න සේවකයෝ වෙන්න පුලුවන්, සායන වල ඉන්න සේවකයෝ වෙන්න පුලුවන් ඒ සේවකයෝ සියලු දෙනාම ආවරණය වෙන විදියට මොරටුව මහා නගර සභාවේ සේවය කරනවානම් ඒ සේවය කරන හැම සේවකයෙකුටම ඇඟිලි සලකුණු යන්ත්‍ර අනිවාර්ය කරන්න. අන්න ඒ තුලින් පුලුවන් අපේ නගර සභාවේ මේ ආම් සහ නේවි කියන සංකල්පය මත වැජබෙන පිරිස් අයින් කරන්න. සමහර වෙලාවට පරිපාලකවරු අත්සන ගහන්නේ තමන්ට ඕන වෙලාවට ගිහිල්ලා හැබැයි ත්‍රීවිල් එක දුවනවා. ඔබතුමා දුන් නිලධාරියෙකු යැවුවොත් එහෙම ජුබිලි එක ගාවට දැන් මේ මොහොතේ ජුබිලි එක ගාව අපේ වැඩ බලන පරිපාලකවරු තුන් හතර දෙනෙක්ම ත්‍රීවිල් දුවනවා. ඒ ජුබිලි එක ගාව කිවුවේ මම උදාහරණයක්. මොරටුවේ ත්‍රීවීල් ස්ටෑන්ඩ් ටික උදේට බලාගෙන ගියොත් එහෙම අපේ පරිපාලක මහත්වරු, සේවක මහත්වරු විශාල ප්‍රමාණයක් තමන්ගේ අත්සන යොදලා එහෙම නැතිනම් කාඩ් එක ගහලා ත්‍රීවිල් දුවන එක තවම කරනවා. ඒ නිසා අපි කියන්නේ මේක කවුරු වුණ, ඔබතුමා නගරාධිපතිවරයා වුණත් වෙන කවුරුහරි නගරාධිපතිවරයා වුණත් මේවා කරන්න දෙන්න බැහැ මොකද හේතුව මේ පොදු මහජනතාවගේ මුදල් වලින් තමයි මේ වැටුප් ගෙවන්නේ. මේ වැටුප් ගෙවන එක මහා සංඝික දේපළක්. ඒ නිසා මේ වැටුප් පොදු ජනතාව ගෙවන බදු මුදල්, වැටුප් වශයෙන් අරගෙන රැකියාවට ඇවිල්ලා රැකියාව කරන්නේ නැතුව තමන්ගේ දේවල්

කරගන්න අවස්ථාව ලබා දෙන්න බැහැ. ඒ නිසා අපි බොහෝම ගෞරවයෙන් මේ යෝජනාව අපි දාන්නේ එක පාලනයක් නෙවෙයි මොන පාලනය ආවත් මේ දේවල් නතර කළේ නැතිනම් මේ නගර සභාව අයාලේ යාමක් තමයි වෙන්නේ. ඒ නිසා කරුණාකරලා මේ තියෙන ගැටලුවට විසඳුමක්නම් අනිවාර්යෙන්ම මේ සැම දෙනාම ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කරන්නට ඕන. හැබැයි ඇඟිලි සලකුණු යන්ත්‍රය දැම්ම පමණින් මේ සියලු ප්‍රශ්ණ විසඳෙන්නේ නැහැ. අධීක්ෂණයක් මේ කලාප වල විශේෂයෙන් පරිපාලකවරුන් මොනවාද කරන්නේ කියලා අධීක්ෂණය කරන්න ඕන. සේවකයෝ ටිකනම් ගිහිල්ලා වැඩ කරනවා. කම්කරු සේවකයාට කිවුවාම එහෙම නැතිනම් පාර අතුගාන කෙනාට කිවුවාම ගිහිල්ලා වැඩ කරන්න කියලා ඒ මනුස්සයා ගිහිල්ලා වැඩ කරනවා. හැබැයි ප්‍රධාන ප්‍රශ්ණය තියෙන්නේ මේ වැඩ බලන පත්වීම් ගහපු පරිපාලකවරු රාශියක් ඉන්නවා. මේ වැඩ බලන පත්වීම් ගහපු පරිපාලකවරු තමන්ගේ රාජකාරිය කරන්නේ මේ අතේ ඇඟිලි ගානටත් වඩා අඩු සංඛ්‍යාවක් තමයි තමන්ගේ රාජකාරිය හරියට කරන්නේ. ඒ නිසා මේවායින් වෙන්නේ මේ නගර සභාවේ මුදල් විශාල වශයෙන් නාස්තියක් වෙන එක. අපි සේවකයෝ පිළිබඳ, අපි සේවකයින්ගේ ප්‍රශ්ණ ආවාම අපි කතා කරනවා. හැබැයි අනෙක් පැත්තෙන් අසාධාරණකම් සේවකයෙකුට එක විදියකටත් තව සේවකයෙකුට තව විදියකටත් සලකන්න බැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා සමහර වෙලාවට මේ දවස් තුන හතර ගෙදර ඉදලා, දැන් ඔබතුමා අත්සන් ලේඛනය අරගෙන බැලුවොත් එහෙම ඔබතුමාට පැහැදිලි වෙයි උදේට ගහන අත්සන නෙවෙයි හවසට ගහලා තියෙන්නේ. උදේට අත්සන ගහන්නේ සේවකයා හවසට අත්සන ගහන්නේ ප්‍රධාන පරිපාලකවරයා. උදාහරණ දෙන්න පුලුවන් ඕනතරම්. ඒ උදාහරණ දීලා තියෙනවා ඔඩිට් එකට. ඔඩිට් එකේ පරීක්ෂණ යනවා හැබැයි මේ දක්වා කිසිදු පිළිවෙලක් නැහැ. ඒ නිසා අපි බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා මේ සේවකයින්ට, අපි දකිනවා සමහර වෙලාවට උදේ ඔබතුමා කොඩිය උස්සනවා මෙතැන අනේ අර සේවකයෝ නිම්හිම් නැතුව ලබාගෙන ඉන්නවා කොඩිය උස්සලා ජාතික ගීය ඉවර වෙනකන් එතැන ඉදන් මෙතනට දුවගෙන එන්න. අරෙහේ ඉදලා දුවගෙන ඇවිල්ලා ගේට්ටුව ළඟ හති අරිනවා. එහෙම දෙයක් තියෙනවා. ඉතින් ඒ නිසා මේ හැමදෙනාටම එකම විසඳුමක් තියෙන්නට ඕන. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා කරුණාකරලා මේ තැන් වලට නිසි අධීක්ෂණයක් සහ ඇඟිලි සළකුණු යන්ත්‍ර දාලා මේ ක්‍රමවේදය හදන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. හේතුව ඔබතුමා නගරාධිපති වෙලා හිටියත් වෙන කවුරුහරි නගරාධිපති වුණත් මේක ඉතාමත් අවශ්‍ය දෙයක් මේක කළේ නැතිනම් නගර සභාවේ විනය හදන්න බැහැයි කියන එක පැහැදිලිව කියනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුජිත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කතා කරනකොට සේවකයින් සම්බන්ධයෙන් මටත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න. මොකද මේ දවස් වල ඔබතුමන්ලා විශේෂ ඩෙංගු ව්‍යාපෘතියක් පවත්වාගෙන යනවා. ඇත්තටම හොඳ දෙයක් මොකද ඩෙංගු රෝගය මම හිතන්නේ ඉතා සීඝ්‍ර ලෙස මොරටුවේ පැතිරිලා තිබුණා. ඒක යම් තරමකට පාලනය වෙලා තියෙනවා. ඇත්තටම ඔබතුමන්ලාගේ ඒ වැඩපිළිවෙල පිළිබඳව මම හදවතින්ම සුබ පතනවා. ඒක තමයි වෙන්න ඕන. අපි හැමදාම සභාව තුළ කතා කරන්නේත් ඔක තමයි. අපිට ඕන මේ බල ප්‍රදේශය ඉතාමත් පිරිසිදු නිරෝගීමත් විදියට මිනිස්සු ජීවත් වෙනවා බලන්න. හැබැයි ඒ වෙනකොට ගරු නගරාධිපතිතුමනි, මෙතුමා මේ සේවකයින්ට වෙන හානිය ගැන කතා කරනකොට අපිටත් ඒවගේ දේවල් දැනිලා තියෙනවා මොකද මේ විශේෂ ඩෙංගු ව්‍යාපෘතිය කරනකොට සුළු සේවකයින්ට යම් විදියකට අසාධාරණයක් සිද්ධ වෙලා තියෙනවා.

ඊට හේතුව තමයි මීට දින කිහිපයකදී මම හිතන්නේ අපේ රංගන මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයෙදී ද කොහෙද ඩෙංගු ව්‍යාපෘතිය සිදුවන අවස්ථාවේ සුළු සේවිකාවන් හතර දෙනෙකුට යන්න ප්‍රවාහන පහසුකම් තිබිලා නැහැ. හැබැයි ඒ අය බස් එකේ තමයි සේවයට වාර්තා කරන්නේ. හැබැයි ඒගොල්ලන්ට දෛනිකව කරන්න තියෙන වැඩ ටිකක් තියෙනවා. හැබැයි එදා දිනයේ ඒගොල්ලන් ඒගොලන්ගේ අදහස් ප්‍රකාශ කළාම අපට යන්න විදියක් නැහැයි කියලා එතැන හිටිය ප්‍රබල මන්ත්‍රීවරයෙක් කමිටු සභාපතිවරයෙක් මේ කාන්තාවන්ට කියලා තියෙනවා එහෙනම් නම කපාගෙන ගෙදර යන්න කිව්වලු මේ කාන්තාවෝ එහතර දෙනාට. අන්න කමිටු සභාපතිවරයා මේ සේවකයෝ ගැන බලලා තියෙන විදිය. මේ සංවේදීව කතා කරන තමුන්නාන්සේලා සේවකයෝ සතුටින් ඉන්න ඕනැයි කියලා තමුන්නාන්සේලා, ඒ කාන්තාවෝ හතරදෙනාට මෙන්න මේ විදියට තමයි කියලා තියෙන්නේ යන්න විදියක් නැතිනම් නම කපාගෙන ගෙදර යන්න කිව්වලු. හැබැයි එතකොට එතැන හිටපු අපේම සේවකයෝ මම හිත්තනේ ඒ හතර දෙනාවම ඔවුන්ගේ ත්‍රීවිල් එකක් දාගෙන ගිහිල්ලා තමයි එදා දවසේ රැකියාව කරලා තියෙන්නේ. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, මීට වඩා සංවේදී වෙන්න. හැමදාම මේක වෙන්නේ නැහැ. මොකද ඒ අයට යන්න පහසුකම් දෙන්න ඕන නැහැ. අපි කියන්නේ නැහැ මේ සුළු සේවකයින්ට යන්න ප්‍රවාහන පහසුකම් දෙන්න ඕන කියලා. නමුත් ඒ වගේ අවස්ථාවක් ආවාම පොඩ්ඩක් සංවේදී වෙලා, අපිත් අපේ කාලේ කාර්මාන්තේ අය ට්‍රැක්ටර් එකේ ටිපර් එකේ යන්නේ. එහෙම යන අවස්ථාවල් තියෙනවා. ඒ විදියට සංවේදී වෙලා ඒ සුළු සේවකයින්ට එහෙම කතා කරන්නේ නැතුව තමුන්නාන්සේලාගේ ඒ කරුණාව ඒ සේවකයින්ට ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුජිත් පුෂ්පකුමාර මහතා දැක්වූ යෝජනාව සම්බන්ධව, ඇත්තටම මේක කාලීනව වැදගත් යෝජනාවක්. මීට පෙරත් අවස්ථා ගණනාවක මේ සභාවේම කියලා තියෙනවා මොකද අපි ඇත්තටම ආධුනික විදියට අපි මේ සභාවේ පරිපාලනය සම්බන්ධයෙන් ලොකු අත්දැකීමක් නැහැ. අහන්න ලැබෙන කාරණය තමයි සේවකයෝ එනවා ඇඟිලි සලකුණ තියනවා සේවකයෝ වෙන රස්සාවල් කරනවා කියලා. මම මීට කලිනුත් යෝජනා කළා පුලුවන්නම් ජංගම දුරකතනයක් වට්ස්අප් වීඩියෝස් සහිතව ජංගම දුරකථන අංකයක් හඳුන්වලා දෙන්න ඔබතුමලා නගර සභාවට. ඒක ප්‍රසිද්ධ කරන්න නගර සභා වෙබ්අඩවිය සහ මේ දැන්වීම් පුවරු වල. අපිට හැකියාව තියෙනවා සාක්ෂි ඕනතරම් එවන්න. සුජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ දැනටත් ඔය වගේ වැඩ කරනවානම්, මම දන්නේ නැහැ ඔබතුමාලා නාස්තිය හොරකම දූෂණය නැති කරන්නනේ ආවේ. එක අතකින් මට හිතෙනවා සමහර වෙලාවට ඔබතුමන්ලා භය ද දන්නේ නැහැ මේ සේවකයින්ට විරුද්ධව ඔබතුමාලා නීත්‍යානුකූලව පියවර ගත්තාම නගර සභාවේ අදාළ සේවාවන් ලබා නොදීම තුලින් නගර සභාව යම් ආකාරයකින් කඩා වැටීමක් සිද්ධ වෙනවා. අපි සම්පූර්ණ සහයෝගය දෙනවා ඔබතුමාට, අපි මුලදි ම කිව්වා අපි ඔබතුමන්ලා ගේන හොඳ යෝජනා ඕනම යෝජනාවකට අපි අත් දෙකම උස්සලා සහයෝගය දෙනවා. මම දන්නවා ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ විශාල පිරිසක් ඉන්නවා ඔයගොල්ලෝ උනන්දුවෙන් ඉන්නවා අපි දන්නවා. අපිට රට හදන්න බැහැ. හැබැයි අඩතරමේ මොරටුව ප්‍රදේශය, මොරටුව මහා නගර සභාව හදන්න ඕන. එතකොට මගේ පුද්ගලික අදහස මේ කවුරු මොන දේශාපලන බලවේග ආවත් මේ මොන දේශාපලන කණ්ඩායම් ආවත් හොරු ඉන්නවා. හොරු අඩු වැඩි වශයෙන් ඕන දේශපාලන කණ්ඩායමකම ඉන්නවා. හැබැයි මේ හෝරු රකින්නේ මේ නිශ්ශබ්දතාවය තමයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අඩුගානේ ජංගම දුරකථන අංකයක් හඳුන්වලා දෙන්න. සමහරවිට මෙතනත් ඇති හොරකම් වලින් පගාගන්න අය, සුජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ කප්පම් ගන්න අය. හැබැයි අපිට ඒකට වැට බඳින්න බැරි අපි මේ කතා කරන

සියල්ල මේ හොරකම් කරන පගාගන්න කප්පම් ගන්න මේ වෙලාවට අත්සන් කරන්නේ නැති මේ සියලු දෙනා දන්නවා. එතකොට ඒගොල්ලන් කල්පනා කරනවා මේ කතා කරන අයව නිහඬ කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,වැදගත් යෝජනාවක් කලක් තිස්සෙ ඉදලා මමත් බලන් හිටියා මේ වගේ පැමිණිල්ලක් ඉදිරිපත් වෙන්නෙ කොහොමද කියලා.ඒකට මම ස්තූති වන්ත වෙනවා.මේ යෝජනාවෙ අපි දකින්නෙ පරිපාලනයේ දුර්වලතාවය ගැන.සේවක මඩුල්ලෙ හොද කට්ටියක් ඉන්නවා.ඒ වගේම කීප දෙනෙක් ඉන්නවා වැරදි කරන සේවකයො.ඒ නිසා අපි අවධානය යොමු කරලා අපිට ආදායම් ලැබෙන මාර්ගයක් සහ නිවාඩු කාල වලට කපා හැරීම් නොකොට ඒ මිනිසුන්ට ඒ දීමනාවත් දෙන්න අපි ඉදිරිපත් වෙනවා.නමුත් ඒ පැමිණිල්ල සාක්ෂි සහිතව ඉදිරිපත් කරන්නෙ.ඒ නිසා මම හිතනවා ඉදිරියේදී අපිට මේ සම්බන්ධව වාර්තාවක් ලබාදෙයි.නිදසුනක් හැටියට අපිට කියන්න ඕනා. මම කේ.ඩී.යූ හොස්පිටල් එකට ගිහිල්ලා ආපසු එන්න පික් මී එකක් කෝල් කරලා අමාරුවෙන් ඉන්න වෙලාවෙ පික් මී එකක් එනවා එකයි ගානකට.පික් මී එකට නගින්න යද්දි ඇහුවා කොහාටද දාලා තියෙන්නේ කියලා සොයිසාපුරට කිව්වම.නැග්ගම ආ මන්ත්‍රීතුමිය කියලා කිව්වා.මම බැලුවා කවුද මේ මම නොදන්න පික් මී එක කියලා බලනකොට නගර සභාවේ සේවකයෙක්.මම ඇහුවා ඔයා කොහෙද පික් මී දුවන්නෙ .මට කියනවා නැහැ මන්ත්‍රීතුමිය දෙකට ඩියුටි තියෙන්නෙ යමින් ගමන් ඔබතුමියව දාගෙන යනවා කිව්වා.මම කිව්වා එච්චර ආදරේද කියලා.මට තිබ්බා ඇවිල්ලා කියන්න මේ වගේ එකක් සිද්ද වෙනවා කියලා.නමුත් මම කිව්වෙ නැත්තෙ අපිට වාර්තාවක් ලැබෙන්නෙ නැහැ.ඉතින් කියලා ඇති වැඩකුත් නැහැ.ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච් සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා කරපු යෝජනාව සම්බන්ධයෙන් පාලක පක්ෂය විදියට කෙටි අදහසක් ඉදිරිපත් කරන්නයි අපි සූදානම.ඇත්තටම මේ යෝජනාව පිළිබද කිසිදු වාදයක් ගැටලුවක් නැහැ.මේක වෙන්න ඕන දෙයක්.ඊට පෙරත් මන්ත්‍රීතුමා අපි සේවකයන් කලාප වලට අනුයුක්ත කලාම අපි කොමසාරිස්තුමියත් එක්ක කතා කරලා සියලුම කලාප වලට යන්ත්‍ර සවිකරන්න කමිටු හරහා ක්‍රියාත්මක වුනා.අවසානයේ ප්‍රධාන ආයතනයට අනුයුක්ත කල නිසා ඒක එහෙමම නැවතුනා.අපි හිතනවා මේක නැවත ක්‍රියාත්මක කරන එක හොදයි.කලාප වලත් සැලකිය යුතු සේවකයන් ප්‍රමාණයක් වැඩ කරනවා. එතුමා සදහන් කරා වගේ ප්‍රජා ශාලාවල මාතෘ ශාලා වල, කලාප ඇතුලෙ සේවකයන් හත්අට දෙනෙක් රාජකාරී කරනවා.ඒ අය පිළිබද නිසි අධීක්ෂණයක් ඇත්තටම මෙතනට සිද්ද වෙන්නෙ නැහැ.එතුමා කියපු බොහෝ කාරනා ඇත්ත.හැබැයි සභාවේ දීර්ඝ කාලයක් තිස්සෙ සම්ප්‍රදායක් ලෙස තිබුන සිදුවීම්. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ පාලනය යටතේත් සැලකිය යුතු මට්ටමෙන් මේක සිද්ද වෙනවා.අපි උත්සාහයක් දරමින් ඉන්නවා මේක වෙනස් කරන්න.සැලකිය යුතු ප්‍රමාණයෙන් අපි නවත්තගෙනත් තියනවා.තවත් කණ්ඩායමක් ඉන්නවා මේක ඒ ආකාරයෙන්ම කරගෙන යන.එතුමා කිව්වා වගේ පැමිණිලි ගණනාවකුත් සදහන් කරලා තියනවා.පැමිණිලි වලට ඒ වරින්ම පරීක්ෂණ සිදුවුනාද කියන ගැටලුව අපිටත් තියෙනවා.යම් යම් අවස්ථාවකදී අපි සේවකයන් පිළිබද පැමිණිලි කරලා තියෙනවා.අපිට පැමිණිලි කරන්න වෙන්නෙ කොමසාරිස්තුමියට.එතුමිය තමයි මේකෙ පරිපාලන භාර නිලධාරියා.එතනින් එහාට සමහර කාරනාවලදී එතුමිය මැදිහත් වෙනවා.එතුමිය සෑහෙන උත්සාහ කරනවා.එතනින් එහාට සමහර කාරනා සම්බන්ධයෙන් අපිටත් ගැටලු තියනවා ගරු නගරාධිපතිතුමනි,අපිත් හිතනවා මේ ඇගිලි සලකුණු යන්ත්‍ර හැකි ඉක්මනින් මේ කලාප වලට

යොමු කරලා.ඒකෙන් විතරක් උත්තර හැදෙන්නෙ නැහැ.මෙතුම ඇවිල්ලා කිව්වා ඊ අටටත් ඇඟිලි සලකුණු තියනවා.දහයටත් ඇඟිලි සලකුණු තියනවා ගරු නගරාධිපතිතුමනි,මේකෙ පරිපාලන ගැටලුවක් තියනවා.මේ පරිපාලන ගැටලුව දේශපාලන අධිකාරියට තනියම මෙහෙයවන්න බැහැ.දේශපාලන අධිකාරිය ඉන්නෙ මේවා තීන්දු තීරණ ගන්න.අපි සභාවක් ලෙස තීරණ ගන්නවා.හැබැයි මේවා ක්‍රියාත්මක කරන්න,මේවා අධීක්ෂණය කරන්න තමයි මේ නිලධාරී කණ්ඩායම ඉන්නෙ ඒ නිසා මම නිලධාරීන්ට දෝෂාරෝපණය කරනව නෙමෙයි.හැබැයි අපි කවුරුත් එකතු වෙලා අපේ වගකීම මේ ආයතනයේ විනය මේ ආයතනයේ සේවකයන්ගේ සියලුම අයිතිවාසිකම් පවා මේ සියල්ල ලබාදීමට අපි හැමෝගෙම වගකීමක් තියනවා මේ ආයතනය පවත්වාගෙන යාමේදී.අපිට මීට වඩා දැඩි අධීක්ෂණයක් මේ ආයතනය තුල පවත්වාගෙන යන්න වෙයි කියන අදහස අපි ඉන්නවා.ඒ වගේම අපේ සේවකයෙක් නැතිවෙච්ච අවස්ථාව.මෙතන ඉන්නවා ආයතන ප්‍රධානීන්.අපි දකිනවා ගරු කොමසාරිස්තුමිය,ගරු ලේකම්තුමා.සමහර සේවකයො උදේ අටට ඇවිල්ලා වැඩට ඉදලා එක පාරට යනවා කොහෙහරි කවුරුත් දන්නෙ නැහැ. පිටවීමේ ලේඛනයක් නැහැ.මේ අය එන්නෙ වැඩ කරන්න.මේ යෝජනාවට කාරනයක් එකතු කරන්නෙ.අපි කවුරුත් දන්නෙ නැහැ සේවකයා වැටිලා කියලා.සේවකයා ඉදලා තියෙන්නෙ පාක් එක උඩ.යම්කිසි ස්ථානයකට සේවකයෙක් රාජකාරියට පිටපත්වුනාට පස්සෙ.ඒ ස්ථානයෙන් එහෙම සේවකයාට යන්න බැහැ.හැබැයි මේකෙ ගොඩක් අය එහෙම යනවා. ගිහිල්ලා ගැටලුවක් ,ප්‍රශ්නයක් වුනාම කවුද වගකියන්නෙ.වගකියන්න ඕන ඔබ ඇතුලු අප කණ්ඩායම.ඒක නිසා මේ තත්ත්වය වෙනස් කරන්න.පරිපාලන අධිකාරිය විදියට ඔබතුමියලත් අපිත් එකතු වෙලා හොද සාකච්ජාවක් මේ යෝජනාවත් පදනම් කරගෙන මේ සියලු කටයුතු කොහොමද නැවත සාමාන්‍ය තත්ත්වයට පත්කරගන්නෙ කියලා අපි සාකච්ජා කරලා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕන කියන අසහස මම ඉන්නවා.එහෙම නැතිවුනොත් මෙතුමන්ට විවේචන කරන්න පුලුවන්.අපි විවේචන ඇහුන්කම් දීලා බැනුම් අහගෙන ඉන්න පුලුවන්.පරිපාලන අධිකාරියෙනුත් ඉල්ලන්නෙ මේකට අදාල ක්‍රියාමාර්ග ඉක්මනට ගමු.අපි මේ යෝජනාවට එකගයි.කිසි ගැටලුවක් නැහැ.සමහර සේවකයන් පිළිබද අපිට තියෙන දැක්ම,අපි සොයා බලන විදිය අපි කථාබහ කරන විදිය සේවකයො දන්නවා.සමහර අවස්ථාවල යම් තත්ත්වයන් මතුවෙන්න පුලුවන් ඒ පීඩාකාරී තත්වයන් ඇතුලෙ.ඒවට උත්තර දෙන්න යන්නෙ නැහැ.අපි සේවකයොත් එක්ක ඉන්නෙ කොහොමද විශේෂයෙන් සෞඛ්‍ය කමිටුව විදියට අපි වැඩකරන්නෙ කොහොමද කියන එක ඒ සේවකයො ගොඩාක් අය දන්නවා.අපි හැමතිස්සෙම සේවකයො පැත්තෙ හැම තිස්සෙම හිටගන්නෙ.පහල සේවකයො විශාල මහන්සියක් දරනවා ගරු නගරධිපතිතුමනි,ඒ අයට අවශ්‍ය දේවල් දෙන්න අපි උත්සාහ දරනවා.සුජීත් මන්ත්‍රීතුමා කිව්වා වගේ වැඩ බලන පරිපාලකයො පනස් හතරදෙනෙක් ඉන්නවා.ඇත්තටම අපි දන්නෙ නැහැ මොනවද කරන්නෙ කියලා.ගැටලුවක් තියනවා.හෘර්ද සාක්ෂියට එකගව අපි ස්වයං විවේචනයක් කරන්න වෙනවා ගරු නගරාධිපතිතුමනි,වැඩ බලන පරිපාලකවරු කිහිපදෙනයි තමන්ගෙ රාජකාරිය හරියට කරන්නෙ.මෙතුමා කිව්වා වගේ හරියට කරන්නෙ.ඒවා අපි හදාගන්න ඕනා.අපි පාලන බලයට ඇවිල්ලා අවුරුද්දක් වෙනවා.අපි විශ්වාස කරන්නෙ නැහැ ගරු නගරාධිපතිතුමනි,එක රයකින් එක අවුරුද්දකින් සියල්ල සමස්තය වෙනස් කරලා විනයානුකූල සභාවක් අපිට හදන්න පුලුවන් වෙයි කියලා.අවුරුදු ගණනාවක් මේවායෙ දේශපාලන මැදිහත්වීම් ඇතුලේ මේ දේශපාලන රිකවරණය ඇතුලෙ කරපු දේවල් වල ප්‍රතිඵලය මේ තාම තියෙන්නෙ.ඒවා වෙනස් කරන්න ලේසි නැහැ.අපි වෙනස් කරනවා ගරු නගරාධිපතිතුමනි,කවුරු අපිත් එක්ක තරහවුනත් වෙනස් කරන්න අපි උත්සාහ කරනවා.හැබැයි ඒ වෙනස් කිරීමේදී සේවකයන්ගෙ අයිතිවාසිකම් සේවකයින්ගේ අවශ්‍යතා ගැන සැලකිල්ලට ලක්කරමින් තමයි අපි

මේ සියල්ල කරන්නෙ.ඔබතුමත් ඉතාම නම්‍යශීලී පුද්ගලයෙක්.හැම වෙලාවෙම ඕනම සේවකයෙක් ඔබතුමා ගාවට ආවොත් හොදින් ඇහුම්කන් දීලා ඒ අයගෙ ප්‍රශ්න නිරාකරණය කරන්න මැදිහත් වෙනවා.අපිත් ඒවට උත්තර දෙන්න උත්සාහ කරනවා.මේ යෝජනාව ඉක්මණින් ක්‍රියාත්මක කරමු ක්‍රියාත්මක කිරීම ඇතුලෙ හොද අධීක්ෂණයකින් සභාවේ සේවාවන් මීට වැඩිය කාර්යක්ෂමව පවත්වාගෙන යන්න අපි කවුරුත් උත්සාහ කරමු යන යෝජනාව කරමින් මම නිහඩ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා සභාව පැත්තෙන් හිතලා ගෙනාපු යෝජනාව සාර්ථක යෝජනාවක්.සුදේශ් මන්ත්‍රීතුමා කිව්වා පහුගිය කාලයෙත් මේ වගේ දේවල් තිබ්බා කියලා.අපිත් විවේචනය කරා.මේකට විදිමත් පියවරක් ගන්න ඕන කියන තැන තමයි අපි ඉන්නෙ.ඔබතුමාලා බලයට පැමිණියාට පස්සෙ මූලික ආරම්භය මූලික මාස කීපය තුල යම්කිසි සාධනීය තත්ත්වයක් තිබ්බා මේකට වැටක් බදින්න.නමුත් දැන් මේක ගිලිහිලා තියෙනවා කියන එකයි මගේ පෞද්ගලික හැගීම.ඕනම තැනක වැඩ කරන්න ඉන්නෙ එක්කෙනයි දෙන්නයි.ඒ මිනිස්සු තමයි බර අදින්නෙ.අත්සන් කරලා වෙන රාජකාරී වල නියැලෙන පුද්ගලයො ගොඩාක් ඉන්නවා.ඔඩිට් එකෙන් ඇල්ලුවාම බොරු කියලා බේරෙනවා.මම කියන්නෙ හොදම දේ බයක් ඇති කරන්න. එක්කෙනෙක් දෙන්නෙක් අල්ලගන්න දඩුවමක් දෙන්න.මේක ඉබේම හැදෙයි.නැත්නම් මේක ක්‍රියාත්මක වෙන්නෙ නැහැ.මොනවා කරත් වැඩක් වෙන්නෙ නැහැ.ඉස්සරනම් අපි දැක්කෙ සෞඛ්‍ය කම්කරුවො කුණු ටිකක් එකතු කරන්න ගියාම නත්තලකට සිංහල අවුරුද්දට මොනවා හරි සන්තෝසමක් ඒ ගෙවල් වලින් ලබාදෙනවා.දැන් කුණු අදිනකොට දෛනිකව ඒ දෙවල් බලාපොරොත්තු වෙනවා.සමහරක් වෙලාවට අපේ ගෙවල් ලග තියෙන කාණුව සුද්ද කරන්න ආවම එහෙම දේවල් බලාපොරොත්තු වෙනවා.ඒ අය වැටුපක් ගන්නවානම් ඒ වැටුපට සරිලන රාජකාරියක් කරන්න ඕනා.ඒක නිසා විදිමත් වැඩපිළිවෙලකට අවතීර්ත වෙන්න.අපිත් අත්දෙක උස්සලා සහයෝගය ලබාදෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,විපක්ෂයේ පැත්තෙන් ආණ්ඩුපක්ෂයට සහයක් විදියට ආණ්ඩුවත් විපක්ෂයත් එකතු වෙලා උත්තර හොයන්න ඕන කාරනාවකට හොද සංසිද්ධානයකට ඇවිල්ලා තියෙනවා.මේ නගරයේ ප්‍රථම පුරවැසියා විදියට ඔබතුමා සීට් එකේ ඉන්නවා.ආණ්ඩුපක්ෂයක් විපක්ෂයක් කියලා බෙදලා තිබුනාට මහා නගර සභා ආඥා පනතට අනුව අපේ මහජන නියෝජිත වගකීම තමයි අපිට තියෙන්නෙ.නගර සභාවක් විදියට වැඩකරද්දි නගර සභාව තුල මල් පැල වගේම වල් පැලත් තියෙන්න පුලුවන්.පක්ෂයක් විදියට අපිට කියන්න බැහැ අපේ පක්ෂයේ විතරයි හොද මිනිස්සු ඉන්නෙ කියලා.සමහර වෙලාවට අපේ ජීවිත රටාවක් සකස් වෙන්නෙ අපේ තිබ්ච්ච අධ්‍යාත්මික ආගමික පසුබිමත් එක්ක.සමහර විටක නගර සභාව තුලම අර කියපු පිරිස ඉන්න අතරෙ ඔබතුමත් දන්නවා වේයන්ගොඩ ස්ටේෂන් එකෙන් නැගලා මොරටුවෙන් බැහැලා නගර සභාවේ වැඩ කරලා දශමෙට ඉවර කරලා මොරටුව ස්ටේෂන් එකට ගිහිල්ලා නැවත වේයන්ගොඩට යන සේවකයෙක් ඉන්නවා.ඒ හොදින් වැඩ කරන මල් පැලයක්.ඒ එක්කම තවත් සේවකයෙක් ඉන්නවා නගරාධිපතිතුමනි,අපි පින්නවල යන්නෙ අවුරුදු ගානකට පස්සෙ අලි බලන්න.පින්නවල අලි අනාථාගාරයේ ඉදලා කෝච්චියේ නැගලා මොරටුව මහා නගර සභාවට ඇවිල්ලා ආයෙමත් වැඩේ ඉවර කරලා පැය තුනහතරක් නැවත පින්නවලට යන සේවකයෙක් ඉන්නවා මෙහේ තමන්ගෙ කාර්යභාරය ඉෂ්ඨ කරන.හැබැයි තවත් සේවකයො ඉන්න පුලුවන් එගොඩඋයන, කටුකුරුන්ද අවට ඉන්න මිනින්සු තමන්ගේ ඇගිලි සලකුණ ගහලා පික් මී දුවන

උඃබර් දුවන.අපිට අවශ්‍ය වෙන්නෙ මේ නගර සභාවට සිස්ටම් එකක්.ඒ නිසා අපිට අපිත් එක්ක හොරු නැහැ කියනවට වඩා අපිට හොරු ඉන්න පුලුවන්.මේ සිස්ටම් එක ඇතුලෙ හොරාටත් හොරකම් කරන්න බැරි සිස්ටම් එකක් ඕනා.ඒ නිසා තමයි තිස්හතර දහක ජන වරමක් ඔබට ලැබුනේ.මේ ජන වරම යම් විදියකින් ප්‍රශ්නාර්ථයකට බඳුන් වුනොත් එහෙම ඒ බඳුන් වෙන්නෙ මාලිමාවේ ජන වරම විතරක් නෙමෙයි ඒ සමස්ත සංකල්පයම.යහපාලන ආණ්ඩුව කාලෙ ආව යහපාලන සංකල්පය.හැබැයි හොදට වැඩ කරන අතර වාරයේදී යම් විදියකින් මහා බැංකුවේ ප්‍රශ්නයක් ආවා.ඒ සල්ලි පියවුනත් යහපාලන සංකල්පය කියන ප්‍රශ්නයට සමස්තයටම පහර වැදුනා.හැබැයි ඊලගට එන ආණ්ඩුවකට නිවැරදි කරන්න බැහැ.අපි මේකට එකට එකතු වෙලා උත්තර හොයන්න ඕන වෙලාවක්.අපට ඕන මානව සම්පත් කළමනාකරණයේදී සේවකයෙක් බඳවාගන්නකොට අපි පුරප්පාඩු සකස් කරනවා.ලිස්ට් හදනවා.බඳවා ගැනීමේදී ඔවුන්ට දෙනවා රැකියා පිරිවිතරයක්.ඒකට අනුව ඔවුන්ගේ කාර්ය පවරනවා.මේ කාර්යපථය පවරන එකේදී සේවකයො හරියට වැඩ කරනවාද කියලා පසු විපරමක් අවශ්‍යයි.යම් විදියකින් මාස ගාන ඉවර වෙලා මේක කරන්න බැරිවුනොත් වැටෙන්නෙ ඔබතුමාවත් එහෙම නැත්නම් මාලිමා ආණ්ඩුව විතරක් නෙමෙයි මේ සංකල්පය.සංකල්පයට පහර වදින එක වලක්වන්න පක්ෂය විපක්ෂය එකතු වෙලා කටයුතු කිරීම වැදගත් වෙනවා.අටට වැඩට එන කෙනා දහයට ඇවිල්ලා අටට අත්සන දානවනම් ඒක වැරැද්දක්.මේ කාරනා ගනිද්දි හොදට වැඩ කරන මිනිස්සු විතරක් අපි තලා පෙලලා හංවඩු ගහනවා විතරයි.නරක මිනිස්සු ඕන තරම් ඉන්නවා.ඒක නිසා මේ සිස්ටම් එක සකස් කරගත යුතුව තිබෙනවා.සිස්ටම් එක හදන්න ඔබතුමාට විපක්ෂයෙන් යෝජනාවක් ඇවිල්ලා තියනවා.අපි එකතු වෙලා වැඩ කරමු.අපි ඩෙංගු වලදිත් එකතු වෙලා වැඩ කලා.මොරටුව නගර සභාව තීරණයක් ගත්තා ඩෙංගු වලදී අපි හැමෝටම දඩ ගහනවා උසාවි දානවා කියලා.මට එක්කෙනෙක් ඇවිල්ලා කිව්වා පුලුවන් නම් දඬේ නවත්තන්න කියලා.මම කිව්වා උසාවි දානවනම් හැමෝටම එකයි කියලා.යම් විදියකින් ඔබට ගෙවා ගන්න බැරිනම් මම මුදල් දෙන්නම්.පක්ෂ විපක්ෂ නෙමෙයි එකතු වෙලා වැරැද්දට එරෙහිව අපි වැඩ කලා. ඒක නිසා තීන්දු තීරණ ගනිද්දි ප්‍රතිපත්ති වලට අනුව ගන්න ඕනා.ඒක තමයි යුක්ති සහගත බව නගර සභාවක් විදියට මොරටුවේ ජනතාව බලාපොරොත්තු වෙන දේ.ඒ නිසා සිස්ටම් හදන්න අපි කටයුතු කරමු.එහෙම නැත්නම් අපි අතීතයටවත් අනාගතයටවත් දොස් කිය කිය ඉදලා වැඩක් නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා නගරාධිපතිවරයා විදියට මේ ගෙවිච්ච කෙටි කාලය ඇතුලෙ මේ ආපු යෝජනාව තමයි සභාවට ආපු වැදගත්ම යෝජනාව.මේ යෝජනාවේ තියනවා වැදගත් පැති කීපයක්.එකක් විපක්ෂය පැත්තෙන් සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා මේක ගෙන ඒම.එකක් පල කරන ලද අදහස් අනෙක පාලනය මූණදීලා තියෙන ප්‍රධානම ගැටලුව.ඔබ දන්නවා දීර්ඝ කාලයක් හුරුපුරුදු වෙච්ච රටාවන් වෙනස් කිරීම ලෙහෙසි පහසු නැහැ.කතා කරන යෝජනාවේ අන්තර්ගතය අප පමණක් නොවෙයි විශේෂයෙන් මොරටුවේ ජනතාව.සැලකිය යුතු ජනතාවට තිබෙන විවේචනය තමයි මොරටුව නගර සභා සේවකයො ඕනම වෙලාවක ඔවුන්ට බලාගන්න පුලුවන් විවිධ තැන්වල.ඒක සෑහෙන කාලයක් තුල මන්ත්‍රීවරයෙන් විදියට ඉන්නකොට විශේෂයෙන් මේ තත්ත්වය මතුකලා.අද නගරාධිපතිවරයා විදියට මම මේ තත්ත්වයට මූණ දෙනවා.මගේ පාලනයත් සභාවක් ලෙස ගත්තම ඔබ අපි හැමෝමත් මහජනයාගේ සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යන්න බැරිවීමේ එක ප්‍රබල හේතුවක් මේ සේවකයන් අදාල සේවයට යෙදවුවම ඒ යොදවන ලද සේවකයින්ගෙන් දහදෙනෙක් යෙදෙවුවොත් දෙන්නෙක් වැඩ.එහෙම තමයි මේ ගමන යන්නෙ.ඔබ දන්නවා අපි එක කඩඉමක් පසුකරා.මීට පෙර අපි විවේචන කරනකොට ඔවුන් රකින්න දේශපාලන බලයක් තිබුනා.හැබැයි අද මේ සභාවේ වැරදි කරන අය

රකින්න දේශපාලන බලයක් නැහැ.මහජනයාගේ මුදල් අපි සාංඝික ලෙස සලකන දේ. දෛනිකව බොහෝ වෙලාවට තනියෙන් කල්පනා කරනවා.කොච්චර වැරදිද මිනිසුන්ගෙ වැටුපත් අරගෙන වෙන ආදායමක් හොයන ගමන් පාලනයටත් ගහලා සභාවටත් ගහලා කොච්චර අශිෂ්ඨද.ක්‍රියාමාර්ග නොගත්තා ම නෙමෙයි.ක්‍රියාමාර්ග ගත්තා. අවස්ථා දෙක එක පිට පිට පැමිණිල්ලක් තිබිද්දි නැවත වහලෙන් බැහැලා හොරකම් කරපු මිනිහෙක්ගෙ වැඩ නැවැත්තුවම ඒ මිනිහව නැවත වැඩට ගන්න කියන ඉල්ලීම මන්ත්‍රීවරු කරා.අපට මේ මාර්ගයේ යන්න වෙලා තියෙන්නෙ.ඊයෙ පෙරේදා කෙනෙක් වැඩ නතර කලා.ඒ නතර කරපු කෙනා යම් විදියකට තහවරු කරගත්තා මත්ද්‍රව්‍ය විකුණනවා.වැඩ නතර කරා.ඔහු මැන් පවර් සේවකයෙක්.අදත් ඔහු රස්සාව ඉල්ලගෙන එනවා.ලිඛිත ඉල්ලීම දෙනවා.කුකුසක් ඇතිවෙනවානෙ.කාටවත් පුද්ගලිකව මේ කතන්දරේ කියන්නෙ නැහැ.දේශපාලනයක් නැහැ.සභාවේ සේවාවන් කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමේදී මුහුණ දී තියෙන ගැටලුවේ ප්‍රධානතම කැල්ලක්.එකක් සේවක ප්‍රමාණය සැලකිය යුතු පුරප්පාඩුවකට යන්නෙ.එකක් ඉන්න සේවකයො ටික කාර්යක්ෂම කරගන්න එක.අපි දන්නවා ඔවුන් කීයට ඇවිල්ලා අත්සන් කරත් දැන් අපි සභාවේ විදියට නිශ්චිත අතිකාල ප්‍රමාණයක් තීන්දු කරලා තියනවා.කීයට කාඩ් එක ගැහුවත් ඊට වැඩිය යන්න බැහැ.සමහර වෙලාවට සෞඛ්‍ය අංශයේ සේවකයො අතිෂය මහන්සියෙන් වැඩ කරන නිසා අපි පැය අටම ඉල්ලන්නෙ නැහැ.අපි ප්‍රශ්න කරන්නෙ නැහැ.ඉතාමත් මහන්සියෙන් රාජකාරි කටයුත්තක් කරන නිසා.ඒ නිසා අපි සභාවක් ලෙස යෝජනවාක් පදනම් කරගෙන අපි හැමෝම දන්න කියන මොරටුවේ ජනතාවත් දන්න අපෙන් ඉල්ලා හිටින පක්ෂ විපක්ෂ එකක් නොවෙයි සභාවේ මතු වෙච්ච සභාවේ යෝජනාවක්.මේ යෝජනාවට සාධාරණයක් ඉෂ්ඨ කිරීම කියන්නෙ මේ යෝජනාවෙ අන්තර්ගත වෙලා තියෙන කරුණු මත අප කෙසේ හෝ වඩාත් නිවැරදි ලෙස මේ සේවකයින් වැරදි ලෙස යොදා ගැනීම වැරදි ලෙස කටයුතු කරන එක නතර කරගැනීම.එය නගරාධිපතිවරයාට විතරක් තනියෙන් කල හැකි දෙයක් නොවේ.සභාවක් ලෙස අප කරමු.කිසිවෙක් අමනාප කරගත යුතු නැහැ.කිසිවෙකුට නරක වචනයෙන් අදවනතුරු බැනලා නැහැ.බනින්න හිතේ ඇත්තෙත් නැහැ.මිනිස්සු කවදහරි හැදෙනවා.තේරුම් ගන්නවා. අවබෝධ කරගන්නවා.හැබැයි ඔබ කියනවා වගේ තීන්දු ගත යුතුයි.තීන්දු ගනිද්දි ඔබ මාත් එක්ක ඉන්නවානම් එම තීන්දු නිවැරදි නම් ඔබට කවදාවත් දුකක් හිතෙන එකක් නැහැ.ඒ තීන්දු බහුතර කැමැත්ත මත ගත්ත තීන්දු.මේ යෝජනාව අනුව හෙට මේ තත්ත්වය වෙනස් කිරීම වෙනුවෙන් ඔබ පෙන්වා දෙන බොහෝ සිද්ධි ඇතුලෙ පැමිණිලි කරනවා.පැමිණිලි ඔඩිට් එකට යනවා.ඔඩිට් එක හරහා ඒක එතන එහෙම තමයි.මෙතනින් පනින්නයි ඕනා.නීතියක් තියනවා.නීතියට අදාල ප්‍රතිපාදන තියනවා.මේ හැම එකක්ම පාලනය කරන්න ආයතනයට අදාල සංග්‍රහය තියනවා.විවිධ නීති අණපනත් තියනවා.දැන් දේශපාලන අධිකාරිය විදියට සභා ගත වෙන්නෙ ඒවා ක්‍රියාත්මක කරවීම සඳහා අපි හැමෝම එකතුව කටයුතු කරන එක.ඉතිං මම හිතනවා මේ කාරනාව අපිට සැලකිය යුතුව බේරගන්න පුලුවන් වෙයි කියලා.සියයට සියයක් බැහැ.අපි වෙන වෙනමත් සාමූහිකවත් දන්නවානෙ.මේ යන මිනිස්සු නොදන්නවා නෙමෙයි.හැමෝම යන්නෙ නැහැ. යම් කාලෙක දේශපාලන බලයක් ආරෝපණය කරගත්තු පිරිසක්.ඇතුලෙත් ඉන්නවා.පොඩ්ඩක් එහෙට මෙහෙට කැරකෙනවා.කාර්යාල කාර්යාල සහයකට දන්නෙ නැහැ එයාගෙ වැඩේ.නිලධාරියම ෆයිල් එක අරගෙන එහාට මෙහෙට ගෙනියන්න ඕනා.පියන් නැහැ.මම කියන්නේ මේවාට වැට බදින්න හොදම අවස්ථාවක් මේ සම්මත කරන යෝජනාව මම නැවත නැවතත් ස්තුතිවන්ත වෙනවා.මට පුලුවන් උපරිම මහන්සියෙන් මේ කාර්යය ඔබේ සහයෝගයත් ඇතුලෙ ඉෂ්ඨ කරනවා.යෝජනාවට ස්තුතිවන්ත යෝජනාවට පක්ෂ වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම අපි ස්තූතිවන්ත වෙනවා ඔබතුමාට නගරාධිපතිවරයා හැටියට පවතින යතාර්ථය තේරුම් අරගෙන ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නට ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අපේ ස්තූතිය පුදකරනවා.මන්ත්‍රීවරු හොඳ තැනක ඉන්නවා.මේ වගේ යෝජනාවක් දානකොට මන්ත්‍රීවරු දෙපාරක් හිතනවා.මොකද හේතුව සේවකයන්ට විරුද්ධව යෝජනාවක් දැම්මම සේවකයො තරහ වෙනවා. හැබැයි අපි එකක් දැනගන්න ඕනා මෙතන ඉන්න මන්ත්‍රීවරු පනස් දෙදෙනාම වගකියන්නෙ සේවකයින්ට නෙමෙයි.අපි වගකියන්නෙ මොරටුවෙ ජනතාවට.අපිට මේකෙ ඉන්න සේවකයන්ව සතුටු කරලා සේවකයන්ට ප්‍රශස්ථි ගායනා කරන්නන අපට අවශ්‍යතාවයක් නැහැ. සේවකයො තමන්ගෙ ඩියුටි එක හරියට කරනවානම් අපි හැමෝම සේවකයොත එක්ක ඉන්නවා.ඒ නිසා සේවකයින්ව ඒ තත්ත්වයට පත්කරගන්න දේශපාලඥයො හැටියට අපි උපර්ම සහයෝගය දෙනවා.ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා නිලධාරීන් හැටියට මේ කාර්ය තේරුම් අරගෙන මොකද මේ සාංඝික දේපල තමයි අපි අතගාන්නෙ. සාංඝීක දේපල හරියට අතගෑවෙ නැත්තම් මරණෙන් පස්සෙ අපි යන්නෙ අපායට. ඒ සඳහා සුදේශ් මන්ත්‍රීතුමාට ස්තූති වන්ත වෙනවා. ඔබතුමාත් ඒ යෝජනාවට දැක්වූව සහයෝගය සම්බන්ධයෙන්. ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. නාගරික කොමසාරිස්තුමියට අපි විශේෂයෙන් මතක් කරනවා මේ සභාවේ අපි හැමෝම, ඔබතුමිය නාගරික කොමසාරිස්තුමිය නාගරික ලේකම්තුමා මේ ඉන්න නිලධාරීන් කොහෙද ඔබලා රාජකාරිය කරන්නේ කියලා ඇහුවාම කියන්නේ මොරටුවේ නගර සභාවේ කියලා කියන්නේ. අපි මහජන නියෝජිතයො කොහෙද කියලා ඇහුවාම නගර සභාවේ මන්ත්‍රීවරු කියලා කියන්නේ. එහෙනම් නගර සභාවේ සේවකයන්ගේ විනය සම්බන්ධයෙන් ඔබටයි මටයි හැමෝටම වගකීමක් තියනවා. සමහර වෙලාවට පහත් විදියට හැසිරෙන සේවිකාවො ඉන්නවා. ඒ සේවික සේවිකාවො ජන්දය දුන්නෙ කාටද ඒවා ගැන හිතන්නේ නැතුව හැමෝටම එක හැන්දෙන් බෙදන පාලනයක් ඇතිකරගත්තනම් අපිට මේ ගමන බොහොම හොඳින් යන්න පුලුවන්.ඒ නිසා එක්කෙනෙකුට එක නීතියකුත් තව කෙනෙකුට තව නීතියකුත් නැතුව හැමෝටම පොදුවේ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනා කියන ගෞරවනීය ඉල්ලීම නාගරික කොමසාරිස්තුමියගෙන් කරනවා.මේ යෝජනාව නැවත වරක් ඉදිරිපත් කරමින් නගරාධිපතිතුමාටත්,අදහස් දක්වන සියලුම විපක්ෂ නායකතුමන් ප්‍රධාන ඒ සියලුම මන්ත්‍රීවරුන්ටත් සියලුම ගෞරවය ස්තූතිය පුදකරනවා.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05(02)** **මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

ඉදිබැද්ද ධම්මාධාර ළමා උයන සහ පෙර පාසලේ පිහිටා තිබෙන සෙල්ලම් උයනේ ක්‍රීඩා භාණ්ඩ කලක පටන් කැඩී බිඳී ඇත. දරුවන් සෙල්ලම් කිරීමට හැකි අයුරින් ඒවා අළුත්වැඩියා කර සහ අවශ්‍ය ක්‍රීඩා උපකරණ සවි කොට සංවර්ධනය කර දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, පී. එම්. ශෙයාන් දුලිප් තිසේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,මේ පෙර පාසලේ ළමයින්ට සෙල්ලම් කිරීමට තිබෙන උපකරණ වල තත්ත්වය ඉතාමත් බාලයි.ඔන්විල්ලාවට යොදාගන්නෙ වඩු කර්මාන්තයට යොදා ගන්න කෝඩ්

නුලක්.ළමයින්ට අනතුරක් වුනොත් දෙමාපියන්ට තමයි කැක්කුම තියෙන්නේ.ලිස්සන බෝට්ටුවේ කකුල් දෙකෙන් එක කකුලක් කැඩිලා.ළමයෙක්ට සෙල්ලම් කිරීමට සුදුසු නැහැ.මාතෘ සායනයකුත් තියනවා.එහි එන්නත් කරන්න එන ළමයිනුත් මේකෙ සෙල්ලම් කරනවා.ළමයින්ට සෙල්ලම් කිරීමට උචිත විදියට මෙය සංවර්ධනය කර දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලන්නෙ.ඉතාමත් සානුකම්පිතව බලලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න.යෝජනාව ඉවත් කරන්නෙ නැතුව ඉක්මණින් ක්‍රියාත්මක කරන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,05(02) යෝජනාව ඉදිරි කටයුතු සඳහා  කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(03) මහා නගර සභා මන්ත්‍රී, එම්. ප්‍රියනාත් මැකන්සි මෙන්ඩිස් මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

මොරටුව වඩුමඩු හිමියන්හට කර්මාන්තය කරගෙන යාමේදී අසල්වැසි පැමිණිලි වලින් පොලිසිය උසාවි වලට යොමු කරන අතර, එය වලක්වාලමින් නගර සභාවට බදුගෙවන වඩු කාර්මිකයා හට මැදිහත්වී ප්‍රශ්ණය විසදා දිය යුතු යැයි ගරු සභාවට යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,වඩු කර්මාන්තය මේ නගරයේ ප්‍රධාන කර්මාන්තයක්.මෙතන ඉන්න මන්ත්‍රීවරුන් සහ ඔවුන්ගේ තාත්තලා වඩු කර්මාන්තයේ යෙදී සිටියා.මමත් වඩු කාර්මිකයෙක්.මම හිතනවා ඔබතුමත් යම්තාක් දුරට සම්බන්ධ වඩු කාර්මිකයෙක් කියලා.ගරු නගරාධිපතිතුමනි, අපිටත් යම් වගකීමක් තියනවා පැවතීගෙන ආව වඩු කර්මාන්තය ඉදිරියේදී යම්තාක් දුරකට ආරක්ෂා කරගැනීමට.ජනතාවගේ සුභ සිද්ධිය සදහා යම් යම් රජයන් නීති රීති ගේනවා.කාල වකවානුවලට අනුව කරන සාමාන්‍ය දෙයක්.නමුත් මොරටුවේ මහජන නියෝජිතයින් වශයෙන් අපිටත් වගකීමක් තියනවා.මේවා කොයි ආකාරයෙන්ද ආරක්ෂා කරගන්නෙ කොයි ආකාරයෙන්ද විසඳුම් දෙන්නෙ කියලා.2006 ඉඳලා නගර සභාව නියෝජනය කරපු පුද්ගලයකු හැටියට අපිත් යම් කරුණු කාරනාවලට මැදිහත් වුනා.නමුත් මම දන්නවා මීට පෙරත් හිටපු දේශපාලඥයින් මේ කර්මාන්තයට කොයි ආකාරයෙන්ද මැදිහත්වුනේ කියලා.එම නිසා ගරු නගරාධිපතිතුමනි මෑත කාලයේ වර්ෂයකට පමණ පෙර සිට පෙර නොවූ විරූ ප්‍රශ්න රාශියක් නැවත ඉස්මතු වෙමින් පැවතුනා.එනම් ශාන්ති අන්තෝනි පාරේ වතුර ටැංකිය අසල නිලංග කියන මහතෙක් මොරටුමුල්ලෙ ලීබඩු සාප්පුවක් කරගෙන යනවා.නමුත් ඒ අහල පහල එක්කෙනෙක් පොලිසියට පැමැණිල්ලක් කරලා පොලිසියෙන් උසාවියට දාලා දැන් නඩුවක් යනවා.එතුමා නිවැරදි කරු වෙලා නඩුව නොවැම්බර් මාසයට කල් ගියා.ඊට පස්සෙ ටැංකිය ගාවත් ප්‍රශ්නයක් සිදුවුනා.ඊට පසු මට දැනගන්න ලැබුනා ජූනි මාසයේ මම නගර සභාවට ඇවිල්ලා සතියක් විතර මට දැනගන්නට ලැබුනා මගේ ගෙවල් පැත්තෙ එනම් නගර සභා වත්තෙ මායිම්ව තියන නිවසක තරුණ ළමයෙක් එයා ණය වෙලා ඉඩමක් අරගෙන ණය වෙලා ගේත් හදාගෙන බොහොම අමාරුවෙන් ඒ කර්මාන්තය කරගෙන යන අතරතුර අල්ලපු නිවසින් පැමිණිල්ලක් දාලා තියනවා.පස්සෙ එතුමාටත් කියලා තියනවා මේක උසාව දාන්න ඕනා කියලා පස්සෙ මම පොලිසියේ ස්ථානාධිපතිවරයාට කතා කරලා මම කිව්වා එක පාරටම නඩු දාන්න යන්න එපා.සද්දය මනින්න අවස්ථාවක් දෙන්න මැනලා අවශ්‍ය කටයුතු අපි නීත්‍යානුකූලව කරමු කියලා.මම විශ්වාස

කරනවා.ඒක හින්දා වෙන්න ඇති ඒකට අවස්ථාව දීලා තියනවා.ඒ අතරතුරදි මම ලිපියක් අරගෙන ඔබතුමාට දුන්න විගස ඔබතුමත් මට සඳහන් කලේ කමිටුවන් පසුව මේක නිත්‍යානුකූලව පොලිසිය හරහා කරන්න කියලා කියපු නිසා තමයි මම යෝජනාව ඉදිරිපත් කෙරුවෙ.මේක සාකච්ඡා කරලා කරන්න පුලුවන් දෙයක්.ගරු නගරාධිපතිතුමනි,මේක මිනිසුන් අවුස්සලා ප්‍රශ්න වැඩි කරගන්න එක නෙමෙයි ප්‍රශ්න වලට විසඳුම්දීම තමයි කරන්න ඕනා.මේ වගේ ඕන හැටියෙ ප්‍රශ්න පසුගිය සභාවලට ඇවිල්ලා තියනවා. පී.එච්.අයි. හරහා කමිටුවලට ගෙන්නලා සාකච්ඡා කරලා විසඳුම් දීලා තියනවා. මේවා පොලිසියට ගිහිල්ලා කරන්න ඕනා දෙයක් නෙමෙයි. පොලිසියෙ සහයෝගෙත් අපි අරගෙන පොලිසය දැනුවත් කරලා.මේ වගේ ප්‍රශ්න ආවම සභාවට යොමු කරන්න කියලා.ඇගට අරගෙන කරන්න ඕනා ප්‍රශ්න.පසුගිය කාලෙ කලේ ඒකයි.වඩු කාර්මික ප්‍රශ්නය මේ ආකාරයෙන් විසඳුවොත් මටත් වඩු කාර්මිකයකු විදියට මේ ප්‍රශ්න උද්ගත වෙනවා.මොකද හේතුව මගේ වටේම තියෙන්නේ ලී මෝල් එහෙම නම් මටත් සිද්ද වෙනවා ලියුම් දෙන්න.එතකොට කී දෙනෙක් බඩ ගින්නේ ඉන්නාවද.ගරු නගරාධිපතිතුමනි,මේ ප්‍රශ්නෙ මේ ආකාරයෙන්උද්ගත වුනොත් මීට වඩා විශාල ප්‍රශ්නයක් ඇවිල්ලා ඔබතුමන්ලාට විශාල බලපෑමක් එල්ල වෙන්න පුලුවන්.මගේ අතේ තියනවා විශාල අත්සන් ලේඛණයක් මගේ ගමෙන් විතරක් මේ අත්සන් ලේඛණය අරගෙන ගියේ ඒ කුඩා ළමයා මිසක් නෙමෙයි.හැබැයි උවමනාව අත්සන අද ගිහිල්ලා ගත්තා. ඒ ඔයගොල්ලන්ගෙ පක්ෂය දිනවන්න ගෙයින් ගෙට ගිය ඒ වගේම යම් යම් පොරොන්දු දීලා ඡන්ද ගත්තු නගර සභාවේ ලසන්ත අයියා.එතුමත් අත්සන් කරනවා ඔබතුමන්ලාට බැන බැන.ගරු නගරාධිපතිතුමනි,මේ වඩු කර්මාන්තය හින්දා රැකෙන පවුල් ගණනාවක් තියනවා. අපි දන්නවා වඩු කාර්මිකයා හබ්බ කරලා තමයි ගෙදරට කන්න බොන්න,ළමයින් පාසල් යවන්න ඇඳුම් පැළඳුම් අරන්දෙන්නෙ.ඒ වලට මුදල් අවශ්‍ය වෙනවාද.මේ වගේ ප්‍රශ්න වලදි වගකිව යුතු සභාවක් හැටියට අපි කර ඇරියොතින් කාර්මිකයා කොහෙද නවතින්නෙ.මේ ප්‍රශ්නය මටත් තදින් බලපානවා. මොකද මම පහුගිය මාසෙම වගේ මේ නගර සභාවට ආවා.මේ ලැබෙන දීමනාවෙන් අපිට ජීවත් වෙන්න බැහැනෙ.අපි ගෙදර ගිහිල්ලා වැඩ කරන්න ඕනා.අපි ගිහිල්ලා හයට නැවැත්තුවොත් මොකද කරන්නෙ.මටත් ගෙදර ගිහිල්ලා ටිකක් රෑ වෙනකම් වැඩ කරන්න සිද්ද වෙනවා.මිනිසුන්ගෙ ප්‍රශ්න විසඳගන්න මිනිස්සු එලි වෙනකම් වැඩ කරන අවස්ථා තියනවා. අසනීපයක් වුනාම වඩු කාර්මිකයා හම්බ කරන මුදල් වලින් තමයි ඒ වලට වියදම් කරන්නෙ. ඔබතුමන්ලා රජය ගන්න කලින් පොරොන්දු දුන්නා.ආහාර වේලට බදු අය කරනවානම් මොකටද ඇහුවා රජයක්. ඊලගට බෙහෙත් වලට බදු ගහනවානම් රජයක් මොකටද ඇහුවා. අද අපිටත් සිද්ද වෙනවා මේවා අහන්න.වඩු කර්මාන්තය කියන දේ අපි ආරක්ෂා කරගත්තෙ නැත්නම් අපි කොපමණ ප්‍රශ්න වලට මුහුණ දෙනවාද.අපේ කාලෙදී මීට වඩා ප්‍රශ්න වලට අපි මුහුණ දුන්නා.දෙදහස් දෙකේ අවුරුද්දෙ ජී.එස්.බී බද්ද ගහපු අලුත නගරාධිපතිතුමාගෙන් ඇහුවා අපි සියලු දෙනාම එකතු වෙලා විරෝධතාවයක් කරන්න හදන්නෙ මොකද කියන්නෙ කියලා.මමත් කල්පනා කරලා බලනකොට ඇත්තටම මම කිව්වා ඔයගොල්ලන් ඕන දෙයක් කරගන්න මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ කියලා කිව්වා.එදා දවසේ කඩලාන හන්දියේදී වඩු කාර්මිකයන් ඒකරාශී කරගෙන විරෝධතාවයක් කෙරුවා.අපි මේක කඩාකප්පල් කෙරුවෙ නැහැ.සහයෝගය දුන්නා.අපි රජයක් වශයෙන් ජී.එස්.බි බද්ද පවා නිදහක් කරලා දුන්නා.එහෙම ප්‍රශ්න විසඳපු රජයක් තමයි අපේ රජය.ගරු නගරාධිපතිතුමනි,මම හිතනවා ඔබ මේ ප්‍රශ්නය අවබෝධ කරගෙන ප්‍රශ්නය විසදයි කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රියනාත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාවේ නෛතිමය ගැටලුවක් තියනවා කියලා මම විශ්වාස කරනවා.එතුමා ඉදිරිපත් කරන පේලි අතර තියෙන

කාරනාවයි යෝජනාවයි අතර ප්‍රතිවිරෝධයක් තියනවා.එතුමා කියන්නෙ වඩු කර්මාන්තයේ නියැලෙන පුද්ගලයකුට අසල්වැසියෙක් ඔහුගෙ කර්මාන්තයෙන් සිද්ද වෙන යම්කිසි අහිතකර බලපෑමක් ඒ අසල්වැසියා සිද්ද වීම හේතුවෙන් ඔහු පොලිසියට පැමිණිල්ලක් කරාට පස්සෙ පොලිසියේ රාජකාරිය තමයි ඒක උසාවියේ දාන එක.උසාවි දාන එක වලක්වන්න අපි නගර සභාවෙන් ඉල්ලීමක් කරනවා වගේ අදහසක් තමයි මේ යෝජනාවේ තියෙන්නෙ.පොලිසිය මගින් උසාවියට දාන කාරනාවකට නගර සභාවට නතර කරන්න පුලුවන්ද කියන එක සම්බන්ධයෙන් ගැටලුවක් තියනවා. මේ යෝජනාවෙ පදනමේ යම් වැරුද්දක් තියනවා. ගරු මන්ත්‍රීතුමා මතුකරන කාරනාවෙ පැති කීපයක් තියනවා. සාධනීය පැතිත් තියනවා, නිශේධනීය පැතිත් තියනවා.එතුමා කියන්නේ වඩු කර්මාන්තයේ හදවත ඒ වඩු කර්මාන්තයේ වැඩ කරද්දි පාරිසරික ප්‍රශ්නයක් නිසා අසල්වැසියෙක් ඒ කර්මාන්තයට විරුද්ධව ක්‍රියාත්මක වුනොත් ඒ කර්මාන්තය වෙනුවෙන් සභාව මැදිහත් වෙන්න කියලා ඉල්ලන්න. ප්‍රශ්න කීපයක් තියනවා. එතුමා කියන්න හදන්නෙ යම්කිසි මැදිහත්වීමක් වඩු කර්මාන්තය වෙනුවෙන් කරන්න. වඩු කර්මාන්තයක් කරනකොට කොන්දේසි වෙන්කරලා තියනවා.කොන්දේසි සපුරලා තියෙද්දිත් එහෙම කරන එක වැරදියි.උදාහරණයක් විදියට මගේ ගෙදර වඩු කර්මාන්තය කරන්නෙ නැහැ.එහා ගෙදර කරනවා.මගේ ගෙදර පාඩම් කරන දරුවෙක් ඉන්නවා.රෑ දහය වෙනකම් වැඩ කරන්න කියන්නේ කොහොමද.එයා විතරක් ජීවත් වෙන්න කියන්න බැහැ.මගේ දරුවො ජීවත් වෙන්නෙ නැද්ද.මැෂින් ගහනකොට කුඩු එනවා.එතකොට මම වඩු කර්මාන්තය කරන්නෙ නැහැ.ආවරණය කරලා කරන්න ඕනා.ඒවා නොසලකා ඒවා කරද්දි පොලිසි යන්නෙ නැතුව කොහොමද ඒ වගේ ගැටුම් තියනවා.ඒවා හරි සංකීර්ණ ප්‍රශ්න.මම මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ යෝජනාව හරියට පැහැදිලිව සභාවටත් මැදිහත් වෙන්න පුලුවන් විදියේ නෛතික රාමුවක් යටතේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා ගරු මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව හංසයා කිරි දියෙන් වෙන්කරලා ගන්න ඕනා වගේ කාරනාවක්. ප්‍රධානම කාරනාව තමයි විශේෂයෙන් පොලිස් රාජකාරී තුල තියෙනවා අරමුණු තුනක්. මේ අරමුණු තුනේ එකක් තමයි මහජන පීඩා වැලකීම සදහා මේ කටයුත්ත අධිකරණයට ඉදිරිපත් කිරීම පොලිසියේ රාජකාරියක්.පොලිසියටත් අභියෝගයක් නොවන විදියට යෝජනාව ක්‍රියාත්මක කරන්න ඕනා. අණපනත් වලට අමතරව විශේෂයෙන් තියනවා. පරිසර ආඥාපනත, පරිසර පනත ඒ වගේම පරිසර අධිකාරියේ තිබෙන පනත. ඒ රෙගුලාසි හරි බලවත්. යම් විදියකින් යම් රෙගුලාසි කඩ කරලා තියනවානම් ඒක යථාවත් කරගැනීමට උදව් කිරීම නගර සභාවේ වගකීමක්.ඒකම තමයි පරිසර බලපත්‍රයේ තියෙන්නේ ඒ නිසා යම් මනුස්සයෙක්ට කනට ඇහෙන්න ඕන ප්‍රමාණය ඉක්මවා යනවානම් යම් මනුස්සයෙක්ගෙ ජීවත් වීමේ සහ මානව හිමිකම් කැඩීමක් වෙනවා.දෙවෙනි එක තමයි එහි තිබෙන අපද්‍රව්‍ය ශරීර ගත වෙනවානම් ඒකත් යම් විදියකින් හානි කරයි.ඊට එහා ගිහිල්ලා යම් කෙනෙක් යම් ව්‍යාපාරයක් කරගෙන යනවානම් ගරු නගරාධිපතිතුමනි,ඒ ව්‍යාපාරය තුල අපි ද්වේශ සහගත විදියට ඒක නවත්තන්න හදනවානම් අන්න මෙතුමා කිව්ව වැරැද්ද එනවා.එහෙම වෙනවානම් ඒකට විරුද්ධව කටයුතු කරන්න පුලුවන් වගේම විශේෂයෙන් මේ යෝජනාව තුල මොරටුවේ ප්‍රධාන ව්‍යාපාරය වන වඩු කර්මාන්තය ශක්තිමත් කරන්න අපිට කරනන් පුලුවන් යෝජනා ටිකට යම් කමිටුවක් පත්කිරීම ඉතාමත් වැදගත් වෙනවා.ඒ කමිටු හරහා යම් විදියකින් වන සංරක්ෂණ බලපත්‍රය ගන්න අපේ වඩු කාර්මිකයාට බැරිනම් දැව ගබඩා කරන්න බැරිනම් අන්න ඒක විදිමත් කිරීමට කටයුත්තට අපිට මැදිහත් වෙන්න යම් ක්‍රියාමාර්ග ලබා යුතුව තියෙනවා.යම් විදියකින් මේ ආයතන අර පනත් වලට අනුකූලව පවත්වාගෙන යනවානම් අසල්වාසියාට යම් තර්ජනයක් වෙනවා නම් ඒක අපිට තියෙන

පනත් තුල විදිමත් කිරීමට අපි මැදිහත් විය යුතුයි.යම් විදියකින් දෝෂ සහගත යනවානම් අපිට ඒක වෙක් කරන්න පුලුවන් අපිට තියෙන පරිසර බලපත්‍ර කොන්දේසි තුල.ඒ නිසා ඒක බොහොම සියුම් කාරනයක්.ඒ නිසා අපේ වඩුවා තමයි අපේ හදවත.අපි සභාවක් විදියට වඩුවවත් බේරගෙනවඩුවාගේ ආර්ථික මට්ටම් හා ශක්ති මට්ටම් ඉස්සරහට ගෙනියනවා වගේම පනත් අතරත් ඒ වගේම විශේෂයෙන්ම 1942 තියෙන පොලිස් රාජකාරී වලට යම් විදියකින් ප්‍රධාන අරමුණු තුනට හානියක් නොවන විදියට මේක සාකච්ජා කරගත යුතුයි.අපිට ප්‍රශ්නයක් වෙන්න පුලුවන් මේ පනත් අතර සට්ටනයක් ඇති වුනා කියලා. ඒ නිසා විධායක ව්‍යවස්ථා ධායක කියන අධිකරණ සංවරණ හා තුලට වලට යම් ප්‍රශ්නයක් නොවන විදියට යම් විදියකින් අලුතෙන් පණත් ගේන්න ඕනනම් අලුතෙන් සාකච්ජා කරන්න ඕනනම් අලුතෙන් කොන්දේසි දාන්න ඕනනම් ඒක සාකච්ජා කරලා වඩුවගෙ සුඛිත මුදිත මට්ටමට ගෙනියන්න කරන කටයුතු ටික අපි කරමු කියලා ගරු නගරාධිපතිතුමනි,යෝජනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,මම ජීවත්වන මධ්‍යම කලාපය වඩු කාර්මිකයන් සියයට අසූවක් විතර ඉන්නවා.ඔබතුමත් මම හිතන්නෙ වඩු කාර්මිකයෙක් විදියට යම්කිසි කාලයක් රැකියාව කරපු පුද්ගලයෙක් විදියට මේ වගේ ප්‍රශ්න මටත් ආවා පැමිණිලි තුනහතරක් පහුගිය සති තුන ඇතුලත.පැමිණිලි කරන පාර්ශවයට යන්නෙ පොලිසියට මම හිතන්නේ නගර සභාවේ බලය පාවිච්චි කරනවද මම දන්නෙ නැහැ.යම් යම් මන්ත්‍රීවරුන් බලය පාවිච්චි කරනවාද මම දන්නෙ නැහැ.ගොඩාක් වෙලාවට ඒ අය උසාවි ගිහිල්ලා තමයි නැවතුනේ.මෙතෙක් කල් පැවති අපේ සාම්ප්‍රදානුකූල කර්මාන්තය අපි ජීවත් වෙන්නෙ අදටත් වඩු කර්මාන්තය නිසා.මොකද අපිට මේ කර්මාන්තය කොහෙවත් ගිහිල්ලා කරන්න බැහැ.වඩුවා කියන්නේ නිවාස බද්ධ ගෙවන ගමන් ව්‍යාපාරයට වෙනම බද්දකුත් නගර සභාවට ගෙවන පිරිසක්.ඉතින් මේ වගේ ප්‍රශ්නයකදී ඔබතුමාගේ මැදිහත්වීම මම හිතන්නේ නෛතික පදනම අපි කියන්නේ ගොඩක් දුරට උසාවි ගෙනියන්නෙ නැතුව මේ වගේ ප්‍රශ්න ජනතා හිතවාදීව විසදන්න පුලුවන් ක්‍රමවේදයක් හදන්න ඔබතුමා මූලික වුනොත් හොදයි.මොකද නැත්නම් අතරමැද ඉන්න මන්ත්‍රීවරු දේශපාලන බලපෑම් විදියට පොලිසියත් එක්ක එකතු වෙලා ජනතාව අපහසුතාවයට පත්කිරීම කියන්නෙ මේ වෙලාවෙ හොද නැති දෙයක්.ඔබතුමාලට ජන්දෙ දීපු පිරිසක් ඉන්නවා.අපිට ජන්ද දිපු පිරිසක් ඉන්නවා.හැමෝම අපිට කියනවා රජය එතකොට තිබ්බ වැඩපිලිවෙල නෙමෙයි දැන් ක්‍රියාත්මක වෙන්නෙ.හැම අතින්ම මිනිසුන්ට ගහන්න පුලුවන් තැන්වලින් අකුල් හෙලන තැන්වලින් ඒ වගේ දේවල් නොකර අපි කොහොමහරි දේශපාලනයක් භාවිතා නොකර කර්මාන්තය රැකගන්න කරන්න පුලුවන් හැකි උපරිමය ඔබතුමාගෙ පැත්තෙන් කරන්න කියලා නැවත ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඇත්තටම වඩු කර්මාන්තය හා දැව කර්මාන්තයට සමහර අය හිතන්නෙ විශාල ලෙස මාලිමා ආණ්ඩුව ඇවිල්ලා ප්‍රහාරයක් එල්ල කරනවා.මේක නවත්තන්න හදනවා කියලා.කිසිලෙස ඒක සිද්ද වෙන්නේ නැහැ.ඔබතුමාට මතකයි ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී අගුලාන පොලිසියෙ ස්ථානාධිපතිතුමා ඉරන්න දැව ගේන අවස්ථාවෙ කිසිම මොහොතක බලපත්‍රයක් අවශ්‍ය නැහැ. ප්‍රශ්නයක් ඇවිල්ලා පොලිසියෙ ස්ථානාධිපතිතුමත් ඔබතුමත් ඇවිල්ලා කාරනාව බේරලා දුන්නා ඇත්තටම කිසිම ගැටලුවක් වුනේ නැහැ. ඒ වගේම වඩු කර්මාන්තයට පොඩි අදහසක් දක්වන්න ඕනා. අපි වඩු කර්මාන්තයක් කරනවානම් මොරටුමුල්ල, ඉදිබැද්ද, කඩලාන කියන්නෙ සාමන්‍යයෙන් රෑ බෝවෙනකම් කර්මාන්තය කරනවා. නමුත් කොරළවැල්ල,

එගොඩඋයන ප්‍රදේශය වගේ වෙනත් ප්‍රදේශවල කර්මාන්තය පටන් ගන්නවානම් කරගෙන යනවානම් නීති රෙගුලාසියක් තියනවා.උදේ අටත් සවස පහත් වෙනකම් තමයි රැකියාව කරන්න පුලුවන්.සාමාන්‍යයෙන් පොහොය දවස හෝ ඉරිදා දවස සෙනසුරාදා වරුවක් මොකද සාමාන්‍ය ජනතාව දරුවන් රැකියාවට යන පුද්ගලයන් නිවසේ රැදී ඉන්නෙ ඒ දවස්වල. වඩු කර්මාන්තය මොරටුවේ විශාල පිරිසක් ජීවත් වන රැකියාවක් ඒක නිසා අපේ පැත්තෙන් කිසිම කිසිම දෙයක් සිදු වන්නේ නැහැ.මානුෂීය පැත්තත් තියෙන්න ඕනා.පැමිණිලි කරන්න ඇත්තෙ මඩුවක් කරනවානම් ඔහුගේ නිවසට ආසන්නවනෙ.ලෙඩරෝග වලින් පෙළෙන දරුවෙක් ඉන්නවානම් ඔවුන් සාමාන්‍යයෙන් යන්නෙ පොලිසියට තමයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,මන්ත්‍රීතුමාගේ චේතනාව නරක නැහැ.හැබැයි මේ අදහස තුල සභාවක් විදියට කිසිම ලෙසක දේශපාලන වශයෙන් වඩු කර්මාන්තයට විරුද්ධව කෙල බිදක්වත් හලලා නැහැ.අපි බහුතරයක් වඩු කර්මාන්තයෙ නියැලුන අය.සම්ප්‍රදායක ගොඩනැගුනු කර්මාන්තයක් වඩු කර්මාන්තය.පස්සෙ තමයි නීතිය ආවෙ.ඒ නිසා මේකෙ උපතේ සිද්ද වෙච්ච දෝෂයක් තිබෙයි.හැබැයි ඒක අපේ යහපතට ආපු එකක්.අපි මේ ශිල්පය දැනගෙන ශිල්පය හරහා සැලකිය යුතු නමක් එකතු කරා ලෝකෙට වඩු කර්මාන්තය තුලින්.වඩු කර්මාන්තයට විවිධ බාධා නීතිය හමුවේ තියනවා.සිද්ධිමය කාරනා ගත්තොත් සෑහෙන ප්‍රමාණයක් ප්‍රශ්න වලට මුහුණ දෙනවා.පාර්ශවයන් හැම විටම ගෙන්නලා සමතයකට පත්කරන්න විවිධ උත්සාහ ගන්නවා.එම උත්සාහයන් ඇතුලෙ පාර්ශව දෙකම සතුටු කරන්න හැමවිටම බැහැ.ඒ නිසා අනිවාර්යයෙන්ම කර්මාන්තය පැත්තෙන් හිතන එක ප්‍රමුඛයි.හැබැයි ගෙදරක මනුස්සයෙක් නිදහසේ ජීවත්වෙන එක බැලන්ස් කරන්න යද්දි අපිට බැරිවුනොත් අර පාර්ශවයත් පොලිසි යනවා.අපි යවන එකක් නෙමෙයි මේ.එහෙම දැනගත්ත පලවෙනි මොහොතෙම මම පොලිසියටත් ගිහිල්ලා සැලකිය යුතු එකක් ඒගොල්ලන් එක්කත් සාකච්ජා කරලා කර්මාන්තයට හානි නොවෙන විදියට අර මිනිසුන්ට ජීවත් වෙන්න පුලුවන් විදියටත් බේරිය යුතුයි තැනට ඉන්නවා.මේ සිද්ධි පදනම් කරගෙන ඇමතිතුමත් හමුවුනා.එතුමාගේ පැත්තෙනුත් කිව්වා ප්‍රාදේශීය කමිටුවක් කැදවලා ඒ කමිටුව හරහා මේක සාකච්ජා කරලා කර්මාන්තයට හානි නොවන විදියට කාලය පිළිබද ප්‍රශ්නය විසදන්න. නඩුවක් දාලා තියනවා දහයෙන් පසුසෙ වැඩ කරන්න.දහය වෙනකම් කිව්වාට වඩුවාට වැඩ තියෙන වෙලාවට දහයෙන් පස්සෙ වැඩ නොකරාම වඩුවා ආදයම නැතිවෙනවා.හැමදාම වැඩ නැහැ.වැඩ තියන කාලයක් තියනවා.ඒ කාලයට වැඩ කරනවා.වඩු කර්මාන්තයට විරුද්ධ වෙලා මේ පුටු එකකවත් කාටවත් ඉන්න බැහැ.ඉතිහාසයේ වඩු කර්මාන්තයට විරුද්ධව විශාල නඩු ප්‍රමාණයකුත් වැටුනා.බලපත්‍රය නොගෙව්වටත් වැටුනා.සැලසුම් අනුමත නැහැ.බලපත්‍රය අරගෙන නැහැ.ඔහොම සිද්ධි තියෙන්නෙ.ඒ නිසා අපි හැමෝම එකතු වෙලා කර්මාන්තයට හානියක් නොවන විදියට පොලිසියත් එක්ක සාකච්ජා කරලා.හැබැයි නීතියට අපිට බලපෑම් කරන්නෙ නැහැ.ඒ නිසා මේ සම්බන්ධව තවදුරටත් සොයා බලා කටයුතු කිරීම සුදුසුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවෙ තියෙන්නේ මොරටුව වඩු කර්මාන්ත හිමියන් කර්මාන්තය කරගෙන යාමේදී අසල්වැසි පැමිණිලි වලින් පොලිසිය උසාවි වලට යොමු කරන අතර එය වලක්වාලමින් නගර සභාවට බදු ගෙවන වඩු කාර්මාකයා හට මැදිහත් වී ප්‍රශ්නය විසදාලීමට ගරු සභාවට යෝජනා කරනවා කියලා. ගරු නගරාධිපතිතුමා අපේ තියනවා වඩු කර්මාන්ත කලාපයක් මේකෙ පැහැදිලිව තියනවා පොල්කොටුවේ කොටසක් අයිති වෙනවා සුදර්මාරාම කොටසක් සහ මොරටුමුල්ල, බෝධිරාමාපාර, ද සොයිසා පාර, රාවතාවත්ත

මෝල්පෙ, ශාන්ත අන්තෝනි පාර, ඉදිබැද්ද කියන කොටස් වලින් යම් කලාපයකට වෙන් කරලා තියනවා. එහෙම තියෙද්දි තමයි අලුතෙන් ප්‍රශ්නය මතු වෙලා තියෙන්නේ. මේ වගේ ප්‍රශ්න නොතිබ්බා නෙවෙයි. අනන්ත අප්‍රමාණ ඇවිල්ලා තියනවා. නමුත් අපි නගර සභාවෙන් අවශ්‍ය කරන කන්ඩිෂන් දාලා පැමිණිලි පාර්ශවයටත් ප්‍රශ්නයක් ඇති නොවෙන්න කටයුතු කරලා තියනවා. අන්න ඒ දේ තමයි මම කරගෙන යන්න කියලා කියන්නෙ. නැත්නම් අලුත් දෙයක් නෙමෙයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි,යෝජනාව සාකච්ඡා වුනාට පස්සෙ කමිටුවට යනවානම් තීන්දුවක් ඕනා. ඔයගොල්ලන් ප්‍රියනාත් මන්ත්‍රීතුමත් එක්ක සාකච්ඡා කරලා සංශෝධනයක් කරලා එතුමාට දෙන්න සංශෝධන යෝජනාව ඉදිරිපත් කරන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මා විසින් ඉදිරිපත් කළ අංක 05(03) දරණ යෝජනාව සම්බන්ධව විවාදයේදී මතු වූ කරුණු සලකා බලා එම යෝජනාව සංශෝධනය කර ඉදිරිපත් කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී, එම්. ප්‍රියනාත් මැකන්සි මෙන්ඩිස් මහතා විසින් සංශෝධිත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.**

මොරටුව වඩුමඩු හිමියන් කර්මාන්තය කරගෙන යාමේදී අසල්වැසි පැමිණිලි වලින් අසීරුතාවයට පත්වන බැවින්, මොරටුව මහා නගර සභාව මැදිහත් වී එම ප්‍රශ්නය විසඳිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදි.

සංශෝධිත යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05(04)** **ගරු නගරාධිපති, කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා, මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා, මහා නගර සභා මන්ත්‍රී, ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා, මහා නගර සභා මන්ත්‍රී, ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා, මහා නගර සභා මන්ත්‍රී, එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා, මහා නගර සභා මන්ත්‍රී, යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා, යන මහත්වරුන් මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා සංග්‍රහයේ සභා රැස්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 13(ඌ) වගන්තිය යටතේ පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මොරටුව මහා නගර සභාවේ සභිකයින් හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.07.28 දිනැතිව පැවති රැස්වීමේදි සාකච්ඡා කල පරිදි මොරටුව ද සොයිසා ක්‍රීඩාංගණයේ පිහිටා ඇති මොරටුව ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් 2026.07.30 දිනැති ලිපිය මඟින් ද ඉදිරිපත් කර ඇති කරුණු අනුව ද ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල රජයේ තක්සේරු වටිනාකම මත මොරටුව මහා නගර සභාවට පවරා දීමට මොරටුව ක්‍රීඩා සමාජය එකඟතාවය පළ කර ඇති බැවින්, ක්‍රීඩා සමාජය විසින් සභාවට මේ දක්වා ගෙවිය යුතු හිඟ බිම් කුලී මුදල් සියල්ල එකී තක්සේරු මුදලින් කැපී යන ලෙසත්, අනතුරුව ගොඩනැගිල්ලේ තක්සේරු මුදලින් ඉතිරිවන කොටස ඉදිරියේදී ක්‍රීඩා සමාජය විසින් ක්‍රීඩාංගණය හා ගෘහස්ථ ක්‍රීඩාංගණය භාවිතය සඳහා මොරටුව මහා නගර සභාව විසින් අයකරනු ලබන මුදලින් හා ක්‍රීඩා සමාජය සමඟ එළඹෙන බදු ගිවිසුම අනුව රජයේ තක්සේරුව

මත ගෙවිය යුතු බදු මුදලින් කැපී යන පරිදි කටයුතු කිරීමටත් එකඟතාවය පළ කර ඇති බැවින් එම යෝජනා සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කර මොරටුව ක්‍රිඩා සමාජයට එරෙහිව මොරටුව මහා නගර සභාව විසින් මොරටුව දිසා අධිකරණයේ පවරා පවත්වාගෙන යනු ලබන නඩු කටයුත්ත සමතයකට පත්වීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමු.

මහා නගර සභා මන්ත්‍රී බී. සජිත් දුමින්ද පීරිස් මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. <u>2026 ජූලි මස ස්ථාවර කමිටු වාර්තාවල නිර්දේශයන් සලකා බැලීම.</u>

### 06 (1) 2026.07.10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන කමිටු වාර්තාවේ නිර්දේශන් සලකා බැලීම.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඉඩම් කමිටුවේ ඇමුණුම 01හි තියනවා යෝජනාවක් සම්බන්ධව එස්.එල්.ටී මොබිටෙල් ආයතනයත් එක්ක සම්බන්ධ වෙලා විශේෂ කමිටු රුස්වීමක් දාගත්තා. ඒ සම්බන්ධව වාර්තාගත වෙලා තියනවා. සභාපතිවරයා නොමැතිව තමයි විශේෂ කමිටුව රුස්වෙලා තියෙන්නෙ. මොකද ඉඩම් කමිටුවේ සභාපතිවරයා නැතුව විශේෂ තීරණයක් ගන්න පුලුවන්ද කියන නෛතික ගැටලුව මට තියනවා. විශේෂයෙන්ම නගර සභා ආඥා පනතේ විසිහත්වෙන වගන්තියේ 03 කමිටුවට කාර්යභාරය සම්බන්ධ එතනදි කියනවා විශේෂ කමිටුවක් කරාම විශේෂ අවස්ථාවකදී තීරණ ගන්නකොට කමිටු සාමාජිකයින්ගෙන් සන පූර්ණයෙන් තුනෙන් දෙකක් ඉන්න ඕනා කියලා. සන පූර්ණයෙන් තුනෙන් දෙකක් තියා සභාපතිවරයෙක් නොමැතිව මෙවැනි විශේෂ කාර්යභාරයක් කරන්නෙ කොහොමද කියන ප්‍රශ්නය අපිට තියනවා. කමිටු සාමාජිකයො නොවන අයද කමිටුවේ තීරණ ගන්නෙ කියන ප්‍රශ්නය තියනවා. කමිටුවෙදිත් ඒ ප්‍රශ්නය විටින් විට මතුවෙනවා ගරු නගරාධිපතිතුමනි.ඇත්තටම අපේ ගරු සභාපතිතුමා බොහොම සහයෝගයෙන් වැඩ කරනවා. නමුත් එතුමා පරයා යන තීරණ පුද්ගලයින් කමිටුවට වැදිලා. ඒක හරිම අසෝභනයි ඇත්තටම මම ඒ කමිටුව ගැන බොහොම පිළිකුලෙන් කතා කරනවා.අපිට තීරණ ගන්න කමිටුවෙන් පිට පුද්ගලයන්ගෙ බලපෑම් එක්ක කරන්න බැහැ නගරාධිපතිතුමා. මොකද මහා නගර සභාවක තීරණ ගන්න කමිටු පත්කරන්නෙ ඇයි කියන එක ප්‍රශ්නාර්ථය මම ඔබතුමාට දෙනවා.ඔබතුමා මට වඩා දන්නවානෙ. ඔබතුමා දීර්ඝ කාලයක් මේ ක්ෂේත්‍රයේ හිටපු පුද්ගලයෙක් විදියට කමිටුවක සභාපතිවරයා නැතුව තීරණ ගන්න පුලුවන්ද. අනෙක අපි ඒ කමිටුවේ සාමාජිකයො. අපිට කමිටුව ඇතුලෙදිත් ප්‍රශ්න මතුවෙනවා. අපිට බලපෑම් කරනවා සමහර පුද්ගලයො ඇවිල්ලා මම නම් ගම් නොකිව්වට ඔබතුමා දන්නවා ඒ පුද්ගලයො කවුද කියන එක.මෙවැනි වැරදි පූර්වාදර්ශ දෙන්න පුලුවන්ද මහා නගර සභාවක.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබ දිගින් දිගටම උත්සහ කරමින් ඉන්නවා ඔබේ හැම ප්‍රකාශයක් ඇතුළෙම අප හට අනවශ්‍ය චෝදනා කරන්න. කිසිම විටක අනිසි බලපෑමක්, අනිසි තීන්දු තීරණ ගන්න දරණ උත්සහයක් මම දන්නේ නෑ. එවැනි ඕනෑම වෙලාවක මා හට කියන්න. ඔබ උත්සහ කරනවා විනා එහෙම කාරණයක් මම දන්නේ නෑ. මගේ අනවබෝධයෙන් මේක සිද්ධ වෙනවා නම් ඒ නිශ්චිත මොහොතේ මා හට දැනුම් දෙන්න. කමිටුවක සභාපති නැතිවුණාම ඒ ඉන්න අයගෙන් සභාපති පත්කරලා කරගෙන යන්න කමිටුවට බලය තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමා, ඉන්න අයගෙන් සභාපති පත්කරනවා කියන්නේ කුමක්ද, කුමක්ද එහි නෛතිකභාවය.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමිය, කමිටුවේ සභාපති නැත්තම් නීතිමය බලයක් තියෙනවා ඒ කමිටුව පවත්වාගෙන යන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමා, කමිටුව තුළ සිදුවුණ කාරණවක් නෙමෙයි. කමිටුවෙන් පස්සේ අපි තීරණය කළ එස්.එල්.ටී.මොබිටෙල් ආයතනයත් සමඟ තිබෙන සාකච්ඡාවක්. ඒ කමිටුවට අදාළ සභාපතිවරයා නොමැතිව සාමාජිකයන්ගේ ගනපූර්ණයෙන් තුනෙන් දෙකකුත් නොමැතිව තමයි එම කමිටුව රැස්වෙලා තියෙන්නේ. එවිට එතන නෛතිකභාවයක් තියෙනවද?, එතන ප්‍රශ්ණයක් තියෙනවා කියන්නේ, කමිටු රැස්වෙලා තිබෙන්නේ සභාපතිවරයා නොමැතිව නිසයි. එතන වෙනත් මන්ත්‍රීවරයෙක්ගේ නමක් දාලා තියෙනවා, එම මන්ත්‍රීවරයා තමයි එම කමිටුව මෙහෙයවලා තියෙන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමිය, මේ සම්බන්ධයෙන් නාගරික ලේකම්තුමා හරහා පැහැදිලි කිරීමක් කරගමු. මෙය විශේෂ කමිටුවක් නෙමෙයි, අනු කමිටුවක්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමා, විශේෂ කමිටුවක් හරි අනු කමිටුවක් හරි පළාත් පාලන නීතිය අනුව කමිටු සාමාජිකයොත් නැතුව, සභාපතිත් නැතුව අනු කමිටුවක් තියන්න පුළුවන්ද?

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමිය, අනු කමිටුවක් පත්කරගෙන තිබෙන්නේ එම කමිටුව හරහා ම නේද? ලේකම්තුමා මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමා, සභාපතිවරයත් නෑ, කමිටු සාමාජිකයොත් නැනේ. මේවගේ තීරණ ගන්නකොට අපි මොකටද කමිටුවකට ගිහිල්ලා වාඩිවෙන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය මේ කමිටුවේ සාමාජිකාවක්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>
ගරු නගරාධිපතිතුමා, ඔව්. මම අහන්නේ මෙතන තියෙන ඇමුණුම සම්බන්ධව.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>
ගරු මන්ත්‍රීතුමිය, මේ කමිටුවට එදා ආපු එකක් නෙමෙයි. මීට ඉදලා තිබුණු එකක්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>
ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමිය පැහැදිලි කරන පැත්තක් තියෙනවා. එතුමිය පැහැදිලි කරන්නේ කමිටු සාමාජිකයෙකුත් නැතුව, කමිටු සභාපතිත් නැතුව. මේකට සහභාගි වෙලා තියෙනවා අපේ නියෝජ්‍ය නගරගාධිපතිතුමිය ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මිය. එතුමිය ඉඩම් කමිටුවේ නෑ. තුසිත් ද සිල්වා මන්ත්‍රීතුමත් සහභාගි වෙලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, ඒක කමක් නෑ කියමුකෝ. එතුමිය සහභාගි වෙන්නේ නගරාධිපතිතුමා වෙනුවට.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, කමිටුවේ නැති අය කොහොමද ඉඩම් කමිටුව වෙනුවෙන් තීන්දු තීරණ ගන්නේ. ඒ කාරණාව තියෙනවා ගරු නගරාධිපතිතුමනි එතන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, මහා නගර සභා ආඥා පනත උල්ලංඝනය කිරීමක් තමයි මෙතන සිදුවෙලා තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේක අවශ්‍ය නම් අනුමත නොකර නැවත කමිටුවට යොමු කරමුද?

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, මෙය වරදක් විදිහට පිළිගන්න එපා. ඔබතුමාගේ විශේෂ අවධානයටයි යොමු කරන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මට මේකේ නෛතික පැත්තෙන් ගැටලුවක් මතු වෙන්නේ නෑ. නමුත් ඔබතුමිය ඉදිරිපත් කරන කාරණාව සැලකිල්ලට අරගෙන මේ කරුණ මේ වෙලාවේ අනුමැතියට ගන්නේ නැතුව ඊළඟ  කමිටුවට සාකච්ඡා කරන්න දාමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, ඒක හොඳයි. බොහොම ස්තුතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, 02(06) සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙම ඉඩම නගර සභාව සතු ඉඩමක්. මෙම ඉඩම ආරක්ෂා කිරීම සඳහා කුමක් හෝ මායිම් වැටක් ගහන්න ඕනේ. ඒකට අදාළ කටයුතු කරන්න කියලා තමයි කිව්වේ. මෙම ඉඩමේ තිබුණේ ප්‍රජා ශාලාවක්. ප්‍රජා ශාලාව සම්පූර්ණයෙන්ම කඩා වැටෙන්න තිබ්බ තත්ත්වය පදනම් කරගෙන බිත්ති ටික ඉවත් කළා. ඉන්පසුව අසල්වාසි පුද්ගලයා ඔහුගේ පුතාගේ නිවස සාදා ගෙන මෙම ඉඩම එයාගේ ඉඩමට ක්‍රමානුකූලව සම්බන්ධ කරගත්තා. දැන් අපට කරන්නට තිබෙන්නේ නගර සභාව සතු ඉඩම ආරක්ෂිත මායිම් වැටක් ගහලා නැවත අපට අත්පත් කරගන්න. මීට  පෙර කමිටු දෙස බැලුවම දිගටම මෙම කරුණ එනවනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, වාර්තාවේ කියනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව, මෙම කාරුණට අදාලව ගරු නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2026.07.17 දින ප.ව.03.00ට සාකච්ඡාවක් පැවැත්වුණා කියලා. මම ඒ සාකච්ඡාව ගැනයි අහන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, එදින සාකච්ඡාව කැඳවූවට එගොල්ලෝ ආවේ නෑ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(01) හි සඳහන් වෙනවා, උක්ත කරුණ සළකා බැලූ කමිටුවට, පෙර ඉඩම් බැහැර කිරීමේදි කටයුතු කළ ආකාරයට අදාළ අවශ්‍ය තොරතුරු නාගරික ගණකාධිකාරි (ආදායම්) විසින් නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ බව ප්‍රකාශ කරන ලදී යනුවෙන්. නගර සභාවේ ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් නාගරික ගණකාධිකාරි (ආදායම්) විසින් මොනවද නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට ලබාදෙන්න තිබෙන තොරතුරු.

<u>**මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මීට පෙර මෙම කටයුතු කරගෙන ගිහිල්ලා තිබුණේ චින්තා මිස්ගේ අංශයෙන්. දැන් කර්මාන්ත අංශයෙන් කියනවා අපිට පුහුණුවක් නෑ, අපිට මේ තොරතුරු නෑ. ඒ නිසා ගණකාධිකාරි (ආදායම්) සමඟ එකතු වෙලා මෙම කටයුතු කරන්න ඉඩ ඕනේ කියලා. එමනිසා ඇ සතු දැනුම හා මීට පෙර ඒකාරාශි කර තිබෙන තොරතුරු ටික නාගරික ඉංජිනේරු අංශයට භාරදිලා දෙපාර්ශවයම එකතු වෙලා මෙම කටයුත්ත කරන්න කියන එකයි අපි කිව්වේ.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |

24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(2), 02(4), 02(5), 02(8) හා 02(10) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(9) දරණ කමිටු නිර්දේශයට විපක්ෂව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා

**2026.07.10 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා )

**06 (2) 2026.07.10 දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සේනක මන්ත්‍රීතුමත් උදේ මතක් කළා. අපි කටුබැද්දේ මිනිස්සු. අපි පොඩි කාලේ ඉඳලම භාවිතා කළේ පුංචි පාර්ක් එක. කටුබැද්ද ප්‍රජා ශාලාව දැන් ග්‍රහණයට අරන් තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. ආයුර්වේද ඩොක්ටර් උඩ ඉන්නවා, එතුමියටත් යන්න කියලලු. එතන ඉන්න සියලු දෙනාම අයින් කරලා. සම්පත් සේවා පියසක් දාන්න යනවා එතන. මෙතන දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්පූර්ණයෙන්ම ග්‍රහණයට අරගෙන. අපි එහෙම නගර සභාවෙන් දුන්නද එතන, කටුබැද්ද මිනිස්සු අපෙන් අහනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි සභාවේ මීට පෙරත් කතා කළා අපි සතු දේපළ වුවත් ප්‍රාදේශීය ලේකම් සතු දේපළ වුවත් වල් බිහිවෙමින් කිසිම ප්‍රයෝජනයක් නොගනිමින් තිබෙන ස්ථාන තිබෙනවා නම් ඒ ස්ථාන ගමේ ජනතාව සඳහා ලබාගැනීමට අවශ්‍යයි. ඒවා අපි සතු වුනත් ප්‍රාදේශීය ලේකම් සතු වුනත් ගමේ ජනතාවගේ දේවල්. මේ ස්ථාපිත කරන්න යනවා කියන්නේ පෞද්ගලික දෙයක් නෙමෙයි දීර්ඝ කාලයක් මේ දේපළ නගර සභාව සතු දේපළක් ලෙස පැවතුණා නමුත් එම දේපළට අදාළ නීත්‍යානුකූල අයිතිය තහවුරු කරන්න නගර සභාව සතු කුමක්වත් මට ලැබුණේ නෑ. ප්‍රාදේශීය ලේකම් කියනවා එයාගේ අයිතියේ තමයි තියෙන්නේ කියලා. මම ඒක එච්චර සැලකිල්ලට ලක් කළේ නෑ. දැන් අපි දන්නවා නගර සභාව සතුව දීර්ඝ කාලයක් මේ ස්ථානයේ බොහොම සේවාවන් පැවැත්වුණු තැනක්. දරුවෝ සෙල්ලම් කළා, තිබුණු ඉඩ ප්‍රමාණයේ. පෙර පාසල තිබුණා, ආයුර්වේදය තිබුණා, මාතෘ සායනය තිබුණා. දැන් අපිට මේ දේපළේ අයිතියක් පිළිබඳ ප්‍රශ්ණයක් එනවා නම් අපි උපක්‍රමශීලී වෙන්න ඕනේ ඒ අයිතිය ඉස්සෙල්ලා අපි ළඟට ගන්න. එහෙනම් අයිතිකාරයා අපෙන් ඉල්ලන්න ඕනේ. ඒකෙන් එයා පිළිගන්නවා එයා අයිතිකාරයා නෙමෙයි කියලා. මගේ එකම අරමුණ තියෙන්නේ පොදු සේවාවන් ඉටු කරන්න. ග්‍රාම සේවක ඉන්නේ ඒ ගමේ ජනතාවගේ සේවාවන් ඉටුකරන්න, සමෘද්ධි නිලධාරි ඉන්නේ ඒ ගමේ ජනතාවගේ සේවාවන් ඉටුකරන්න. මෙම නිලධාරීන්ට ග්‍රාමීය ජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබාදීම සඳහා ස්ථානයක් ලබාදිය යුතුයි. එම ස්ථානය ලබාදීමේදී එම ස්ථානය නගර සභාවේදී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද එසේ නොමැති නම් වෙනත් රාජ්‍ය ආයතනයකට අයත්ද කියන එක නෙමෙයි මට වැදගත් අර ඉහතින් සඳහන් කරපු සේවාවන් හොඳින් පවත්වාගෙන යාමයි. එහිදි මාතෘ සායනයට හානියක් නොවිය යුතුයි. අපි කලින් තිබුණු මාතෘ සායනය අළුතින් හදලා ඒකට ගියා. අපිට අයිති ඩොක්ටර් කෙනෙක් උඩ ගොනැගිල්ලේ ඉන්නවා. කිසිම සේවාවක් හානියක් නොවන ආකාරයෙන් ඒ භූමියේ ජනතාවගේ සේවාවන් ටික පවත්වාගෙන යාමයි අරමුණ. ඉහතින් කියපු අයිතිය පිළිබඳ ප්‍රශ්ණයක් තිබෙනවා නම් අපි ඒ ගැන කතා කරමු කොහොමද නිශ්චිත ලේඛන හරහා තහවුරු කරගන්නේ, මොනවද අපි මේකට යොදන උපක්‍රම කියලා. බොහෝ නගර සභා දේපළවලට මේ සම්බන්ධ ගැටලුවක් තියෙනවා. ඒක තමයි අපි වුට්ටක් සාකච්ඡා කරන්න ඕනේ. කාටවත් දීලා නෑ. කාට දුන්නත් නැතත් අයිතිය සනාථ වෙන්නේ නීත්‍යානුකූල ලියකියවිලි ඇතුළේ. ඔය කාරණාවේදි අපි ස්ථාන ගණනාවක සිරවෙලා සිටිනවා. දිගරොල්ල කඩටිකේ, බොරළු ක්‍රීඩාංගණය වෙන්න පුළුවන්. දැන් අපිට එක පැත්තකින් යන්න වෙනවා අපි කොහොමද අපි අයිතිය තහවුරු කරගන්න ලේඛන ටික සකස් කරගන්නේ කියලා. මම ඒකයි කිව්වේ අපේ චූලරත්න මහතාගේ පිටත්වීම අපිට විශාල ලෙස

බලපාන්නේ මෙන්න මෙතනදි කියලා. අපි කාටවත් ලිඛිතව අයිතිය දුන්නේ නෑ, සේවාවන් ටික පවත්වාගෙන යාමට අපි එකඟයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා කියනවා ඒකේ ඔප්පුව නෑ කියලා. නගර සභාවේ ඔප්පුව නැති ස්ථාන ගොඩක් තියෙනවා. උදාහරණයක් සිරිබරමැණිකේපුර අපිට ඔප්පු නෑ. නමුත් දීර්ඝ කාලීන භුක්තිවින්ද නිසා අපි ඉඩම් නිරවුල් කිරිමේ දෙපාර්තමේන්තුවෙන් පළමු පන්තියේ ඔප්පුවක් ලබාදුන්නා. සේනක දමයන්ත මන්ත්‍රීතුමයි, මමයි දෙන්නම අපි ඉපදිලා අපිට බහතෝරණ කාලේ ඉඳලා ජීවත් වුණේ කටුබැද්ද ප්‍රදේශයේ. අපි දෙන්නම සෙල්ලම් කරන්න භාවිතා කළා ඔය ග්‍රවුන්ඩ් එක. අපි දන්න කාලේ ඉඳලා මොරටුව මහා නගර සභාවෙන් තමයි පාලනය වුණේ. අපේ තිලක් මන්ත්‍රීතුමත් සාක්ෂි දරනවා. එතුමා මට වඩා වැඩිමහල්. එතුමත් එහෙමයි. මෙහි භුක්තිය අපි විදලා තියෙනවා විශාල කාලයක්. නමුත් කවදාවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇවිල්ලා කියලා නෑ මේක අපේ කියලා. ඔප්පුවක් තියනවද නැද්ද කියලා අපි දන්නේ නෑ. නමුත් අපි අහලා තියෙනවා භුක්තිය අවුරුදු ගණනාවක් ඒ කියන්නේ අවුරුදු 70ක් 80ක් භුක්ති විඳින විට ඒක පළමු පන්තියේ ඔප්පුවක් ලබාදෙන්න හේතු සාධකයක් කියලා. ඒ නිසා ඒ අනුව අපිට පුංචි පාර්ක් එක ඉඩමේ පළමු පන්තියේ ඔප්පුවක් අපට ගන්න පුළුවන්. මම දන්නේ නෑ දීලා තියෙනවද කියලවත් මේ වෙනකොට. ග්‍රාම නිලධාරි කාර්යාලය දාන්න ඉඩදුන්න එක වෙනම කතාවක්. කටුබැද්ද ජනතාව ග්‍රාම නිලධාරිගෙන් සේවය ලබාගන්න ඕනේ. ඒක හරි. නමුත් මොරටුව නගර සභාව සතු දෙයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදීම අපි අනුමත කරන්නේ නෑ. ඒක ලොකු ප්‍රශ්ණයක්.

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(02) දිගරොල්ල පොළ භූමිය සංවර්ධනය කිරීම සම්බන්ධව. මේ සම්බන්ධයෙන් ඔබතුමා සමඟ සාකච්ඡාවක් කළා කියලා තියෙනවා.මෙම වාර්තාවේ තිබෙන විස්තර අපිට පැහැදිලි මදී. ඒ නිසා අපි ඔබතුමාගෙන් දැනගැනීමට කැමති දිගරොල්ල පොළ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කෙසේද ක්‍රියාත්මක වෙන්නේ කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි හැමෝම දන්නවා දිගරොල්ල පොළ භූමියේ තිබෙන තත්ත්වය හොඳ නෑ කියලා. යම් සංවර්ධනීය ක්‍රියාවලියකට යා යුතුයි. ඒක අපි පරිස්සමින් කරගන්නට වෙනවා. මක්නිසාද මේ අය දීර්ඝ කාලයක හුරුවෙච්ච විදිහ නිසා. අපේ මූලික අවශ්‍යතාවය තියෙන්නේ පාරිභෝගික ජනතාවට නිදහසේ භාණ්ඩ රැගෙන යාමට පුළුවන් පොළක් බවට පත්කිරීම. නමුත් වෙළඳුන්ට ලබාදුන් සීමාවක් ඉක්මවා ගිහිල්ලා මේ විශාල ලෙස අත්පත් කරගෙන ඉන්නවා. ඒ නිසා මෙම තත්ත්වය වෙනස් කිරීමේ අරමුණින් තමයි මෙම අදහස ඉදිරිපත් කළේ. එහිදි අපි මුලින්ම කල්පනා කළා මේකට එන මාර්ගය සකස් කිරීම. මෙහි මැද්දේ තිබෙනවා බක්කි ප්‍රමාණයක්. නමුත් මෙහි සැලකිය යුතු බක්කි ප්‍රමාණයකින් වෙළඳාම් සිදුවෙන්නේ නෑ. බක්කිවලින් දෙන්නෙක් නැත්තම් තුන්දෙනෙක් විශාල පරාසයක් අත්පත් කරගෙන සිටිනවා. පළතුරු තමයි දෙපැත්තේ දාගෙන ඉන්නේ. මැද කැල්ලක් තියෙනවා. නමුත් නිශ්චිත ලෙස එහි මුකුත් නෑ. මුළු පොළම ගත්තොතින් විධිමත් බවකින් තොරයි. අපි විශාල වියදමක් දරනවා විදුලියට හා ජලයට. නමුත් එයින් එන ආදායම ගත්තම ඉතා කුඩා ප්‍රමාණයක්. ඒ නිසා මෙහි වෙනස්කමක් ඕනේ කියලා කල්පනා කළේ. එහි ඉන්න වෙළඳුන්ටත් හානියක් නොවන ලෙස මැද්දේ තිබෙන ගොඩනැගිල්ලේ බක්කි ටික මැද්දට අරගෙන ඒගොල්ලෝ ස්ථානගත කරලා ඒ තැන්වලට. පිටිපස්සේ ඔබ දකිනවා මාළු ලැලි ටිකක් තියෙනවා කිසිම ප්‍රයෝජනයක් නැතිව. ඒ නිසා මස් කඩේට අවශ්‍ය ලැලි දෙක තියලා අනිත් ලැලි ටික ඉවත් කරන්න. ඊළඟට පිටුපස්සේ හදපු වැසිකිළියක් තියෙනවා සම්පූර්ණයෙන්ම විනාශ වෙච්ච. එය අලුතින් හදන්න ඕනේ.

ඉස්සරහ තිබෙන වැසිකිළිය ලඟ තිබෙනවා පොදු ජල කරාමයක් මේ ජල කරාමය එළි වෙනකම් බාහිර පුද්ගලයන් භාවිතා කරනවා. ඒ නිසා ක්‍රමානුකූලව, ඒකට අවශ්‍ය කරන සැලැස්මක් ඉදිරිපත් කළා. මම අදහස් කරන්නේ ඔවුන් නැවත සාකච්ඡාවකට කැඳවලා ඔවුන් සමඟ එකඟතාවයක් තුළ මේ වෙනස්කම් ටික කරගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ සාකච්ඡාව කරලා තියෙන්නේ මහජන උපයෝගිතා කමිටුවද?

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා සභා දෙකකට කලින් කිව්වා මේ යෝජනාවත් එක්කම මොරටුව පොළ සංවර්ධනය කරන්න ඕනේ කියලා. එවිට අපේ සමන්ත මන්ත්‍රීතුමා කිව්වා කාගිල්ස් එකට වඩා මිල වැඩියෙන් තියෙන්නේ මොරටුව පොළේ පලතුරු වෙළඳාම තුළ කියලා. ඔබතුමා ඒ අවස්ථාවේ කිව්වා පහු වෙනිදාම ක්‍රියාත්මක කරන්න කියලා. තාම ක්‍රියාත්මත වුණේ නෑ නගරාධිපතිතුමා. මාස දෙකක තුනක් ගියා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේකේ විශාල පමාවක් තියෙනවා කියන එක පිලිගන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ කාරණාව සම්බන්ධවම මම ඉල්ලීමක් කරනවා, මෙතුමා කියපු විදිහට පාරිභෝගික අධිකාරියට මේ සම්බන්ධයෙන් යවන්නම් කියලා කිව්වා. දෙවැනි කරුණ අපි කතා කරපු ටන්ස්ටන් බල්බ් එක නිසා අපේ පොදු විදුලි සැපයුමෙන් විශාල ප්‍රමාණයක් එක් පාර්ශවයක් විතරක් ගන්නවා කියන එක. ඒකට ස්ථිරසාර විසඳුමක් ඇත්තටම අවශ්‍යයි. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා කඩිනමින් ක්‍රියාත්මක වෙන්න කියලා. ඊට අමතරව පොළ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඔබතුමා කරපු කතාවේ සත්‍යතාවයක් තියෙනවා. මොකක් හරි ටයිම් ෆ්‍රේම් එකක් තියෙනවද මෙන්න මේ කාලෙත් එක්ක මේක ක්‍රියාත්මක වෙනවා කියලා හා මේක අවතීර්න වෙනවා හා අවසන් කරනවා කියලා. ඊළඟට ඔබතුමාගෙන් පැහැදිලි කරගන්න කැමතියි මේක ලබාදීමේදි යම් ස්කෙච් එකක් තියෙනවනේ, ඒ ස්කෙච් එක තියෙනවා නම් අපිට එයාලා අල්ලලා තියෙන ප්‍රමාණය පැහැදිලිව වෙන්කර ගන්න පුළුවන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මීළඟ කමිටුවේදි මේ කරුණු ටික අරගෙන සාකච්ඡා කරලා එකඟතාවයකට එමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(05) තෙලවල සිහිති හමුව පෙර පාසල සම්බන්ධව. මෙම වාර්තාවේ තියෙන්නේ, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, මෙම කරුණ සම්බන්ධයෙන් 2026.05.12 දිනැති මහජන උපයෝගීතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(12) දරණ නිර්දේශය පරිදි ඉදිරි කටයුතු කිරීමටත් ඒ සම්බන්ධව පෙර පාසලේ දරුවන්ගේ දෙමව්පියන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමටත් නිර්දේශ කරන ලදී කියලා. අපි අහන්න කැමතියි මොකක්ද අලුත්ම තත්ත්වය කියලා. එදා අපි පැහැදිලව ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කළා ස්වාමීන් වහන්සේ මුණගැහිලා මේ සම්බන්ධව සාකච්ඡා කරන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඒ සම්බන්ධව ස්වාමීන් වහන්සේ සමඟ දුරකතනයෙන් සාකච්ඡා කළා. ස්වාමීන් වහන්සේගේ කථාව ඇතුළේ අපිට යම් චෝදනාවකුත් තිබුණා. ඒ තුලින් මම තේරුම් ගත්ත දෙය තමයි හාමුදුරුවෝ පෙර පාසල ඉවත් කරනවට එකඟ නෑ. ඒ කියන්නේ අපිට ඉඩ තියෙනවා. අනාරක්ෂිත තත්ත්වයක් පිළිබඳවනේ දෙමාපියන් පැත්තෙන් මතුවුණා කියන්නේ දරුවන්ට.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දෙමාපියන්ගේ පැත්තෙන් මතුවෙලා නෑ. නිරීක්ෂණයට ගිය කමිටුවේ කට්ටිය තමයි අනාරක්ෂිත බව දැකලා තියෙන්නේ. දෙමාපියෝ මේකට විරුද්ධ නෑ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඒක තමයි. කමිටුව පක්ෂ විපක්ෂ නියෝජනයක් ඇතුවනේ නිරීක්ෂණය සඳහා ගියේ. ඔවුන්ගේ අදහසුත් සඳහන් කළා. කොහොම නමුත් මම හිතනවා යම් වියදමක් යන නමුත් අපි තෙලවල පුස්තකාලය හදන්න ඕනේ ඒක හරි. පෙර පාසල සම්බන්ධයෙන් නම් මගේ අදහස නම් සාකච්ඡා කළ යුතුයි. පන්සලේ පවත්වාගෙන යනු ලබන පෙර පාසල සම්බන්ධයෙන් ස්වාමීන් වහන්සේගේ විරෝධතාවයක් නෑ. උන්වහන්සේ ප්‍රකාශ කළේ අවුරුදු ගණනාවක් තිස්සේ ඔය සඳහන් කරන ගසේ ගෙඩි තිබුණා කවදාවත් දරුවෙක්ට හානියක් වෙලා නෑ කියලයි. මම මේ කියන්නේ ස්වාමීන් වහන්සේගේ පැත්තෙන් ආපු අදහස්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පන්සලේ දහම් පාසල් දරුවෝ 600ක් 700ක් ඉගෙන ගන්නවා. මේ වන තෙක් කාටවත් හානියක් වෙලා නෑ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, ඒක තමයි. මම කියන්නේ දෙමාපියන්ගේ සාකච්ඡාවෙන් පසුව පෙර පාසල දිගටම පන්සලේ පවත්වාගෙන යාමට පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, බොහොම ස්තුතියි. මේ නිර්දේශය සම්බන්ධයෙන් ඔබතුමාගෙන් මැදිහත්වීමක් වෙන්න. මොකද හේතුව, මම දැක්කා මුදල් කමිටුවෙත් තියෙනවා පෙර පාසලේ තැන වෙනස් කරලා සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් මුදල් වෙන් කිරීමක් පිළිබඳව.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිතුමා, මම ඒ පිළිබඳව කතා කළා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 02(06) අභ්‍යාස පොත් ලබාදීම සම්බන්ධව. එහි දැන් අවසාන කොටස යන්නේ. මම එහි කමිටු නිර්දේශයේ දැක්කා, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, පාසල් සිසුන් සඳහා අභ්‍යාස පොත් කට්ටල බෙදාදීමේ ව්‍යාපෘතියට අදාළව අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය ඉක්මවා ඇති බැවින් මින්පසු අයදුම්පත් භාර නොගන්නා බව සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට ලිපියකින් දැනුම් දීමට නිර්දේශ කරන ලදී කියලා. තවමත් අයදුම්පත් එකින් එක භාරදෙමින් ඉන්නවා පක්ෂ විපක්ෂ දෙගොල්ලොම. ඒ නිසා ඉල්ලීමක් කරනවා අවසාන වතාවට අපට මාසෙක කාලයක් ලබාදෙන්න කියලා. අයදුම්පත් සුළු ප්‍රමාණයක් තියෙන්නේ ඒ ටික

සම්පූර්ණ කරලා භාරදෙන්න. මක්නිසාද කාටවත් හානියක් නෑ ඒක දුන්නා කියලා. ඔබතුමා අපට මාසෙක කාලයක් ලබා දෙනවද?

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඒක සභාව තීරණය කරන්න ඕනේ. තනියම තීන්දු කරන්නේ නෑ. මම කියන්නේ මොකක් හරි වැඩක අවසානයක් තියෙන්න ඕනනේ. අපි අවස්ථා කිහිපයක්ම දුන්නා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි අගෝස්තු මාසයේ ඉවර කරමු.එක මාසයක් ඇති. මේ මාසේ ඇති අපිට.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සභාව එකඟ නම්, ආපසු පස්සේ දොස් කියන්න එපා. අගෝස්තු මාසයේ මෙය අවසන් වෙන කොට මේ කටයුත්ත කළේ නැත්තම්, එතනින් මේක අවසන් කරලා මේ ඉතුරු වෙන ටික බෙදා දීමේ වැඩසටහනක් මම හදනවා. අපරාධයක්නේ මේක මහජනතාවගේ සල්ලිනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අගෝස්තු මාසේ එන්නේ පාසල් නිවාඩුව.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අගෝස්තු මාසය අවසන් වනතෙක් කාලය හොඳටම ප්‍රමාණවත්. දැන් ඉතාම සුළු ප්‍රමාණයක්නේ තියෙන්නේ. ඒක අපි ඒ කාලය අරගෙන ඉවර කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ අවධානය යොමු කරනවා කරුණු අංක 05. එහි සඳහන් වෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව, මෙම ගොඩනැගිල්ල ඵලදායි කාර්යයක් සඳහා යොදා ගැනීම සඳහා ප්‍රජා මණ්ඩල රැස්වීම් වලට ලබාදීමට කටයුතු කරන ලෙස නිර්දේශ කරන ලදී යනුවෙන්. මම දන්නේ නෑ ප්‍රජා මණ්ඩල රැස්වීම් තියෙනවද කියලා මොරටුවේ. දැන් අපිට තිබෙන ගැටලුව උපයෝගිතා කමිටුව උත්සහ කරන්නේ නැද්ද කොහොම හරි මෙම පෙර පාසල නැවත ඇති කරන්න. ඒ කියන්නේ ගෙයින් ගෙට ගිහිල්ලා අපි මෙහෙම පෙර පාසලක් කරනවා දරුවන් එවන්න කියලා හරි ජනතාව දැනුවත් කරන්න. අපි එහෙම කලින් කළා. අපේ පෙර පාසල් 15යි තියෙන්නේ. තිස්ගාණක් තිබුණා පෙර පාසල්. ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා උපයෝගිතා කමිටුවෙන් මේ පෙර පාසල වැසෙන්න දෙන්න එපා. වැසුණු එක නැවත ඇති කරන්න ලබන අවුරුද්දේ හරි. අඩුම තරමේ ළමයින් හය හත් දෙනෙක් අරගෙන හරි මේක ඇති කරන්න කුමක් හෝ වැඩපිළිවෙලක්. ළමයින් පොත්පත් ටිකක් දීලා, ඒ කියන්නේ දරුවන්ව ආකර්ෂණය කරගන්න මොනවා හෝ දීලා, දුප්පත් තැන්වලට ගිහිල්ලා කතා කළාම ඒ දරුවන්ව ගන්න පුළුවන්. ඒ නිසා මේ පෙර පාසල වැසෙන්න දෙන්නේ නැතුව මේක නැවත වරක් කරන්න ස්ථාපනය කරන්න අවශ්‍ය කරන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, කරුණු අංක 09 පෙර පාසල ඉවත් කර ගැනීමට. එහි යෝජනාව තමයි "එගොඩඋයන දකුණ ග්‍රාමසේවක වසමේ අල් හසනාත් පෙර පාසල ඉවත්කර පාරමී පෙර පාසලට අනුබද්ධ කර එගොඩඋයන දකුණ මාතෘ සායනයට එම ඉඩකඩ ලබාදෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටීමි." මාතෘ සායනයට මෙම ඉඩකඩ ලබාදීමේ චේතනාව මම ඉතා අගය කරනවා. නමුත්

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය පිණිස යොමු කරනවා පාරමී පෙර පාසල ප්‍රජා ශාලාවේ තමයි දැන් ස්ථාපිත කරලා තියෙන්නේ. අපි දන්නවා කමිටුවේ සභාපතිතුමිය ලොකු උත්සහයක් දරනවා පෙර පාසල් කොන්ට්‍රිට් එකට වඩා කොලිටි එකට ගෙනියන්න. එතුමියගේ ජූලි මාසේ ස්ටේට්මන්ට් එකක් තිබුණා එතුමිය කිව්වා පෙර පාසල් දුප්පත් දරුවන්ට පමණක් නොව සාමාන්‍ය මධ්‍යම පාන්තික දරුවන්ටත් යන්න පුළුවන් විදිහට හදන්න ඕනේ කියලා. අපි පෙර පාසල නඩත්තු කරනවා නම් නිර්නායකයන් තියෙනවා. එලෙස ගත් විට පාරමී පෙර පාසල එම නිර්නායක යටතට එන්නේ නෑ. එහෙම තියෙද්දි අල් හසනාත් පෙර පාසලේ දරුවන් දස දෙනෙකු පමණ සිටිනවා. ඒ දරුවන්වත් ගෙනල්ලා මෙම පෙර පාසලට දාන්න හදනවා. එතන නිර්නායකයන් සුදුසු නෑ පෙර පාසලේ දරුවන්ට. ඒනිසා ඒ සඳහා අවධානය යොමු කරන්න කැමැතියි අපි අටුව කඩලා පුටුව හදන්නේ නැතුව මේ දරුවන් ගැන හිතලා තීන්දු තීරණ ගන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ මන්ත්‍රීවරිය ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් කතා කරනවා නම්, මාතෘ සායන ගොඩනැල්ලේ ඉඩකඩ මදි ප්‍රශ්ණයක් තියෙනවා. මීළඟට පාරමී පෙර පාසලත් සමඟ ඒකාබද්ධ කරන්න කියලා යෝජනාවක් ඇවිල්ලා තියෙනවා. යාබඳව මුහුණලා තියෙන පෙර පාසල් දෙකක්. ඔබතුමිය කිව්වා වගේ පාරමී පෙර පාසලේ ගැටලු ගණනාවක් තියෙනවා. එය දරුවන්ට සියල්ල සපිරි හොඳ පෙර පාසලක් නෙමෙයි. අපි නිර්දේශයකුත් නිකුත් කරලා තිබෙනවා එම පෙර පාසලේ තිබෙන අඩුපාඩු සම්බන්ධයෙන් ඉදිරියේදි ක්‍රියාත්මක වන්න.ඒවගේම තමයි අපි මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ වනතෙක් අරගෙන නෑ. පළමුව යෝජනා කරලා තියෙන්නේ අදාළ පෙර පාසල් දෙකෙහි දෙමාපියන්, ගුරුවරුන් මේ සියලු දෙනා සම්බන්ධ කර සාකච්ඡාවක් කරන්න. දෙවනුව ඔබතුමිය කියනවා වගේ පාරමී පෙර පාසලේ දැනට සිටින දරුවනුත් අඩු පහසුකම් යටතේ සිටින්නේ, ඒ නිසා මේකට ගෙනල්ලා දාලා හරියන්නෙත් නෑ. මේ දෙගොල්ලෝ එකම පෙර පාසලක් බවට පත් කරන්න. අපේ මීළඟ යෝජනාව තමයි දෙමාපිය සාකච්ඡාවෙන් අනතුරුව පාරමී පෙර පාසල දරුවන්ට සිටීමට සුදුසු පරිදි අවශ්‍ය පහසුකම් සියල්ල සපුරා දෙන්න. පළමු අදියරට විතරයි මන්ත්‍රීතුමිය අපි අත තියලා තියෙන්නේ. පළමුව මෙම පෙර පාසල් දෙකෙහිම ගුරුවරු දෙමාපියන් සියල්ල කැඳවලා එක සාකච්ඡාවක් ගන්නවා ඔවුන් කැමති නම් පමණක් එක පෙර පාසලක් බවට පත්කරන්න ඉන් අනතුරුව තමයි ඉදිරි සංවර්ධන කටයුතු මෙම පෙර පාසලේ සිදුකරන්න යෝජනා කරගෙන ඉන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා කරුණු අංක 03, අපේ මොරටුවේ වීරයා, වීරපුරන්අප්පු ගුණ සැමරුම පිළිබඳව. එය උත්සවත්ශ්‍රීයෙන් සමරන්න යෝජනා වෙලා තිබෙනවා. අපේ වීරපුරන්අප්පු වීරයාගේ කඩුව තිබෙන්නේ, කඩුවේ අයිතිකාරයා චන්දන ප්‍රනාන්දු මහත්මයා. එතුමාට යම් ආරාධනාවක් කරලා තිබෙනවාද?, මා හට කිව්වා තවත්මත් එතුමාට ආරාධනාවක් නෑ කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි එතුමව සම්බන්ධ කරගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මීළඟ කාරණාව තමයි මොරටුව මහා නගර සභාවේ පෙර පාසල් සම්බන්ධව අපි කතා කළා ඒවා විධිමත් කිරීම සම්බන්ධව. දුප්පත්, නැති බැරි පවුල්වල දරුවන් නගර සභා පෙර පාසල් වලට එනවා කියනවට වඩා හැම දරුවෙක්ම මෙතනට එන තත්ත්වයට විධිමත් කරන්න කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුයි. ඒනිසා මම ඔබතුමාට ගරු නගරාධිපතිවරයා විදිහට යෝජනාවක්

කරන්න කැමැතියි අපි දකින එකක් තමයි සෑම කමිටුවකම අපි තීන්දු තීරණ ගත්තට ඒවට විසඳුම ලැබෙන්නේ නෑ. ඒ විසඳුම් ලැබෙන්නැති වුණාම එක පැත්තකින් නගරාධිපතිවරයා හැටියාට ඔබතුමාලත් අපහසුතාවයට පත්වෙනවා, අපෙනුත් මහජනතාව අහනවා. අනිත් පැත්තෙන් ගත්තට පස්සේ මහජනතාව බලාපොරොත්තු වුණ ඔවුන්ගේ පරිමාධිපත්‍ය බලයටත් අතුල් පහරක් වදිනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි කමිටුවල තිබෙන යෝජනා මාස, මාස 02, අවුරුද්දට වඩා ගිහිල්ලා අතපසු වෙනවට වඩා මේක ඉක්මණින් ඉවර කරගන්න සමස්ථ කමිටුවලට යම් වැඩපිළිවෙළක් අවශ්‍යයි. එහෙම නැති වුණොත් විසඳුම් නැති කමිටු වාර්තා බවට විතරක් පත්වෙයි. එමනිසා ඒ පිළිබඳව විද්‍යාත්මකව හිතලා ක්‍රමවේදයක් සකස් කරන්න. එහෙම නැති වුණොත් මාස දෙක තුන ගොඩවෙලා අපිට කරගන්න බැරි තත්ත්වයට පත්වෙනවා.ඒ නිසා පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඕ ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කාරණා දෙකක් සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කරනවා. පළමු කරුණ නම් සුජිත් මන්ත්‍රීතුමා විසින් සඳහන් කළ සිහිති හමුව පෙර පාසල සම්බන්ධයෙන්. කමිටු විදිහට අපි එතන නිරීක්ෂණය කරපු කාරණාව සම්බන්ධයෙන් එතුමාගේ අදහස් දැක්වීමේ තිබුණා. ගරු නගරාධිපතිතුමනි, එම ස්ථානයේ ස්ථානීය පරික්ෂාවක් සඳහා අපි කමිටුව විදිහට මන්ත්‍රීවරු, මන්ත්‍රීතුමිලා කිහිපදෙනෙකු සහභාගි වුණේ. මම සහ ලිහිණි මන්ත්‍රීතුමිය ඇස් දෙකෙන් දැක්කා එතන ඒ දරුවන්ට ඉන්න සුදුසු පරිසරයක් නෙමෙයි කියලා. ඒ ස්ථාවරයේ අපි අදත් ඉන්නවා. නමුත් ස්වාමීන් වහන්සේත් එකඟ නම් එම ස්ථානයේ පෙර පාසල පවත්වාගෙන යන්න ගැටලුවක් වෙන්නේ නෑ කියලා, දෙමාපියොත් එකඟ නම්, මේ සභාවෙත් බහුතරයක් එකඟ නම් ඒ එකඟතාවය සම්බන්ධයෙන් මම ප්‍රශ්ණ කරන්නේ නෑ. කාරණාකරලා මහා සභාව වාර්තාවේ සඳහන් කරන්න මම සහ ලිහිණි මන්ත්‍රීතුමිය එම ස්ථානය දරුවන්ට නුසුදුසු අනාරක්ෂිත ස්ථානයක් කියන ස්ථාවරයේ සිටින බව. එතන පෙර පාසල පැවතුනත් මට අදාළ නෑ. මේක පැහැදිලිව ලියන්න කියලා කියන්නේ කවදා හෝ දවසක යම්කිසි අනතුරක් සිදුවුවහොත් අපි ඒකෙන් නිදහස් වෙන්න ඕනේ. මක්නිසාද, මෙම කාරණා අපි ඇස් දෙකෙන්ම දැක්ක නිසා.

ගරු නගරාධිපතිතුමනි, දෙවැනි කරුණ වීරපුරන්අප්පු ජාතික විරුවාගේ සැමරුම නගර සභාව අගෝස්තු 08 වෙනිදාට යොදාගෙන තිබෙනවා. සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා ඇතුළු අපේ කණ්ඩායමක් 08 වෙනිදා වීරපුරන්අප්පු ගුණ සමරු උත්සවයක් පවත්වන්න එතුමා උපන් උයන ග්‍රාමයේ සූදානම් කරලා තියෙනවා. අපි හට ආරාධනා පත්‍ර මුද්‍රණය කරන්න තරම් මුදලක් නොමැති නිසාත්, ඒ සඳහා යම් මුදලක් වැයවන නිසාත්, මොරටු පුත්‍රයා, ජාතික දෙවැනි නිදහස් සටනේ නායකත්වය ගත් පුද්ගලයා වන වීරපුරන්අප්පු ශ්‍රීමතාණන්ගේ 178 වන ගුණ සමරු උත්සවය අගෝස්තු 08 වෙනිදා සවස 03.30ට ලුනාව මංසන්ධියේ දුම්රියපොළ අසළ බුදු පිළිමය අසළ පැවැත්වීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා සහභාගී වන මෙන් ඉතාමත් ගෞරවයෙන් ලෙන්ගතුකමින් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මා හට ප්‍රතිපත්තිමය කාරණාවක් ඉදිරිපත් කරන්න තියෙනවා සුජිත් මන්ත්‍රීතුමා සඳහන් කරපු පෙර පාසල සම්බන්ධයෙන්. අපි මහජන උපයෝගිතා කමිටුව හැටියට ඉතාමත් සත්භාවයෙන් ඒ ස්ථානයට ගියා. අපි සත්භාවයෙන් ඒ දිහා බැලුවා. මමත් අම්මා කෙනෙක්. අපිටත් ඒ පරිසරය ගැන යම්කිසි වැටහීමක් තිබුණේ නෑ. එතන ළිඳක් තියෙනවා. අපිට එතන සිටින දරුවන්ගේ ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටලු මතුවුණා. යම්තැනක දහම් පාසලේ පුටු ගොඩගහලා තිබුණා. ළමුන් එතන ඉඳගෙන පාඩම් කරන්නේ. යම් විදිහකින් එක පුටුවක්

ඇද්දොත් පුටු ටික ඔක්කොම දරුවන්ගේ ඇඟට කඩාගෙන වැටෙනවා. වැසිකිළිය තියෙන්නේ ඉතා දුරින්. ඒ හරියේ ලිඳක් තියෙනවා. අපි දන්නේ නිතරම ගුරුවරයෙක් සමඟ වැසිකිළියට යනවද කියලා. අපි නිරීක්ෂණය කල විට අපි එහි ඇති අනාරක්ෂිතබව සත්භාවයෙන් හැඟී ගිය නිසා තමයි අපි කමිටුවක් හැටියට මෙම යෝජනාව ඉදිරිපත් කළේ. අපිට මෙතන දේශපාලනය අදාළත්වයක් නෑ. දෙමාපියන්ට ප්‍රශ්ණයක් නැත්තම්, ස්වාමීන් වහන්සේට ප්‍රශ්ණයක් නැත්තම්, ඔබතුමාටත් ප්‍රශ්ණයක් නැත්තම් ඔබතුමා තීරණය කරන්න. නමුත් අපි කමිටුවක් හරියට තීරණයක් ගත්තම ඒක ඕවර්රයිට් කරන එකත් අපි කරන අපහාසයක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පසුගිය මහජන උපයෝගිතා කමිටුව නියෝජනය කරමින් නගර සභාව සතු පෙර පාසල්වල නිරීක්ෂණ වාරිකාවට සහභාගි වුණා. අදාළ නිරීක්ෂණ වාරිකාවේදි පෙර පාසල් 17ටම අපි ගියා. මෙතනදි පක්ෂ විපක්ෂ කියලා නෑ. එතන නිරීක්ෂණය කරද්දි ඇත්තටම නුසුදුසු තත්ත්වයක තමයි තිබුණේ. කමිටුවක් විදිහට අපි සියලු දෙනා ඒක අත්දැක්කා. එතන තිබෙන ආවරණය සහිත ශාලාව, ගස්, එම ගස්වල පොල්අතු වේලිලා, පොල්ටික එහෙම්මයි. ලිඳක් තියෙනවා පාලුවට ගිහිල්ලා. ඔය තත්ත්වෙත් එක්ක තමයි කමිටුවක් විදිහට තීරණය කළේ මෙතන අනිවාර්යයෙන්ම නුසුදුසුයි කියලා. මම කියන්නේ මෙතන නුසුදුසු නම් සියලු දෙනාම එකඟවෙලා අනාරක්ෂිත තත්ත්වය ඉවත් කරලා, එතන නායක ස්වාමීන් වහන්සේත් කැමති නම් සුදුසු විදිහට සකස් කරලා ඒ පෙර පාසල පවත්වන්න කියලා මම යෝජනා කරනවා. අපි කමිටුවක් විදිහට තමයි මෙම තීරණය ගත්තේ.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,  මේ කරුණ සම්බන්ධයෙන් මමත් එම නිරීක්ෂණ වාරිකාවට සහභාගි වුණා. ඒ අවස්ථාවේදි මේ මන්ත්‍රීවරුන් මන්ත්‍රීතුමියන්ලා ඉදිරිපත් කරපු කාරණාව අපි ඒ විදිහට දැක්කා. ලිහිණි මන්ත්‍රීතුමිය එතන තිබුණු තත්ත්වය සම්බන්ධයෙන් හොඳ පැහැදිලි කිරීමක් කළා. ඒ තත්ත්වය එලස තමයි පැවතුණේ ගරු නගරාධිපතිතුමනි. කෙනෙක් විරුද්ධ වුණා කියලා අපිට දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නොහිතා ඉන්න බෑ. ඒ නිසා මේ සම්බන්ධයෙන් වඩාත් සැලකිල්ලක් දක්වන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසලේ දරුවන් ඉන්නේ පාසල ඇතුළේ. පෙර පාසලේ ගුරුවන් දෙදෙනකු සිටිනවා. සාමාන්‍යයෙන් දරුවන්ව පෙර පාසලට තුළට රැගෙන යන්නේ දෙමව්පියෝ. ඉන් අනතුරුව දරුවන්ට වැසිකිළිවලට එක්ක ගෙන යන්නේ පෙර පාසලේ ගුරුවරයෙක්. පෙර පාසලේ සිටින දරුවන් පහළොස් දෙනා වෙනුවෙන් නගර සභාව වැටුප් ගෙවලා ගුරුවන්ට දෙනෙකු සේවයේ යොදවා තිබෙනවා. අපිට තිබෙන ගැටලුව තමයි මොකක්ද මේ අනාරක්ෂිත බව කියලා.ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා සභාව හැටියට නිරීක්ෂණ වාරිකාවක් කරලා, එතන නිරීක්ෂණය කරලා, ස්වාමීන් වහන්සේ සමඟත් සාකච්ඡා කරලා අපි තීන්දුවක් ගමු. අනිත් කරුණ තමයි ගරු නගරාධිපතිතුමා, ලිහිණි මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා කමිටුවට අපහස කරනවා කියලා. කමිටුවට තීන්දු ගන්න බෑ නිර්දේශ කිරීමට පමණයි පුළුවන්. තීන්දු ගන්නේ මෙතන. ඒනිසා ඕනම වේලාවක කමිටු තීන්දුවක් සභාවට වෙනස් කරන්න පුළුවන්. මේක තමයි උත්තරීතර ස්ථානය. ලිහිණි මන්ත්‍රීතුමිය, මේක උසාවිය නෙමෙයි, එමනිසා ඔබතුමියට එතනදි වැරදුණා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, පැහැදිලිව ම කියන්නට ඕනේ  මේ සම්බන්ධයෙන් ඔබතුමා ස්වාමීන් වහන්සේ සමඟ සාකච්ඡා කරලා මේක තීන්දුවක් කරන්න. ඔතනින් පෙර පාසල ඉවත් කළා කියලා මට ගැටලුවක් නෑ. නමුත් මම කියන්නේ මම දකින අත්දැකීම්වලින් ඔතන තමයි පෙර පාසල තියන්න හොඳම තැන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසල් නිරීක්ෂණ චාරිකාවේදි එතන ගුරුවරු දෙනෙකු සිටියා, අපේ කමිටුව තිබුණා, දෙමාපියන් දෙනෙකු එතන සිටියා. එහිදි ඒ අයගේ ඉල්ලීම මත තමයි අපි කමිටුවක් විදිහට මෙවැනි නිර්දේශයන් වලට එන්නේ. ඒ අවස්ථාවේදිත් ඔටිසන් සහිත දරුවෙක් සිටියා එම දරුවා පොල් ගහක් යට ලිස්සන බෝට්ටුවක් ළඟ තමයි සිටියේ. ඒ අවස්ථාවේදි උප නගරාධිපතිතුමියගේ රියදුරු මහතා විසින් තමයි එල්ලෙමින් තිබුණු පොල් අත්ත ගලවා ඉවත් කළේ දරුවාගේ හිසට වැටෙයි කියලා. ඒ අවස්ථවේ එතන ගුරුවරියන් දෙදෙනා හා දෙමාපියන් දෙදෙනකු සිටියා, ඒ අය සමඟ සාකච්ඡා කරලා කමිටුවක් විදිහට තමයි මෙවැනි නිර්දේශයකට ආවේ. අපේ කිසිදු පෞද්ගලික අවශ්‍යතාවයක් නෑ පන්සලේ තිබෙන පෙර පාසල වෙනත් ස්ථානයකට ගෙනියන්න. නමුත් දරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් වගකිව යුතු කමිටුවට විදිහට අපි ඒ අවස්ථාවේදි මෙම නිර්දේශය නිකුත් කරන්න සිදුවුණා. දරුවන්ගේ ආරක්ෂාව සලස්වනවා නම් ඊට අදාළ පරිසරයක් තිබෙනවා නම් කිසිදු බාධාවක් නෑ කමිටුව විදිහට ඒ ස්ථානයේ පෙර පාසල පවත්වාගෙන යන්න. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි මම කියන්න කැමති මේ කමිටුව ගැන මේ අවස්ථාවේදි කතා කරද්දි අපි ආරම්භයේදි කිව්වා වගේම ඔබතුමාගේ මැදිහත්වීම මත මෙම පෙර පාසල් පද්ධතිය නැවත නගාසිටුවන්න. දැයට පිපෙන මල් පෙර පාසල බොරළු ක්‍රීඩාංගණය කෙළවරේ තිබුණු පෙර පාසලක්. අපි කමිටු නිර්දේශය මත අවුරුද්දක් වැනි කාලයක් තුළ වෙහෙසිලා මේ වනවිට එම පෙර පාසල දරුවන්ට ආරක්ෂාකාරි තත්ත්වයක තියෙනවා. මොරටුවේ දරුවන්ට ආදර්ශවත් පෙර පාසල් පද්ධතියක් බවට මෙම පෙර පාසල් පද්ධතිය පත්කිරීමට ඔබතුමාගේම සංකල්පයකට අනුව ඉදිරියේදි කමිටුවක් විදිහට යෝජනාව ගෙන ඒමට සූදානම් කරලා තියෙනවා. දුප්පත් දරුවට පමණක් නොව ඕනෑම තරාතිරම දරුවෙකුට එන්න සුදුසුම පෙර පාසල් පද්ධතිය මොරටුව මහා නගර සභා පෙර පාසල් පද්ධතිය බවට පත් කරන්නට කමිටුවක් විදිහට මහන්සි වෙනවා. දැයට පිපෙන මල් පෙර පාසල ආදර්ශ පෙර පාසල විදිහට දරුවන්ට සෑම අතින් ම යෝග්‍යතාවක් සහිත පෙර පාසලක් බවට පත්කිරීමට පළමුවෙනි පියවර වශයෙන් සංවර්ධනය කිරීමට නියමිතයි. ඔබතුමාගේම යෝජනාවක් ඒක. අපිට කිසිදු ගැටලුවක් නෑ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන විදිහට පෙර පාසල පන්සලින් වෙනත් තැනකට ගෙනියන්න. නමුත් කමිටුවට විදිහට ඒ අවස්ථාවේදි නිරීක්ෂණ චාරිකාව ඇතුළේ අපි දෙමාපියන්, ගුරුවරුන් ඒ අය ඔක්කොම ඉදිරිපත් කරපු තොරතුරුත්, ඒ අවට නිරීක්ෂණය කරලා අපි ලබපු අත්දැකීම් එක්ක තමයි අපි මෙවැනි නිර්දේශයකට ගියේ. දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරනවා නම් අපට කිසිදු අවශ්‍යතාවයක් නෑ පන්සලේ පෙර පාසල වෙනත් තැනකට අනුයුක්ත කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තෙලවල පෙර පාසල සම්බන්ධයෙන් අවසන් නිර්දේශය තියෙන්නේ දෙමාපියන් සමඟ සාකච්ඡා කරලා තීරණයක් ගැනීමට.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දෙමාපියන් සමඟ සාකච්ඡා කළා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කමිටුවේ නිලධාරින් ඒ අය සමඟ සාකච්ඡා කරලා හොඳ තීරණයක් ගන්න ඒ තීරණයට අපි එකඟයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි මේකෙන් සභාවට පාඩමක් ගත යුතුව තිබෙනවා. අපි හැමෝටම වැදගත්. මම හිතන්නේ අපේ අත්දැකීම් එක්ක කියන්නේ, ස්ථාවර කමිටුවක් කියන්නේ අපි දීලා තියෙන නෛතික ක්‍රියාවලිය ඇතුළේ බලවත් ආයතනයක්. ඒ ආයතනය තනි අතේ හැසිරිච්ච එක සම්පූර්ණයෙන් අත්හැරියා. දැන් කමිටුවේ සාමාජිකයින්ට පුළුවන් සාකච්ඡා කරලා ඒ කමිටුවේ පොදු තීන්දුව ගන්න. දැන් අද ඒ කමිටුවේ පොදු තීන්දුව එනවා. නමුත් එම පොදු තීන්දුව සභාවට ආවම සභාවේ මන්ත්‍රීවරුන්ට ඒ තීන්දුවට අදාළව අදහස් පළ කරන්න පුළුවන්. එහෙම අදහස් පළ කරමින් තමයි අද මෙතනට ආවේ. කමිටුවේ තීන්දුව මොකක්ද දෙමාපියන් සමඟ සාකච්ඡාවක් කරගන්න එක. කමිටුව ගිහිල්ලා නිරීක්ෂණය කළා කමිටුවේ බහුතරයක් ඉන්නවා එතන පෙර පාසල පවත්වාගෙන යාමට සුදුසු නෑ කියලා. ඒ කියන්නේ පාන්සල සමඟවත් ස්වාමීන් වහන්සේ සමඟවත් ප්‍රශ්ණයක් නිසා නෙමෙයි. ඔවුන් ඔවුන්ගේ අත්දැකීම් ඇතුළේ ගත්ත දේ. දැන් අපි මේ සභාවේ තීරණයක් කරන්න ඕනේ කමිටුව නිර්දේශය අනුමත කරනවද නැද්ද කියන එක. කමිටුවක් නිර්දේශ කරනවා සභාවට, සභාව තමයි අනුමත කරන්නේ. ඒ අවස්ථාවේදි මන්ත්‍රීවරුන්ට අදහස් පළ කරන්න පුළුවන් ඒකට කිසි බාධාවක් නෑ. ඒ අදහස් ප්‍රකාශ කිරීම ඇතුළේ කමිටු නිර්දේශය ක්‍රියාත්මකයි. දෙමාපියෝ ගෙන්නලා සාකච්ඡා කරනවා. මම කියන්නේ කමිටුව තුළ තමයි මූලික නිර්දේශයන්ට අදාළ මැදිහත්වීම කරන්නට ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම වේලාසන කථා කළා කටුබැද්ද පුංචි පාර්ක් එක තිබුණු ස්ථානය. මම හිතන්නේ සුජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ තිලක් මන්ත්‍රීතුමා, සුදත් ක්‍රිශාන්ත මන්ත්‍රීතුමා සහ හිටපු අනුර ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ඇතුළු අපි හතර පස්දෙනාම ඉස්සර ක්‍රීඩා කරපු තැනක්. ඒ කාලේ ඔය ගොඩනැගිලි එකක්වත් තිබුණේ නෑ. සම්පූර්ණයෙන්ම ග්‍රවුන්ඩ් එකක් විතරයි තිබුණේ. ඒ කාලේ නගර සභාව විසින් ජනතාවගේ විරෝධතාවය මැද තමයි ඔබ ගොඩනැගිල්ල ඉදිකළේ. ඒ ගොඩනැගිල්ලේ මූලික ආරම්භය. ඉන් පසුව නිල නිවාසයක් ඉදිකරන්න ගත්තා. ඒ නිල නිවාසය අවුරුදු ගාණක් එක තැන තිබ්බේ. ඉන් අනතුරුව මරණාධාර සමිතියකට පොඩි කෑල්ලක් වෙන් කරලා දෙන්න කියලා අපි ඉල්ලුවා අපි ඉදිකිරීම කරගෙන ප්‍රයෝජනය ගන්නම් කියලා. නමුත් ඒකවත් අපිට නගර සභාවෙන් ලැබුණේ නෑ. ඒ නිසා මේක නගර සභාව සතු දේපළක්. විශේෂයෙන් ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ වගකීම යුතුකම වෙන්නේ නගර සභාව සතු දේපළ බැහැර කිරීම නෙමෙයි ආරක්ෂා කිරීම. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරින් කියනවා ඔවුන් ළඟ ඔප්පු තියෙනවා කියලා. නමුත් ඊට වඩා අයිතියක් අපට තිබෙන්නට ඕනේ දීර්ඝ කාලයක් සභාව සතුව තිබුණා නිසා සභාව පරිහරණය කිරීම නිසා. ඒ නිසා ඒක ආරක්ෂා කරගන්න කියන ඉල්ලීම කරනවා මේ සම්බන්ධයෙන් කතා කරන්න යැයි ප්‍රදේශවාසින්ගේ දැඩිව ඉල්ලීම් කළ නිසා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 වන දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(1), 02(3), 02(6), 02(7), 02(8), 02(9), 02(10), 02(11), 03, 04, 05, 06, 07 හා 08 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා

12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 වන දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටු වාර්තාවේ අංක 04 දරණ කමිටු නිර්දේශයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.10 දින පැවති මහජන උපයෝගිතා හා කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.07.10 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා )

**06 (3) 2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.චන්දන පී. විතානගේ මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා නීති කමිටුවේ අංක 04 යටතේ පී.සුජීව පීරිස් මහතා, සේවා අංක 666. ඔහු ආදායම් පරීක්ෂක තනතුරට පත් කරගැනීමේදි ඔහුට ප්‍රමුඛතාවය දිය යුතු බවට වන ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ ලිපිය පරිශීලනය කිරීමේදි ඔහුට ප්‍රමුඛත්වය ලබාදිය යුත්තේ ඇයිද යන්න තහවුරු කිරීම සඳහා ලේඛන කිහිපයක් ද ඉදිරිපත් කරලා තියෙනවා. මේ ලේඛනවල තියෙනවා ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් 2008.08.09 වෙනිදා පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා ඇති ලේඛනයක, ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇති අතර, පුරප්පාඩු පිරවීමේදි ඔහුට ප්‍රමුඛත්වය දී කටයුතු කිරීමට නිර්දේශයක් දක්වලා තිබෙනවා. එම නිර්දේශය 2009 ජනවාරි 05 වෙනිදා නැවත වතාවක් ලිපියක් මගින් තහවුරු කරලා තියෙනවා.

මම හිතන්නේ ආදායම් පරීක්ෂක තනතුරට පත්කිරීමේදි ඔහුට ප්‍රමුඛත්වය ලබාදීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කර ඇති ලේඛනවලින් පෙනී යනවා 1996 සිට වසර 30ක පමණ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයෙකු හැටියටත් යම් අසාධාරණයක් මේ පුද්ගලයාට සිදුවී ඇති බව. අපි මේ වන විට තරඟ විභාගයක් පවත්වා මෙම තනතුර පුරප්පාඩු පිරවීමට කටයුතු කරලා තිබෙනවා. නමුත් මෙම තරඟ විභාගය තුළ යම් ආකාරයක සේවා කාලය ඇගයීමකට ලක්කරලා, ඒවගේම යම් අසාධාරණයක් සිදුවී ඇත්තම් ඒ පිළිබඳව සලකා බලලා, විශ්‍රාම යාමට ආසන්නව සිටිනවා නම් ඒ පිළිබඳව ද සලකා බලලා යම් සේවකයෙකු සේවය කළ කිරීම තොරව අවසන් කිරීමට හැකිවන ආකාරයට අවස්ථාවක් ලබාදිය යුතුයි කියන තත්ත්වය තමයි මම දකින්නේ. විශේෂයෙන් මෙම ලිපියට ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇති ලේඛන පරිශීලනය කර බැලුවහොත් යම් අසාධාරණයක් සිදු වී ඇති බව පැහැදිලිව දක්නට ලැබෙනවා. විශේෂයෙන් ම පළාත් පාලන කොමසාරිතුමා විසින් සිදුකර ඇති නිර්දේශය, මෙම පුද්ගලයා යම් කිසි පරීක්ෂණයකට ලක්කරලා එම පරීක්ෂණය මත ලබා දී ඇති නිර්දේශයක්. එමනිසා මම නැවත කියා සිටින්නේ යම් සේවකයෙකුගේ සේවා කාලය, වසර 30ක් සේවය කරපු සේවකයෙක්. ඔහු තරඟ විභාගයේදී ලබා ගත් ලකුණු ප්‍රමාණයට මෙම සේවා කාලයත් සැලකිල්ලට ගෙන, ඒවගේම යම් අසාධාරණයක් සිදුවී තිබෙනවා නම් එම අසාධාරණයත් සැලකිල්ලට ගෙන මෙම තනතුර පිරවීමේදි කටයුතු කිරීම වඩාත් සුදුසු යැයි කියන කාරණය මම ඔබතුමාට පෙන්වා දෙන්න කැමතියි. එමනිසා ඒ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, නඩු වාර්තාවේ ප්‍රශ්ණ කිහිපයක් තියෙනවා. පළමු නඩුව නගර සභාව මගින් ලක්ෂ 87ක් වියදම් කරලා මුද්දර ගාස්තු සම්බන්ධයෙන් අපගේ විරෝධතාවය නොසලකා හිටපු නගරාධිපතිතුමා එම නඩුව පැවරුවා. නඩුවේ විවාදය තිබුණා 07.14 වන දින. නමුත් එදින විවාදය අරගෙන නෑ. මෙම නඩුව ගොනු කරලා හුඟක් කල් වෙනවා ගරු නගරාධිපතිතුමනි. 2022 දාපු නඩුවක්. මෙය නගර සභාවට අයවිය යුතු ආදායමක් ලෙස උපකල්පනය කරලා නගරාධිපතිතුමා එතුමාගේ ඒකමතික තීරණයට මෙම නඩුව දැම්මා. නඩු කල් යනවා. නමුත් මෙය මොන පදනමකින් කල් ගියාද කියන එක මම දන්නේ නෑ. නමුත් මම යෝජනා කරන්න කැමති අඩුම ගානේ ඊළඟ දිනයට කලින් සීනියර් ලොයර්ස් සමඟ කන්සල්ටේෂන් එකක් තියලා මේ නඩුවේ තත්ත්වය දැනගන්න. අපට මේ සම්බන්ධයෙන් යම්කිසි මැදිහත්වීමක් කරන්න පුළුවන්ද, නැත්තම් මේකේ තව දෙයක් කරන්න පුළුවන් මෙය අපිට විතරක් බලපාන දෙයක් නෙමෙයි නම් අනිත් නගර සභාවටත් ඉන්ටර්වීන් වෙන්න පුළුවන් නම් අවස්ථාවක් තියෙනවා. එමනිසා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මක්නිසාද, රුපියල් ලක්ෂ 87ක් ගෙවලා අපිට ප්‍රතිලාභයකුත් නෑ, අඩුම ගානේ ඒකේ විවාදයක් තියලා ඒකේ අවුට්කම් එක මොකක්ද කියලාවත් අපි දන්නේ නෑ. මීළඟට නඩු වාර්තාවේ 10, මධ්‍යම වෙළඳ පොළේ කඩ හිමියන් දහතුන්දෙනෙක් මොරටුව මහා නගර සභාවට විරුද්ධව පෙත්සමක් දාලා තියෙනවා. මොරටුව මධ්‍යම වෙළඳ පොළේ ප්‍රශ්ණයකුත් තියෙනවා. එම මධ්‍යම වෙළඳ පොළ සම්බන්ධයෙන් ඔබතුමාලගේ රජය යටතේ සංවර්ධනය කරන්න සැලසුමක් තියෙනවා කියලා නගර සභාවේ ඔබතුමාලගේ පාලනයේ මුල් අවධියේදී ප්‍රකාශ කළා. අයවැයේදීත් ඔබතුමා ඒ ගැන ප්‍රකාශ කළා. නමුත් අද වෙනතුරු ඒ සම්බන්ධයෙන් කිසිදු සාකච්ඡාවක් නෑ. ඒ අතරතුර තමයි මේ මධ්‍යම වෙළඳ පොළේ නඩුව යන්නේ. ඒකත් 2022 ඉඳලා යනවා. එම නඩුවේ දැනට විරෝධතා ගොනු කිරීමක් තමයි තිබෙන්නේ. නමුත් මම ඉල්ලීමක් කරන්න කැමතියි මේ සම්බන්ධයෙන් අපි වග උත්තරකාර පාර්ශයක් නිසා මෙම ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බලලා සමථයකට එළඹීමට හැකියාවක් තිබෙනවා නම් සාකච්ඡා කරන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, මීළඟට 12 වන

කරුණ, කඩලානේ නගර සභාවේ ඉඩම සම්බන්ධයෙන් අපි නගර සභාවේ සාකච්ඡා කරලා නඩුව පැවරුවා. අදාළ නීතිඥතුමා මට කතා කරපු අවස්ථාවේ කිව්වා ඒ ඉඩමට අදාළ නගර සභාව සතු ප්ලෑන් එකක් අස්ථානගත වෙලා කියලා. නඩුව ඉස්සරහට අරගෙන යන්න නම් අදාළ ප්ලෑන් එක සොයාගත යුතුයි. එමනිසා මම ඒ සම්බන්ධයෙන් මම කටුබැද්ද මන්ත්‍රීතුමා සමඟත් සාකච්ඡා කළා, එතුමත් උත්සහයක් දැරුවා. එතුමා සර්වියර්ගේ නිවසට ගියත් එය සොයා ගන්න බැරිවුණා. හේතුව එම ප්ලෑන්ස් ටික ඇක්සස් කරගන්න බෑ. මම ඉල්ලීමක් කරන්න කැමතියි ආයතන කමිටු සභාපතිගෙන් මොරටුව මහා නගර සභාවේ නීති නිලධාරි යටතේ ඒ සර්වියට ලියුමක් යවන්න එම ප්ලෑන් එකක ඉල්ලලා. එම ප්ලෑන් එක නැතුව මේ අධිකාරි පත්‍රය ක්‍රියාත්මක කරන්නට බෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 04, වෙළඳපොළ භාරකරු, පී.සුජීව පීරිස් මහතා විසින් ගරු නගරාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ලද අභියාචනය සම්බන්ධයෙන්. එහිදි සඳහන් කරලා තියෙනවා, උක්ත කරුණ සලකා බැලූ කමිටුව, මෙම සභාවේ පවතින ආදායම් පරීක්ෂක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා තරඟ විභාගයක් පවත්වා දැනටමත් එම පුරප්පාඩු සඳහා නිලධාරින් තෝරාපත් කරගැනීමට කටයුතු කරන ඇති බව කමිටු නිර්දේශයේ සඳහන් කරලා තිබෙනවා. ගරු නගරාධිපතිතුමනි, සුජීව පීරිස් මහතා කියන්නේ කාලයක් තිස්සේ සභාවේ සේවය කරන නිලධාරියෙක්. මෙතුමා මේ සම්බන්ධයෙන් 2004 වර්ෂයේදී ලිපියක් ඉදිරිපත් කරලා තිබුනත් එහිදිත් එම ලිපියත් සලකා බලලා නෑ. ඉන්පසුව නැවතත් 2008 වර්ෂයේදි ආණ්ඩුකාරතුමාටත් ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ලිපි සියල්ලම මෙම ලිපියෙහි ඇමුණුම් වල සඳහන් වෙලා තියෙනවා. මෙතුමා ඉල්ලන්නේ සාධාරණ ඉල්ලීමක් වුවත් මෙම සාධාරණ ඉල්ලීම මත මෙතුමාට සිදුවෙලා තියෙන්නේ අසාධාරණයක් බව අපට පෙනී යනවා. ගරු නගරාධිපතිතුමනි, මම දීර්ඝව කතා කරන්නේ නෑ මේ සම්බන්ධව. පී.සුජීව පීරිස් මහතාට අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා නම් කමිටුවට මොහුගේ අභියාචනය නැවත භාරගෙන කමිටුවේ නිර්දේශයක් අරගෙන මොහුට එම තනතුර ලබාදීමට හැකිනම් එය ලබාදීමට අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ඔබතුමාගෙන් දැනගැනීමට අවශ්‍යයි. ඇඟිලි සළකුණු යන්ත්‍රයේ වාර්තා ගැනීමට නොහැකි ප්‍රශ්ණයක් තිබෙනවාද ?, ඒනිසා අතිකාල සාදා ගැනීමේ ප්‍රශ්ණයක් තියෙනවා. දවස් හතක් යනවා කියලා කියන්නේ වාර්තාව ගන්න. ඒනිසා අතිකාල සාදන එක දවස් හතකින් පස්සට යනවා. මෙම ගැටලුව ඊට ඉස්සෙල්ලා කරගන්න විදිහක් නැද්ද.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ සේවය කරන අයට මෙම ප්‍රශ්ණය තදින් බලපාලා තිබෙනවා. ආයතන අංශයෙන් දැනුම්දීලා තියෙන්නේ සතියක් විතර යයි කියලා. පුළුන්නම් වෙනත් ක්‍රමවේදයක් හදලා දෙන්න.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා

6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(4), 02(7) හා 06 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
9. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ කමිටු වාර්තාවේ අංක 02(4), 02(7) හා 06 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 04 දරණ කමිටු නිර්දේශයට විරුද්ධව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය )

**06 (4) 2026.07.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(01) ගලිරථ සම්බන්ධව. අපි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් දැනගැනීමට කැමතියි ගලිරථ සේවාව ලබාගැනීම සම්බන්ධයෙන් ඇති ක්‍රමවේදය කුමක්ද කියලා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, උක්ත ප්‍රශ්නයට පිලිතුරු ලබාදීම සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට අවස්ථාව ලබාදෙනවා.

<u>ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක - ඒ.පී.ධර්මසේන මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගලි රථ සේවා ලබාගැනීමට අප ළඟ පෝරමයක් තියෙනවා, එය සම්පූර්ණ කරලා අපට ලබාදෙන්න ඕනේ. ඉන්පසු අපි ළඟ ප්‍රශ්ණාවලියක් තියෙනවා, ඒ විස්තර ටිකක් පුරවගෙන තමයි මුදල් අයකරගැනිම සිදුකරන්නේ. මුදල් අයකරගැනීමෙන් පසුව, මුදල් ගෙවපු පිළිවෙලට තමයි සේවාව ලබාදෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ගලි සේවාව ලබාදීමේ සාමාන්‍ය පිළිවෙල වන්නේ පෝරමයක් තියෙනවා ඒක පුරවනවා, ඉන්පසුව වැසිකිළි වලේ ස්වභාවය පිළිබඳව විමසීමක් කරලා මුදල් අයකිරීම සිදුකරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි දැනුවත් විදිහට නම් ඕක ඔහොම නෙමෙයි. අදාළ පුද්ගලයා ඇවිත් ගලි සේවාව ලබාගැනීම සඳහා අදාළ පෝරමය සම්පූර්ණ කළාට පසුව, කෙනෙකු එවන්නම් කියනවා වැසිකිළිවල බැලීමට. සල්ලි ගන්නේ නෑ. ඉන්පසු ප්‍රධාන පරිපාලකට කියනවා ගිහිල්ලා බලන්න කියලා. ප්‍රධාන පරිපාලක තමන්ගේ කවුරුහරි හරි තමන් හරි ගිහිල්ලා බැලුවට පස්සේ තමයි ආපසු ඇවිල්ලා අදාළ පුද්ගලයා සල්ලි ගෙවන්නේ. ඉන් අනතුරුව තමයි ගලි සේවාව ලබාදෙන්නේ. ඔය කියන වෙනස්වීම වුණා නම් වෙන්න ඕනේ සතියක එකහමාරක කාලසීමාව තුළයි. මොකද හේතුව අපේ ගේ ඉස්සරහ පුද්ගලයකු ආවා සල්ලි ගෙවන්න, ඒ පුද්ගලයට වෙච්ච දේ තමයි මම කියන්නේ. සාමාන්‍ය රැකියාවක නිවාඩුවක් දාලා ආවොත් ගරු නගරාධිපතිතුමා, ඒ පුද්ගලයට සිද්ධ වෙනවා ගලි රථ සේවාව ලබාගැනීම සඳහා දවස් දෙකක් නිවාඩු දාන්න. ඊට අමතරව නගර සභාව මගින් ගලි රථ සේවාව සපයන දිනයෙත් ඒ පුද්ගලයාට සිදුවෙනවා නිවාඩු ලබාගන්න.ඒ නිසා ගලි රථ සේවා ලබාගන්න පුද්ගලයෙකුට දවස් තුනක් රස්තියාදු වෙන්න සිදුවෙනවා අදාළ පුද්ගලයාට. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙත් අවධානය යොමු කරනවා. කරුණාකරලා මේ ක්‍රමවේදය වෙනස් කරන්න. මේක ලොකු ගැටලුවක්. අනිත් කරුණ තමයි ගලි සේවා ලබාගැනීමට පැමිණියන් පසුව ඉන්නේ කළමණාකරණ සහකාරවරයෙක් නෙමෙයි ඉන්නේ වෙන කෙනෙක්. එයාගේ ඇනුම් බැනුම්, ලොකුකම් බලන්නත් සිදුවෙලා තියෙනවා පරිභෝගිකයාට. ඒනිසා අපි සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගේ අවධානයට යොමු කරනවා, අපිට කමක් නෑ තනතුර මොකක්ද කියලා නමුත් මිනිස්සුන් සමඟ සම්බන්ධ වෙලා සුහදව වැඩ කරන්න පුළුවන් කෙනෙක් ඒ සඳහා යොදවන්න මිනිසුන් අපහසුතාවයට පත්නොවන ලෙස. මොකද බනින්නේ අපිට නෙමෙයි ඔබතුමාලට.

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(08) ජලය බැස නොයන කාණුවක් ඩෙංගු මදුරුවන් බෝවීම වළක්වා ගැනීම සම්බන්ධවයි. මේ පිළිබඳව ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙත්, සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙත්, ගරු නගරාධිපතිතුමාගෙත් අවධානය යොමු කරන්නේ පොඩ්ඩක් බලන්න. ඔබතුමාලගේ මන්ත්‍රීවරියක් වන ස්වර්ණා විජේරත්න ගරු මන්ත්‍රීතුමිය තමයි මෙම යෝජනාව ගේන්නේ. යෝජනාව ගේන්නේ 2025.09.17 වෙනි දින. එහි සඳහන් වෙනවා ඉහත කරුණට අදාළව ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් 2025.12.10 දිනැතිව පහත සඳහන් වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා සහ ඉන්පසුව ඉහත කරුණට අදාළව තාක්ෂණ නිලධාරි විසින් 2026.01.16 දිනැතිව පහත සඳහන් වාර්තාව ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. ඉන් අනතුරුව සඳහන් වෙනවා, උක්ත කරුණ ඉටු කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා මිනිස් ශ්‍රමය සම්බන්ධ ලැයිස්තුවක් සකස් කර ඇති නමුදු පෙදරේරු කාර්යය ඉටුකිරීම සඳහා සභා සේවයකයින් නොමැති බව වාර්තා කර සිටින බව. ආපසු වාර්තාවෙ සඳහන් වෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුවට, මෙම කාර්යය ඉටුකරමින් පවතින බවට වාර්තා වූ බැවින් එම කටයුත්ත කඩිනමින් නිම කිරීමට යටත්ව මෙම කාරුණ වාර්තාවෙන් ඉවත් කිරීමට නිර්දේශ කරන ලදී යනුවෙන්. මේ සඳහා අවුරුද්දක් ගිහිල්ලා තියෙනවා කාණුව පොඩ්ඩක් හදාගන්න. ඒක තමයි තියෙන ගැටලුව. සිරිබර මැණිකේපුර කියන්නේ සිය ගාණක් ජීවත්වන තැනක්.

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(09) ඇමුණුම් අංක 07ට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද 2026 ජූනි මස ඩෙංගු රෝගීන් පිළිබඳ වාර්තාව සළකා බැලීම. ගරු නගරාධිපතිතුමනි, මෙම වාර්තාවේ සඳහන්, වෙනවා "උක්ත කරුණ සලකා බැලූ කමිටුවට, 2026 ජූනි මස ඩෙංගු රෝගීන් පිළිබඳ වාර්තාව (ඇමුණුම් 07) ඉදිරිපත් විය. එකී වාර්තාව අනුමත කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී" කියලා.

මම දැනගන්න කැමති සභාපතිතුමා ඩෙංගු වාර්තාව අනුමත කරනවා කියන්නේ මොකක්ද කියලා. ඩෙංගු මදුරුවන් හරියට කාලා තියෙනවද කියලද. නමුත් මේක ප්‍රශ්ණයක් තියෙනවා ගරු නගරාධිපතිතුමා. ඇමුණුම 07 සම්බන්ධයෙන් ඔබතුමාගේ සහ සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා. ගරු නගරාධිපතිතුමා, තෙලවල මගේ බොහොම ළඟ හිතවතෙක් ජයරංග මහතා සාක්ෂි දරයි මේ මොහොතෙත් අයි.සී.යූ. එකේ ඉන්නවා දෙන්නෙක්. තෙලවල කොට්ඨාශයේ ඩෙංගු වැහිවැහැලා. නමුත් මේ වාර්තාවේ තෙලවල කොට්ඨාශය අතුරුදහන් වෙලා. ඒවගේම තමයි මේ වාර්තාවේ මෝල්පේ කොට්ඨාශය අතුරුදහන් වෙලා. මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඩෙංගු රෝගීන් 176යි කියලා තියෙනවා, සම්පූර්ණ ගාණ තියෙනවා 294ක්. මොරටුවේ ඩෙංගු ප්‍රමාණය පස් ගුණයක්වත් අඩුම තරමින් වැඩි වෙන්න ඕනා. මම අහන්න කැමතියි සභාපතිතුමාගෙන් තෙලවල, මෝල්පේ ආදි වසම් ඉවත් කරන ලද්දේ ඩෙංගු නැති නිසාද කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇමුණුම් 07 සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා. සාමාන්‍යයෙන් ඩෙංගු තොරතුරු ඉදිරිපත් කරන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් පමණක්ද? අපිත් වාර්තාවක් තියාගන්නවද? අපේ වෙනම ඉන්පෙන්ඩන්ට් නිරීක්ෂණයක් තියෙනවද? නැත්තම් එගොඩඋයන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් දෙන දත්ත මත පමණක් ද රදා පවතින්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, දැන් අපි කොහොමත් දන්නවා ඩෙංගු රෝගය විනිශ්චය කරලා ඩෙංගු බව නිශ්චිත ලෙස හදුනාගත්තු රෝගීන් රිපෝට්ස් එන්නේ රෝහල්වලින් එම්.ඕ.එච්. ඔෆිස් එකට. අපිට තියෙනවා එම්.ඕ.එච්.ඔෆිස් දෙකක්. ඒ දෙක තමා මොරටුව හා එගොඩඋයන කියලා කොටස් දෙකකින් යන්නේ. ඒවට අයිති කොට්ඨාශ තමයි වෙනම වෙනම පෙන්නලා තියෙන්නේ. නමුත් අපි කවුරුත් දන්නවා මේ රෝගය හඳුනා නොගත් විශාල ප්‍රමාණයක් පිටස්තර තැන්වලිනුත් ප්‍රතිකාර ගන්නවා. ඒක ලෙඩේමද කියලා හඳුනාගෙනත් නෑ. නමුත් ලෙඩේ හොද වෙනවා. ඒක ඩෙංගු වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. බහුතර පිරිසක් රෝහලගත වෙන්නෙම නෑ. අපිට එන වාර්තාවනේ අපි අරගෙන කියන්නේ. ඒක රෝහල්වලින් තහවුරු කරපු වාර්තාව. නගර සභාව හා එම්.ඕ.එච්.ඔෆිස් එකයි ඒකාබද්ධ වෙලා තමයි සෑම සිකුරාදා දිනකම මේ සාකච්ඡාව ගන්නේ. එහිදි මේ තත්ත්වය සැලකිල්ලට අරගෙන වර්ධනය වෙමින් තිබෙන භූමි කොහේද කියලා හඳුනාගෙන ඊට අවශ්‍ය කරන වැඩපිළිවෙල සකස් කරමින් යන්නේ. ඒක තමයි පසුගිය කාලෙටම සිද්ධ වුණේ. මේ වන විට සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවෙලා තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඩෙංගු වාර්තාවේ තිබෙනවා ජූනි මස ඩෙංගු රෝගීන් එගොඩඋයන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය කියලා. එහි තියෙනවා 2026.06.15 සිට 2026.06.18 දක්වා ඉදිබැද්ද කොට්ඨාශයේ ඩෙංගු රෝගීන් නැත. මේ දින කිහිපයේ තමයි අපේ දුව රෝහලේ හිටියේ. එම්.ඕ.එච්. ඔෆිස් එකේ ඉන්න පී.එච්.අයි මහත්වරුත් ඇවිත් බලලත් ගියා දුමත් ගැහුවා. රෝහලෙන් ලැබුණු වාර්තාවත් මම ඔහුට දුන්නා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සුජිත් මන්ත්‍රීතුමා මතුකරපු ප්‍රශ්ණවලට, විශේෂයෙන්ම ගලිරථ සම්බන්ධයෙන් ගත්තොත් ගලිරථ සම්බන්ධයෙන් මීට කලින් අපි සාකච්ඡාවක් ගත්තා ප්‍රධාන

පරිපාලකවරු යවලා ස්ථාන පරීක්ෂාවක් කරලා එහෙම වැඩක් කරමු කියලා. නමුත් සභාවේදිම මේ ප්‍රශ්ණය මතුවුණා ඒක ගැටලු සහගතයි ඒනිසා අපි නැවත මෙම ස්ථානයට ඇවිල්ලා ඒ අයට අදාළ පෝරමය පුරවලා ඒ අදාළ තොරතුරු ටික රැස්කරලා එතනින්ම යවන්න තමයි අපි තීරණය කළේ. ප්‍රායෝගිකව ගියාම පරිපාලකවරුන්ගෙත් අකමැත්තක් ආවා. ඒ නිසා ඒක සිද්ධ වුණේ නෑ. ඇත්තටම යෝජනාව ආවා සාකච්ඡා කෙරුණා නමුත් ඒක සිද්ධ වුණේ නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එම යෝජනාව එන්න බලපෑවේ මට මතක විදිහට මුදල් ගෙවලා ගලි රථය වෙන්කරගත්තට පස්සේ ගිහින් බලනකොට පස්සේ. එවිට වෙන්නේ අර පුද්ගලයගේ මුදලින් 50%ක් කපනවා. ඒකට විසඳුමක් විදිහට තමයි යෝජනා කළා අදාළ ඒරියා එකේ ඉන්නවා පී.එච්.අයි.කෙනෙක්, පරිපාලකවරයෙක්. ඔවුන්ට ඒරියා එකේ ගිහිල්ලා අදාළ ස්ථානය කිව්වම ඒ වැසිකිලි වල චෙක් කරලා බලන්න. ඒක ජනතාවගේ පැත්තෙන් හිතලා ගත්තේ. නමුත් නිලධාරින්ගේ පැත්තේ තිබ්බා ඒක ප්‍රායෝගික නැති බවක්. එමනිසා ජනතාවට ආයෙත් අසාධාරණයට මුහුණු දෙන්න සිද්ධ වෙනවා ගෙවපු මුදල සම්පූර්ණයෙන් නොලැබෙන නිසා. ඔය තිබුණු ගැටලුව තමයි ආවේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මීළඟට මෙතුමා සඳහන් කරපු ගැටලුව ඇත්තටම ප්‍රායෝගික ප්‍රශ්ණයක්. අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරින් දෙදෙනෙකු සිටියා නමුත් එම නිලධාරින් දෙදෙනා සේවයට එන්නේ නෑ. එනිසා අපට අවසානයේ ගලි රථ බලන්න දෙන්න වුණා අපේ කාර්යාල කාර්ය සහායක චින්තක මහතා තමයි බලන්නේ. ඒ සඳහා යොදවන්න නිලධාරියෙකු නොමැතිව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඒ තරම් අසරණ වුණා. දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරි කිහිප දෙනා විශාල රාජකාරි ගොඩක යෙදී සිටින බවයි අපට දැනුම් දුන්නේ. පුද්ගලයාගේ ස්වභාවය හා හැසිරීමේ ස්වභාවය අනුව ගැටලු ටිකක් තියෙනවා මම ඒක පිලිගන්නවා. ඇත්තටම ඒක කාර්යාල කාර්ය සහායක කෙනෙකුගේ රාජකාරියක් නෙමෙයි. ඇත්තටම සමහර ගැටලු තියෙනවා අපිට විසඳ ගැනීමට අපහසු. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මෙම ගැටලුව මතු කිරීම සම්බන්ධයෙන්. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මේ වනවිට ගැටලු කිහිපයකට මුහුණු දෙනවා නිලධාරිනගේ හිඟය නිසා. අතිකාල ප්‍රශ්ණය එනවා. එක නිලධාරිණියක් එන්නෙම නෑ. දැනට ඉන්නේ මධුෂා මිස් හා අළුතින් ආපු වාසනා මිස් ලොකු කාර්යාභාරයක් කරනවා. තව මිස් කෙනෙක් ඉන්නවා එයාගේ කැපාසිටි එක ඒ වැඩේ දුවන්න මදි. එනිසා ගරු නගරාධිපතිතුමනි, මේ ගැටලුව ඉක්මණට විසඳ ගන්න සිදුවෙනවා නැත්තම් හෙට අනිද්දා සේවකයන් ටික ඔබතුමාගේ කාර්යාලයට පැමිණෙයි අතිකාල ලැබුණේ නෑ කියලා. ඔබතුමාගේ ගැටලුව අපි හෙට ඉදලා කුමක් හෝ ක්‍රියාත්මක කරන්නම්. මීළඟට ඔබතුමා මතු කරපු ඩෙංගු සම්බන්ධ ගැටලුවේදි අපි ඉදිරිපත් කරන්නේ එම්.ඕ.එච්. ඔෆිස් එකෙන් අපිට එන වාර්තාවනේ. ඇත්තටම ගත්තොත් මීට වඩා වැඩිවෙන්න පුළුවන්. නමුත් දැනට අපට තිබෙන ප්‍රායෝගික තොරතුරු ගත්තොත් 07 වෙනි මාසේ 29 වෙනි දා සිට 07 වෙනි මාසේ 31 දක්වා මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සමස්ථ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 26 ක් ලෙසයි වාර්තා වෙනවා. එගොඩඋයන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සමස්ථ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 11ක් ලෙස වාර්තා වෙනවා. තෙලවල ගැටලුව මන්ත්‍රීතුමා, තෙලවල කියලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයක් නම් වෙන්නේ නෑ. ඒක අයත් වෙන්නේ බොරුපන කොට්ඨාශයට. මෝල්පේ සම්බන්ධවෙන්නේ කටුබැද්ද කොට්ඨාශයට. ඔබතුමා කියන එක හරි තෙලවල ප්‍රදේශයේ තවමත් ඩෙංගු රෝගීන් හමුවෙනවා. අපට ඒ ගැන වෛද්‍යතුමත් කිව්වා. අපි සෑම සිකුරාදා දිනකම එම රැස්වීම ගන්නවා. අපිට හිටපු

නගරාධිපතිතුමාත් යම් චෝදනාවක් කරලා තිබුණා සමාජ මාධ්‍යය ඇතුළේ මෙම රැස්වීම් කැඳවනවා කියලාවත් දන්නෑ වගේ. අපි කියන්නේ එන්න. අප මේ හැමදේම සාකච්ඡා කරනවා පෙර තිබුණා වගේම. වෛද්‍යවරුත් උපරිමයෙන්ම සම්බන්ධ වෙනවා. ඔබතුමාලගේ පැත්තෙනුත් මෙම අඩුපාඩු පෙන්නලා දෙන්න. අපි අනිවාර්යයෙන්ම ඊට අදාළ ක්‍රියාමාර්ග ගන්නවා. ඒත් එක්කම මම පොඩි වෙලාවක් ගන්නවා. අපි ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ගැන මට පොඩ්ඩක් කතා කිරිමට අවශ්‍යයි.  අපි ගාව තියෙනවා සමස්ථ වාර්තාව, අපි සතුටුයි කියන්න අපි මේ අවුරුද්දේ බජට් එකේ ටාගර්ට් කරලා තියෙනවා මිලියන 10ක්, මේ වන විට අපි මිලියන් 06ක් උපයලා තියෙනවා. මාස 06යි අපි මිලියන 06ක් උපයලා තියෙනවා. අපි සතුටු වෙනවා අපේ පාලනය තුළ යම් ජයග්‍රහණයක් ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙන් ලබලා තියෙනවා. මේක තව දියුණු වෙන්න ඕනේ. තව මේකෙන් වැඩිපුර ආදායම් ලබන්න පුළුවන්. අපි කියන්නේ මීට කලින් උපයපු ආදායම් සමඟ සසඳා බලද්දි ඉතාම හොඳ තැනකට ඇවිල්ලා තියෙනවා. ඉතාම විනිවිද භාවයෙන් ටෙන්ඩර් ක්‍රමය ඇතුළේ සියලු ආදායම් එතන එන ක්‍රමයක් තියෙනවා. අඩුපාඩු ඇති, නමුත් පොදුවේ ගත්තොත් ඉහළ මට්ටමෙන් සිදුවුනු වංචා දැන් සිදුවෙන්නේ නෑ කියන සහතිකය අපි දෙනවා.  ද්‍රව්‍ය ප්‍රතිසාදන මධ්‍යස්ථානය මේ වසර අවසන් වන විට යූ.එන්.ඩී.පී.ආයතනයත් සමඟ එකතු වෙලා තවත් දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. මිලියන 18ක් ආධාරයක් අපට එම ආයතනයෙන් ලැබෙනවා. අපි උපරිම මහන්සි වෙනවා. ඒවගේම පොදු ආරාධනයක් කරනවා ගරු නගරාධිපතිතුමා, ලබන 08 වෙනිදා රජයේ ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ සිදුවන පිරිසිදු කිරීමේ අත්තම කියන වැඩසටහන අපි යොදාගෙන තියෙනවා. ලුනාව කළපුව ආශ්‍රිත ප්‍රදේශය පිරිසිදු කිරීමටත්, ලුනාව දුම්රියපොළ ආශ්‍රිත ප්‍රදේශය පිරිසිදු කිරීමටත්, ඒ සඳහා පී.ආර්.ඩී. එක, නගර සභා සේවයකයින් හා ප්‍රජා සහභාගීත්වය සහිතව සිදුකරනවා. අපි විවෘතව ආරාධනා කරනවා සියලු දෙනාටම 08 වෙනිදා උදෑසන 09.00ට එන්න ලුනාව කළපුව අසළට. අපි කවුරුත් එකතු වෙලා ලුනාව කළපුවේ තිබෙන තත්ත්වය මීට වඩා හොඳ තැනකට ගේන්න මැදිහත් වෙමු. අපි ශ්‍රමදායකත්වය සියලු සහභාගිත්වය ඇතුලුව මේ කාර්යය ගොඩදාගන්න මහන්සි වෙමු කියලා ඉල්ලා සිටිනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු  නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |

13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(3), 02(6), 02(7), 02(11), 03 හා 04 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(1), 02(2), 02(8), 02(9) හා 02(10) දරණ කමිටු නිර්දේශයන්ට විරුද්ධව ද ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
12. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය )

**06 (5) 2026.07.14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභා ක්‍රීඩා කණ්ඩායම් ඉතාම හොඳ මට්ටමක ඉන්නවා. මේ වන විට රාජ්‍ය සේවා ක්‍රිකට් තරගාවලියේ තරග තුනක් පැවතුණා. ඒ තරග තුනෙම අපි ලකුණු 200ට වඩා ප්‍රමාණයක් ලබාගනිද්දි අනෙක් කණ්ඩායම් ලකුණු 100ට සීමා කරන්න විශේෂයෙන් අපේ කසුන් අබේකෝන් මහතා ඇතුළු කණ්ඩායම. ඒනිසා ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒත් සමඟම ගරු නගරාධිපතිතුමනි, මම නිතරම අවධාරණය යොමු කරන්නේ ඔවුන්ට අවශ්‍ය කරන තව පහසුකම් ටිකක් ලබාදිය යුතුව තිබෙනවා. එක් වතාවක් මම අජිත් කුරේ මහතාගෙනුත් එම ඉල්ලීම කළා. දැන් අපට කිසිදු ගැටලුවක් නොමැතිව වත්කමක් ටිකකත් අපට දීලා තිබෙන අවස්ථාවේ තව උපකරණ කිහිපයකුත් ක්‍රිකට් කණ්ඩායමට ලබාදෙන්න කියලා ඉල්ලා සිටියහොත් මෙම කණ්ඩායම හොඳ තැනකට ගන්න පුළුවන් වෙයි. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, මා විසින් මීට ඉහතදී කමිටුවට ඉදිරිපත් කළ කාරණාවක් තියෙනවා අපේ පාපැදි ශූරයා වෙනුවෙන් මොරටුව මහා නගර සභාවට ඔහුව අනුයුක්ත කරලා තරග සඳහා ඉදිරිපත් කරන්න ඕනේ කියන එක. ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් හා විශේෂයෙන් පාපැදි සම්මේලනයත් සමඟ එකතු වෙලා මොහුව දිරිගන්වන්න සහ ඉදිරි තරග සඳහා යොමු කරන්න කටයුතු කරන්න. ඒවගේම අනෙකුත් ක්‍රීඩා වලට දක්ෂයොත් නගර සභාව තුළ සිටිනවා, ඒ සඳහත් පුළුල් ප්‍රවේශයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. මීළඟ කරුණ තමයි ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් අපි පසුගිය දවස්වල මතක් කළා අපේ තිබුණු ටේප් බෝල් තරගාවලියක්. ඒ සඳහා ආරාධනා කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන අතර, මට තවමත් පැහැදිලි නෑ ගරු නගරාධිපතිතුමනි, මා වැරදි නම් නිවැරදි කරන්න. මම මීට කලින් සභා වාරයේදී කිව්වා තහඩුවක් සම්බන්ධ ප්‍රශ්ණයක්. ඒ තහඩුව තාමත් තියෙනවද, එහෙම නැතිනම් එය සකස් කරලද තියෙන්නේ, ඒක සකස් කරලා නැත්තම් කවදා වගේ නිවැරදි කරන්න පුළුවන්ද කියන එක ගැන පොඩි පැහැදිලි කිරීමක් කළොත් වටිනවා.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**
ගරු සභාපතිතුමා, එම ගැටලුවේ තත්ත්වය කොහොමද ?

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා**
ගරු නගරාධිපතිතුමනි, හදලා නෑ. හේතුව නම් ඉංජිනේරු මහතාගෙන් විමසූ විට උඩ නගින්න සේවකයකු නෑ කියනවා. එතුමාගේ උත්තරය ඒක. දැන් මාසයක් කිට්ටුවෙන්න එනවා.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉංජිනේරුතුමා, උඩ නගින්න කෙනෙක් නැතුව තහඩුව හදාගන්න විදිහක් නෑ කියනවා. එන්ඩෝ එකෙත් එහෙමයි. සීට් 08ක් හෝ 09ක් හින්දා මුළු ඉන්ඩෝ එකම තෙමිලා විනාශ වෙනවා. දැන් අර තහඩුව දාන්නේ කවුද.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා**
ගරු නගරාධිපතිතුමනි, ඉන්ඩෝ එකේ නෙමෙයි. කටුබැද්ද හෝල්ට් එක පැත්තේ ටෙරන්ස් එකේ තියෙන්නේ. ඔය කියන්නේ එළියට පෙනෙන පැවිලියන් එකේ.

**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**
ගරු නගරාධිපතිතුමනි, මේක තියෙන්නේ ගාලු පාරට ආසන්නව. හදිසියේවත් ප්‍රශ්ණයක් වුණොත් අපිට තිබෙන ගැටලු ඒකට අදාළ වෙන්නේනෑ.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉංජිනේරුතුමා, මේක අවසන් කරන කුමක් හෝ දිනයක් සභාවට කියන්න. අපේ පැත්තේ කවුරුත් නෑ කියලා කවුද මේක කරන්නේ. මේ වැඩේ වගකීම භාරගන්නේ නැනේ.

**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**
ගරු නගරාධිපතිතුමනි, මට අවසරය දෙනවා නම් මම වැඩේ කරන්නම්.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේක ආණ්ඩු පක්ෂය කරනවද විපක්ෂය කරනවද කියන එක නෙමෙයි. ඕක තව පොඩ්ඩකින් මම නැගලා කරන්නම්. ඒක නෙමෙයිනේ අපට දැන තිබෙන ප්‍රශ්ණය. ඒ තහඩුව පමණක් නෙමෙයි බැලූ බැල්මට පේනවා අර ඉන්ඩෝ එකේ වහල. සීට් ඕනතරම් අපි ලඟ තියෙනවා. දැන් මේ කියනවා කෙනෙක් නෑ නගගන්න කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**
ගරු නගරාධිපතිතුමනි, අපේ සුළු නඩත්තු අංශය ඉතාම අකාර්යක්ෂමයි. අපිට දැන් නිදහසට කරුණු කිය කිය ඉන්න බෑ. ලබන වෙනිදා තියෙනවා වේල්ස් කුමරි විද්‍යාලයත් එක්ක ක්‍රිකට් තරගයක් තියෙනවා. මේකට එන්නේ කාන්තා කණ්ඩායම්. මොනවා හරි ගැටලුවක් උනොත් එහෙම. ඒනිසා ගරු නගරාධිපතිතුමා, අපි මේක ඉවර කරමු.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉංජිනේරුතුමා, මේකේ වගකීම භාරගන්න. නගර සභාව කියන්නේ අපි ඔක්කොම එකට වැඩ කරන ආයතනයක්. පහසුවට මේවා බෙදාගෙන තියෙන්නේ. කොමසාරිස්තුමිය, තහඩුවක් හදාගන්න කෙනෙක් නෑ කියලා එහෙට මෙහෙට ඇඟිලි මාරු කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මෙවැනි දේ නිසා හැල්ලුවෙන්නේ මමවත් ඔබතුමාවත් නෙමෙයි සභාව. අපේ ඉංජිනේරුතුමාට වහලට නග්ගන්න කෙනෙක් නෑ මෙතන කියනවා නම්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම කියන්නේ දැන් කතා කරලා කිව්වා නම් එරන්දට, රමේෂ්ට එහෙමයි මේ වැඩේ වෙන්නේ. මම කියන්නේ ඕක අපිට හෙට හදන්න පුළුවන් එතකොට මේ වගකිව යුතු නිලධාරීන්?

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ටයිම් ලයින් එකක් දෙන්න මේ දවසින් ඉස්සෙල්ලා කරන්න කියලා. එහෙම නැතුව ටාගට්ස් වලට යන්න බෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඒක ප්‍රියශාන්ත මහතාට භාරදෙනවා. අපි ඒක හෙට කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(1) ද සොයිසා ක්‍රිකට් ක්‍රීඩාංගණයේ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සහ සේවක පුරප්පාඩු දැනුම් දීම සම්බන්ධව. එම කරුණ යටතේ වාර්තාවේ සඳහන් වෙනවා මෙම ක්‍රීඩාංගණයේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවම වශයෙන් සේවකයින් 10 දෙනෙකුගේ සේවය අවශ්‍ය වේ. එහෙත් දැනට ක්‍රීඩාංගණයට අනුයුක්තව සිටිනුයේ සේවකයන් 7 දෙනෙක් පමණි. එයින් එක් සේවකයෙකු පිළිකා රෝගයෙන් පෙළෙන බැවින් තණතිල්ල වසන කවර ඇදීමට ඔහුගේ සේවය ලබාගත නොහැක. එබැවින් තවත් සේවකයන් 4දෙනෙකු මෙම ක්‍රීඩාංගණයට අනුයුක්ත කරන මෙන් ඉල්ලා සිටිමි. එම සේවකයින් දසදෙනා තරඟ පවත්වන දින උදෑසන 07.30ට පෙර තණතීරුව වසන කවර ඉවත් කිරීම සඳහා සේවයට වාර්තා කළ යුතුවෙයි.එම නිසා අමතර සේවකයින් ලබා දෙන්නේ නම් ඔවුන් උදෑසන ඔවුන් උදෑසන 07.30 වන විට ක්‍රීඩාංගණයට වාර්තා කිරීමට කටයුතු කල යුතුව ඇත. ඉහත කරුණ සම්බන්ධයෙන් කාරුණික අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමි. මේ ක්‍රීඩාංගණයේ හිටපු පළපුරුදු සේවකයින් පසුගිය දවස්වල ඉවත් කරලා දැන් කියනවා සේවකයින් මදී කියලා. මොකක්ද මේකේ තේරුම. ඒ නිසා කරුණාකරලා පෞද්ගලික පලිගැනීම් සිදු නොකර මේ කාර්යය පිළිබඳව මූලිකත්වය දෙන්න. තහඩුව හදාගන්න කවුරුත් නෑ. හරිම ලැජ්ජයි මේක.

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 02(2), ක්‍රීඩා භූමි භාරකරු එච්.එල්.ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සලකා බැලීම. ගරු නගරාධිපතිතුමා, ඔබතුමා විසින් පුහුණුකරුවන් සමඟ සාකච්ඡාවක් කරලා එහි වාර්තාවක් දාලා තියෙනවා ඇමුණුම් අංක 01 යටතේ. එම වාර්තාවේ තියෙනවා මෙම සාකච්ඡාව අවසානයේ ගන්න ලද තීරණයන් පහත පරිදි දැක්වේ කියලා. එහි අංක I යටතේ, ද සොයිසා ක්‍රීඩාංගණය, මොරටුව තුළ දරුවන්ගේ ක්‍රීඩාව නංවාලීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීම. ක්‍රීඩා පුහුණුකරුවන් සමඟ කරන ලද සාකච්ඡාවේදී මෙම කරුණ ගත්තේ මොකද කියලා අපි දන්නේ නෑ. ඊට පස්සේ තියෙනවා, නිසි පරිදි ගාස්තු නොගෙවා ද සොයිසා ක්‍රීඩාංගණයට ඇතුළු වීමට අවස්ථාව ලබා නොදීම සහ ඒ පිළිබඳව සොයා බැලීමට ආරක්ෂක අංශය හා ක්‍රීඩා භූමි භාරකරුවන් දැනුවත් කිරීම. මේක ඉතාමත් හොඳ තීන්දුවක්. නමුත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා සමහර මන්ත්‍රීවරුන්ගේ හිතවත් පුහුණුකරුවෝ ඇවිල්ලා නොමිලේ තමන්ගේ කාර්යය කරගන්නවා ක්‍රීඩාංගණයට ඇවිල්ලා. ඒ

නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් ඔබතුමා පෞද්ගලිකව මැදිහත් වෙලා සොයා බලන්න. සමහර පුහුණුකරුවෝ රුපියලක්වත් ගෙවන්නේ නැතුව හම්බකරගන්නවා ක්‍රීඩාංගණයෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සුජිත් මන්ත්‍රීතුමා මට කරුණාකරලා පිලිතුරක් දෙන්න මොන මන්ත්‍රීවරයාගේ පුහුණුකරුවන්ද නොමිලේ පහසුකම් සලසා ගන්නේ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි ලැබුණු තොරුතුරුවලට අනුව සුසන්ත මන්ත්‍රීතුමාගේ හිතවතුන් තමයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණය ඔප්පු කරලා පෙන්නුවොත් මම අද ඉල්ලා අස්වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක ඔප්පු කරන්න උසාවියක් නෙමෙයිනේ.

සභා සෝෂා

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මම කියන්නේ අපි යමක් කියන කොට පොඩි වගකීමක් සහිතව කියමු. මෙම ග්‍රවුන්ඩ් එකේ තිබිච්ච තත්ත්වය පිළිබඳව අපි කවුරුත් දන්නවා. මෙම ගවුන්ඩ් එකේ හිටපු සේකයන් ප්‍රමාණය පිළිබඳව දන්නවා. එහි හැසිරීම් තිබිච්ච ආකාරය පිළිබඳව දන්නවා. අපි නොදන්නවා නෙමෙයිනේ. නමුත් අපි ආවට පස්සේ මට මතක හැටියට එම ස්ථානයේ රාජකාරි නිසිලෙස කරන්නේ නැති දෙන්නෙක්ව ඉවත් කරනකොට පස් දෙනෙක් එතනට දැම්මා. අනුයුක්ත කරපු සේවකයන්ගෙනුත් ඒ අවශ්‍යතාවය ඉෂ්ටකෙරෙන ප්‍රමාණය ප්‍රමාණවත් නෑ. එහෙම වෙන්න හේතුව මෙම ක්‍රීඩාංගණය භාරව ඉන්න භාරකරුවන්ගේ පවතින විශාල දුබලතාවයක් නිසා. ඒ නිසා ඉතා ඉක්මණින් ඒ සියල්ල වෙනස් කරනවා. අපි ගත්තු තීන්දු ඇතුළේ තියෙන්නේ මෙම ක්‍රීඩාංගණය කවුරුහරි භාවිතා කරනවා නම්, මෙම ක්‍රීඩාංගණය තිබෙන්නේ මොරටුව ජනතාවගේ දරුවන්ට භාවිතා කරන්න තමයි. නමුත් සභාව විසින් මෙම ක්‍රීඩාංගණය නඩත්තු කරගෙන යන්න නම් යම් මුදලක් අය කරන්න සිදුවෙනවා. ඔය කියන විදිහට මම දන්නේ කාගේ මන්ත්‍රීවරයගෙද කියලා. මන්ත්‍රීවරුන්ගේ නෙමෙයි පුරුදුවෙච්ච කණ්ඩායමක් ඉන්නවා. ඒ අය මෙම ක්‍රීඩාංගණයට ඇතුළුවෙලා ඒ අයගේ පුහුණු කටයුතු ගෙවීමකින් තොරව කරගෙන යනවා. මම ක්‍රීඩාභූමි භාරකරුවන්ට කියලා තියෙනවා ගෙවීම් කරන්නේ නැතුව පුරුද්දකට ක්‍රීඩාංගණයට ඇතුළුවෙනවා නම් ඒක කරන්න දෙන්න එපා. මේකට නමක් ආදේශ වෙන්නේ මන්ත්‍රීවරයෙක් කියලා, මන්ත්‍රීවරයා ක්‍රීඩා කමිටුවේ සභාපතිවරයා ලෙස ඔහු මෙතන මැදිහත්වීමක් කරමින් වෙහෙස වෙමින් ඉන්නවා. ඒක ඕන කෙනෙක් දන්නවා. ඔහු කාගෙවත් හිතවත්කම්වලට කරන දෙයක් නෙමෙයි. වගකීම මම ගන්නවා. පුළුවන්නම් මන්ත්‍රීවරයාගේ හිතවත් පුහුණුකරුවෙක් කියලා පරීක්ෂණයක් ඕන වෙලාවක තියන්නම්. මම කියන්නේ, අපි ප්‍රකාශ කරන කොට ඒ ප්‍රකාශය ඇතුළේ යම්කිසි කෙනෙකුට අයුක්ති සහගත ලෙස චෝදනා එල්ල කරන එක සාධාරණ නෑ. එහෙම එකක් තියෙනවා නම් කියන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම චෝදනාව එල්ල කළේ, ඔබතුමාට සඳහන් කළේ, මෙහෙම ආරංචියක් තියෙනවා ඒ ගැන හොයලා බලන්න කියලා. එහෙත් ක්‍රීඩා කමිටු සභාපතිවරයා තමයි මගෙන් ඇහුවේ කවුද මන්ත්‍රීවරයා කියලා. ක්‍රීඩා කමිටු සභාපතිවරයාට අයිතියකුත් නෑ මා සමඟ ප්‍රශ්ණ කරන්න. මක්නිසාද, මම කතා කරන්නේ මුලසුනට. මගෙන් ප්‍රශ්ණයක් අහනවා නම් අහන්න ඕනේ මුලසුන. මා හට ක්‍රීඩා කමිටු සභාපතිතුමාගේ නම සඳහන් කරන්නට වූයේ ඔහු මගෙන්

අහපු නිසා. ඔහුගේ නම තමයි ප්‍රකාශ වුණේ. ඔහු ගිහිල්ලා පුහුණුකරුවන් සමඟ මත්පැන් පානය කරනවලු. ඒ අවස්ථාවල ගත්ත ෆොටෝ එවලා තියෙනවා. ඔබතුමට අපි ලැබෙන්න සලස්වන්නම්.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එම වාර්තාවේ තීරණ අංක V, ඇකඩමි නොවන පෞද්ගලික අභ්‍යන්තර පුහුණුවීම් සහ මළල ක්‍රීඩා පුහුණුව සඳහා ක්‍රීඩා පුහුණු ප්‍රවේශ ගාස්තු හා ක්‍රීඩාංගණ ගාස්තු සඳහා මුදල් අයකිරීම, ද සොයිසා ක්‍රීඩාගණය තුළදීම සිදු කිරීමට ක්‍රීඩාභූමි භාරකරු ප්‍රියන්ත මයා පැවරීම. එසේ අයකර ගන්නා මුදල් නිසි ක්‍රමවේදයකට අනුව නගර සභාව වෙත ගෙවීම. මේ නීත්‍යානුකූල නෑ. මේක ප්‍රියන්ත මහතාට පවරන්න බෑ, එහෙනම් ආර්.අයි. මහතෙකු යොදවන්න ඕනා රාජකාරියට. රිසිට්පත්‍රයක් නිකුත් කරන්න ප්‍රියන්ත මහතාට බලයක් නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ කියන්නේ හරි කියලා අනිත් කරුණුවලට පක්ෂද,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේක වැරදිද නැද්ද කියන එක නෙමෙයි.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබට වැරදියි. ඔබ විරුද්ධයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔව් මම පෙන්වා දෙනවා වැරදි කියලා. ඒ පිළිගන්න නොපිළිගන්න එක ඔබතුමාගේ කාර්යයක්. එම වාර්තාවේ තීරණ අංක VI, ද සොයිසා ක්‍රීඩාංගණය හදිසි පුහුණුවීම් සඳහා වෙන් කරවා ගැනීමේදි ගාස්තු ගෙවන ලද බිල්පත පමණක් පරික්ෂා කර බලා පුහුණුවීම් සිදුකිරීමට අවස්ථාව ලබාදීම. එම වාර්තාවේ තීරණ අංක VII,ද සොයිසා ක්‍රීඩාංගණයේ කොන්ක්‍රීට් විකට්ටුවේ පවතින අඩුපාඩු සකස් කිරීමට තාක්ෂණ නිලධාරි දිනූෂ චතුරංග මයාට පැවරීම. තාක්ෂණ නිලධාරි දිනූෂ චතුරංග මහතාට ක්‍රීඩාංගණයේ සයිඩ් විකට් හදන්න දෙන්නේ ඒ මහත්මයා මොනවද දන්නේ ක්‍රිකට් ගැන. මේක ජාත්‍යන්තර ක්‍රීඩා පිටියක්. මේක ඔබතුමාගේ පෞද්ගලික බූදලය නොවෙයි. මේකේ ඕන ඕන විදිහට වැඩ කරන්න බෑ.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දිනූෂ මහතා දක්ෂතාවය තියෙන කෙනෙක්. අපි ඒක පිළිගන්නවා. නමුත් මේකට විශේෂඥ අය ඉන්නවා. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියළුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(2), 02(3), 02(4) හා 02(5) හා 03 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අංක 02(1) කමිටු නිර්දේශයට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ඩී.බ්‍රෙන්ඩන් එච්.ක්‍රිස්ටල් කාන්ත මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
13. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - එම්.ප්‍රියනාත් එම්.මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.07.13 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය )

**06 (6) 2026.07.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්බන්ධ කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු අංක 03, මේ වන විට වසා දමා ඇති මධ්‍යම වෙළඳපොල කඩ කාමර සම්බන්ධයෙන්. මම ඔබතුමාගෙන් අහන්නේ, මධ්‍යම වෙළඳපොළ සම්බන්ධයෙන් ඔබතුමාලට සැලසුමක් තියෙනවද?, එතනට යන්න බෑ. එතන කඩවල් කැඩිලා, ප්‍රතිසංස්කරණයක් වෙන්නේ නෑ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, දැනට වැසිකිළි පද්ධතියේ ගැටලුව බරපතල විදිහට තියෙනවා. ඒනිසා ඒක හදන්න දාලා තියෙනවා. නඩුහබ ප්‍රමාණයකුත් තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මෙහිදි කතා කරනවා කඩ කාමර කුලියට දීම සම්බන්ධයෙන්. එතන ප්‍රශ්ණ ගොඩක් තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, නඩු කටයුතු ටික මුලින්ම අවසන් කරගෙන ඉන්න ඕනා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් පවතින වර්තමාන ගිවිසුමක් වලට කුමක්ද සිදුවෙන්නේ. එතන සිටින මිනිසුන්ගේ ප්‍රශ්ණවලට, වසා දමා තිබෙන කඩ නැවත දෙනවද,

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, නඩු කටයුතු ටික මුලින්ම අවසන් කරගෙන ඉන්පසු බලමු මොකක්ද කරන්න පුළුවන් කියලා.

<u>ගරු මහ නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපි මේ කාරණාව සම්බන්ධව ගොඩනැගිලි සංවර්ධන අධිකාරියෙන් වාර්තාවක් අරගෙන තියෙනවා. ඒ වාර්තාවේ තියෙනවා සංවර්ධනය කරලා වැඩක් නෑ අවුරුදු 10කට ආයෙත් හදන්න වෙනවා කියලා. අපිට මීළඟ  කමිටුවේදි තීරණයක් ගන්න වෙනවා ගිවිසුම්වලට මොකද කරන්නේ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාලා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න මෙතනින් එහාට මේක කන්ඩෙම් බිල්ඩින් එකක්, එමනිසා කඩ කාමර කුලියට දීමක් සිදුවෙන්නේ නෑ කියලා.

<u>ගරු මහ නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ලිහිණි මන්ත්‍රීතුමිය, අපි ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ එවපු වාර්තාව  ගිය සතියේ කමිටුවට දැම්මේ. ඊළඟ  කමිටුවේදි අපට තීරණය කරන්නට වෙනවා අපි මොකක්ද කරන්නේ කියලා. එතට වෙනකම් මේ සිදුවීම ඇවිල්ලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් මීට පෙර වාර්තාවක් ලබාදීලා තියෙනවා මේක කන්ඩෙම් කරලා. අපි හදිස්සියේවත් මීට පෙර පබ්ලික් ප්‍රයිවට් පාට්නර්ෂිප් කියන ක්‍රමයට රාජ්‍ය අංශයත් පෞද්ගලික අංශයත් සම්බන්ධයෙන් මේක සකස් කරන්න සංවර්ධනය කරන්න යෝජනාවක් ඇවිල්ලා ක්‍රියාත්මක වෙලා තියෙනවා. ඉස්සර තිබුනේ මෙගා පොලිස්, මහ නගර සංවර්ධන අමාත්‍යාංශයෙන්. ඒක දැන් වෙනත් නමකින් තියෙන්නේ. මෙම ගොඩනැගිල්ල සංවර්ධනය කරන්න පබ්ලික් ප්‍රයිවට් පාට්නර්ෂිප් එකට අවශ්‍ය කරන ප්‍රධාන කටයුතු ටික සකස් වෙලා තිබෙන නිසා එතනින් ඉස්සරහට යන්න පුළුවන් ද කියන එක ඔබතුමා සලකා බලන්න. දෙවැනි කරුණ තමයි ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මධ්‍යම වෙළඳපොළේ පසුගිය කාලයේ හොරකමක් සිද්දවුණා ඔබතුමා දන්නවත් ඇති. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම මේකට අදාළව කියන්න හදන්නේ ඒ සම්බන්ධයෙන් අපේ ආරක්ෂක අංශයේ තියෙන ආරක්ෂක විධිවිධාන තර කරන්න ඕන පළවෙනි කාරණාව, දෙවැනියට මේකට අදාළ නොවුනත් විශේෂයෙන් දැන් හොරු හිතන් ඉන්නේ පහුගිය ටිකේම සිද්ධ වෙච්ච නිසා දහස් ගාණක ලක්ෂ ගාණක හොරකම් කළා. දැන් හොරා හිතනවා හොරකම් කළාට පස්සේ අපේ නඩු විධාන සංග්‍රහායේ තියෙන 366 වගන්තියට අනුව හොරකමක් කළාට පස්සේ ගොඩක් වෙලාවට මාස 03කට විතරයි හිරේ යන්නේ. රු.1500/- යි දඩේ. එතකොට පට්ට හොරෙක්නම් තමයි මාස 06ක් යන්නේ. එතකොට කෝටි ගාණක් හොරකම් කරලා රු.1500/- ගෙවන එක හොරාට ලාභයි. ඊළඟ කරුණ ගරු නගරාධිපතිතුමනි, දැන් මොරටුව බොරලැස්ගමුව මේ හැමතැනම හොරකම් සිද්ධ වෙනවා. අපෙත් හොරකමක් කළා. වෙලා තියෙන්නේ හොරකම කළාට පස්සේ අපේ

බාස්ගේ බුරු ඇඳත් හොරකම් කරගෙන ගිහිල්ලා හොරා. දැඩිගම එකේ රූපසිංහ එකේ උකස් තිබ්බාට පස්සේ මේ පාරේ ගහලා තියෙනවා වැඩි මිලට රන් භාණ්ඩ උකස් ගන්නවා කියලා. හැබැයි ඒ ගහලා තියෙන ගොඩක් අංක අර හොරකම් කරපු හැඳුනුම්පත් වලින් ගත්ත අංක. ඊට පස්සේ ඒවා අරගත්තාට පස්සේ ඒගොල්ලන් කරන්නේ ඒවා උණු කරනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, බඩු හම්බවෙන්නෙත් නැහැ. ගරු නගරාධිපතිතුමනි, මොරටුව නගරයේ ගහලා තියෙනවා නීත්‍යානුකූල නොවන විදියට ඒවගේ බෝඩ් ගහලා තියෙනවා ඒවා තහනම් කරන්න සහ නීත්‍යානුකූල ආයතන වලට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි දෙයක් නිවැරදි කරනවා නැතිනම් මෙය මහා නගර සභාවේ ලේඛනගත වන නිසා හොඳ නැහැ. මෙය ද්වේෂයකින් කියනවා නොවෙයි. හොරකමට ඊට වඩා දඬුවම් තියෙනවා සහ මාස 03න් හොරකමෙන් එළයට එන්නෙත් නැහැ. වසර 02ක් දක්වා හිරේ දාන්නත් පුලුවන් මහේස්ත්‍රාත් අධිකරණයෙන් මහාධිකරණයෙන් වුනොත් ඊට වඩා වැඩියි. මම මේක කිවුවේ නීතිමය කාරණාව නිවැරදි කරන්න විතරයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇමුණුම 05, මෙම ගොඩනැඟිල්ල කඩා ඉවත් කළ යුතු බවට දන්වා එවා ඇති බැවින් අළුත්වැඩියා කටයුතු සිදුකරන්නේ නම් එන්බීආර්ඕ වාර්තාවක් ලබා ගන්න කියලා. මොකද්ද කරන්නේ දැන්, මොකද්ද ඒ ඉන්න මිනිස්සුන්ට වෙන්නේ. ඔබතුමා ඒකට තීන්දුවක් ගන්න ඕන. මොකද එන්න එන්න එකපාරට කඩාගෙන වැටුනොත් මොකද ඔක්කෝම යකඩ දිරලා පාත්වෙලා තියෙන්නේ. දැන් ඔබතුමා ගන්න තීන්දුව මොකද්ද කියලා තමයි මම අහන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔව් දැන් මට එකපාරටම කියන්න බැහැනේ ගන්න තීන්දුව මේකයි කියලා. කමිටුවක් දාලා තියෙනවා ඒ කමිටුව ඇතුලේ සාකච්ඡා වෙමින් තියෙනවා සාකච්ඡාවට අරගෙන තියෙනවා මේ සියලු තත්ත්වයන් ඒ තත්ත්වයන් ඇතුලේ කමිටු නිර්දේශයක් දෙන්න ඕන සභාවට.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔසඳ මන්ත්‍රීතුමා ඒකේ පිටත තියෙන කම්බි සම්බන්ධව තමයි ඔය වාර්තාවේ තියෙන්නේ නමුත් ඇතුලේ තියෙන කම්බි සම්බන්ධයෙන් වාර්තාවක් ගන්න මොරටුව විශ්ව විද්‍යාලයට දෙන්න කියලා තියෙනවා. පරීක්ෂාවට ලක් කරන්න කියලා මේක.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් ඒ ලිපිය ඊයේ දිනයේ දී ගියා. සතියක් ඇතුලත ඒගොල්ලන් ඒ වාර්තාව දෙනවා. ඒ කියන්නේ අපේ අර ස්ටේඩියම් එක වහල නැති වෙච්ච එකයි මධ්‍යම වෙළඳපොලේ තත්ත්ව වාර්තාව මොරටුව විශ්ව විද්‍යාලයෙන් දෙන්න එකඟවෙලා තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට ප්‍රාදේශීය සංවර්ධන කමිටුව සම්බන්ධයෙන් අපිට දැනුම්දීමක් කරන්නේ නැහැ. මොරටුව නගරයේ සිදුවන ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිද්ධ වෙනවා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ. දැන් ඔබතුමන්ලා බස් හෝල්ට් එක ගැන මොරටුවේ ව්‍යාපෘති ගණනාවක් එහිදී සාකච්ඡා වෙනවා. ඒක ගැන අපිට දැනුවත් බාවයක් ලැබෙන්නේ ඒක සම්බන්ධ වෙන නිසා ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අපිව දැනුවත් කරන්න. අනෙක් එක ඉදිරියේ

දී මේ ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය මොරටුවේ ඉදිරිය සම්බන්ධයෙන් මේ නගර සභාවේ සාකච්ඡා කරමු කියලා යෝජනා කරනවා. අපි හැමදාම කාණුයි ඩෙංගුයි ගැන කතා කරනවා, නගරයක් හැටියට සංවර්ධනය වීමක් ගැන කිසිදු අවස්ථාවකදී සාකච්ඡා වෙන්නේ නැහැ. කිසිම අලුත් දෙයක් මේ මොරටුව නගරයේ සිද්ධ වෙන්නේ නැහැ. රත්මලාන, පිළියන්දල, කැස්බෑව, පානදුර නගර දියුණු වෙලා. මොරටුව මැද තියෙනවා ටවුන් එකක් ලක්ෂ 02ක ජනගහනයක් ඉන්න කිසිම දියුණුවක් නැහැ. ඉතින් ඔයගොල්ල කියන පොහොසත් රට හදනවානම් කරුණාකරලා අපි සැලැස්ම සාකච්ඡා කරලා. දැන් බජට් එකත් අවුරුද්දක් වුණා.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02 (05) කොරළවැල්ල කඩ කාමර පැවරීම සහ ගිවිසුම් ගතවීම සම්බන්ධයෙන් කියලා ලේඛනයක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ මේ කඩ කාමර 16න් බැලුවාහම කිහිපයක්ම තියෙනවා ගිවිසුම් ගතවෙලා නැහැ. ඊට අමතරව ගරු නගරාධිපතිතුමනි, සමහර ගිවිසුම් තියෙනවා කාලය ඉකුත්වෙලා 1988 වෙනකොට එතකොට දැන් අපිට හැමදාම සිද්ධ වෙන්නේ මේ අවසානයට ආවට පස්සේ තමයි අපේ නගර සභාවේ දේපල එළියට ගියාට පස්සේ තමයි නඩු වැටුනට පස්සේ තමයි මේ සම්බන්ධයෙන් හොයන්න ගන්නේ. දැනටත් මේ ගිවිසුම් නැති ඒවා තියෙනවා 06ක්. මේ අයට ලියුමක් යවලා කැඳවලා සාකච්ඡාවක් කරලා නියමිත පරිදි බදු ගිවිසුමක් සකස් කර ගන්න ඕන අනිවාර්යෙන් මේ අවස්ථාවේ. එහෙම නැතිනම් අනෙක් කට්ටිය සම්බන්ධයෙන් මම හිතන්නේ 1988 වෙද්දි ඉවරයි. මම දන්නේ නැහැ මේ යෝජනාව දැනුවත්ව දැම්මාද නොදැනුවත්ව දැම්මාද කියලා. මේ කඩ කාමර ඔවුන්ගේ නමට පවරා දෙන ලෙස කඩ කාමර පවරා දීමට හැකියාවක් නැහැ නමුත් ඔවුන්ට බදු දෙන්න පුලුවන්. එහෙමනම් නියමිත බදු ගිවිසුමකට ඇවිල්ලා බදු කොන්දේසි නියමාකාරයෙන් සකස් කරලා තමයි මේ දේ කරන්න ඕන. මම හිතන්නේ අපිට දැනටත් මේ නඩුවක් තියෙනවා කඩ කාමර සම්බන්ධයෙන්. ඒ නිසා මේ බදු ගිවිසුම් නිසියාකාරයෙන් කොන්දේසි ඉදිරිපත් කරලා මේවා ආයතන හා නීතිය පිළිබඳ කමිටුවට එවනවානම් මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් තියන්න පුලුවන්. එහෙම නැතිනම් නගර සභාවට සිද්ධ වෙනවා හැමදාම නඩු වලට යන්න. අන්තිමේදී මෙතනට ඇවිල්ලා නඩු වල ගාස්තු සාකච්ඡා කරන්න වෙනවා. ඒ නිසා මේවා නැවත සංශෝධනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |

10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂවඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී. සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
13. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.07.14 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය) |

**06(7) 2026.07.15 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, පස්වෙනි පිටුවේ සෙව්වන්දි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරලා තිබුණ කරුණට අදාළව දැන්වීම් පුවරු ප්‍රදර්ශණය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර වාර්තාවක් දාලා තියෙනවා. ඒ වාර්තාවේ ඔයගොල්ලන් හඳුනාගෙන තියෙනවා නාමපුවරු සවිකළ හැකි ස්ථාන පිළිබඳව. මට දැනගන්න පුලුවන්ද මේ නාම පුවුරු සවි කරන්නේ මේ ඇඩ්වර්ටයිසින් කරන්නේ නගර සභාවෙන් මේ ස්ට්‍රක්ෂර් ගහලාද නැත්නම් ඔයගොල්ලන් තුන්වෙනි පාර්ශවයෙන් ටෙන්ඩර් කරන්න බලාපොරොත්තු වෙනවාද? මොකද්ද මෙතැනින් ඉදිරියට කරන්නේ කියලා. මම යෝජනා කරනවා කරුණාකරලා නගර සභා වියදමින් මේ ටෙන්ඩර් කරන බෝඩ් ගහලානම් ඒක කරන්න එපා. මේක තුන්වෙනි පාර්ශවයකට දීලා ඇඩ්වර්ටයිසින් ඒජන්සි එකකට දීලා කරුණාකරලා හරි ක්‍රමවේදයකට මේක කරන්න නැතිනම් අනෙක් දේවල් වගේම වෙයි.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |

| | | | |
|---|---|---|---|
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ 02(06), 02(07), 02(08) හා 04 දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අංක 02(05) දරණ කමිටු නිර්දේශයට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

**2026.07.15 දින පැවති එලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය) |

**06(8) 2026.07.15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(12) උක්ත කරුණ සලකා බැලූ කමිටුව, සෑම ස්ථානයකම පවතින කපා ඉවත් කළ දැව කොටස් මැන පවතින සියලුම දැව කොටස් සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර නාගරික ගබඩාව වෙත භාරදීමත්, එම දැව කොටස් සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු සිදු කිරීමටත්, එහි ප්‍රගතිය මීළඟ කමිටුවේදී සලකා බැලීමටත් නිර්දේශ කරන ලදි කියලා තියෙනවා. දැන් අපි අහන්නේ අපි දැක්කා සොයිසාපුර ගස් වගයක් කපලා ඒක එවෙලේම විකුණලා තිබුණා. ඒ සම්බන්ධයෙන් අපේ අභ්‍යන්තර විගණන අංශයට දැනුවත් කළාම අභ්‍යන්තර විගණන අංශයෙන් ගිහිල්ලා බලලා වාර්තාවකුත් දැම්මා. අපිට දැනගන්න අවශ්‍යයි ඒ සම්බන්ධයෙන් මොකද්ද තත්ත්වය කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම පුද්ගලික ඉඩම් වල ප්‍රදේශවාසීන් ඉල්ලීම් කරනවා තමන්ගේ ඒ ගස් කපලා ඉවත් කරන්න කියලා. එහෙම ඉවත් කරන්න කිව්වාම අපි මිල මුදල් මුකුත් ගෙවන්නේ නැහැ. ගෙවන්නේ නැතුව කවුරුන් හෝ එන පුද්ගලයෙකුට අපි කපලා අරගෙන යන්න සලස්වනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ අහන්නේ සොයිසාපුර අපේ නොවුනත් අපි භාවිතා කරන දේපලක් තුළ තිබුණ ගස් වගේක අතු වගයක් කැපුවා. අපේ ප්‍රජාශාලාවේ වහළය මතට තිබුණු. ඒ අතු ටික සම්බන්ධයෙන් අපේ අභ්‍යන්ත විගණන අංශය දම්මලා මේක චෙක් කෙරුවා මේකේ මොනවාහරි චෝදනාවක් තිබුණා. ඒ සම්බන්ධයෙන් මොකද්ද ගත්ත ක්‍රියාමාර්ගය කියලානේ අහන්නේ මේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, තැනදි වුණේ අතු වගයක් තමයි එතැන කපලා තියෙන්නේ. කපලා තිබිලා මම හිතන්නේ එක අත්තක් ඒ කපාපු පුද්ගලයා අරගෙන ගියා. යම් කිසි ප්‍රමාණයක එකක්.

අනෙක් ඒවා සම්පූර්ණයෙන් දරට දාන්න තියෙන ඒවා. අරගෙන ගිහිල්ලා නැවත වාරයක් ඔහුට කියලා ඒක නැවත ඔහු ඒ ස්ථානයට ගෙනෙල්ලා දැම්මා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් කරනවා. නිවාස අධිකාරියට අයත් අපි පාවිච්චි කරන ගොඩනැඟිල්ලක් තියෙනවානේ ඒකේ වහලය කැඩුණානේ එතකොට නැවත අලුතින් වහලය සකස් කරද්දි අනතුරුදායක අත්තක් තියෙනවා මාර ගසත් එක්ක අපේ කලාප ඔෆිස් එක පැත්තෙන් එන ලොකු අත්තක්. ඒ අත්ත තමයි අපේ කෝකිලා මිස් මැදිහත් වෙලා ඒ ටීඕ වාර්තාවත් එක්ක මේක කපන්නේ. එතකොට කපන්නේ අපේ සේවකයෝ. ඊට පස්සේ ඒක කොහොමහරි ඔය ගස් අතු ගන්න කෙනෙක් ඒක නිසාව අධිකාරියට අයිති නිසා ඒ භූමිය ඒගොල්ලන්ගෙත් අවබෝධය සහිතව තමයි මේක වෙන්නේ. ගස් අතු විකුණනවාද කියන්න මට අවබෝධය නැහැ. ගස් අතු ගන්න කෙනෙක් ඇවිල්ලා මේක අරගෙන යනවා. ඊට පස්සේ නැවත මම හිතන්නේ සුජිත් මන්ත්‍රීතුමත් එතැනට යනවා මේකේ යම් ප්‍රශ්ණ කිරීමක් සිද්ධ වෙනවා ඒ ප්‍රශ්ණ කිරීම ඇතුලේ මටත් මේ තොරතුරු ආවාට පස්සේ කෝකිලා මිසුත් මැදිහත් වෙලා වහාම නැවත ඒ අතු ටික ගෙනෙල්ලා බාන්න කියනවා ලූනාව කලපුවේ. දැන් ඒක කලපුවේ තියෙනවා. මේකේ මේ ප්‍රශ්ණකාරී තත්ත්වයක් මතුවුණ නිසා. මම හිතන්නේ ඔඩිට් එක ආවා එතැනට. ඒ අදාළ පරික්ෂණ කටයුතු කරනවා. මොකද්ද සිද්ධ වුණේ කියන්න මට හරි අවබෝධයක් නැහැ. මුදල් ගනුදෙනුවක් සිදුවුණාද කියන එක පිළිබඳව අවබෝධයක් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, හරි පරිස්සම් වෙන්න ඕන ගස් ගැන කොටන් ගැන කියද්දි. මෙතුමා සමන්ලාල් ප්‍රනාන්දු නගරාධිපතිව හිරේ දැම්ම මිනිහෙක් මේ ඉන්නේ. ඒක නිසා හරිම පරිස්සමින් වැඩේ කරන්න මොකද මුදල් නැද්ද කියන්න දන්නේ නැහැ අරගෙන ගියොත් අනිවාර්යෙන්ම ඔබතුමන්ට ආයේ හිරේ යන්න වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙතනදී අපි දන්නේ නැහැ ඔඩිට් එකෙන් ගත්ත තීන්දුව මොකද්ද කියලා තවම අපිට තීන්දුවක් ලැබුණේ නැහැ. නමුත් මේ කොටන් එතැනින් ඉවත් කර ගැනීමම වැරදියි. ඒ වැරැද්ද අවබෝධ වෙලා ආපහු ගෙනෙල්ලා දාපු එක වෙනම කතාවක්. හැබැයි මේ කොටන් කවුරුහරි ඉවත් කරගැනීමට උපදෙස් දුන්නානම් ඒක වැරදියි. ඒ නිසා කරුණාකරලා ඒ උපදෙස දුන්නේ කවුද කියලා ඉවර වෙලා සොයා බලන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරයි කියන විශ්වාසය අපි තියාගන්නවා.

ගරු නගරාධිපතිතුමනි, අපිට පොඩි දැනුවත්වීමක් සඳහා මේ කරුණ අහනවා. 02(26) කරුණේ මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් දිනැතිව ඉදිරිපත් කරන ලද පහත ලිපිය සලකා බැලීම. ඒකේ මම හිතන්නේ ග්‍රවුන්ඩ් එකේ පැවිලියන් එක සංවර්ධනය කරන්න යෝජනා කරලා තියෙනවා. උත්සව සඳහා දෙන්න පුලුවන් විදියට. ලක්ෂ 91ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකේ මොකද්ද අරමුණ අපිට පැහැදිලි නැහැ ඒක. ලක්ෂ 91ක් වගේ ලොකු මුදලක්.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, එහි අරමුණ තියෙන්නේ දැන් අපේ සභා මුදල් යොදවනවා බොහෝ සංවර්ධන වැඩ වලට ඒවා කළ යුතුයි. නමුත් සභාවේ ආදායමක් ඉලක්ක කරගෙන නැවත අපිට ආදායමක් උපයා ගැනීම, ආදායම් පැත්ත ගැන හිතපුවහම අපි දැකපු දේ තමයි මීට පෙර අපිට තියෙන අත්දැකීම් තමයි ඔය ගොඩනැඟිල්ල විවිධ උත්සව වලට ලබා දුන්නා. එතකොට මේක නැවත ප්‍රතිසංස්කරණය කර ගැනීමෙන් පුළුවන්කම ලැබෙනවා සභාවට ආදායමක් ලෙස නැවත මේ ගොඩනැඟිල්ල අවශ්‍යා උත්සව වලට ලබා දෙන්න. ඒ පිළිබඳව කරපු

සාකච්ඡාවකදී තමයි ඇස්තමේන්තුව හැදෙන්නේ ඒ ඇස්තමේන්තුව පිළිබඳව අපිට නැවත දැනුවත් වෙන්න වෙයි.

__මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා__

ගරු නගරාධිපතිතුමනි, ඇස්තමේන්තුවේ තියෙන්නේ නගරාධිපතිතුමා හැත්තෑ එක්ලක්ෂය තමයි ඇස්තමේන්තුව. වැට් එක ඔය තියෙන අනෙකුත් ඒවා අනුව තමයි ඔය අනුමත අනූඑක්ලක්ෂය එන්නේ. අපි ඒක සලකා බලන්න පුලුවන්. ඒකේ මේ ගැටලුවක් තියෙනවා ඒකේ සම්පූර්ණයෙන්ම වහලය සම්පූර්ණයෙන් දිරාපත් වෙලා කියලා තියෙනවා.

__මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා__

ගරු නගරාධිපතිතුමනි, මේ සංවර්ධන ව්‍යාපෘතිය ඉතාමත්ම හොඳ ආයෝජනයක්. මොකද හේතුව ඒක මොරටුව නගර සභාව කියලා කිවුවාම තියෙන ලොකුම අඩුවක් අපිට මේක හදාගන්නත් බැරි වුණානේ. ඒ නිසා ඒක ලොකු දෙයක් හැබැයි ලක්ෂ අනූඑකක් තියෙන්නේ.

__මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා__

ගරු නගරාධිපතිතුමනි, අපි ඒ ඇස්තමේන්තුව පරීක්ෂා කරමු මොනවටද ඒ ගියේ කියලා. ඒකේ හැබැයි අපිට දැනුම් දුන්නේ ලක්ෂ 40ක විතර එකක් යනවා කියලා වහලය සම්පූර්ණයෙන් හදන්න. කමිටුවට ගෙනෙල්ලා පරීක්ෂා කරමු.

__මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය__

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන්නේ 2025 දෙසැම්බර් මාසේ එගොඩඋයන දකුණේ වරිපනම් අංක 65 සිට 63 දක්වා සහ 63 සිට 266 දක්වා මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා ඒකේ නිර්දේශයක් දෙනවා තාක්ෂණ නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනවා. එතකොට මේක දෙසැම්බර් මාසේ යෝජනාව දාන්නේ. ජනවාරි මාසේ ඒ යෝජනාව අංක 03 (26) යටතේ එනවා. එම යෝජනාවම එතකොට ඒකේ නිර්දේශය තියෙනවා තාක්ෂණ නිලධාරී වාර්තාව කියලා අංක 11 ඇමුණුම යටතේ තියෙනවා අදාළ මාර්ගය පවරා ගැනීම සම්බන්ධව වාර්තාවක් සංවර්ධන නිලධාරීවරියට පැවරීම සහ කමිටුවට වාර්තා කිරීම කියලා ජනවාරි මාසේ නිර්දේශ වෙනවා. ඊට පස්සේ එම යෝජනාව නැවත පෙබරවාරි මාසේ අංක 02(18) යටතේ එනවා. එතනදී සංවර්ධන නිලධාරී වාර්තාව අනුව ඇස්තමේන්තුව සකස් කිරීමට නිර්දේශ වෙනවා. මාර්තු මාසයේම එම යෝජනාවම 02(15) යටතේ එතනදී නිර්වේශය වෙන්නේ ඇස්තමේන්තුව සකස් කර මීළඟ කමිටුවට ඉදිරිපත් කරන්න කියලා. අප්‍රේල් මාසේ නැවත එම යෝජනාව එනවා 02(10) යටතේ එතනදී නිර්දේශය වෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් මෙම කරුණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන ඉටුකළ යුතු කර්මාන්ත ලේඛනයට ඇතුලත් කිරීමට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරනවා. එතනින් කතාව ඉවරයි ඒ යෝජනාවේ. ඒක වෙයිද?

__ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා__

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඉවර නැහැ. ඒක දැන් හෙට අනිද්දා වෙද්දි ඔක්කෝම වැඩ කටයුතු අවසන් කරලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් හරහා මුදල් වෙන් කරලා තියෙන්නේ. පාර හැදෙනවා දැන් ගිහිල්ලා ඔක්කෝම කටයුතු සිද්ධ කළා. රේල් පාර පැත්තට යන තැන පටුයි. එතන අඩි 06ක විතර ප්‍රමාණයක් තියෙන්නේ. අපේ හිටපු උප නගරාධිපතිතුමා එතුමාගේ ඉඩමෙන් දුන්නා. එතකොට ඒ ලයින් එකේ ගිහිල්ලා පොඩි බෝතල් කට වගේ තියෙනවා ඉතින් යම් උත්සහායක් කරනවා අරගොල්ලන්ට පොඩ්ඩක් වැටවල් ටික පොඩ්ඩක් පස්සට ගන්න කියලා අර එක ගෙයක පොඩි පඩියක් තියෙනවා පොඩ්ඩක් කඩන්න එයා එකඟ වුණොත් අපිට ඒ ගානටම ගෙනියගන්න පුලුවන්. එහෙම බැරිවුනොත් තියෙන විදියටම ගල් අල්ලලා ඒක ඉවර කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා මොකද මේකේ ක්‍රෙඩිට් එක ඔබතුමන්ටත් යනවා. මොකද මේ යෝජනාව 2018 දී ඔබතුමා සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ 02(02), 02(03), 02(04), 02(05), 02(06), 02(07), 02(08), 02(09), 02(13), 02(14), 02(15), 02(19), 02(24), 02(29), 02(38), 02(39), 02(40), 02(41) හා 02(42) දරණ කමිටු නිර්දේශයන්ට පක්ෂව ද, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |

| | | | |
|---|---|---|---|
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා |

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

**2026.07.15 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය) |

**06(9) 2026.07.16 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සංශෝධන කිහිපයක් තියෙනවා ඉදිරිපත් කරන්න. මේ සංශෝධන ඇත්තටම නගරාධිපතිතුමා කෙටුම්පත් දුන්නාම මේ සංශෝධන මම හැදුවා. හදලා මේ කෙටුම්පත දුන්නා ඒ දුන්න කෙටුම්පතෙහි දුන්න වෙනස්කම මේකේ වෙලා නැහැ. මුලින් අංක 06 ලීලාරත්න මන්ත්‍රීතුමා ගෙනෙල්ලා තියෙනවා මොරටුව එක්සත් සුහ සාධන ළමුන් ප්‍රවාහනය කරන සේවා සංගමයේ වාහන නවත්තන්න ලුනාව කලපුව ළඟ පාර්කින් ස්පේස් එකේ. එහිදී අපි එකඟවෙලා තියෙනවා රු.2000ක් අරගෙන වාහනයක් පාර්ක් කරන්න ඒ සංගමය වෙනුවෙන්. හැබැයි මේකේ ලියලා නැහැ ඒ මුදල ඒ වාහන වෙනුවෙන් අපට ගෙවන්න ඕන ඒ සංගමය. අපිට බැහැ වාහන

පස්සේ ගිහිල්ලා අය කරන්න. සංගමය විසින් අප වෙත ගෙවිය යුතුයි. ඒ වාහන ලැයිස්තුව අපිට දෙන්න ඕන ඒ ලැයිස්තුවට අනුකූලව එන මුදල සංගමය විසින් මාසපතා අපිට ගෙවිය යුතුයි. ඒක සංශෝධනයට ලක් වෙන්න ඕනැ.

ගරු නගරාධිපතිතුමනි, අංක 14 හැටන් නැෂනල් බැංකුවෙන් ඉල්ලලා තියෙනවා වාහන 02ක් නවත්තන්න පුරන්අප්පු කාර් පාර්ක් එකේ. අපි ඒකට එකඟ වුණා එක වාහනයකට රු.5000ක් අයකරන්න. හැබැයි ඒ පන්දාහත් ප්ලස් වැට් කියන එක මේකේ හැදෙන්න ඕන. අංක 13 ප්‍රවේශ ගාස්තු කපා හැරීම සුපර් සිටි එකේ, මේකේ තියෙන්නේ අපි නිර්දේශ කළා කියලා කපා හරින්න නමුත් කපා හරින්න නිර්දේශ කරපු බවක්නම් අපි කළේ නැහැ. අපි යෝජනා කරන්නේ මම හිතන්නේ ආණ්ඩුකාරතුමාට නිර්දේශ කරන්න මේක කපා හරින්න අවසාන අනුමැතිය ගන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව සම්බන්ධයෙන් අපි කියන දේවල් සම්බන්ධයෙන් ඔබතුමා බොහෝම අවධානයෙන් ඉන්න. මේ ඔබතුමන්ලාට අපි බනිනවා නෙවෙයි. මේ කතා කරන්නේ ඔබතුමන්ලාට හදාගන්න දේවල්. ඒ නිසා මේ ඉතාමත්ම වැදගත් අද මුදල් කමිටුව ඉතාමත් වැදගත් කරුණු කාරණා රාශියක් තියෙනවා. පළවෙනි එක මුදල් කමිටුවේ කිසිදු සංශෝධනයක් සිදුවුණේ නැත. තුසිත් මන්ත්‍රීතුමා අදහස් දැක්වීමක් කළා. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට හිටියා. මුදල් කමිටුවේ සභාපති කවුද? සභාපතිවරයාට තමයි පුලුවන් මේකේ සංශෝධන කරන්න. ගරු නගරාධිපතිතුමන්ට පමණයි පුලුවන් සංශෝධන කරන්න. තුසිත් මන්ත්‍රීතුමාට මේකේ සංශෝධන කරන්න බැහැ. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, සභාවට වැදගත් කරුනු කිහිපයක් පෙන්වා දෙන්නම්. ඊට පෙර ඔබතුමාගේ අවධානය යොමු කරනවා 03(11) කටුබැද්ද උතුර සුමන පාර දේපළක් සම්බන්ධයෙන්. අදාළ බද්ද පිළිබඳ දේපළෙහි වර්තමාන අයිතිකරු වෙත 2024.01.02 හා 2024.01.03 දෙදින විශය භාර නිලධාරී විසින් දුරකථන මඟින් දැනුවත් කිරීමට උත්සහා කළ ද, දුරකථනයට ප්‍රතිචාර නොදැක්වූ බව වාර්තා කර ඇත. දුරකථන මඟින් දැනුවත් කරන්න කියලා කොහේවත් නැහැ නගරාධිපතිතුමා. දුරකථන මඟින් කොහොමත් පණිවිඩ දෙන්න බැහැ නිලධාරීන්ට. දුරකථනයෙන් දැනුවත් කළේ ඇයි කියන ප්‍රශ්ණය අපි අහනවා. සංවර්ධනය නොකළ ඉඩම් බද්ද පිළිබඳව තමන් දැනුවත් නොවූ බව අයදුම්කරු ලිපියකින් දැනුම් දී ඇත. අයදුම්කරු වෙත දැනුම් දීමට නොහැකි වූ බැවින් 2023 හා 2024 වර්ෂ සඳහා සංවර්ධනය නොකළ ඉඩම් බද්ද අය නොකිරීමට ප්‍රධාන තක්සේරු නිලධාරී නිර්දේශ කර ඇත. අයදුම්කරුව දැනුවත් කරන්න බැරි වුණා කියලා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරන්න මේ සඳහා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් දෙලක්ෂ දහසයදහස් නවසියයක මුදල සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට කටයුතු කරන ලෙස නිර්දේශ කළා. මේක මේ සභාවට එන්නේ මේක අනුමත කරනවාද විරුද්ධ වෙනවාද කියලා බලන්න. මේක ඇතුලේ තියෙන ගොඩක් කාරණා ඇති එක එක විදියට දුරකථනයෙන් කතා කළා, දුරකථනයට ආවේ නැහැ අදාළ තක්සේරු නිලධාරීන් කියන ඒවා. හැබැයි කමිටුව ඔය මුකුත් සැලකුවේ නැහැ. කමිටුව කිවුවා එයා ගෙවිය යුතු සමුපූර්ණ මුදල ගෙවීමට කමිටුව තීන්දු කළා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඒ තීන්දුව දුන්න එක ගැන අපි බොහෝම ගෞරව කරනවා ඔබතුමාට. නමුත් ඒ තීන්දුව දුන්නා කියලා ගරු නගරාධිපතිතුමනි මේ ප්‍රශ්ණය ඉවර වෙන්නේ නැහැනේ. ඔබතුමා ඒක නිසා නගරාධිපතිවරයා හැටියට මේ එන ප්‍රශ්ණ ආපහු නොයෙන්න ඒගොල්ලන්ට උපදෙස් දෙන්න ඕන. මේ තක්සේරු නිලධාරීට කරන්න බැරි දෙයක්නේ මේ 2023 ඒවා කපාහරින්න පුලුවන්ද නිලධාරීන්ට. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමා ටිකක් බලන්න.

ඔබතුමා අරගෙන තියෙන තීන්දුව හරියි. ඔබතුමාගේ තීන්දුව සම්බන්ධයෙන් අපේ එකගතාවය පල වෙනවා. ඒකේ කිසිදු ගැටලුවක් නැහැ.

ගරු නගරාධිපතිතුමනි, 03(12) කරුණ ලුනාව වාල්ස් පෙදෙස සී වීව් රෙසිඩන්ස් නාගරික නිවාස ව්‍යාපෘතියේ නිවාස හිමිකම්ලාභී පුරවැසියන් නමින් වරිපනම් අංක දේපළට අදාළව වීපීරේඛා සහතික හා නොපරවා ගැනීමේ සහතික හිමිකම් සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ එම් ඔ එෆ්/ ඩීජී/ එල්ආර්ඩී/ සීඕ/ 44/ 2026 හා 2026.04.27 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක අමප/26/0716/809/079 හා 2026.05.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ගරු නගරාධිපතිතුමනි, ඒකෙත් ඔබතුමා නැතිනම් ඔබතුමා කියයි තීන්දුව කිවුවේ නැහැ කියලා. ඒකෙත් උක්ත කරුණ සලකා බැලූ කමිටුව සී වීව් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ පදිංචිකරුවන් සමඟ සාකච්ඡාවක් පවත්වා ඉන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීමට නිර්දේශ කරන ලදී. ඔබතුමාගේ අවසරය පතනවා මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න මොකද මේක ලක්ෂ 102ක ගනුදෙනුවක් සභාවට අහිමි වෙන්න යන්නේ. එතකොට ගරු නගරාධිපතිතුමනි, මේ ඉඩම අපිට අයිති නැහැයි කියලා, හැබැයි මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා එක පැත්තකින් ඔබතුමා පාර්ලිමේන්තුවට ගියාම පාර්ලිමේන්තුවේ තියෙන සාකච්ඡාවකදී දැඩි ස්ථාවරයක ඉදලා තියෙනවා සභාවට මේකේ අනිවාර්යෙන්ම අයවිය යුතුයි කියන ස්ථාවරයේ ඉදලා තියෙනවා කියලා අපිට ආරංචි. එහෙම හිටියානම් අපේ ස්තූතිය පිරිනමනවා. මෙහි මම අවධානය යොමු කරනවා මම මේක සභාගත කරන්නම් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව 2004.07.07 වන දින දීලා තියෙනවා අපිට මෙහෙට නාගානන්ද කොමසාරිස් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් වෙනුවට කියලා තියෙනවා නියෝජ්‍ය කොමසාරිස් ඉඩම් හා හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය මොරටුව. කඩයිම් සිතියම් අංක 520207 – 06.18 දරණ ලුනාව තානායම පිහිටි ඉඩම සම්බන්ධවයි. ඉහත ඉඩමට අදාළව ලිපි ලේඛන සියල්ල පරීක්ෂා කළෙමි. මොරටුව මහා නගර සභාව නමින් ඉඩම අත්පත් කරගෙන භාරදුන් බවට ලිපි ලේඛන නැතත් මොරටුව මහා නගර සභාවට අවුරුදු 70ක පමණ භුක්තියක් ඇති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් සමඟ ද සාකච්ඡා කළෙමි. ඒ නිසා දෙවන පෙළ හිමිකම් සහතික පත්‍රයක් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා නාගානන්ද මහත්තයා කොමසාරිස් හැටියට ලියුමක් දීලා තියෙනවා. සාමාන්‍යයෙන් අවුරුදු 70ක නගරාධිපතිතුමා අපිට භුක්තියක් තියෙනවානම් එයා එතනත් කරලා තියෙන්නේ වරදක්. එතැන අපිට දෙවන පෙළ ඔප්පුවක් නෙවෙයි දෙන්න ඕනෑ, පළවෙනි පෙළ ඔප්පුවක්. එතකොට පළවෙනි පෙළ ඔප්පුවක් අපිට දීලා නැහැ. කොහොම වුණත් එයා අපිට දෙවෙනි පෙළ ඔප්පුවක් දීලා තියෙනවා අපි මේක එයා භුක්තිය පිළිඅරගෙන තියෙනවා අවුරුදු 70ක භුක්තියක් තියෙනවා කියලා. ඊට පස්සේ මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා තව ලිපියකට මේ ලිපි ටික මම සභාගත කරන්නේ ඔබතුමන්ලා සාකච්ඡාවකට ගියාම අපි නෙවෙයිනේ යන්නේ සාකච්ඡාවට ඔබතුමන්නේ යන්නේ. ඉතාමත්ම වටිනවා ඒ නිසා. මේකේ පැහැදිලිව ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශයක් දාලා තියෙනවා අමාත්‍ය මණ්ඩල සංදේශය 2012 මැයි මාසේ. කොළඹ නාගරික කලාපය හැරුණු කොට කොළඹ දිස්ත්‍රික්කයේ අඩු පහසුකම් නාගරික ජනාවාස වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ මොරටුව මහා නගර සභා සීමාව තුළ වන අතර, දැනට හඳුනාගෙන ඇති එබඳු අඩු පහසුකම් නාගරික ජනාවාස සංඛ්‍යාව 90කි. එසෙම මෙම අඩු පහසුකම් නාගරික ජනාවාස වල ඇති නිවාස සංඛ්‍යාව 3535 ක් පමණ වේ. දැනට පවතින දත්ත අනුව මෙම පහසුකම් ජනාවස 90ත් නිවාස 28 ත් අයිතී කියලා ඒකේ විස්තරයක් කියලා

මෙයා කියනවා මේ නිවාස හදන්න බලාපොරොත්තු වුණ හේතුව. හේතුව කියනවා පළවෙනි එක මෙම නිවාස ව්‍යාපෘතිය මඟින් මොරටුව මහා නගර සභා කලාපයේ පවුල් 356කට පහසුකම් සහිත නිවාස ලබාදීම. මේ නිවාස යෝජනා ක්‍රමය මොරටුවේ පවුල් කීයක් ඉන්නවාද? මොරටුවේ පවුල් ඉන්නේ ගරු නගරාධිපතිතුමනි 07යි ඉන්නේ. මේක විමල් වීරවංශ මහත්තයා තමයි දාලා තියෙන්නේ. ඉදිකිරීම් ඉංජිනේරු සේවා අමාත්‍ය ඉන්නකොට. එතකොට මේක මොරටුවට දෙන්න තමයි හදලා තියෙන්නේ. දෙවෙනි එක අඩු පහසුකම් නාගරික ජනාවසෙ පවුල් 365ක ජීවන තත්ත්වය ඉහළ නැංවීම. මේ අඩු පහසුකම් සහිත නිවාස වල මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න තමයි මේ නිවාස යෝජනා ක්‍රමය කරලා තියෙන්නේ. වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 352ක් පමණ වටිනා ඉඩම් පර්චස් 712ක් පමණ ප්‍රමාණයක් රජයෙන් නිදහස් කිරීමට හැකිවිණි. ඒ කියන්නේ ඒ මිනිස්සු ඉන්න යම් යම් තැන්වලින් ඉඩම් පර්චස් 712ක් පමණ නිදහස් වෙනවා කියලා කියනවා. මේ කිසිම දෙයක් ගරු නගරාධිපතිතුමනි, සිද්ධ වුණේ නැහැ, මොකද හේතුව මේගොල්ලෝ මේ ඉඩම් ටික වික්කා. ගෙවල් ටික වික්කා. ගෙවල් 356ක් මේගොල්ලෝ වික්කා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම ඊළඟට ඔබතුමාගේ අවධානයට යොමු කරනවා පැහැදිලිව මේකේ නගරාධිපති හැටියට හිටපු සමන්ලාල් ප්‍රනාන්දු මහත්තයා තමන් ෆයිට් කරලා තියෙනවා සෑහෙන්න මේ ඉඩම් කොටස ගන්න. එතුමා එවපු ලියුමකුත් තියෙනවා. ඒ ලියුමේ පැහැදිලිව සඳහන් කරලා ගෝඨාභය රාජපක්ෂ මහතා ඉඩම පවරා ගත්තාම ඒකට එරෙහිව කරපු අභියාචනාව අපි ළඟ තියෙනවා. ඒ අභියාචනයට පස්සේ ඉදිරිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සටහනකින් කියනවා මෙන්න මෙහෙම මොරටුව මහා නගර සභාව විසින් ඉල්ලා ඇති ඉඩම සඳහා වන රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව රුපියල් මිලියන 102 ක මුදල මහා භාණ්ඩාගාර අරමුදල් මඟින් ලබා ගැනීම සහ එකී ඉඩම රජය මඟින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරීම කරන්න කියන එක කියලා නැවත වරක් කියලා තියෙනවා හිටපු අමාත්‍යවරයා. එතකොට ගරු නගරාධිපතිතුමනි, අනෙක් එක තමයි ලස්සනම වැඩේ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවකයෝ 24 දෙනෙකුට මේ ගෙවල් දීලා තියෙනවා පඩියෙන් කැපෙන්න. ඒ කියන්නේ මේ අඩු ආදායම්ලාභීන්ට දෙන්න හදපු නිවාස ටික පඩියෙන් කැපෙන්න දීලා තියෙනවා සේවකයින් 24 දෙනෙකුට. 10% කුත් අඩු කරලා. ඒත් එක්කම ඒ ගත්ත කට්ටිය කුලියට දීලා තියෙනවා. ඒ වටිනාකමින් ලක්ෂ 10ක් අඩුවෙන් තමයි මේ කට්ටියට දීලා තියෙන්නේ. අනෙක් කට්ටියට ලක්ෂ 50කට දෙනවානම් මේගොල්ලන්ට දීලා තියෙන්නේ ලක්ෂ 40 කට. විශේෂයෙන්ම දේ තමයි මේකේ අරගෙන තියෙන්නේ විවිධ පැතිවල හිටපු සල්ලි තියෙන මිනිස්සු. එක මනුස්සයා ගෙවල් 3, 4 අරගෙන තියෙනවා. සමහරු 5, 6 අරගෙන තියෙනවා. ඉතින් මේ මිනිස්සුන්ට අර නිවාස යෝජනා ක්‍රමය හදපු ඒ නිවාස යෝජනා ක්‍රමය නිර්මාණය කරපු අරමුණ සම්පූර්ණයෙන්ම අයින් කරලා තමයි මේ නිවාස ටික විකුණා මේක තනිකර ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් තමයි මේගොල්ලන් මේ නිවාස විකුණලා තියෙන්නේ. ඒ නිසා මෙතන තියෙන ගැටලුව තමයි ගරු නගරාධිපතිතුමා මොරටුව මහා නගර සභාවට වන්දි දෙන්න පොරොන්දු වෙලා. වන්දි දෙනවා කියලා සියලු දේ කරලා එහෙම නැතිනම් අපිට ඔඩිටෝරියම් එක හදලා දෙනවා කියලා විමල් වීරවංශ මහත්තයා පොරොන්දු වෙලා ඊට පස්සේ මෙතන ගොඩනැඟිල්ලක් හදලා දෙනවා කියලා නාලක ගොඩහේවා හිටපු අමාත්‍යවරයා පොරොන්දු වුණා. කොහොමහරි මේ කිසිදෙයක් නැතුව අවසානයේ මේගොල්ලෝ මේක ගෝඨාභය මහත්තයාවත් රවට්ටලා දැන් ඉන්න කැබිනට් එකත් රවට්ටලා දැන් ඉන්න ජනාධිපතිතුමාවත් රවට්ටලා මේගොල්ලන් උත්සහා කරන්නේ මේ කිසිම දෙයක් නැතුව මේගොල්ලන් මේක ගන්න තමයි උත්සහා කරන්නේ. අපි පැහැදිලිව කියනවා මේ සම්බන්ධයෙන් වරිපනම් සහ නොපරවා

ගැනීමේ සහතික, වීරීරේබා සහතික මේ උදවියට දීම තුලින් මේ උදවියට දෙන්න අපි තීන්දු කළොත් එහෙම අපි ලොකු අමාරුවක වැටෙනවා. මොකද හේතුව අපිට ආපහු බැදීමක් නැති වෙනවා. ඒ නිසා මෙතන ඉන්නේ මොරටුවේ මිනිස්සු නෙවෙයි. මෙතන ඉන්නේ මොරටුවේ පවුල් 07යි. හැබැයි මෙතන ඉන්නේ සම්පූර්ණයෙන්ම මේ ඉඩම් ලබා ගත්ත උදවිය තමයි මෙතැන ඉන්නේ. ඒ නිසා අපිට තියෙන ගැටලුව මේ මිනිස්සුන්ට වරිපනම් දෙන එක ප්‍රශ්ණයක් නෙවෙයි මේ මිනිස්සුන්ගේ කුණු ටික අදින එකේ ප්‍රශ්ණයක් නෙවෙයි ඒගොල්ලොත් මිනිස්සු ඒක අපි පිළිගන්නවා. හැබැයි මොරටුවේ ලක්ෂ 02 ක ජනතාව අසාධාරණයක් වෙන්නේ මොකද හේතුව මිලියන 102 ක් පොඩි සල්ලියක් නෙවෙයි අපේ නගර සභාවට ගත්තොත් එහෙම මිලියන 102 ක මුදලක්. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා අඩුතරමේ මේකේ ප්‍රාදේශීය ලේකම්තුමා නිරෝෂන් මහත්තයා පවා ලියුමක් දීලා තියෙනවා 2013.09.18 වෙනිදා නියෝජ්‍ය කොමසාරිස් හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය මොරටුව කියලා. ඒකේ තියෙනවා ඒ අනුව මෙම ඉඩම සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූවන් නැත පදිංචි කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් අදින ලද කියලා අංකය දාලා අනු ලේඛනය අනුව මොරටුව මහා නගර සභාව සතු ඉඩමක් බව තහවුරු කර ඇති බව වාර්තා කරමි. ප්‍රාදේශීය ලේකම් විසිනුත් කියනවා මේක අපේ ඉඩමක් කියලා නගර සභාවට අයිති ඉඩමක් කියලා තහවුරු කරලා තියෙනවා කියලා එයත් දීලා තියෙනවා. මේ තියෙන්නේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඇඳපු ඒ මිනින්දෝරු සැලැස්ම. මේ මිනින්දෝරු සැලැස්ම නැතුව ඔප්පුවක් හදන්න බැහැ. අනිවාර්යයෙන්ම මේ හැම ඔප්පුවකම මිනින්දෝරු අංකයක් තියෙනවා. ඒ නිසා මිනින්දෝරු සැලැස්මක් හදලා තියෙනවා මොරටුව මහා නගර සභාවට මේකේ පැහැදිලිව තියෙනවා ඒ නිසා මේ මිලියන 102 අපි කොහොමහරි ගන්න ඕන කියන තැනයි අපි ඉන්නේ. මොකද හේතුව ඒක හම්බවෙන්නේ මාලිමාවේ පාලනයට ද, ඒක හම්බවෙන්නේ වෙනත් පාලනයකට ද කියන එක අපිට අදාළ නැහැ. අපිට ඕන කොහොමහරි මේක ලබා ගන්න. මේ මොරටුව ජනතාවගේ මුදල්. ඒ නිසා මේ මොරටුව ජනතාවගේ මුදල් මංකොල්ල කන්න තමයි මේ ජනාවාස අධිකාරිය උත්සහා කරන්නේ. ඒ නිසා අපි තරයේ කියා සිටිනවා ඔබතුමාට කරුණාකරලා මේකේ මේ මුදල ලබා ගන්න ඒ අවශ්‍ය කටයුතු කරන්න මොකද හේතුව මේකේ වරිපනම් බදු මේ පොතේ නිදහස් කළොත් අපිට ලොකු ප්‍රශ්ණයක් වෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ ආණ්ඩුව තියෙන්නේ දැන්, කැබිනට් සංදේශයක් ඒගොල්ලන් දාලා තියෙනවා. අපි දැක්කා ඒක. ඒකේ ඇමුණුම හැටියට තියෙනවා අපි කියන්නේ ඔබතුමන්ලාට දේශපාලන ඔබතුමන්ලාගේ දේශපලාන සම්බන්ධකම් උපයෝගි කරගෙන අතිගරු ජනාධිපතිතුමාව හරි දැනුවත් කරලා මොරටුව මහා නගර සභාවට මේ වෙලා තියෙන අසාධාරණයට පිළියමක් කරගන්න කියන ගෞරවනීය ඉල්ලීම අපි ඔබතුමන්ලාගෙන් කරනවා. මොකද නැතිනම් හේතුව මේක මහා අපරාධයක්.

ගරු නගරාධිපතිතුමනි, මේක තුසිත් මන්ත්‍රීතුමා කිව්වා ඒක සංශෝධනය කළා කියලා නමුත් අංක 06 කරුණ උක්ත කරුණ සළකා බැලූ කමිටුව, ඉහත සඳහන් ප්‍රවාහන සේවා සංගමයට අයත් සාමාජිකයන්ගේ නම් හා වාහන අංක ඇතුළත් වාර්තාවක් ලබා ගැනීමටත්, මාසිකව එක් වාහනයක් සඳහා රු.2000/- ක මුදලක් අයකර ගැනීමටත්, උදෑසන 7.30 සිට සවස 2.00 දක්වා පමණක් එම වාහන නවතා තැබීම සඳහා ඉඩ ලබා දීමටත් කටයුතු කිරීමට නිර්දේශ කරන ලදී. මෙම වාහන කොහේද ගාල් කරන්නේ කියන එක පැහැදිලිව මේකේ සඳහන් වෙලා නැහැ මම හිතන්නේ. මේකේ සඳහන් වෙලා තියෙනවා මම දැක්කේ නැහැ. ඒ නිසා මේකට මේ කොහේද තැන කියන එක පැහැදිලිව අපිට කියන්න. කොහේද මේක ගාල් කරන්න හදන තැන? ඒ වගේම

මේක අයකර ගන්න සභාවට ලැබෙන මුදල් නිසා අපි ඒ ගැන කතා කරන්නේ නැහැ. ගාල් කරන තැන සම්බන්ධයෙන් අපිට පැහැදිලි කිරීමක් කරන්න.

ගරු නගරාධිපතිතුමනි, අංක 08 ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණ සළකා බැලීම. නාගරික ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් බැඳි ආයතන සම්බන්ධයෙන් ඊට අදාළ කටයුතු කර ගැනීම සඳහා නව වාහනයක් ලීසිං ක්‍රමය යටතේ හෝ ලබා ගැනීමට 2026.06.25 වන දින සෞඛ්‍ය අනු කමිටුවේදී යෝජනා විය. උක්ත කරුණ සළකා බැලූ කමිටුව, නාගරික ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් බැඳි ආයතන සම්බන්ධයෙන් ඊට අදාළ කටයුතු කර ගැනීම සඳහා ටොන් තුනක ටිපර් රථයක් කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීමට කටයුතු කිරීමට නිර්දේශ කරන ලදී කියලා තියෙනවා. ඒකේ තියෙනවා මේ ඉන්දියන් කියලා දාලා. ගරු නගරාධිපතිතුමනි, වාහනයක් ගන්නවානම් ඉන්දියන්නම් ගන්න එපා මොකද හේතුව වැඩි කල් පාවිච්චි කරන්න බැහැ. ඒක අපි දන්නවා. ඒ නිසා කරුණාකරලා ගන්නවානම් වාහනේ ඒක පැහැදිලිව පාවිච්චි කරන්න පුලුවන් වාහනයක් ගන්න කියන ඉල්ලීම අපි කරනවා.

ගරු නගරාධිපතිතුමනි, වැදගත් කාරණාවක් තියෙනවා. නාගරික ගණකාධිකාරී (ආදායම්) විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණු සළකා බැලීම. කටුබැද්ද සුපර් සිටි කඩ අංක 27 හා 30 සම්බන්ධවයි. මෙහි උක්ත කඩ කාමර 2023.07.10 සිට 2028.07.09 දක්වා වසර 05 කට ටෙන්ඩර් කර ලබා දීමෙන් අනතුරුව එකී කඩ කාමර තුළට ජලය ගලා ඒමේ ගැටලුවක් හේතුවෙන් 2023 සැප්තැම්බර් මස අලුත්වැඩියා කටයුතු සඳහා සභාවට භාර දී ඇත. අලුත්වැඩියා කටයුතු සඳහා දීර්ඝකාලීනව මෙම කඩ කාමර දෙක වසා තැබීමට සිදුවීමෙන්, 2024.09.20 දිනැතිව කඩ අංක 27 හා 30 හි බදුකරුවන් විසින් එකී කඩ කාමර සඳහා ඔවුන් විසින් ගෙවන ලද සියලු මුදල් නැවත ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර මේ වන විට ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කර ඇති බැවින් වෙනත් ව්‍යාපාර කටයුත්තක් සඳහා මුදල් යෙදවිය නොහැකි බවට දන්වා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇත.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබ මේ වාර්තාවනේ මේ කියවන්නේ. දැන් ඔබෙන් මේ සභාවට ඕන ඔබ මේ වාර්තාව කියවලා ඔබට තියෙනවා මේ සම්බන්ධව අදහසක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ වාර්තාවේ කියවන්නේ අවශ්‍ය ටික විතරයි. මම සම්පූර්ණ වාර්තාවම කියවන්නේ නැහැ. ඒ අවශ්‍ය ටික විතරයි කියවන්නේ. ඒ අවශ්‍ය ටික කියන්නේ නැතුව මට මගේ කරුණ කියන්න විදියක් නැහැ. මේ බොහෝම පොඩි වාක්‍යයි මම මේ කියලා තියෙන්නේ. ඒ නිසා මම මේ සම්පූර්ණ දේවල් කියවන්නේ නැහැ. අංකය සහ අත්‍යාවශ්‍ය දේ විතරයි කියවන්නේ. ඒ නිසා මෙකේ ගරු නගරාධිපතිතුමා අවුරුද්දක් ගිහිල්ලා තියෙනවා 2023 දැන් මේ 2026 තාමත් කඩේට වතුර එන එක නවත්ත ගන්න බැරිවෙලා තියෙනවා. මේකයි ප්‍රශ්ණේ. ඒතකොට ඒ මිනිස්සුන්ගේ මුදල ගෙවන්නෙත් නැතුව අංක 30 කඩේ ආපහු ටෙන්ඩර් කරලා දීලා තියෙනවා. ඉතින් ඒක ඒ මිනිස්සුන්ට අසාධාරණයක්. දැන් ඒ මිනිස්සු කියනවා 30 කඩේ ටික 27 ට දාන්න කියලා. ඒක තමයි ඒ මිනිස්සු ඉල්ලලා තියෙන්නේ. හැබැයි 27 කඩේ තවමත් බිස්නස් එක පටන් ගන්න විදියක් නැහැ දැන් අවුරුදු 03ක් පහුවෙලා තවම ඒ මිනිස්සුන්ගේ වතුර එන එක නවත්තලා නැහැ. වැස්ස ආවාම ඔක්කෝම කඩේ වතුර පිරෙනවා. ඒක නවත්තලා නැහැ. අනෙක් එක තමයි තව එකක් අපිට විශාල පාඩුවක් වෙලා තියෙනවා වතුර

එන නිසා ලිෆ්ට් එකත් කැඩිලා තියෙනවා පහුගිය කාලේ. ලිෆ්ට් එක කැඩෙන්න ප්‍රධාන හේතුව වැහි වතුර එන නිසා. ඉතින් ඔන්න ඕවා තමයි ප්‍රශ්ණ.

ගරු නගරාධිපතිතුමනි, අංක 13 කරුණ නාගරික ගණකාධිකාරී (ආදායම්) විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණු සළකා බැලීම. කටුබැද්ද සුපර් සිටි පැරණි කඩ හිමියන්ගෙන් අය කරන ප්‍රවේශ මුදල් කපා හැරීම සම්බන්ධවයි කියලා මේකේ ලෝයර් කියලා තියෙනවා එහිදී ඒ පිළිබඳ තීරණයක් ගැනීමට කරුණු විමසීම සඳහා බස්නාහිර පළාත් ප්‍රධාන නීති නිලධාරි වෙත යොමු කිරීමට මොරටුව මහා නගර සභා නීති නිලධාරි මගින් නිර්දේශ කරන ලදී කියලා. ගරු නගරාධිපතිතුමා හැබැයි නාගරික ගණකාධිකාරි ආදායම් විසින් කියනවා නමුත්, එම ලිපිය යොමු කිරීමට ප්‍රථම හඳුනාගත් පරිදි 1987 අංක 19 දරණ මහා නගර සභා ආඥා පනතේ දැක්වෙන විධි විධාන සම්බන්ධව සලකා බලා ප්‍රවේශ මුදල් කපා හැරීමේදී කපා හරින මුදල් ප්‍රමාණය සම්බන්ධව තීරණය කිරීමට මහා සභාවට බලතල ඇති බව ඉතා පැහැදිලිව දක්වා ඇති බැවින් එම මුදල මුදල මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව වෙත මෙම කරුණ නැවත යොමු කිරීමටත්, එම කපා හැරීමට තීරණය වන මුදලට අනුමැතිය ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කළ යුතුව පවතී. දැන් අපේ එකවුන්ටන් නෝනා කියනවා ඔබතුමාගේ අවධානය යොමු කරනවා 266 (අ) එහි තියෙන්නේ අත්හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු බව තරම් හෝ අයකර ගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිළිඳු බව මත එම මුදල අත්හැරිය යුතු බව සභාවට පෙනී ගියහොත්, වරහන් ඇතුලේ තියෙනවා 252 වගන්තියේ දෙවන උප වගන්තියෙන් අත්හැර දැමීම සඳහා විධිවිධාන සලස්වනු ලැබූ මුදලක් නොවන සභාවට යම් පුද්ගලයෙකුගෙන් අයවිය යුතු සම්පූර්ණ මුදලම හෝ ඒ මුදලින් යම් කොටසක් හෝ යෝජනා සම්මතයක් මඟින් සභාව විසින් අත්හැර දමනු ලැබිය හැකිය. රුපියල් එක්දහසකට ඉක්මවන මුදලක් අත්හැර දැමීමට අදාළ වන එවැනි සෑම යෝජනා සම්මතයක්ම අමාත්‍යවරයාගේ අනුමැතියට යටත් විය යුතුය. මේකේ කියන්නේ ගරු නගරාධිපතිතුමා අත්හැර දමන්න පුලුවන් එක්කෝ නොසලකා හැරිය යුතු මුදලක් ඒ කියන්නේ රුපියල් ශත වගේ මුදලක් අපි දැන් ශත ගණන් ගන්නේ නැහැනේ. එක්කෝ ඒ මනුස්සයා දිළිඳු වෙලා ගෙවා ගන්න බැහැ. එක්කෝ එහෙම නැතිනම් ඒ මනුස්සයාට පිස්සු හැදිලා එහෙම නැතිනම් ලෙඩ වෙලා අංශභාගය හැදිලා මැරිලා ඒ වගේ මනුස්සයෙක්ගෙන් අයකර ගන්න බැහැ. අන්න එහෙම එකක් හැර වෙන කිසිදු මුදලක් මේකේ කපා හරින්න බැහැ නගරාධිපතිතුමා. හැබැයි එකවුන්ටන් නෝනා කියනවා මේකේ 266 (අ) වගන්තියෙන් මේක කපා හරින්න පුලුවන් කියලා. ඒ අනුව තමයි ඔබතුමා මේ නිර්දේශය දාලා තියෙන්නේ. ඒ නිසා මේක කරන්න බැහැ. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා මහා නගර සභා ආඥා පනතේ 254 (01) මේ ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ මේ ආඥා පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ යම් බද්දක්, දඩ මුදලක් දඩුවම් වශයෙන් හෝ ගෙවීමක් ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහා නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක එහි යම් විධිවිධානයක හෝ එකී යම් අතුරු ව්‍යවස්ථාවක රීතියක හෝ නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුවද ඒ බද්ද, දඩ මුදල දඩුවමක් වශයෙන් වූ ගෙවීම ගාස්තුව හෝ වෙනත් ගෙවීම් කරගෙන එය මහා සභාවේ අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය. ඒ නිසා මේකේ බැඳිලා ඉන්නේ නාගරික කොමසාරිස්තුමිය. ඒ නිසා මේ ප්‍රවේශ මුදල කපා හරින්න. ගරු නගරාධිපතිතුමනි, තුන්කෝටි තිස්හයලක්ෂ තිස්හයදහස් තුන්සියහතලිස් නවයයි ශත හැත්තෑතරක් මේ මුදල පොඩි මුදලක් නෙවෙයි මේ අහිමි කරන්න යන්නේ. ඒ නිසා මේක කොහෙත්ම කපා හරින්න දෙන්න බැහැ. මේක කපා හැරියොත් එහෙම මේක අත උස්සන සියලු දෙනාටම අනිවාර්යෙන්ම ස'වාර්ජ් එකක් එනවා. ඒක අද බොහෝම වුන්වෙයි අපි 26ක් හිටියා

මෙයාලගේ නැහැ ඒ නිසා අපි දිනනවා කියලා. ගරු නගරාධිපතිතුමනි, ඒ නිසා කරුණාකරලා මේ මන්ත්‍රීවරුන්වත් අමාරුවේ දාන්නේ නැතුව මේ කරුණ අයින් කර ගන්නේ. මේ කරුණ අනුමත වෙලා කපා හැරියොත් එහෙම මේකෙන් ගැලවීමක් නැහැ මේක හැබැයි වගකීම මේ වගකීම සම්පූර්ණයෙන්ම එන්නේ නාගරික කොමසාරිස්වරියට. නාගරික කොමසාරිස්වරියට උඩින් හැමදේකට ඔබතුමා ඉන්නවා හැබැයි ඔබතුමාවත් යටත් කරලා තියෙනවා නාගරික කොමසාරිස්වරිය ආදායම් එකතු කර ගැනීමේ දී නාගරික කොමසාරිස්ට යටත් ඔබතුමා. ඒ නිසා නාගරික කොමසාරිස්වරිය අනිවාර්යෙන්ම ආදායම එකතු කරගන්න බැදිලා ඉන්නවා. ඒක කපා හරින්න විදියක් නැහැ. මම මේකම කිවුවේ නැහැ මම පළවෙනි එක විතරයි කිවුවේ. දෙවෙනි කරුණ 185 කියන වගන්තියෙනුත් පැහැදිලිව නාගරික කොමසාරිස්වරියට මේකේ බලතල දීලා තියෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ පැහැදිලිව මේ ප්‍රවේශ මුදල් කපා හරින්න බැහැ ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න අපි අපේ වගකීම කළා ඔබතුමාලා කැමති විදියට මේක ඕනෑ විදියකට හිතාගෙන ඕනෑම දෙයක් කරන්න අපිට මේකේ ගැටලුවක් නැහැ මොකද කිවුවා නාහනා ගුරු ඉහළින් ගියත් එකයි පහළින් ගියත් එකයි.

ගරු නගරාධිපතිතුමනි, එච් එන් බි එකෙන් ඉල්ලලා තියෙනවා වාහන දෙකක් ගාල් කරන්න. අපේ නිලධාරීන් කියලා තියෙනවා එක් මොටර් රථයකට පැයකට රුපියල් 50 ගානේ ප්ලස් වැට් දිනකට පැය 09 ක් සඳහා 531 යි. දින 25ක් සඳහා රු.26550යි. මේ 26550 රුපියල් 5000කට අය කළේ කුමන හේතුවක් නිසාද? ගරු නගරාධිපතිතුමා මේක අතින් ගෙවන එකක් නෙවෙයි, මේක බැංකුවෙන් ගෙවන්නේ. ඇයි මේ මහජනතාවට ලැබෙන මුදලක් අඩු කරන්නේ අපි. කරුණාකරලා මේක සංශෝධනය කරන්න. මේක සංශෝධනය වුණේ වැට් එක නෙවෙයි මේක එන්න ඕන තුසිත් මන්ත්‍රීතුමා. ඔබතුමාට සංශෝධනය කරන්නත් බැහැ. හැබැයි අපි ඔබතුමාගෙන් ඉල්ලනවා මේ ජනතා මුදල් ඒ නිසා මේක ගෙවන්නේ බැංකුවෙන්. ඒ නිසා කරුණාකරලා මේ රු.26550 අය කරගන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලුනාව සී වීව් රෙසිඩන්සීස් නිවාස සංකීර්ණය මම හිත්නනේ අපේ නගර සභාවට ඉතාමත් අවාසනාවන්ත විදියට අහිමිවෙලා ගිය දේපලක් හැටියට ඉතිහාසගත වෙලා ඉවරයි. මොරටුව මහා නගර සභාවට තිබුණ අමිලම සම්පතක්. මම හිතන විදියට ද සොයිසා ක්‍රීඩාංගනයට පස්සේ අපිට තිබුණ ලොකුම දේපල අපගේ අතපසු වීමක් අත්හැරීමක් එහෙම නැතිනම් බරපත නොසැලකිල්ලක් හින්දා අද මොරටුව මහා නගර සභාව වෙතින් ගිලිහී ගිහිල්ලා තියෙනවා. මම හිතන්නේ මේක 2020 දී මේ ගැසට් පත්‍රය නිකුත් කරන්නේ රජයේ ඉඩමක් හැටියට. ඒ වෙලාවෙත් අපේ දෙවන පෙල හිමිකම් සහතිකයක් තිබිලා තියෙනවා මේ දේපළට. මේ දේපළට අයිතිවාසිකම් කියන්න බැරි වුණේ මොන කාරණයකටද? ඉතාමත් සෝචනීයයි. මේ මොරටුවේ බදු ගෙවන ජනතාවට වෙච්ච බරපතලම අසාධාරණයක් විදියටයි මම දකින්නේ. 2020 දී රජයේ දේපළක් හැටියට ගැසට් කරලා 2020 ඒ කාලේදීම රජයේ ඉඩම් පනත යටතේ රජයේ ඉඩමක් හැටියට ප්‍රධාන පත්‍රය දෙනවා. මේ ප්‍රධාන පත්‍රය දෙනකොට අපිට තියෙන අයිතිවාසිකම් ඉදිරිපත් කිරීම සඳහා රජයට විශේෂයෙන් ජනාධිපතිවරයා මෙවැනි ප්‍රධාන පත්‍රයක් දෙන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අපිට දැනුවත් කිරීමක් කරන්න තිබුණා. නමුත් මුනිවත රැකලා තියෙනවා මෙහි හිටපු පාලන අධිකාරිය ඉතාමත් තුච්ච විදියට මේ ආකාරයට කටයුතු කිරීම නිසා මේ මොරටුව මහා නගර සභාවට තිබුණ ලොකු දේපළක් අහිමි වෙලා තියෙනවා මේ නිසා. අපි කියන්න කැමති පර්චස් 280ක ඉඩමක් මේක ඒ අවස්ථාවේදී රජය විසින් ප්‍රධානයක් හැටියට ලබා දෙනවා. දැන් එය මොරටුව මහා නගර සභාවෙන් ගිලිහී ගිහින් තියෙනවා. ඊට පස්සේ 2012 දී

නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක ඔවුන් ඉතාමත් සූක්ෂම විදියට මේ ඉඩම අරගෙන තියෙනවා. දැන් මිලියන 102 ක් අපිට ගෙවන්නම් කියලා පොරොන්දු වෙලා තමයි මේ තත්ත්වයට ආවේ. මිලියන 102 ක් ලබා නොදී මේ තත්ත්වය ලබා ගැනීම සඳහා උත්සහා දරනවා. අපි විශේෂයෙන්ම කියන්න කැමතියි මේ මිලියන 102 ලබා ගැනීම සඳහා කටයුතු කරන්න ඕනා. 2026.04.27 වෙනිදා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරලා තියෙනවා, ඊට පස්සේ ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලය තීරණය කරලා තියෙනවා ඒ අනුව මා ඉල්ලා සිටින්නේ විශේෂයෙන්ම මේ පාළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා මඟින් කැබිනට් සංදේශයක් මඟින් හෝ අපිට අයවිය යුතු මිලියන 102 ගැනීමට කටයුතු කරන්න මොකද නාගරික ප්‍රවාහන මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් දාපු සංදේශයක් අනුව තමයි මේ කැබිනට් තිරණය ලබාගෙන තියෙන්නේ. ඒ නිසා ඒ කැබිනට් තීරණයේ කොහේවත් නැහැ මොරටුව මහා නගර සභාවට අයවිය යුතු මිලියන 102 දෙන්න කියලා. ඒ නිසා සභාවට අයවිය යුතු මිලියන 102 සඳහාවත් අපගේ පළාත් පාලන පලාත් සභා අමාත්‍යවරයා හරහා කැබිනට් සංදේශයක්වත් ඉදිරිපත් කිරීමට උත්සහායක් ගන්න කියන ඉල්ලීම කරනවා නැතිනම් මේ මොරටුව මහා නගර සභාවට වෙච්ච ලොකුම අගතිය මේ හරහා වෙනවා. මේක කොයි කාලේ වුණාද කාගෙන් වුණාද කියලා අදාළත්වයක් නැහැ. දැන් වෙච්ච දේ වෙලා ඉවරයි. මේවාට වගකිව යුතු මිනිස්සු අපි දන්නවා කවුද කියලා. ඒ නිසා මා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ දැන් භූමිය අහිමි වෙලා ඉවරයි මිලියන 102 ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

සභා ඝෝෂා

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වාර්තාව බලනකොට මට අහන්න තියෙනවා එක කරුණක්. ඔබතුමා නත්තල් සීයා ද කියලා. සමාවෙන්න මම මේ දේ කිවුවාට. මේක හරිම සහනදායී විදියට කපා හැරලා දීලා දානවා. මේක ආදායම් උපයන ආයතනයක්. හැමදේම ස්වෙච්ඡාවෙන් හිතැගි පරිදි කපා හරින ආයතනයක් නෙවෙයි. මේ වාර්තාවේ ගත්තාම 252 (3) වගන්තිය යටතේ කපා හරින දේවල් ගොඩක් තියෙනවා. තුනේ ඉදන් ගත්තාම වරිපනම් බදු කපා හරිනවා. 26 වෙනි වගන්තිය යටතේ සොයිසාපුරත් වරිපනම් බදු කපා හරිනවා. මේ වාර්තාව ගත්තාම හැම මාසෙම කපා හැරීම් ගාන අපි එකතු කළොත් සිග්නිෆිකන්ස් පෝෂන් එකක මුදල් හැමදාම කපා හරින්න මේ මන්ත්‍රීවරු අනුමත කරනවා. දැන් මම කියන්න කැමතියි 252 (3) ආඥා පනතේ බලන්න අපි කපා හැරීමකට ලක් කරනවානම් එතැනින් එහාට බලපත්‍ර නිකුත් කිරීමත් කළ නොහැකි. එතකොට මේ කඩ වල වරිපනම් බදු කපා හරිනවානම් එතැනින් එහාට ඔබතුමන්ලා කුමන පදනමකින්ද සේවා සපයන්නේ? කුමන පදනමකින්ද කුණු එකතු කරන්නේ? කුමන පදනමකින්ද වෙළඳ බලපත්‍ර නිකුත් කරන්නේ? එතකොට අය වියයුතු දේ අය නොකර ගැනීම හරහා ඔබතුමන්ලා නගර සභාව හරහා ඔවුන්ට සේවයක් ලබා දෙනවා. එතකොට මේ නගර සභාව මොරටුව ජනතාවගේ බදු මුදල් අවභාවිතාවක්ද සිදු වන්නේ ද? සිදු නොවන්නේද කියලා මම ඔබතුමාගෙන් ඉතා සරල ප්‍රශ්ණයක් අහනවා. ඔබතුමාම ඒකට ඔබතුමාගේම හෘද සාක්ෂියෙන්ම උත්තර දීලා, ඔබතුමාගේ විද්වත් මන්ත්‍රී මණ්ඩලයෙ උපදෙස් මත නීතිඥවරු ඉන්නවා මල් පැල ඉන්නවානේ, අපිනේ වල් පැල. මල් පැල වලින් අහලා. 252 (3) වගන්තියේ පැහැදිලිව කියනවා කොහොමද කපන්න පුලුවන් කියලා. ඒකේ කියනවා මෙසේ කපා හරිනවානම් 1 උප වගන්තිය යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, නිකුත් කරනු ලබන බලපත්‍ර වේ නම් එය ප්‍රත්‍යානය කළ යුතුය. මෙතන කොමසාරිස්තුමියටත් වගකීම් තියෙනවා 252 (ආ) තියෙනවා එහි සඳහන් යම් බදු එකතු

කරන්නෙකුට නිකුත් කිරීම කොමසාරිස්වරයෙකුගේ කාර්යය භාර්යය වේ. ඉතින් ඔයගොල්ලන් එකතුවෙලා තමයි නගරාධිපති කොමසාරිස් වෙතත්, කොමසාරිස් නගරාධිපති වෙතත් සියලු දෙනා එක්ව එකට බැදෙනවා. ඉතින් අපිට කරන්න පුලුවන් ඔබතුමන්ලාට ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් විතරයි. තව දෙයක් කියන්න කැමති 03 (10) සංවර්ධනය නොකළ ඉඩම් සම්බනධයෙන් තමයි මෙතැන කපා හැරීමක් නිර්දේශ කරන්නේ. එතකොට මෙතුමා කිවුවා ඒක නිර්දේශ නොකලා කියලා. නමුත් මම කියන්න කැමතියි සංර්ධනය නොකළ ඉඩමකට යම් කිසි දෙයක් බද්දක් තියෙනවානම් ඉඩම ගන්න මනුස්සයෙක් ඒ ඉඩම ගන්න ඉස්සෙල්ලා බයර් බිවයා නීතියේ සංකල්පයක් තියෙනවා තමුන් ඉඩමක් ගන්න ඉස්සෙල්ලා ඒ ඉඩම සම්බන්ධයෙන් ණය තියෙනවාද? ලෝන් තියෙනවාද? වරිපනම් ගෙවලාද? නොගෙවලාද? නොපරවා ගැනීමේ සහතික ලබා ගන්න පුලුවන්ද බැරිද වීපී රේඛා තියෙනවාද? නැද්ද? මේ සැම සියලු දෙයක්ම සර්ච් කරලා බලලා ගන්න ඕන. එතකොට ඒ අවස්ථාවේ දී සංවර්ධනය නොකළ ඉඩමකට බද්දක් තියෙනවානම් ඒක ඒගොල්ලන් හොයලා බලන්න ඕන. ලේඛනගත අයිතිය මාරු කරන්න ආවාම තමයි දන්නේ සංවර්ධනය නොකළ ඉඩමකට බද්දක් තියෙනවා කියලා. ඒ අවස්ථාවේ මේ නගර සභාවට දුවගෙන ඇවිල්ලා මන්ත්‍රීවරයෙක් අල්ලගෙන මට මේ සංවර්ධනය නොකළ ඉඩමකට බද්දක් තියෙනවා අනේ මේක ටිකක් අයින් කරලා දෙන්න කිවුවොත් ඒවා මේ වාර්තාවට දැමීම ඇත්තටම නොදැනුවත්කමට නෙවෙයි අපි ලැජ්ජ වෙන්න ඕන. මේවා ඒ ඉඩම් ගන්න මිනිස්සුන්ගේ නොදැනුවත්කම. මේවා මේ සභාවට ඇවිල්ලා කොල නාස්ති කරලා මේ වාර්තා වල දාන එක ඇත්තටම ලැජ්ජාවක්. මේවා මේ වාර්තාව නොපැමිණිය යුතු කරුණු. එතනින් ගිහිල්ලා ඔබතුමා මෙතන වාර්තාවේ 39 කියවන්න. 03(10) කියනවා සංවර්ධනය නොකළ ඉඩම් සම්බන්ධයෙන් බදු කැපීම කියලා. 39 කියනවා සංවර්ධනය නොකළ ඉඩම් බදු අය කල යුතු ආකාරයි පිළිබඳව විශාල විස්තරයක් තියෙනවා. අතනින් කපන්න කියනවා මෙතනින් කරනවා. එකක් තිරණය කරන්න ගන්නවාද නැද්ද කියලා. ඔබතුමන්ලා තේරුම්ගන්න ඔබතුමන්ලා මේ නගර සභාවේ ප්‍රතිපත්තිය මොකද්ද කියලා. සංවර්ධනය නොකළ ඉඩමකට බද්දක් ගන්නවානම් කරුණාකරලා කිසිම අවස්ථාවකදී ඒවා කපා නොහැරිය යුතුයි.

ගරු නගරාධිපතිතුමනි, 03(12) සී වීව් රෙසිඩන්සීස් සුජිත් මන්ත්‍රීතුමා ඉතා දීර්ඝ ලෙස සී වීව් රෙසිඩන්සීස් සම්බන්ධයෙන් විස්තරයක් කළා. ගරු නගරාධිපතිතුමනි, මෙතනදී මම දකින්නේ වෙන තර්කයක්. මෙතන ඉන්න පුද්ගලයන්ට වරිපනම් දෙනවාද? නොදෙනවාද? ඒක පුද්ගලයින්ගේ අයිතියක් හැටියට ඒගොල්ලන්ට අධිකරණකට යන්න පුලුවන්. ගිහිල්ලා මානව අයිතිවාසිකමක් හැටියට ඒගොල්ලන්ට ඒක ඉල්ලන්න පුලුවන්. හැබැයි මේක සම්බන්ධයෙන්, මේක අපේ නගර සභාවේ ඉඩම. අපිට මේක සම්බන්ධයෙන් මිලියන 102 ක් අයිති වෙන්න ඕන. ඒක අපේ අයිතිවාසිකමක්. ඒ වගේම ඒ ඉන්න මිනිස්සුන්ටත් අයිතිවාසිකමක් තියෙනවා ඒ මිනිස්සුන්ට ඒ වරිපනම් දේවල් නොපැවරුම් සහතික ලබා ගන්න. හැබැයි ඔබතුමන්ලා ආණ්ඩු බලයේ හිටියට ඔබතුමන්ලා මේ වාර්තාවට කැබිනට් අනුමැතියයි, නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියයි එතන ඉන්න පුද්ගලයින්ගේ ලිපි, එක එක ඩිපාට්ස්මන් වල ලිපි මෙතන දාලා මේ නගර සභාවට කැබිනට් අනුමැතියත් ගෙනෙල්ලා ඔබතුමන්ලා අත උස්සලා තීරණය කරනවානම් මේක දෙන්න ඕන කියලා කරුණාකරලා අපේ විරෝධතාවය ඔබතුමාට ප්‍රකාශ කර සිටිනවා. ඔබතුමන්ලා සියලු දෙනාම ඒකට අත උස්සලා අද දින අනුමත කළොත් කරුණාකරලා එන ආණ්ඩුවකින් ඒ මිලියන 102 මේ නගර සභාවට ගෙවීමේ වගකීමත් ඔබලා භාර ගන්න කියලා මම කියනවා. මේකෙන් ගැලවෙන්න මම ඔබතුමන්ලාට කියනවා ගෞරවයෙන් මේ සම්බන්ධයෙන් ගැලවෙන්න නඩවක් පවරන්න කියලා. මොරටුව මහා නගර සභාව නීතිමය කාර්යයකට යන්න

ඕන. නාගරික සංවර්ධන අධිකාරිය මේ සියලුම පාර්ශව සම්බන්ධ කරලා මම කියනවා නීතිමය කෘතයකට මේ මොරටුව මහා නගර සභාව මේ මිලියන 102 අයකර ගැනීම සඳහා කරුණාකරලා නඩුවක් දාන්න ඕන. ඒ නඩුව දාන්න ඕන්නැත්තම් ඒ සල්ලි අපිට හම්බවෙන්නේ නැහැ. මොකද මේ අවස්ථාවේ පවතින පාලක පක්ෂයත් ඔබලා, පළාත් පාලන ආයතනයත් ඔබලා මේ අතින් මේ අතට මාරු කරනවා. මෙතන ඉන්න රෙසිඩන්ස්ලාගෙන් ලියුම් අරගෙන ඔබතුමන්ලා අර වරිපනම් දුන්නොත් සුජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපිට මේක සදහටම නැති වෙනවා. එතකොට මොරටුව නගර සභාව සහ මොරටුව නගරය ජනතාවට අයිති වියයුතු අයිතිවාසිකමක් ඔබතුමා පැහැර හැරියා. සමන්ලාල් ප්‍රනාන්දු නගරාධිපතිතුමා හිටිය කාලේ එතුමත් මේ මිලියන 102 ගන්න ලොකු ෆයිට් එකක් දැම්මා. හැබැයි එතුමත් ඒක කළේ නැහැ. මෙතන මේ අවස්ථාවේ අපිට ඒ මිනිස්සුන්ට වරිපනම් නොදෙන්න කියලා සදාකාලිකව මේක අල්ලගෙන ඉන්නත් බැහැ. එතකොට ඒ මිනිස්සු එෆ් ආර් එකක් දැම්මොත් ඒ එෆ් ආර් එකක් හරි රිට් එකක් හරි දැම්මොත් ඒ රිට් එකට මොරටුව මහා නගර සභාව අවනත වෙන්න වෙනවා. රිට් එකක් දාලා මැන්ඩපුස් එකක් දාලා දෙන්න කිව්වොත් කියලා අපිට දෙන්න වෙනවා. මම කියන්නේ ඒ දේ කරන්න ඉස්සෙල්ලා කරුණාකරලා ආයතන කමිටුවට මේක දාලා මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තකට යන්න කියලා මම ඔබතුමාට ඉල්ලීමක් කරන්න කැමතියි.

ගරු නගරාධිපතිතුමනි, 13 වෙනි කරුණ කටුබැද්ද සුපර් සිටි එකේ ප්‍රවේශ ගාස්තු කපන්න කියලා ඔබතුමා කියලා තියෙනවා. ප්‍රවේශ ගාස්තු කියන්නේ ඇඩ්වාන්ස් පේමන්ට් එකක්. බිල්ඩිමක් කුලියට දෙනකොට ඇඩ්වාන්ස් පේමන්ට් එකක් ගන්නේ ස්කියුරිටි එකට. රෙන්ට් එක දෙන්නේ නැත්තම් ඒ ඇඩ්වාන්ස් පේමන්ට් එකෙන් ඒක කපා ගන්න පුලුවන්. නගරාධිපතිතුමා රජයෙන් ඇවිල්ලා මේ බිල්ඩින් හදලා දෙන්නේ මේවා යම් කිසි ප්‍රමිතියකට උස්සන්න. එතකොට ඒ ප්‍රමිතියට උස්සන්නනම් ඒවා වල ඉන්න මිනිස්සු නිකන් ඉන්න බැහැ. ඒ මින්සුන්ට කුලී ගෙවන්න ඕන. අපි බිස්නස් එකක් කරනවානම් ඒ බිස්නස් එකේ කුලිය ගෙවන්න ඕන. අපි දේශපාලන පොරොන්දු දුන්නේ නැද්ද දන්නේ නැහැ ඔබතුමා. අපි මේ දේශපාලනය පදනම් කරගෙන හරි කිසි දෙයක් පදනම් කරගෙන හරි මේ නගර සභා වලට හිමිවිය යුතු ආදායම් අපිට අත්හිටුවන්න හැකියාවක් නැහැ නගරාධිපතිතුමා. ඒක වැරදියි. අපි මේ රටේ ඔබතුමන්ලා පොහොසත් රටවල් ලස්සන රටවල් නිර්මාණය කරන්නනම් කරුණාකරලා ප්‍රමිතියක් ඇතුව රට පාලනය කරන්න. කටුබැද්ද වෙළඳ සංකීර්ණයට වෙලා තියෙන්නේ සත පනහට රෙන්ට් එකට දීලා ඒවා නඩත්තු කරන්න සල්ලි නැහැ. ඒ එන ආදායම් ප්‍රමාණවත් නැහැ අඩුතරමේ ඒ බිල්ඩින් එක මේන්ටේන් කරන්න. ඕකම වෙනවා මේ කටුබැද්ද සුපර් සිටි එකටත්. මේ මිලියන 33 ඔබතුමා කපා හැරියොත් ඒ ආදායම සම්පූර්ණයෙන්ම නගර සභාවට අහිමි වෙනවා. එතකොට ඒවායේ ලිෆ්ට් රෙනොවේට් කරන්නේ ටොයිලට්ස් රෙනොවේට් කරන්නේ බිල්ඩිම රෙනොවේට් කරන්නේ කොහෙන්ද කාගේ සල්ලිද එතකොට මේ ඉන්න මිනිස්සු කිසිම ඒකට වගවීමක් නැහැ. රෙන්ට් එකක් ගන්නේ නැහැ ඔහේ ඉන්නවා. ඒක අසාධාරණ නැද්ද? මෙන්න මේවා තමයි ඔබතුමා පරිපාලක හැටියට තිරණය කළ යුත්තේ. ඇත්තටම මෙය නිර්දේශය කිරීම සම්බන්ධයෙන් අපේ කලකිරීම මේ වගේ දේවල් දකිනකොට.

ගරු නගරාධිපතිතුමනි, අංක 34, මේ ඔලිවර් ප්‍රනාන්දු එතුමාගේ රු. 39880/- කපන්නේ මොන පදනමකින්ද කියලා කරුණාකරලා ඒක පොඩ්ඩක් පැහැදිලි කරන්න කියලා මම කොමසාරිස්ගෙන් ඉල්ලනවා. මෙතන කැඩැස්තර සිතියමේ 269 හා 270 ඔලිවර් ප්‍රනාන්දු මොරටුව නගර සභාවට රු.39880/- ක් ගෙවලා තියෙනවා. මේක මොන පදනමකින්ද කපන්නේ කියලා. කරුණාකරලා මේ වගේ නිර්දේශ දාන්න ඉස්සෙල්ලා මේ නිර්දේශය දාන්න හේතුව මොකද්ද කියලා මේ නගර සභාවට පැහැදිලි කරන්න කියලා ඉල්ලනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මමත් ජීවත් වෙන ලුනාව සි වි්වි රෙසිඩන්ස් නිවාස සංකීර්ණය ඒ පදිංචි ජනතාවට වරිපනම් ඔවුන්ගේ නමට ලබාදීම සම්බන්ධයෙන් ඔවුන්ට නොපරවා ගැනීමේ සහතික සීඕසී ලබා ගැනීමේ පහසුව නගර සභාව ලබා දෙන්න අවශ්‍ය කරන මැදිහත්වීම සිද්ධ කරන අවස්ථාවේ ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් පවා නිකුත් වෙලා තියෙන අවස්ථාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් මන්ත්‍රීතුමියත් කතා කළා ඔවුන්හට වරිපනම් ලබාදීමට විරුද්ධව. ඔවුන් ඒ විරුද්ධ කතා කිරීමට පදනම තමයි ලුනාව තානායම් වත්ත ඉඩම නගර සභාවට අයිතිය තිබුණා නගර සභාව අවුරුදු 70ක් භුක්ති වින්දා. ඒ නිසා මේක නගර සභාවට අයිති බව පෙනී යනවා කියලා දෙවන පන්තියේ ඔප්පුවක් ලබා දුන්නා. ඒ නිසා නගර සභාවට මිලියන 102 ක් වන්දිය වශයෙන් ලබා දෙන්න නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉටු නොකිරීම හේතුව මුල් කරගෙන මොරටු ජනතාවට වෙච්ච මේ සභාවට වෙච්ච ඒ පාඩුව හේතු කොටගෙන මේ වෙද්දි ලුනාව සි විවි රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ පදිංචි වෙලා ඉන්න පවුල් 356 නිවස 356 හිමිකරුවන් හට වරිපනම් ඒවුන්ගේ නමින් ලබා නොදෙන්න කියන මූලික තර්කය තමයි මේ අවස්ථාවේ දි අපි දැක්කේ. ගරු නගරාධිපතිතුමනි, මේ කාරණා සම්බන්ධයෙන් මොරටුවේ පුරවැසියෙක් විදියට මගේ විරුද්ධත්වයක් නැහැ හැබැයි ඇත්ත කාරණයක් තියෙනවා මේ ඉඩම හොයාගෙන මේ ඉඩම තිබුණ තත්ත්වය ගැන කවුරුත් දන්නවා තමුන්නාන්සේත් දන්නවා රවිනාත් ගුණසේකර මහත්තයා ඉන්න කාලේ ඔය ඉඩමට කරන ගියේ මොකද්ද කියලා දන්නවා. ඔබතුමා අපි ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ඉදලා ඒකට කරපු අරගලය මොකද්ද කියන දේත් දන්නවා. නමුත්, නිවාස ඇමති විමල් වීරවංශ සහෝදරයා තේරී පත්වුණාට පස්සේ නිවස ව්‍යාපෘති හැදීමේ දී නාගරික ජනාවාස සංවර්ධන අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් හැටියට මම කොළඹ දිස්ත්‍රික්කයේ හදපු ලොකුම නිවාස ව්‍යාපෘති 02 හදන්න මොරටුවට ගේන්න පුලුවන් වුණා. ඉන් එකක් ලුනාව අනෙක් එක අඟුලාන. එතකොට අඟුලාන හැදුවේ ඒ වෙරළ තීරය වෙරළ බාදනයට ලක්වෙන ජනතාවට ඒ කැබිනට් පත්‍රිකාව දැම්මේ එහෙම. හැබැයි ලුනාව නිවාස ව්‍යාපෘතිය හැදුවේ සුජිත් මන්ත්‍රීතුමා නිවැරදිව කිවුවා ඒ කැබිනට් පතිකාවේ කාරණාව. මොරටුවේ වටිනා ඉඩම් දෙකක් අපි ඒකට කියනවා ඉංග්‍රීසියෙන් වී ලොකේෂන් දෙකක් ඒ කියන්නේ වානිජමය වටිනාකමක යම්කිසි පිරිසක් පදිංචි වෙලා ඉන්නවනම් උදාහරණයක් කියන්න අලෙව්වත්ත අපි යෝජනා කළා අලෙවි වත්තේ ඉන්න අයව ඔතනට ගෙනෙල්ලා ඒ ඉඩම නිදහස් කරලා වානිජමය පදනමින් දියුණු කරන්න සංවර්ධනය කරන්න. ඒවගේ අරමුණකින් තමයි ඔය නිවාස හැදුවේ. අනෙක් පැත්තෙන් මොරටුවේ ඉන්න අයට විතරක් නෙවෙයි පොදුවේ ගත්තාම කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුවට ප්‍රවනතාවය සහිතව පොදුවේ කොළඹ දිස්ත්‍රික්කයේ පහළ මධ්‍යම පාන්තික නිවසක් නැති ඒක කැබිනට් පත්‍රයේ තියෙනවා අපේ විමල් සහෝදරයා ඉදිරිපත් කරපු. ඒ කැබිනට් පත්‍රය අපේ අධිකාරියෙන් තමයි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙන් තමයි කෙටුම්පත් කළේ. අපේ හිටපු සභාපතිතුමා පාලිත මහත්තයා. ගරු නගරාධිපතිතුමනි, ලුනාව සී වීවී රෙසිඩන්සීස් නිවාස සංකිර්ණයේ ඉන්න මිනිස්සු වෙනුවෙන් මම කතා කරන්න ඕන මොකද මම ඒකේ කළමනාකරණ කමිටුවේ සභාපති සහ මම ඒතැන පදිංචිකරුවෙක්.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැන් අපිට කැමති වුණත් අකමැති වුණත් අපිට අවසන් තීන්දුවකට බොහෝම ආසන්න කාලයක එන්න වෙනවා. අවසන් තීන්දුව යනු මිනිසුන්ගේ යහපත ඉතිහාසයේ විශාල වැරදි ගොඩක් කරලා ඉවරයි. ඒවා නැවත ආපස්සට හරවන්න බැරි

තරමටම කිදා බැහැලා තියෙන්නේ. දැන් මේ මොහෙතේ ඉන්න මිනිස්සුන්ගේ අයහපත ඒවගේම මොරටුවේ මින්සුන්ට අහිමි වෙච්ච වත්කම. මෙන්න මේ දෙක ඒකක් මේ ඉන්න මිනිස්සු තවදුරටත් තලන්නේ පෙලන්නේ නැතුව ඒ මින්සුන්ගෙන් මේ වෙලාවේ අපි තවදුරටත් මේ ඉන්න පීඩාකාරී ජීවිතයෙන් තව හිර කරන්නේ නැතුව ඒ මින්සුන්ව නිදහස් කරන්න. ඊළඟ එක තමයි මොරටුවේ ජනතාවට ඉතිහාසයේ සිද්ධ වෙච්ච ලොකුම හානිය අපි පිලිගන්න වෙනවා මුළු ඉතිහාසයක් ඇතුලේ හිටපු ඔය ආපු දේශපාලන බලධාරීත්වය විසින් මේ දේපල වගකීම් බෙදිලා යනවා කාටත්. ගන්න පුලුවන්නම් හැන්සාඩ් වාර්තා ඔය දේපල වෙනුවෙන් හැප්පිච්ච මේ සභාවේ ප්‍රධානම මනුස්සයා මම කියලා මම විශ්වාස කරනවා. හැබැයි සමහර ඒවා ඉතිහාසයේ වෙනස් කරගන්න බැරි තත්ත්වයකට ජනාධිපති අත්සන් කරලා අපිට දෙනවා. කැබිනට් එක අත්සන් කරලා දෙනවා. රාජ්‍ය ආයතනයක් රාජ්‍ය ආයතනයක් යොදවා ගන්න එපා කියලා නීතිපති කියනවා. අපිට වෙන්නේ දැන් අපි ගොඩක් සාම්ප්‍රදායික තැන් වල නැහැ. හෙට හිරගෙවල් කීයක යවනවා කිවුවත් මිනිස්සු වෙනුවෙන් කළ යුතු දේ ඒක කරනවා. හැබැයි ඒකෙදි කාල පරාසයක් තුළ ඒ කියන්නේ අපි මෙතන නිවාස ටික දුන්නා, දෙන්න වුණා. හැබැයි ඒ වෙනුවට ෆයිට් කරනවා අපිට අඩුතරමේ නිවාස 500ක් ඕනි. ඒක ලැබෙනකන් අරගල කරනවා. වෙන උත්තරයක් නැහැ වෙන විසඳුමක් නැහැ. හැමදාම මේ සභාවේ කාලය අරගෙන ඔබත් මමත් හැප්පිලා දැන් අපි මේ සභාවේ මුදල් කමිටුවේ තියෙනවා අර මස් කඩේට අදාළව ටෙන්ඩර් කරලා. අනෙක් පැත්තෙන් ලියුමක් එනවා අර ඉඩමටම අයිති කොටසක් ඒක නිදහස් කරන්න. මම කියන්නේ එකකට එකක් ඉතාම නරක විදියට එක එක පාර්ශවයන් තම තමන්ට වාසිදායක විදියට. මම කියන්නේ අපි ඉන්න ඕන ජනතාවගේ පැත්තේ. නීතිය පැත්තෙන් සමහර ප්‍රශ්ණ කිරීම් එයි. මුහණ දෙන්න වෙයි ජනතාව වෙනුවෙන් කමක් නැහැ. ඒ නිසා බොහෝම ඉක්මනින් ඔය තින්දුව ගන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බොහෝම ස්තුතියි ඔබතුමාගේ ස්ථාවරයට. මම කියාගෙන ආවේ ඔය මිලියන 102 කියන ඉලක්කම තීරණය කළෙත් අපි. මොකද එවකට සමන්ලාල් නගරාධිපතිතුමා විමල් වීරවංශ සහෝදරයාව මාත් එක්කම ගිහිල්ලා හම්බවුණා. ඒ වෙලාවේ කිවුවා අපිට ඉඩමට වන්දිය දෙන්න එතනදි පැහැදිලිව කිවුවා එතුමා ඉඩමට වන්දිය දෙන්න, මොකද මේ ගෙවල් හැදුවේ ආණ්ඩුවේ සල්ලි වලින්, මේ ගෙවල් මහජන මුදල්. සුජිත් මන්ත්‍රීතුමා කියපු කාරණා තියෙනවා. ඒවා වෙනම පරීක්ෂණ කරන්න. ගෙවල් ගත්ත ඒවා කුලියට දීලා තියෙනවා, නිවසක් නැති අයම ද ගෙවල් අරගෙන තියෙන්නේ කියලා ඉන්නවා  ගෙවල් දෙක තුන අරගත්තු අය ඉන්නවා. ඒවා පරීක්ෂණය කරමු. නමුත් දැන් ඒ ගෙවල් අරගෙන. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, පැහැදිලිව කිවුවා ඒ වෙලාවේ සල්ලි අරගත්තේ ගෙවල් හදන්න. වැඩිපුර ලක්ෂය ඉඩමට ඕනනම් වෙනම කැබිනට් පත්‍රිකාවක් දාන්න ඕන ටෙෂරියට. එතකොට ඒ අනුව තමයි මිලියන 102 දැම්මේ. මිලියන 102 දැම්මාට පස්සේ කැබිනට් අනුමැතිය ගන්න කලින් ආණ්ඩුව වැටුනා 2015. එතැනින් එහාට මුකුත් සිද්ධ වුණේ නැහැ. මම පිලිගන්නවා නගරාධිපතිතුමනි, අපේ නගර සභාවට මොකද ඔය ගෙවල් ගත්ත හැමෝම මම ඇතුළුව විශාල ප්‍රමාණයක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සල්ලි දුන්නා. මේ වනවිට ගෙවල් 220ක් සම්පූර්ණ මුදල ගෙවලා ඔප්පු අරගෙන තියෙනවා. සමහර ගෙවල් ලක්ෂ 45යි 50යි 55යි 56යි ඒවගේ. 130කට ආසන්න පිරිසක් ඉන්නවා 50%ක් ගෙවලා මම ඇතුළුව. ගණන් හදලා බලන්න බිලියන කොච්චරක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය අරගෙනද කියලා. ඔවුන්ගෙන් මිලියන 102 ක් මේ මොරටුවේ ජනතාව වෙනුවෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ලබාදීම සාදාචාරාත්මකයි. ඒ තැන මමත් ඉන්නවා. හැබැයි ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලන්නේ ඔබතුමා ඒ ස්ථාවරයේ ඉන්න

නිසා මම ආයෙත් කතා කරන්නේ නැහැ. මම ඉල්ලන්නේ, දැන් ඒ මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා. මොරටුවේ මිනිස්සු ගත්තොත් මාත් එක්ක 7ක් 8ක් වගේ ඉන්නේ. අනෙක් ඔක්කෝම වගේ ගත්තොත් පිටස්තර. මොරටුවට පිටින් අය. හැබැයි මොරටුවෙන් පිට අය වුණාට ශ්‍රී ලංකාවේ පුරවැසියෝ. ඉන්දියාවේ, බංගලාදේශයේ මිනිස්සු ඔතන පදිංචි නැහැ. ප්‍රශ්ණයක් තියෙනවා ඇත්ත. කොටින්ම කියනවානම් මට ඔය ඉන්න සමහර අය එක්ක අරගල කරලා සෑහෙන අර්බුධ මැද්දේ තමයි ඔය ඉඩම අරගෙන ඔය ගෙවල් හැදුවේ. මටත් හිතෙනවා ගරු නගරාධිපතිතුමනි, සමහර දැන් ඔය පදිංචි වෙලා ඉන්න සුළු පිරිසකගේ සමහර අලච්චි ක්‍රියාකාරකම් ගත්තාම, අපරාදේ මම මේ ගෙවල් හදන්න මහන්සි වුණේ කියන්න මටත් කළකිරුණු අවස්ථා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, යථාර්තයට අපි මුහුන දෙන්න ඕන. නිවාස 356ක් හදලා ඒ ගෙවල් විකුණලා ඉවරයි. ඒ නිසා ඒ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියෙන් සල්ලි හෝ ව්‍යාපෘතියක් ගන්න එක වෙනම දෙයක්. හැබැයි මම ඉල්ලා සිටිනවා බාධා කරන්න එපා අවුරුදු 04ක් තිස්සේ සෑහෙන්න අරගල කරලා තර්ක කරලා අවුරුදු 04කින් පස්සේ ඒ මිනිස්සුන්ට තමන්ට කියලා වරිපනම් අංකයක් එක්ක වරිපනම් තමන්ගේ නමට ලබාදෙන ක්‍රියාවලියට එරෙහි වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මම ස්තූතිවන්ත වෙනවා මේ වෙලාවේ ප්‍රවාහන නාගරික සංවර්ධන ගරු ඇමතිතුමා බිමල් රත්නායක ඇමතිතුමාට බොහෝ කාලෙකට කලින් ජනතා විමුක්ති පෙරමුණේ කොළඹ දිස්ත්‍රික් කමිටුවේ එකට වාඩිවෙච්ච දෙන්නා අපි දෙන්නා. ඒ නිසා මම ස්තූතිවන්ත වෙනවා එතුමාට විසදන්න බැරි වුණ ප්‍රශ්ණයක් විසදන්න වුණා. හැබැයි එතුමන්ගෙනුත් ඉල්ලන්න ඕන කරුණාකරලා කැබිනට් පත්‍රිකාවක් දාලා මිලියන 102 මුදල මේ මොරටුව ජනතාව වෙනුවෙන් මොරටුව සභාව වෙනුවෙන් අරන් දෙන්න කියලා අපි ඉල්ලීමක් කරන්න ඕන. ඒ වගේම තව 50% ගෙවන අයගේ ප්‍රශ්ණයක් තියෙනවා නගරාධිපතිතුමනි මේ කඹ ඇදීම නිසා මේ වරිපනම් ප්‍රශ්ණය මේ නගර සභාව සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කඹ ඇදීම නිසා අද ඒ පදිංචිකරුවන්ට කතා කරන මම ඇතුළුව අමතර ලක්ෂ 7, 8ක මුදලක් පොලියක් විදියට ගෙවන්න වෙලා තියෙනවා. අපි වාරික වශයෙන් ගෙවන්න හදනකොට බැංකු ලෝන් දෙන්න හදනකොට අපිට බැංකු ලෝන් ගන්න හම්බවුණේ නැහැ සීඕසී වරිපනම් ඒවා නැති නිසා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි ඉල්ලා සිටිනවා මේ ප්‍රශ්ණය විසදන්න ඔබතුමා දරන උත්සහායට මගේ ස්තූතිය පුද කරන අතර මේ සඳහා සී වීව් රෙසිඩන්සීස් පදිංචිකරුවන්ගේ පැත්තෙනුත් සාධාරණ විදියට බලන්න කියලා ඉල්ලමින් ඔවුන්ට වරිපනම් ලබාදීමේ කටයුත්ත හැකි ඉක්මනින් නිම කරන්න කියලා ඉල්ලා සිටිමින් මේ 13(12) කරුණට පමණක් මම මගේ පක්ෂපාතීත්වය පල කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අංක 12 සුපර් සිටි එකේ කඩ කාමර අංක 27, 30 සම්බන්ධව. මේකේ අග්‍රිමන්ට් එකකට එළඹෙනවා 2023 ජූලි මාසේ. 2023 සිට 2028 දක්වා අවුරුදු 05කට අග්‍රිමන්ට් එකකට එළඹෙනවා. ඒ එළඹිලා 2023 ජූලි මාසේ ඉදලා සැප්තැම්බර් වෙනකොට ඒ මින්සුන්ට කඩය කරගෙන යන්න බැහැයි කියලා වතුර එනවා කියලා ඒගොල්ලෝ නැවත අපිට භාර දෙනවා අලුත්වැඩියාව සඳහා. ඒ භාර දීලත් 2024 වෙනකන් අපි මුකුත් කරලා නැහැ. 2023 සිට 2024 ඒගොල්ලෝ අපිට මතක් කරනකල් අළුත්වැඩියා කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ඒ කියන්නේ අවුරුද්දක් අපිට ආදායම අහිමිවෙලා තියෙනවා සභාවට මෙය කොමසාරිස් පාලනය යටතේ. මම මේ පරිපාලනය සම්බන්ධව කියන්නේ. ඊට පස්සේ 2025 එනවා ඒ ඇවිල්ලාත් එතකොට තමයි මතක් වෙන්නේ තව කඩකාමර 05ක් තියෙනවා මේක ටෙන්ඩර් කිරීම සඳහා. එතකොට 2026 තමයි 27, 30 සහ ඉතුරු 05ත් එක්ක ටෙන්ඩර් කරන්නේ. එතකන් අපි මේ ගැන අවධානය යොමු

කරලා නැහැ. ඔබතුමාගේ අවධානය පිණිස යොමු කරනවා මොකද සභාවට අයවිය යුතු ආදායමක් අපිට අහිමි වෙලා තියෙනවා. මේක අපේ පරිපාලනය සම්බන්ධ ගැටලුවක්.

ගරු නගරාධිපතිතුමනි, අංක 18 ලිපි ද්‍රව්‍ය සම්බන්ධව මාස 06කට අපි ලිපිද්‍රව්‍ය ඉල්ලුම් කරනවා. ඒ ඉල්ලුම් කරන්නේ ජූලි මාසේ සිට දෙසැම්බර් මස දක්වා මාස 06කට. නමුත් දැන් මේ වාර්තාව එන්නේ යෝජනාව මුදල් කමිටුවට. ඊට පස්සේ ඒක අනුමැතියට ගිහිල්ලා ඔක්කෝම වෙලා එනකොට මාස 02ක් නැත්නම් 03ක් ගිලිහල්ලා. එතකොට මේ මාස 06ට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මාස 03 ක් සඳහා ලබා ගැනීම සඳහා අපි අනුමැතිය දෙනවාද? ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. මොකද අපිට මේ ලිපි ද්‍රව්‍ය අපිට ජූලි මාසේ ඉඳලා ඕනනම් අපි අඩුම ගානේ අප්‍රේල් මාසෙවත් මේ යෝජනාව ගේන්න ඕන. මෙතනත් මම පරිපාලනය සම්බන්ධ ගැටලුවක් දකිනවා මේ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, අංක 30 සුළු මුදල් සම්බන්ධව. මෙතන යාන්ත්‍රික ඉංජිනේරු අංශයට සුළු මුදල් සම්බන්ධව ෆෝම් එකක් ඉල්ලනවා අලුතින් හදලා ඒ කියන්නේ කොළඹ නගර සභාවෙත් ඒ ෆෝම් එකලු පාවිච්චි කරන්නේ, දෙහිවලත් ඒ ෆෝම් එකලු පාවිච්චි කරන්නේ කියලා අපිටත් ඒ ෆෝම් එක සුදුසුයි කියලා යෝජනා කරනවා. මම කියන්නේ අපි ඉන් ඉස්සෙල්ලා අපි දැනගන්න ඕන මේ දෙපාර්තමේන්තුව විතරද සුළු මුදල් පාවිච්චි කරන්නේ කියලා. නැතිනම් සුළු මුදල් භාවිතා කරන් ආයතන තියෙනවා දෙපාර්තමේන්තු තියෙනවා. ඒ සියලු දෙනාටම එක ක්‍රමවේදයක් තියෙන්න ඕන. මොකද මේගොල්ලන්ට ප්‍රතිපූර්ණය කිරීමේ දී ගැටලු මතු වෙනවාලු. පර්චස් කරලා මිලදී ගැනීමේ දී බිලක් තියෙනවානම් ප්‍රතිපූර්ණය කරන්න තියෙන ගැටලුව මොකද්ද? ඒ නිසා මෙතන මේ සම්බන්ධව මේ ෆෝම් එක ඇමුණුම් අංක 44 බලන්න, දැනට භාවිතා කරන ෆෝම් එක දාලා නැහැ සංසන්දනය කරන්න. කොයි වගේද ඒකේ අඩුපාඩු අපි දකින්නේ නැහැ. හැබැයි දැන් අලුතින් ඉදිරිපත් කරන්න තියෙන ෆෝම් එක තමයි මෙතැන දාලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, අංක 25 මුදල් බැදි ආයතන සම්බන්ධයෙන් වාර්ෂිකව බදු මුදල් මිලියන 16 ක් ලැබෙනවා. ඒ නිසා අපි ටොන් 3ක ටිපර් රථයක් මිලදී ගැනීම සුදුසුයි කියලා. අනිවාර්යෙන් මේ ටිපර් රථය මිලදී ගැනීම සුදුසුයි. නමුත් මේකට අදාළ විශ්ලේෂණ අපි ඉල්ලුවොත් ඒගොල්ලෝ ඒවා ලැබෙන්නේ නැහැ. මේ වාර්ෂිකව මිලියන 16ක් ලැබෙනවා ඒකට අදාළව වියදම දාන්නේ නැහැනේ. අපිට වියදමක් නැතුවද මේ ආදායම ලැබෙන්නේ. එතකොට මේ කසල බැහැර කිරීම සඳහා වියදමක් දරනවා. කොපමනද මේ වියදම? ඒ වියදම සම්බන්ධව මෙතන සඳහනක් කරන්නේ නැහැ. ඒ නිසා මේක අසම්පූර්ණයි. අපි වාර්තාවක් ඉල්ලුවා වානිජ අංශ කොච්චරක් තියෙනවාද කියලා. නිකන් අර දෙන්නම් වාලේ දෙන විදියට වාර්තාවක් දුන්නා. නිකන් අපි දන්න ආයතතන, දැන්ට භාවිතා නොකරන ආයතන සියලුදේම නම් දාලා තිබුණා. ඒ නිසා මේ සම්බන්ධයන් වාර්තාවක් ලබාදීමෙන් පසු මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, අංක 20 වැය විශ්ලේෂණයේ 1405 මහා සභා සංග්‍රහා සඳහා මැයි මාසයේ වියදම් කරනවා රු.79000/-ක්. එතකොට කමිටු සංග්‍රහා සඳහා වියදම් කරනවා රු. 89000/-ක්. එතකොට ජූනි මාසේ වියදම් කරනවා මහා සභා සංග්‍රහා සඳහා රු.182,360/- ක් ඒක ඩබල් වෙලා තියෙනවා. මොකද දෙපාරක් තිබුණොත් අපිට සංග්‍රහා නැතිනම් වෙනත් වියදම් මේකට ඇතුලත් කරලාද? එතකොට මැයි මාසේ කමිටු සංග්‍රහා සඳහා රු.89000/-යි ජූනි මාසේ සඳහා රු.45000/-යි. වෙනත් සංග්‍රහා සඳහා තියෙනවානම් වියදම් ඒවා වෙනත් කරුණක් යටතේ සඳහන් කරන්න.

කමිටු සංග්‍රහා මේ මන්ත්‍රීවරුන්ගේ අකවුන්ට් එකට බැර කරන් එපා. මන්ත්‍රීවරුන්ගේ අකවුන්ට එකට වෙනම එකක් තියන්න. වෙනත් සංග්‍රහා වෙනත් කියන මාතෘකාවක් යටතේ දාන්න. ඒ නිසා මේක පැහැදිලිව ලබන වාරයේ එනකොට මේක වෙනස් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්දු පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට ප්‍රධාන මිලියන 102 ක ප්‍රශ්ණයක් ආවා. මේ සී වීව් රෙසිඩන්සීස් පිළිබඳ කතා කරද්දි 1909 පරිපාලන වාර්තාව අපිට හම්බවෙනවා. ඒ පරිපාලන වාර්තාවට අනුව ලුනාව තානායම ඉඩම මිලදී ගන්නේ එංගලන්තයේ රැජින. ඒ අයිතිය භාර දෙනවා පළාත් මාර්ග කිමිටුවට සහ දිස්ත්‍රික් මාර්ග කමිටුවට මුලින්ම ඊට පස්සේ කාලානුරූපිව සනීපාරක්ෂක මණ්ඩලයට යනවා. ඊට පස්සේ ලෝකල් බෝඩ් එකට යනවා. ඊට පස්සේ නගර සභාවට එනවා. ඊට පස්සේ මහා නගර සභාවට එනවා. ගරු නගරාධිපතිතුමනි, අපි ඔප්පුවක් ලබා ගන්නකොට ඒ ඔප්පුව පවරන ක්‍රම 04ක් තියෙනවා. ඒකක් තමයි අයිතිය පවරනවා එහෙම නැතිනම් භුක්තිය පවරනවා, එහෙම නැතිනම් පරම අයිතිය තියෙනවා එහෙම නැතිනම් පැවරුම් ලිපියකින් පවරනවා. ගරු නගරාධිපතිතුමනි, රැජින මේ තානායම් මිලදී ගන්නකොට විශේෂයෙන් අබේපුස්ස, හොරණ ඒ වගේම මොරටුවේ තානායම නගර සභාවට ලබා ගන්නේම ගරු නගරාධිපතිතුමනි නගර සභාවට භුක්තිය සච්චන විදියට ආදායමක් ලැබෙන පරිද්දෙන්. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මේකේ ප්‍රධාන කාරණයක් තියෙනවා ඒ තමයි ඒ රැජින විසින් භුක්තිය පවරපු තානායම් ඉඩම මොරටුව නගර සභාවට ආදායම් ලබන්න පවරන අතරේ මෙතුමා මතක් කරපු විදියට ජනාවාස සංවර්ධන අධිකාරිය ඒ කැබිනට් පත්‍රිකාව දාන්නෙම ගරු නගරාධිපතිතුමනි, අඩු ආදායම්ලාභී සඳහා කියන දේත් එක්ක. ඒ නිසා පළවෙනි කොන්දේසිය ඔවුන් වයිලේට් කරලා තියෙනවා. ඉන් පස්සේ ඒත් එක්කම මේක විකුණනවා. ඒ අනුව ගරු නගරාධිපතිතුමනි, අඩු ආදායම්ලාභීන්ට මේක ලබා දෙනකොට මොරටුවේ හැමදෙනාම කැමති වෙනවා මේක ලැබෙන්නේ මොරටුවේ ජනතාවට කියලා. හැබැයි හත් දෙනෙකුට ඇරෙන්න යාපනය, අනෙක් පැත්තෙන් ගත්තොත් අදාළ අමාත්‍යාංශයේ ඉන්න නිලධාරීන් විශාල ප්‍රමාණයක් මේ ඉඩම් ලබා ගන්නවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අද වෙනකොට ඔවුන් බලාපොරොත්තු වුණේ අඩු ආදායම්ලාභීන්ට දෙන්න වුණාට, බිලියන ගානක විශාල ආදායමක් තියෙනවා මෙතුමා කිවුව විදියට, ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ නඩු දාන්න ඕනත් නැහැ අපිට බඩු ගන්න පුලුවන් විදියක් තියෙනවා. ඒ තමයි ගරු නගරාධිපතිතුමනි, මේ මිලියන 102 ගන්නකොට අද වෙනකොට ජනාවාස දෙපාර්තමේන්තුවේ ඒ අරමුදලේ එහෙම නැතිනම් ඒ ගිණුමේ මුදල් තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා ගරු ජනාධිපතිතුමන්ටත්, අදාළ අමාත්‍යතුමන්ටත් අපේ නගර සභාවේ මේ වෙනකොට වැටුප් ප්‍රතිපූර්ණය කරන්නේ 40%යි.

සභා සෝෂා

<u>ගරු නගරාධිපතිතුමනි - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, ඔබතුමන්ලා දක්ෂයි තොරතුරු දන්නවා දැනුම තියෙනවා ඒ නිසා ඔබලා මෙතන කතා කරනවා. හැබැයි අපි අනෙකා පිලිබඳවත් හිතන්න ඕන. මේ ටයිප් කරනවා කියන්නේ සෙල්ලමක් නෙවෙයි. සභාවේ මුලු කතා වලින් සභාවේ මුලු කාලය ඇතුලේ ගත්තොත් තුන්දෙනෙක් හතර දෙනෙක්. අපි අවශ්‍ය කරුණු ටික කෙටි කරලා කියන්න පුලුවන් වුණානම්. දැන් අපි උදේ ඉඳන් මේ වෙනකන් මේ සභාවේ ඔබ බැලුවේ ආණ්ඩු පක්ෂයේ මම හිතන්නේ අද දවසේ කතා කලා පොඩි කැලි තුන්දෙනෙක් නැත්නම් හතර දෙනෙක්. ඒක නිසා

හොඳයි කියනවා නෙවෙයි. ඉතිහාසයේ ඔබ මම හිටපු මේ ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රීවරු. හැබැයි අද අපි සමත්වෙලා තියෙනවා ඔබ අපි පොදු සභාවක් ලෙස අර තිබුණාට වඩා යම් තැනකට උසසලා තියලා තියෙනවා අපි හැමෝගේම දායකත්වයත් එක්ක. දැන් අපි කොච්චර වර්ණනා දාලා අතපය දිග හැරලා කරුණු කාරණා අපි කතා කළත්, අපිට අවශය දැන් මේකේ විසඳුම කතාව ඇතුලේ නෙවෙයි තියෙන්නේ. කතාව ඇතුලේ තොරතුරු තියෙයි කතා කරන බව මන්ත්‍රීවරයා දක්ෂා බව මාධ්‍ය වලින් එළියට අරගෙන යන්නත් පුලුවන්. හැබැයි අපිට අවශ්‍යයි මේ විසඳුම. මේ නිවස පද්ධතියේ ඉන්න මිනිස්සුයි මේ මොරටුව මහා නගර සභාවට වෙච්ච අලාභ හානියයි අපි කොහොමද සාකච්ඡාවකින් විසඳ ගන්නේ සභාවේ ලොකු කාලයක් අරගෙන නෙවෙයි. වෙනම ඒක කොහොමද කරගන්නේ, අර අපි අධිහාර එකකට ලක්වෙලා තියෙන එක ගැටලුවක් තියෙනවා. අපි කොහොමද ඒක විසඳගන්නේ. දැන් ඒ පිළිබඳව කරගන්න අර සාකච්ඡාව සංවාදය සභාවේ වාර්තා තුළ ලොකු කාල වේලාවක් ගැනීම තුළ, ඔබට මේ අයිතියක් නැහැ කියලා නෙවෙයි කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා හරි. ඔබතුමා කියන එකට විසඳුම තමයි මම දැන් කියන්න යන්නේ. මම කියන්න හැදුවේ මේ මිනිස්සුන්ගේ වැඩේ ඉටුවෙන ගමන් ඔබතුමාට ඔම්බුඩ්ස්මන්වරයාට ලියුමක් ලියන්න පුලුවන් යම් පාර්ශවයකට රාජ්‍ය යාන්ත්‍රණය පැත්තෙන්. යම් අගතියක් සිද්ධ වෙනවානම් ඒ පිළිබඳව යම් විමර්ශණයක් කරලා සාධාරණයක් ඉෂ්ඨ කරන්න. ඒ නිසා නගර සභාවේ අපේ ඉන්න ඡන්ද දායකයින්ටත් යන්න ඕනානම්. ඒ නිසා අපිට ආයතනයක් විදියට යන්න බැරිනම් ඒක තමයි විසඳුම නගරාධිපතිතුමනි, ඒ විසඳුම ඔම්බුඩ්ස්මන්වරයා දුන්නොත්, එහෙම නැතිනම් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා දුන්නොත් ඒක කාටවත් බැහැයි කියන්න බැහැ. ඒකයි මම කියන්න හැදුවේ කාලේ කන්න නෙවෙයි. ගරු නගරාධිපතිතුමනි, මම හැමදාම මොකක්හරි කිවුවොත් මොකක්හරි විසඳුමක් අරගෙන තමයි ඉන්නේ. ඒ නිසා මම අඩ අඩ ඉන්නවාට වඩා විසඳුම් දෙන්න තමයි හදන්නේ. ඒ විසඳුමත් එක්ක ඔම්බුඩ්ස්මන්වරයා ලඟට යන්න කියලයි මම කිවුවේ. ඒ නිසා මිලියන 102 එන ගමන් අර ජනතාවටත් යුක්තිය ඉෂ්ඨ වෙනවා මේ ජනතාවටත් යුක්තිය ඉෂ්ඨ වෙනවා නඩු යන්නෙත් නැහැ බඩු හම්බවෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලුනාව තානායම පිළිබඳව විශාල සාකච්ඡාවක් ගියා. ඒ නිසා අපි සරලව හිතුවොත් මොරටුවේ තියෙන ඉඩමක් ජනාවාස සංවර්ධන අධිකාරියෙන් ඇවිල්ලා ඉදිකිරීම් කරලා ඒ අය මුදලක් උපයා ගන්නවා. බැලූ බැල්මට ඉතාමත් අසාධාරණ සිද්ධියක්. ඒ නිසා තමුන්නාන්සේලා මැදිහත් වෙලා මේකට අපි හොරා කිය කිය කතා කළේ හිටපු සමන්ලාල් නගරාධිපතිට. හැබැයි මේ සභාවේ දේවල් ආරක්ෂා කරගන්න යම් යම් වාසි තියෙන්න පුලුවන් වෙන වෙන විදි වලින්. සභාවේ දේවල් ආරක්ෂා කරගන්න බොහෝම කැපවීමක් කරයි කියන දේ මතක් කරන්න ඕන. විශේෂයෙන්ම ලුනාව තානායම මේ ඉඩමට ගිහිල්ලා ඔය මිලියන 102 ලබාගන්නත් ඒකට කතා කරගන්න ලබා ගත්තේ නැතිවුණාට කතා කරගන්න තැනට ගිහිල්ලා ඒ දක්ෂතාවය තිබුණා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා ඔබතුමාගේ ශක්තිමත් ආණ්ඩුවක් තියෙන්නේ. ඒ නිසා අදාළ අමාත්‍යවරුන් එක්ක ජනාධිපතිතුමා එක්ක කතා කරලා අපිට අසාධාරණයක් වෙලා තියෙනවා මේ නිසා මේ මුදල අපිට මොන විදියකින් හරි එක්කෝ සංවර්ධන යෝජනා ක්‍රමයක් හරි අපි ලබාදෙන්න කියලා ඉල්ලීම් කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉතිහාසයේ වැරදි කරපු මිනිස්සුන්ට අද සහතිකයි, වරදි නොකරපු අපිට චෝදනයි එනවානම් මම කියන්නේ ඉතාම අසාධාරණයි. මේක ගන්න බැරි වුණත්, එක විටෙක මට මතක් සජිත් ඇමතිතුමා ඉන්න කාලේ මේ මුදල දෙන්න ඔන්න මෙන්න තිබුණා. මේ ගෙවල්ම ඉල්ල ඉල්ල හිටියා.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මිලියන 102ක් ගන්න තැන එයා හිටියා. අපි කියන්නේ, මට පෞද්ගලිකව කාගෙන්වත් වැඩක් නැහැ. නමුත් මොරටුවේ තිබෙන දේපළක් බේරගන්න මෙතනදී තමුන්නාන්සේ මැදිහත් වෙන්න කියන ඉල්ලීම තමයි කළේ. ඒ නිසා නගරාධිපතිතුමනි, සුජිත් මන්ත්‍රීතුමා සහ අපේ මන්ත්‍රීවරු ඉතාම වැදගත් අදහස් දැක්වූවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නිවරදි කරන්න ඕන කතාවක් මේක. ගෙවල් ඉල්ලපු කතාව අපේ මන්ත්‍රීවරු හිටියා බහුතරයක් පක්ෂ විපක්ෂ දෙපැත්තේම ඉන්න ගෙයක් නැතුව මන්ත්‍රීවරු බහුතරයක් හිටියා. ඒ නිසා තමයි ඒ ගෙවල් ඉල්ලන්න පෙලඹුනේ නැතිනම් මේ කාටවත් සාක්කුවේ දාගන්න ගෙවල් ඉල්ලුවේ නැහැ. මටත් ගෙයක් තිබුණෙ නැහැ. ඒ නිසා ගෙවල් නැති මන්ත්‍රීවරු ගොඩක් හිටියා අපේ. නිකන් නෙවෙයි ඉල්ලුවේ සල්ලි වලට.

**2026.07.16 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |

19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් 2026.07.16 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03(07), 03(09), 03(10), 03(11), 11, 16, 17, 23, 24, 27(02), 27(03), 31, 32 හා 38 යන කමිටු නිර්දේශයන්ට පක්ෂවත්වත්, අංක 03(01), 03(02), 03(03), 03(04), 03(05), 03(06), 03(08), 03(12), 08, 13, 14, 18, 19, 20, 21, 25, 26, 27(04), 27(05), 27(06), 27(07), 28, 30, 33, 34 හා 37 යන කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
10. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එම්. ප්‍රියනාත් මැකන්සි මැන්දිස් මහතා

**පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරයා 2026.07.16 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 03(07), 03(09), 03(10), 03(11), 03(12), 11, 16, 17, 23, 24, 27(02), 07(03), 31, 32 හා 38 යන කමිටු නිර්දේශයන්ට පක්ෂවත්වත්, අංක 03(01), 03(02), 03(03), 03(04), 03(05), 03(06), 03(08), 08, 13, 14, 18, 19, 20, 21, 25, 26, 27(04), 27(05), 27(06), 27(07), 28, 30, 33, 34 හා 37 යන කමිටු නිර්දේශයන්ට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

**2026.07.16 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.07.16 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

## 07. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව</u>

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2026.07.16 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 21 යටතේ 2026 ජූනි මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 32 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත

## 09. <u>වෙනත් කරුණු</u> - නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2026.08.04 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.